# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016 දෙසැම්බර් 07 වන බදාදා**
2016 மார்கழி 07 புதன் கிழமை
Wednesday 07th December 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුවමාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභාගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.00ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.00 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.00 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම නම් උදේ 09.00 ට මූලාසනයට ආවා. නමුත් මේ වෙලාවේ සාකච්ඡාව කරගෙන යන්න බැහැ. සභානායකතුමා හරි ඇමැතිවරයෙක් හරි පූර්ණ කාරක සභාවට යෝජනා කරන්න ඕනෑ. ඇමැතිවරු කවුරුත් නැහැ. සභානායකතුමා නැහැ. මේ වගකීම කවුරු හරි ගන්න ඕනෑ. අපිත් අමාරුවෙන් එන්නේ. අපි උදේ 05.30 ට ඇහැරිලා ඔක්කෝම වැඩ පැත්තකට දාලා එන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමා, අමාත්‍ය මණ්ඩලය, විපක්ෂ නායකතුමා කිසි කෙනෙක් නැහැ. අයවැයක් තිබෙන කොට ඒක ඒ අයගේ වගකීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපිත් එහෙමයි. කිසිම උත්සවයකට, මළ ගෙදරකට යන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අමාත්‍යවරයෙක් එනවා. උදේ 09.00 ට පටන් ගන්න, කිසිම අමාත්‍යවරයෙක් නැහැ. සභාවක්ද මේක?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

විනාඩි දෙකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි ගණන වැඩක් නැහැ ඇමැතිතුමා. එන්න දැන ගන්න ඕනෑ. අහල පහළ ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. අද දවසේ නිවේදන කිසිවක් නැහැ. ප්‍රදායන් පිළිබඳව සලකා බැලීම සඳහා දැන් පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කිරීමේ අවස්ථාව. ඒ සඳහා ගරු සභානායකතුමාට හෝ අමාත්‍යවරයෙකුට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, *"ප්‍රදානයන් සඳහා වූ ඉල්ලීම් සලකා බැලීම පිණිස මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2017
# පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATMENT - 2017
COMMITTEE OF THE WHOLE COUNCIL

| | | |
|---|---|---|
| ශීර්ෂ අංක100 | - | **ආණ්ඩුකාරවරයා** |
| ශීර්ෂ අංක101 | - | **බස්නාහිර පළාත් සභාව** |
| ශීර්ෂ අංක102 | - | **පළාත් රාජ්‍ය කොමිෂන් සභාව** |
| Head no 100 | - | Governor |
| Head no 101 | - | Western Province Provincial Council |
| Head no 102 | - | Provincial Public Service Commission |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමුවෙන්ම විවාදය ආරම්භ කිරීමට විපක්ෂයට අවස්ථාව ලබා දෙනවා. ඒ අනුව ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා නැහැ. මට තේරෙන්නේ නැහැ කවුද නම් කරන්නේ කියලා. නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සූදානම්ද? නැහැ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විවාදය ආරම්භ කිරීමට ආරාධනා කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. මේ ගැන විපක්ෂයට විතරක් චෝදනා කරන එක වැරැදියි. ආණ්ඩු පක්ෂයත් දැන ගන්න ඕනෑ. උදෑසන 09.00 ට සභාව ආරම්භ කරන කොට කිසිම ඇමැතිවරයෙක් මේ සභා ගර්භයේ නැහැ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා හිටියා. සභා ගර්භයේ මන්ත්‍රීවරු තුන් දෙනයි හිටියේ. හැම කෙනෙක්ම දන්නවා උදේ 09.00 ට සභාව පටන් අරගෙන සවස 05.00 ට අවසන් වන බව. පොඩි ළමයි නොවෙයි නේ? අපිත් උදේ පාන්දර ඇහිරිලා, අනෙක් වැඩ නවත්වලා මේකට එන්නේ. අපි ගම්පහ ඉන්නේ. අපට එන්න පුළුවන් නම් අනෙක් අයටත් එන්න පුළුවන් නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සවස 05.00 ට ඇවිල්ලා ඉල්ලනවා, විනාඩි 15 ක් 20 ක් දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාට මේ ප්‍රශ්නය නිසා නින්ද යන්නෙත් නැහැලු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු සභාපතිතුමනි, අපි ගම්පහ ඉඳලා ඔබතුමා වාගේම මේ සභාවට වෙලාවට ආවා. කොළඹ ඉන්න අපේ ඇමැතිතුමන්ලාට එන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක තේරුම් ගන්න ඕනෑ. අපි අවුරුද්දට එක පාරයි මුදල් ප්‍රකාශය සම්බන්ධව සාකච්ඡා කරන්නේ. මන්ත්‍රීවරු සහ ඇමැතිවරු ඔක්කෝම මේ ගැන වගකීම ගන්න ඕනෑ. හැම කෙනෙක්ම. නිලධාරීනුත් එහෙමයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, එහෙම නම් අපි දැන් ආරම්භ කරමුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධාන ලේකම්තුමාත් මේ සභාවේ ඉන්න නිසා මම මේ කථාව කියන්නට ඕනෑ. දැන් 09 වැනිදා උදේ 09.00 ට - ඔබතුමා කියන්න ඇමැතිතුමා. අපි තීන්දුවක් ගත්තා අයවැය විවාදය විතරක් නොවෙයි, පළාත් සභා රැස්වීම් තියන කිසිම දවසක උදේ වරුවේ උත්සව දාන්න එපැයි කියලා. Grand Monarch උත්සව ශාලාවේ. උදේ 09.00 ට උත්සවයක් තියෙනවා. මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. මම ඒක කරන්න එපා කියලා කිව්වා. මහ ඇමැතිතුමාට කිව්වා. එතුමා ඒක පිළිගත්තා. පළාත් පාලන කොමසාරිස්තුමියට මගේ කාමරයට එන්න කියලා මම කිව්වා, ඒක කරන්න එපා කියලා. නමුත් ඒක පිළිගත්තේ නැහැ. අද උදේ නියෝජ්‍ය සභාපතිතුමාට කථා කරනවා දුරකථනයෙන්, හෙට උදේ 09.00 ට එන්න කියලා. මොකක්ද මේ වැඩ පිළිවෙළ?නිලධාරීන්ට එහෙම අයිතියක් නැහැ. මේ පළාත් සභා රැස්වීම. වැදගත්ම රැස්වීම. මම එතුමියට බොහොම ගෞරවාන්විතව ආරාධනා කරලා කිව්වා, මේක කරන්න එපා කොමසාරිස්තුමිය. මේ ලියුම් ටික බෙදන්න එපා කියලා. නමුත් ඒක ඇහුවේ නැහැ. සභාවේ සභාපතිතුමාට ඒ ගෞරවය දක්වන්නට ඕනෑ. එක එක විධියට මේක යන්න බැහැ. කථා කරලා කියනවාලු. මෙතුමාට කථා කරලා කියලා. අපේ ගාමිණී තිලකසිරි ඇමැතිතුමාට කථා කරලා කියලා. නියෝජ්‍ය සභාපතිතුමාට

කථා කරලා කියලා. මොකක්ද මේ වැඩේ? අපි ඔක්කෝම උත්සවයට ගියා නම් මොකද වෙන්නේ? මෙතැන සභාව නැහැ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරු ඒ උත්සවය වර්ජනය කළාම හරි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, අද හෝමාගම ගෙවල් 500 කට මුල්ගල් තියනවා සජිත් ප්‍රේමදාස මැතිතුමා. අපි ඒවටවත් සහභාගී නොවී ආවේ. විනාඩි 02 යි පරක්කු වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා මම ඉතාම ඕනෑකමින් සඳහන් කරනවා. ප්‍රධාන ලේකම්තුමා සභාවේ ඉන්නවා. අනෙකුත් අමාත්‍යාංශ නිලධාරීන්ට සහ අනෙකුත් සියලුම නිලධාරීන්ගෙන් මම ඉල්ලා සිටින්නේ මෙහෙම කරන්න එපා. අපි තීන්දුවක් අරගෙන තිබෙනවා. පළාත් සභා රැස්වීම් දිනවලදී කිසිදු උත්සවයක් දාගන්න එපා කියලා. එහෙම දැනුවත් කරලා තියෙද්දී තවමත් දුරකථනයෙන් කථා කරලා කියනවා උදේ 09.00 ට එන්න කියලා. විශාල මුදලක් වැය කරලා. ඒ ගැන ඔබතුමන්ලා මොකක් හරි තීන්දුවක් ගන්න. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.11]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, විවාදය ආරම්භ කරන්න මට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි ආරම්භයේදී සාකච්ඡා කරනවා ශීර්ෂ අංක 100, 101 සහ 102 යටතේ තිබෙන ආණ්ඩුකාරවරයා, බස්නාහිර පළාත් සභාව හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව. ගරු සභාපතිතුමනි, දැන් පළාත් සභාවලට තමන්ගේ කටයුතු කරගෙන යනකොට අපි දන්නවා, නෛතික අවහිරතා තිබෙනවා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපට දෙනු ලැබූ බලය පැහැදිලි බලයක්ද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. ඒ වාගේම අපි ඊයේ මේ විවාදය ආරම්භයේදී සාකච්ඡා කළා අපට මූල්‍ය අවහිරතා තිබෙනවා. නෛතික අවහිරතා හා මූල්‍ය අවහිරතා දෙක වළක්වන්න කොයි වෙලාවෙත් අපට මධ්‍යම ආණ්ඩුව උදව් කරන්නේ නැහැ. මේ අවුරුදු 28 ක පළපුරුද්දෙන් අපි ඒක දන්නවා. ඒ නිසා මේ අවහිරතා, අභියෝග ජයගන්න එකේ වගකීම තියෙන්නේ පළාත් සභාවේ ඉන්න අපටයි. අපි හෘදය සාක්ෂියට එකඟව කල්පනා කරලා බලන්න ඕනෑ, පසුගිය කාලයේ අපි ඒ වෙනුවෙන් මොනවාද කළේ කියලා. අඩුම වශයෙන් අපට පේනවා අවුරුද්දක, මූල්‍ය වර්ෂයක කටයුතු කරගෙන යන්න, සාකච්ඡා කරන්න, අදහස් දක්වන්න, තර්ක විතර්ක කරන්න, මේක හරි මහට ගන්න අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඇතැම් ඇමැතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ උනන්දුව පිළිබඳව ඉතාම කනගාටුදායකයි. එහෙම තත්ත්වයක් තුළ කොහොමද අපි මේ නෛතික හා මූල්‍ය බාධා ඉවත් කර ගන්නේ? ඒ නිසා මේක අපි යළිත් වරක් කල්පනා කරලා බලන්න ඕනෑ. හැබැයි එහෙම වුණත් පසුගිය අවුරුදු 28 ඇතුළත පළාත් සභාවක් හැටියට අපි ධනාත්මකව හිතනවා නම් අපි දකිනවා, මේ පළාතට පළාත් සභා හරහා විශාල සේවයක් කරලා තිබෙනවා. තමන් තෝරා ගත්තු ජනතාවට සේවයක් කරලා තිබෙනවා. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ.

හැබැයි, මට විශේෂයෙන් මතකයි. අපේ මන්ත්‍රීතුමෙක් මතක් කළා, හිටපු ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මහ ඇමැතිවරියට හැටියට ඉඳලා එළියට ගියාට පස්සේ මේ පළාත් සභාවේ කටයුතුවලට අනවශ්‍ය විධියට ඇඟිලි ගැහුවේ නැහැයි කියලා. ඒක හොඳ තත්ත්වයක්. මොකක්ද මේකෙන් පේන්නේ? පළාත් දේශපාලනය හා පරිපාලන නායකත්වය ඒ කටයුතු නායකත්වයට කරගෙන යන්න රටේ රාජ්‍ය පාලකයා ජනාධිපතිතුමා හෝ ජනාධිපතිතුමිය ඉඩ ප්‍රස්ථා ලබා දීලා තිබෙනවා. උදව් කරලා තිබෙනවා. ඒ නිසා මේ පළාත් පරිපාලනයේ කැපවීම හා දායකත්වය මීට වඩා ඉහළ යන්න ඕනෑ අපට ඒ රාජ්‍යයෙන් ලැබෙන සහාය, මූල්‍ය ආධාර, නෛතික සහාය, නිදහස ලබා ගන්න නම් කියන කාරණය මා මතු කරන්න කැමැතියි. දැන් පළාත් සභාවකට අනන්‍ය වූ විධායක බලය පාවිච්චි කිරීමට නම් පළාත් සභාව විසින් සකස් කර ගන්නා ලද ප්‍රඥප්ති අවශ්‍යයි. අපි දන්නවා ප්‍රඥප්ති හැත්තෑ ගණනක් විතර අපි සකස් කරලා තිබෙනවා. නමුත්

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

ප්‍රශ්නය තියෙන්නේ ඒක නොවෙයි. ආදායම් උත්පාදනය කිරීම සඳහා මේවා කොතරම් දුරට අපි උපයෝගී කර ගන්නවාද කියන එක. ඒ නිසා මේ ප්‍රඥප්ති සම්පාදනයට තිබෙන දුෂ්කරතාත් ඉවත් කරලා, තිබෙන ප්‍රඥප්ති මුදල් ඉපයීම සඳහා පාවිච්චි කරන්නේ කොහොමද කියන එක ගැන අපි පළාත් සභාවක් හැටියට මීට වඩා හිතන්න ඕනෑ. මම මෙපමණ වෙලා කිව්වේ අපේ ආණ්ඩුකාරතුමාගේ වගකීම අතිවිශාලයි කියලා, අපට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ලබා දීලා තිබෙන බලය පිළිබඳව විශ්ලේෂණයක් කරන කොට ගරු සභාපතිතුමනි, පෙනී යනවා. විශේෂයෙන්ම මේ ප්‍රඥප්ති පිළිබඳව මම විශ්වාස කරනවා අපේ ඉන්න සාමාජිකයින්ගේ දැනුමත් ඉතාම සීමිතයි කියලා. මොකද, අපේ මේ පළාත් සභාවේ ඉන්න ජනතා නියෝජිතයින්ගේ දැනුම මීට වඩා ඉහළ දාන්න පුළුවන් නම් මේ ප්‍රඥප්ති පිළිබඳව.එහෙම නම් මීට වඩා මේ අය සටන් කරයි. ප්‍රඥප්ති හරහා මුදල් උපයන්න කටයුතු කරන්නේ කොහොමද කියලා. ඒ නිසා ඒ දැනුම දියුණු කිරීමේ අවශ්‍යතාවය මා අවධාරණය කරනවා. මම විශ්වාස කරනවා මේ කටයුත්ත ආණ්ඩුකාරතුමාගේ වගකීමේ එක කොටසක් කියලා. එහෙම නම් කාරක සභා ශක්තිමත් කරලා, කමිටු පත් කරලා, ප්‍රඥප්ති සම්පාදනයට මුල පිරීමේ විශාල වගකීමක් ආණ්ඩුකාරතුමාට තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය වසරේදීත් මේ වැය ශීර්ෂයට අදාළව විපක්ෂයෙන් විවාදය පටන් ගත්තේ මම. ඒ වෙලාවේදී මම යමක් මතක් කළා. ඒ කාරණය යළිත් මම මතක් කරන්න කැමැතියි ගරු සභාපතිතුමනි. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළව. පළාත් සභාවක් විසින් ප්‍රඥප්ති සම්පාදනය කරනු ලැබිය හැකි කාරණාවට ව්‍යාප්ත වන විධායක බලය එම පළාත් සභාව පිහිටුවනු ලැබූ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් 154 (ඊ) ව්‍යවස්ථාවට අනුකූලව කෙලින්ම හෝ පළාත් අමාත්‍යවරයන් මාර්ගයෙන් හෝ සිය යටත් නිලධාරීන් මාර්ගයෙන් හෝ ක්‍රියාත්මක කළ හැක්කේය. ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමන්ලාගේ අවධානය මීට වඩා මේ ගැන යොමු වෙන්න ඕනෑ. අපි දන්නවා. ප්‍රවාහනය සම්බන්ධයෙන් එක්වරක් එක ප්‍රඥප්තියක් සකස් කරලා නමුත් ඒක ක්‍රියාත්මක නොවී නරත වෙලා තිබුණා. ඔබතුමා ඒක පිළිගන්නවා. මේ ත්‍රිරෝද රථ ලියාපදිංචියට ගිය වෙලාවේ ඔබතුමාට ඒක ප්‍රශ්නයක් බවට පරිවර්තනය වුණා. මම හරි නේද ඇමැතිතුමා?එහෙම නම් ප්‍රඥප්ති නිකම් පැත්තකට දාලා තියෙන්න දෙන්න එපා. දැන් මේවා ප්‍රයෝජනයට ගන්න. මේවායේ නෛතිකභාවය ආරක්ෂා කරන්න. එහෙම නම් මේ කටයුත්තේදී ආණ්ඩුකාරතුමාට - මම දන්නවා අපේ ආණ්ඩුකාරතුමා ඉතාම දක්ෂ, හොඳ බුද්ධියක්, දැනුමක් තිබෙන, සියලු දේවල් කියවන කියවන කෙනෙක් බව. අපි ආණ්ඩුකාරතුමාව දෙතුන් වරක් හමු වුණා. එතුමා අදහස් දක්වන විධියෙන් අපට තේරුණා, මේ පළාත් සභාවේ මොනවාද වෙන්නේ කියන එක එතුමා පැහැදිලිව දන්නවා. අපි කථා කරන සෑම වචනයක් පාසාම ආණ්ඩුකාරතුමා දන්න බව. එහෙම නම් මේ පණිවිඩයත් ආණ්ඩුකාරතුමාට යා යුතුයි ගරු සභාපතිතුමනි. ඒ නිසා අද අපි මේ ආදායම් ඉපයීමේ බරපතළ අර්බුදයකට මුහුණ පා සිටින වෙලාවේ ආදායම් එකතු කිරීමට අදාළ ප්‍රඥප්ති කොපමණ තිබෙනවාද? එහෙම නම් ඒවා ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒවායෙන් කොහොමද ආදායම් ලබා ගන්නේ කියන එක ආණ්ඩුකාරතුමා හරහා මම හිතන්නේ මෙතුමන්ලාට උපදෙස් ලබා දෙන්න ඕනෑ සහ මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා. ඒක ආණ්ඩුකාරතුමාගේ කටයුත්තක් ලෙසටයි මා සලකන්නේ.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා පසුගිය වසරේදී ආණ්ඩුකාරතුමාගේ අඩුපාඩු පිළිබඳව, කාර්යාල පිළිබඳව විවිධ දේවල් කථා කළා. නමුත් මම හිතනවා ඒ වෙලාවේදී ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව අවධානය යොමු කළේ නැහැයි කියලා. කොහොම වෙතත් මේ බදු එකතු කිරීමේ කටයුත්තේදී අපට තිබෙන කාරණයක් තමයි මේ බදු නියම කරන්නේ ආණ්ඩුව. ඊට පස්සේ බදු වෙනස් කරන්නේ ආණ්ඩුව. පළාත් සභාවක් හැටියට අපි මොකද කරන්නේ? බදු නියම කරන සහ බදු වෙනස් කරන ඒවායේ නෛතික බලය තමන්ගේ අතට ගත්තු ආණ්ඩුවට විරුද්ධව අපි සටන් කරන්නේ නැහැ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපට දීලා තිබෙන බලය - අපට විශාල බලයක් තිබෙනවා. අපේ ඉන්න ගරු ප්‍රධාන ඇමැතිතුමා සහ ඇමැති මණ්ඩලය, ගරු මන්ත්‍රීවරු මේ පිළිබඳව මීට වඩා විශ්ලේෂණයකට යා යුතුයි කියලා මා විශ්වාස කරන්නේ. ඒ ගැන සොයා බලා තමන්ට හිමි වෙලා තිබෙන බලය නෛතිකව තමන් අතට අරගෙන ආදායම් වැඩි කර ගන්න පුළුවන්. මේක මධ්‍යම ආණ්ඩුවට දෙන්න ඕනෑ නැහැ. ඒ නිසා මේ ගැන අවධානය යොමු වෙන්න ඕනෑ. මේක

ආණ්ඩුකාරතුමාගේ කාර්ය භාරයේ කොටසක්. ප්‍රධාන අමාත්‍යතුමා සහ ඇමැතිවරු මේ ගැන ආණ්ඩුකාරතුමා සමග කථා කරන්න ඕනෑ කියලා, විධායකයත් එක්ක කථා කරන්න ඕනෑ කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා ආණ්ඩුකාරතුමාට මේ ගැන අවධානය යොමු කරන ගමන් ඊට අමතරව තව කාරණයක් තිබෙනවා. ආණ්ඩුකාරතුමාට මේ පණිවිඩය යා යුතු නිසයි මම කියන්නේ. අමාත්‍යාංශ කටයුතු පිළිබඳව. අපේ අමාත්‍යවරුන්ගෙන් මම අහනවා. කල්පනා කරලා බලන්න, උපදේශක කාරක සභා අපි කීවරක් රැස් කළාද? උපදේශක කාරක සභා රැස් කිරීම ඉතාමත් දුර්වලයි. මේක තමයි ඇත්ත. ඒ නිසා උපදේශක කාරක සභා හරහා කරන්න පුළුවන් වැඩ කොටස අතිවිශාලයි. අපේ මහ ඇමැතිතුමා එදා අයවැය කථාවේදී කිව්වා, සමහර කටයුතුවලට මන්ත්‍රීවරුන්ගෙන් යුත් කමිටු පත් කරනවා කියලා. ඉතාමත් හොඳයි. අපි ඒ වාගේ දේවල්වලට විශාල සහායක් දක්වනවා. අපි කොන්දේසි විරහිතව මහ ඇමැතිතුමාට උදව් කරනවා. ඒ කියන්නේ මේක ඵලදායී තැනකට ගෙනියන කමිටු පත් කරනවා නම් අපි උදව් කරනවා. හැබැයි, එහෙම පත් කරන කමිටු උපදේශක කාරක සභා වාගේ වෙන්න දෙන්න එපා. ඒ කමිටුවල ප්‍රතිඵල ලබා ගන්න ඕනෑ කියන එක මා විශ්වාස කරනවා.

මේ යහපාලනය ගැන අපි දිගටම කථා කරනවා. ඊයේ සමහරු කථා කළා අපි මේ යහපාලනයේ නැහැයි කියලා. යහපාලනයේ සැබෑ අර්ථය මේ පළාත් සභාවට ගෙන දෙන්න පුළුවන් කොහොමද? පසුගිය කාලයේ වුණු දේවල් නොවෙන්න වග බලා ගන්න එක. ඒකයි මේ යහපාලනයෙන් අවසාන අරමුණ විධියට අපි බලාපොරොත්තු වෙන්නේ. යහපාලනය කියන්නේ පරණ වුණු, අඩුපාඩුම වෙන එක නොවෙයි. අපට, යහපාලනයට උදව් කරන්න එපා. හැබැයි පරණ වුණු දේවල් ආයිත් වෙන්න ඉඩ දෙන්න එපා. ඒකයි අපි බලාපොරොත්තු වෙන්නේ කියලා මේ වෙලාවේදී මම කියන්න කැමැතියි. ඒ නිසා ආණ්ඩුකාරතුමා ගැන මම යළිත් යමක් කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි. ආණ්ඩුකාරතුමා තමන්ගේ කටයුතු ගැන ඉතාම අවබෝධයෙන් ඉන්නවා. මට මතකයි පසුගිය දවසක ගිණුම් කාරක සභාවේ අපේ සභාපතිතුමා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු ගිහිල්ලා ආණ්ඩුකාරතුමා හම්බ වෙලා ගිණුම් කාරක සභාවේ වාර්තාව භාර දීපු වෙලාවේ, එතුමා දැක් වූ අදහස් ගැන ඇත්තටම අපේ මන්ත්‍රීවරු ප්‍රශංසාව පළ කළා. මොකද, ඒකට හේතුව, එතුමා මේ කරුණු පිළිබඳව මනා අවබෝධයකින් ඉන්න නිසා. එක අවස්ථාවකදී එතුමා කිව්වා, ඔබතුමන්ලා ඉතාම හොඳ ප්‍රශ්න අහනවා. සමහර වෙලාවට පාර්ලිමේන්තුවේදීවත්- අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් ඊයේ මේ ගැන මතක් කළා. පාර්ලිමේන්තුවේදීවත් අහන්නේ නැති තරම් හොඳ ප්‍රශ්න ඔබතුමන්ලා අහනවා. හැබැයි මේවාට නියම පිළිතුරු හම්බ වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවාද? ඒ නිසා හැමදාම ප්‍රශ්නය මහ හැරලා යන්න එපා. අපි ඇමැතිවරුන්ගෙන් ඉල්ලා සිටින ඕනෑ, ප්‍රශ්න මහ ඇරලා යන්න එපා. මේ ප්‍රශ්නවලට කොහොම හරි පිළිතුරු දෙන්න උත්සාහ කරන්න. අපි යම් විවේචනයක් ගෙනාවාම ඒක ධනාත්මකව භාර ගන්න. කොපමණ නරක විවේචනය වුණත්, හොඳ පැත්තක් තිබෙනවා. ඒ හොඳ පැත්ත භාර ගන්නය කියලා ඉල්ලීමක් කරන්නත් මේ අවස්ථාව මම යොදා ගන්නවා.

ඒ වාගේම අපි මීට කලිනුත් මේ වසරේදී අපි කථා කළා, අපේ එදිනෙදා කටයුතු මෙහෙයවනු ලබන පළාත් සභා කාර්ය මණ්ඩලය ගැන. සභා ලේකම් කාර්යාලය ඉතා විශාල කාර්ය භාරයක් කරනවා. එතුමන්ලාගේ සේවය අතිවිශිෂ්ටයි. ඒ ගැන ආයිත් කියන්න දෙයක් නැහැ. ගිය වසරේ කියපු දේම තමයි මේ වසරේත් කියන්නේ. හැබැයි එතුමන්ලාගේ කාර්යාල පිළිබඳ විවිධ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි ඒ ප්‍රශ්න තිබුණත් එතුමන්ලා එතුමන්ලාගේ කාර්ය භාරය හරියට කරනවා. අපි දන්නවා අපට අලුත් ගොඩනැගිල්ලක් හැදෙනවා. අලුත් කාර්යාල හැදෙනවා. එතකොට ඒ ප්‍රශ්න ගොඩක් විසඳෙන බව අපි විශ්වාස කරනවා. ඒ වාගේම මම ගිය වසරේ හැන්සාඩ් කාර්ය මණ්ඩලය ගැන ප්‍රශ්නයක් මතු කළා. හැන්සාඩ් කාර්ය මණ්ඩල ප්රශ්න යම් ප්‍රමාණයකට විසඳිලා තිබෙනවා ගරු සභාපතිතුමනි. හැබැයි ඒකෙත් අවසාන විසඳුම එහේට මෙහේට දෝලනය වන බව පේන්නට තිබෙනවා. ඒ නිසා ඒකට අවසාන විසඳුමක් ලබා ගැනීම සඳහා මැදිහත් විය යුතුයි කියලා මම මේ වෙලාවේදී මතක් කරන්න කැමැතියි.

ඊට අමතරව අපි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන කථා කළා. ගිය සැරේ අපේ ගොඩක් මන්ත්‍රීවරු, ඇමැතිවරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉතා හොඳයි. ඒකේ කටයුතු ඉතා හොඳයි. හොඳට කරනවා. විනිවිධභාවයෙන් කරනවා. සීමිත සම්පත් ඒ අයට තියෙන්නේ. අපක්ෂපාතියි. ඒ සියලු දේවල් කිව්වා. හැබැයි,

[ගරු සුසිල් කිදෙල්පිටිය]

පසුගිය වසර ඇතුළත යම් යම් කාරණාවලදී, මම උදාහරණයක් කියන්නම්. යම් යම් කාරණාවලදී මේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව අපට ප්‍රශ්නාර්ථයක් මතු වුණා. මම උදාහරණයක් කියන්නම්. මොකක්ද ඒ උදාහරණය. මේ ගුරුවරුන් බඳවා ගැනීමේදී ඉතාම මන්දගාමී ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරයි කියන එක මේ වෙලාවේ මතක් කරනවා. ඒ අය කියන්නේ අපට අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ නියමයක් නැහැ. කාඩර් එකේ ප්‍රශ්න තියෙනවා. අද කාඩර් එකේ ප්‍රශ්න තියෙනවා කියලා ඒගොල්ලෝ මේ වැඩේ අල්ලගෙන ඉන්න කොට පන්ති කාමරයට ගුරුවරු නැහැ. එතකොට අපි ඇවිල්ලා මොකද කරන්නේ? ඇමැතිවරයාට බලපෑම් කරනවා. අනේ අපට පන්ති කාමරයේ ගුරුවරු නැහැ. ඒ නිසා පන්ති කාමරයට ගුරුවරුයා දෙන්නය කියලා. හැබැයි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ගියාම මොකද කියන්නේ? අපට කාඩර් එකේ ඉඩ නැහැ. මෙන්න මේ ප්‍රශ්නය, මෙතැන ලොකු ගැටළුවක් තිබෙනවා. මේ ගැටළුව විසඳා ගන්න ඕනෑ. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තව ප්‍රශ්නයක් මතු වුණා. මොකක්ද? HNDE, ජාතික උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමා සමත් අයට ගුරු පත්වීම් දීම සම්බන්ධයෙන්. මම ඇමැතිවරයාට කථා කළා. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කථා කළා. ඒගොල්ලන්ගේ එතැන පොඩි ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේක අපේ අධ්‍යාපන ඇමැතිවරයා දන්නවා. එතැනත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ යම් ගැටළුවක් මතු වෙලා, මම ඇමැතිතුමාට කිව්වාට පස්සේ, ඇමැතිතුමා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කථා කළා. මෙවැනි ගැටළු ගොඩනැගෙන්න නරකයි. මොකද, ඒකට හේතුව රාජ්‍ය සේවයට පිරිස් බඳවා ගැනීම සම්බන්ධයෙන් විශාල වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තිබෙනවා. ඒකට අපි කාටවත් මැදිහත් වෙන්න බැහැ. හැබැයි, ඒකේ ක්‍රියාකාරකම් නිසා මේ පළාත් සභාවේ කොතැන හරි තැනක වැඩ කටයුතුවලට බාධාවක් වෙනවා නම් ඒ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා අපි මැදිහත් විය යුතුයි කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා. ඒ නිසා වඩාත් කාර්යක්ෂම සහ නිර්මාණශීලී ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වුණත් කටයුතු කරන්න ඕනෑය කියන එක මා දැඩි ලෙස විශ්වාස කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, අපි මතක් කරන්න ඕනෑ. පසුගිය වසරක කාලය තුළ හිටපු ප්‍රධාන ලේකම්තුමිය එක්ක අපට සැහෙන ගැටළු මතු වුණා. අපි මේ පළාත් සභාවේදී විවිධ විවේචන ගෙන ආවා. එතුමිය එවැනි නිලධාරිනියකට ඉතාම නොගැළපෙන ලෙස කටයුතු කළා. අවසානයේ අවුරුදු 13 කට පස්සේ එතුමියට ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් යන්න වුණා. දැන් අලුතෙන් ප්‍රධාන ලේකම්තුමෙක් පත් වෙලා ඉන්නවා. එතුමා ගැන අපි දැඩි විශ්වාසයක් තිබෙනවා. එතුමාට හොඳ අවබෝධයක් තිබෙනවා. අපි විශ්වාස කරනවා එතුමාගේ නිල සීමාවෙන් එහා ගිහිල්ලා දේශපාලන කටයුතුවලට මැදිහත් නොවෙයි කියලා. එහෙම මැදිහත් වුණොත් අවසානයේදී අර හිටපු ප්‍රධාන ලේකම්තුමියට වුණා වාගේ FCID එකේ තමයි නතර වෙන්නේ කියලාත් කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, මීළඟට මම මතු කරන්න හදන්නේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ගැන. අපි කවුරුත් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ගැන කථා කරන්නේ නැහැ. දැන් ඔබතුමන්ලාට නම් මිලියන 190 ක වාහන ටිකක් හම්බ වුණා. ඒකට කමක් නැහැ. ඒ වාගේම අනෙක් ධූරධාරීන් ගැනත් කල්පනා කරලා බලන්න. ඊළඟට බලන්න මේ ධූරධාරීන්ගේ නෛතිකභාවය. දැන් මේක දෙන්න ගියාම කියයි ධූරධාරීන් නීතිමය වශයෙන්, නෛතික වශයෙන් පිළිගෙන නැහැයි කියලා. ධූරධාරීන් නෛතික වශයෙන් පිළිගැනීමට ලක් කර ගැනීමේ වගකීම තියෙන්නේ කාටද? ඒ වගකීම වෙන කාගේවත් නොවෙයි ගරු සභාපතිතුමනි, ඒ වගකීම තිබෙන්නේ අපේ. අපට මේක නෛතික තත්ත්වයට පත් කර ගන්න පුළුවන්. කළ යුතුයි. ධූරධාරීන් කියන්නේ, ඒ ධූරයට අවශ්‍ය සහ ලැබිය යුතු පහසුකම් ටික තියෙන්න ඕනෑ ගරු සභාපතිතුමනි. ඒවා ලබා දීම සඳහා නෛතිකභාවය ඇති කිරීමේ කටයුත්ත - නීතිමය උපදෙස් ගන්නේ ඒකටයි. නෛතිකභාවය ඇති කර ගැනීමේ වගකීම තිබෙන්නෙත් අපේ අතෙයි කියලා මතක් කරන්න කැමැතියි.

ඊළඟට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදවලින් භාගයක් අපට දෙන්න ඕනෑ. ඒක අපට ව්‍යවස්ථාවෙන් සහතික කරපු එකක්. හැබැයි, මොකද වෙලා තියෙන්නේ? පාර්ලිමේන්තුවේ දෛනික දීමනාව රුපියල් 2500/- ක් ගෙවනවා. අපට මොකද වෙලා තියෙන්නේ? අඩුම ගණනේ අපට රුපියල් 1250/- ක් ගන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. ඊළඟට කාර්යාලයට ලක්ෂයයි. නිවසට ලක්ෂයයි. වාහන පර්මිට් එකයි. මේ එකක්වත් පළාත් සභා මන්ත්‍රීවරුන්ට නැහැ. හැබැයි ගම් මට්ටමේ, බිම් මට්ටමේ ගිහිල්ලා ජනතාව

වෙනුවෙන් කටයුතු කරන්නේ කවුද? ඔය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මළ ගෙදරකට, මඟුල් ගෙදරකට එනවාද? හැබැයි, අවසානයේ අපියි ඒකට යන්න ඕනෑ ගරු සභාපතිතුමනි. මම මේ මම ගැන විතරක් නොවෙයි කථා කරන්නේ. මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙන පහසුකම්වලින් භාගයක් අපට ලබා දෙන්න. මේක වචනයට සීමා කරන්න එපා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි ජනතාවට සේවය කරන අතරම, සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. දැන් බලන්න අපේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කීයටද ගෙදරට එන්නේ? මෙතුමාගේ මුළු දවස ගෙවෙන්නේ -මේ වාගේ විවාදයක් තිබෙන දවසට එතුමාගේ මුළු දවසම ගෙවෙන්නේ පාරේ. මේ වාගේ මන්ත්‍රීවරු - මම නම් කොළඹ ඉන්නේ. මට ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ කොළඹ නොඉන්න, ඒ වාගේ දුෂ්කරතා විඳින මන්ත්‍රීවරු ගැන මීට වඩා අපි සලකන්න ඕනෑ. මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට වැඩිය සේවයක් එතුමන්ලා කරනවා. අපි ඇත්ත පිළිගන්න එපැයි. අත්තනගල්ල පැත්තේ එතුමා විශාල සේවයක් කරනවා. මම පෞද්ගලිකව දන්නවා. ඉතින් ඒ නිසා මේ ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. කාර්ය මණ්ඩලවලට සාධාරණය ඉෂ්ට කිරීමේ වැඩ පිළිවෙළකුත් සකස් කරන්න ඕනෑ කියලා කියනවා. මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි. අවසාන වශයෙන් මේ පත්තරේක පොඩි වාර්තාවක් තිබුණා. මේක ගරු ආණ්ඩුකාරතුමාට මේ පණිවිඩය යන්න ඕනෑ. Do yes in office Governors' get duty free vehicle permit.ඒ නිසා අපේ පර්මිට් එක ගැනත් ආණ්ඩුකාරතුමාගේත්, ධූරධාරීන්ගේත්, ඔබතුමන්ලාගේත් සියලු දෙනාගේත් අවධානයට යොමු කරන්නය කියලා ඉල්ලීම කරමින් ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා කාලය ලබා දීම පිළිබඳව.

[පූ.භා. 09.29]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන් ආණ්ඩුකාරවරයා, සභා ලේකම් කාර්යාලය සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව අදහස් දක්වන්න මේ අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම මම කථාව පටන් ගන්න කලින් මතක් කරන්න ඕනෑ.ඊයේ මගේ කථාව විනාඩි 02 කට සීමා කෙරුවා. මම අතිශයින් කනගාටු වෙනවා, ඒ වෙලාව කපා දැමීම පිළිබඳව. ඒ වාගේම සමස්ත සභා ලේකම් කාර්යාලයටම මගේ කාල වේලාව කපා දැමීම පිළිබඳව මගේ චෝදනාවක් තිබෙනවා. මම පෞද්ගලිකව විශ්වාස කරනවා අවුරුදු 28 ක් ගිය මේ පළාත් සභා කාල සීමාව තුළ සභාපතිතුමා ප්‍රමුඛ සමස්ත සභා ලේකම් කාර්යාලය මීට වඩා මේ සභාවේ කටයුතු පිළිබඳව යම් අධ්‍යයනයක යෙදෙන්න ඕනෑ කියලා. මේ සභාවට එන මන්ත්‍රීවරු, කවුදවෙලාවට එන්නේ? කවුද වෙලාවට යන්නේ? කවුද කාරක සභා නියෝජනය කරන්නේ? ඒ අයගේ නියෝජනය කිරීම් පිළිබඳව සභා ලේකම් කාර්යාලය වාර්තාවල් පවත්වාගෙන යනවාද? ඒ වාර්තාවල් අනුව යම් අධ්‍යයනයක යෙදෙනවාද? මේ මන්ත්‍රීවරු අතුරින් කොයි තරම් ප්‍රමාණයක් සභාව පිළිබඳව වැඩ කරන අය ඉන්නවාද? නැති අය ඉන්නවාද කියලා. මම විශ්වාස කරනවා. අයවැය විවාදය වන අවස්ථාව වනකොට සභා ලේකම් කාර්යාලය සභාපතිතුමාගේ නායකත්වයෙන් යම් අධ්‍යයනයක යෙදෙන්න ඕනෑ. මේ සභාවට යම් මඟ පෙන්වීමක් කරන්න ඕනෑ. මේ සභාවේ කථා කරන්න වැඩි වශයෙන් යොදවන්න ඕනෑ මන්ත්‍රීවරු කවුද කියලා. ඒ යොමු කිරීම සභා ලේකම් කාර්යාලයේ වගකීමක් කියලා මම විශ්වාස කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. සභා ලේකම් කාර්යාලයට ඒ ගැන වගකීමක් නැහැ. සංවිධායකවරු දෙන්නෙක් ඉන්නවා. එහෙම කියන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ චෝදනාව මේක තමයි. සභා ලේකම්කාර්යාලයට වගකීමක් නැහැයි කියලා කියන එකම සභා ලේකම් කාර්යාලය මේ සභාවේ කටයුතු නොසලකා හැරීම කියලා තමයි මට කියන්නට තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ චෝදනාව ප්‍රතික්ෂේප කරනවා. ඔබතුමා කරන්නේ පදනම් විරහිත චෝදනාවක්. සභා ලේකම් කාර්යාලය කවදාවත් -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

සභා ලේකම් කාර්යාලය කියන එක වැරැදියි. සභාපතිතුමයි වගකීම ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කරුණාකරලා මට කථා කරන්න දෙන්න. ඊට පස්සේ ඔබතුමා කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට කාලය දෙන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ සභාවේ අයවැය විවාදය පැවැත්වෙන අවස්ථාවල්වලදී ඡන්දයක් විමසන්නේ නැත්නම් විනාඩි 30 ක්, පැය භාගයක් මේ සභාවේ කථා කරන කාලය දීර්ඝ කිරීමේ බලය, අයිතිය, නීතිමය වරප්‍රසාදය තියෙනවා. හැබැයි, ඒ මැදිහත් වීම ඔබතුමා කළෙත් නැහැ. ඔබතුමාට ඒ මැදිහත්වීම සඳහා මඟ පෙන්වීම කළෙත් නැහැ. මම කියන්නේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera- Chief Opposition Whip

නැහැ, නැහැ. මඟ පෙන්වීම කළා. මම ඉල්ලීම් කළා පුද්ගලිකව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මඟ පෙන්වීම කළාට මගේ කථාව දුන්නේ නැහැ ගරු සභාපතිතුමනි. මම කථාවට සූදානම් වෙලා ආවේ. ගරු සභාපතිතුමනි, පැය 02 ක් කථා කරනවාට වැඩිය අමාරුයි, විනාඩි 05 ක් සංවිධානාත්මකව කථා කරන එක. ඒ නිසා අපි එන්නේ කථාවට සූදානම් වෙලා. අපි කථාවට එන්නේ ලැහැස්ති වෙලා. අපි කථාවට එන්නේ යම් ප්‍රමාණයකට අධ්‍යයනයක යෙදිලා. ඒ නිසා අපේ කථාව නතර කරලා දාන එක ඉතාම වැරැදියි සහ මේ සභාවට කරන ලොකු අසාධාරණයක්. අපි යමක් මේ සභාවට එකතු කරන්න උත්සාහ කරනවා. ඒ නිසා එවැනි අවස්ථාවක එවැනි කථාවක් කපලා දාන්න කටයුතු කරන එක වැරැදි සහගතයි. අපි දැකලා තිබෙනවා, මේ මූලාසනය ඕනෑ තරම් තේරුමක් නැති කථාවලට, වැඩක් නැති කථාවලට අවස්ථාව සලසා දෙමින් කාලය නාස්ති කරනවා. ඉතින් සභා ලේකම් කාර්යාලය නිසි අධ්‍යයනයක් නොකරපු නිසා තමයි මේ වැරැද්ද මේ සභාවට වෙන්නේ. ඒ නිසා අපි යෝජනාවක් විධියට කරනවා. මේ සභා ලේකම් කාර්යාලය පිළිබඳව කථා කරන නිසා මන්ත්‍රීවරුන්ගේ කටයුතු පිළිබඳව මීට වඩා අධ්‍යයනයක යෙදෙන්න. ඒක සභා ලේකම් කාර්යාලයේ වගකීමක්. සභා ලේකම් කාර්යාලයට නිලධාරීන් නැත්නම් ඒ සඳහා නිලධාරීන් පත් කර ගන්න. ඉන්න කෙනෙක් පත් කරන්න. මේ මන්ත්‍රීවරුන්ගේ කටයුතු පිළිබඳව අධ්‍යයනයක යෙදීම සභා ලේකම් කාර්යාලය නිරන්තරව කළ යුතුයි කියන කාරණය මම මේ වෙලාවේ ගරු සභාපතිතුමා හරහා මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මට ඊයේ කරන්න බැරි වුණා කථාවේ ඉතුරු ටික මම අද දවසේ කරලා තමයි මගේ කථාව පටන් ගන්නේ. මම කරුණාවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මට අවශ්‍ය කාලය ඒ සඳහා ලබා දෙන්නය කියලා. ගරු සභාපතිතුමනි, මම කිව්වේ මේ සභාවේ මුදල් කපලා දාලා තිබෙනවා. විශාල ප්‍රමාණයක් මුදල් කපලා දාලා තිබෙනවා. මේ මුදල් කපා දැමීම පිළිබඳව මම ඊයේ උදේත් පසුගිය කථාවල වාර්තාවල් අධ්‍යයනය කරන එක තමයි මේ පුස්තකාලයේ කෙරුවේ. ඒ කරලා තමයි මම මේක බොහොම අමාරුවෙන් සොයා ගත්තේ. 2003 එනම් මීට අවුරුදු 13 කට කලින් අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා කියපු දේ. මේක මේ සභාවට නැවත නැවතත් කියන්න ඕනෑ. එතුමා කිව්වා ප්‍රධාන ඇමැතිතුමා පිළිගත යුතු එක පැහැදිලි කරුණක් නම් මධ්‍යම රජය, පළාත් සභාවට මුදල් ලබා දෙන්නේ නම් ඔවුන්ට එම මුදල් ලබා ගැනීමට සිදු වන්නේ ජනතාවගෙන් බවයි. මිනිසුන්ගෙන් සල්ලි අරන් තමයි ආපහු අපේ සභාවට දෙන්නේ. මේ සම්බන්ධයෙන් මගේ මතකයට එන්නේ ඇලන් බී. ක්ලයිනගේ වචනයයි. ඔහු කියා සිටියේ,The Government give to the Pepole only what it has Preaviously taken from them කියලා. Minors the cost of administration. එනම් රජය ජනතාවට

ලබා දිය හැකිකේ ඊට පෙර ජනතාවගෙන් ලබා ගත් මුදලින් පාලන තන්ත්‍රය නඩත්තු කිරීමට වැය වූ මුදල් අඩු කර පසුව ඉතිරි වන මුදලයි කියලා. පාලන තන්ත්‍රය නඩත්තු කරලා ඊට පස්සේ ඉතුරු වන මුදල් තමයි මේ ආයතනවලට දෙන්න පුළුවන් කියලා. එහෙනම් ජනතාව වෙනුවෙන් වැඩි මුදලක් වැය කිරීමට නම් අපි එක්කෝ ජනතාවගෙන් වැඩිය ලබා ගත යුතුයි. එහෙම නැත්නම් පාලනය වඩා කාර්යක්ෂම කරගත යුතුයි.

රටක ආර්ථිකය මන්දගාමී තත්ත්වයකට පත්ව ඇති අවස්ථාවක ජනතාවගෙන් බදු හරහා ලබා ගත හැකි මුදල අඩුවීම ස්වභාවිකයි. පාලනය අකාර්යක්ෂම නම් ජනතාවගෙන් බදු ගන්න බැහැයි කියලා එතුමා කිව්වා. එසේ අඩුවෙන් අය කරගෙන ඇති මුදල් ජනතාව වෙනුවෙන් සංවර්ධනයට හෝ රජයේ වියදම් වෙනුවෙන් වෙන් කරද්දී අනිවාර්යෙන්ම අඩු මුදලක් වෙන් කිරීමට සිද්ධ වෙනවා. ඒ අතරම ජනතාවගෙන් බදු වශයෙන් මුදල් ලබා ගන්නා පාලන තන්ත්‍රය හෝ ආයතන එම මුදල් නිසි පාලනයකින් හෝ විනයකින් තොරව වැය කරන්නේ නම් යම් තහංචි, පැනවීමට සිද්ධ වෙනවා කියලා එතුමා කිව්වා. ඒ කථාව අද දවසට ඉතාම සාධාරණයි කියලා අපි විශ්වාස කරනවා. විනයකින් තොරව මුදල් පාවිච්චි කරන්නේ නැත්නම් මේවා කප්පාදු කරන්න වෙනවා කියන කාරණය එතුමා ඉතාම පැහැදිලිව කිව්වා. ඒ කාරණය තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා සමස්ත සභාවේම මුදල් අඩු කරලා හැම ආයනයකම, මුදල් කපලා දාන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරවරයා පිළිබඳව මම මතක් ඕනෑ. විශේෂයෙන් අපි දන්නවා අපට ආණ්ඩුකාරවරයා පිළිබඳව තිබෙන්නේ යටත්විජිත මානසිකත්වය හරහා මතු වුණු ආකල්පයක්. අපි දන්නවා, බ්‍රිතාන්‍ය කිරීටය ආරක්ෂා කරන්න තමයි යටත්විජිත යුගයේ ආණ්ඩුකාරවරු මේ රටේ පත් කරනු ලැබුවේ. අපට තවමත් ඔළුවේ තිබෙන්නේ ඒ ආණ්ඩුකාරවරයාමද මේ ඉන්නේ කියලා. ඊළඟ කාරණය තමයි ගරු සභාපතිතුමනි, අපි දන්නවා,13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවට පස්සේ විධායකයේ බලය පළාත් සභාව තුළ ක්‍රියාත්මක කරන්න තමයි, විධායකයේ Representative විදියට, විධායකයේ නියෝජිතයා විදියට ආණ්ඩුකාර ධූරය ස්ථාපිත කරනු ලැබුවේ. ඒ නිසා ආණ්ඩුකාරවරයා හැමදාම විධායකයට අවශ්‍ය දේ මේ පාලන තන්ත්‍රය ඇතුළේ ක්‍රියාත්මක කරනවා. අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා මේ වෙලාවේ මේ ස්ථානයේ නැති එක ගැන මම කනගාටු වෙනවා. එතුමා ඉතා පැහැදිලිව කිව්වා, එතුමාගේ නායකයා තමයි අලුත් ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම සිද්ධ කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ආචාර්ය ජයන්පති වික්‍රමරත්න මැතිතුමා. කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා කිව්වා එතුමා හදන අලුත් ව්‍යවස්ථාවේ ආණ්ඩුකාරතුමාගේ බලය තවදුරටත් හැල්ලු කරන, තවදුරටත් දියාරු කරන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කරනවා කියලා. පළාත් සභාවට තවදුරටත් බලය ස්ථාපිත කරන්න, අපට ආණ්ඩුකාරවරයා පිළිබඳව තිබෙන්නේ එවැනි අදහසක්. ආණ්ඩුකාරවරයා හැම වෙලාවේම ඉන්නේ මේ සභාවේ බලය පාලනය කරන්න. මේ සභාවේ බලය තුනී කරන්න තමයි ඉන්නේ කියලා. හැබැයි, අපි පෞද්ගලික වශයෙන් බැලුවාම කියන්නට ඕනෑ වර්තමාන ආණ්ඩුකාරවරයා පිළිබඳව. එතුමා ඉතාම අවබෝධයෙන් කටයුතු කරන, ඉතාම අධ්‍යයනයක් තිබෙන, මේ සභාවේ කටයුතු ගවේෂණය කරන ඉතාම නිර්මාණශීලී ආණ්ඩුකාරවරයෙක්. හැබැයි මේ ආණ්ඩුකාරවරයා, තනතුර නොවෙයි. පුද්ගලයාට අදාලව අපි කියන්නට ඕනෑ. මේ ආණ්ඩුකාරවරයා අපේ බලය හැල්ලු කරන්න කටයුතු කරන ආණ්ඩුකාරවරයෙක් නොවෙයි. අපේ බලය වැඩි කරන්න එතුමාගේ උත්සාහය තිබෙනවා. ඒක අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ.

මම මේකට කියන පැහැදිලි උදාහරණය තමයි ගරු සභාපතිතුමනි. ඔබතුමාත් දැක්කා, අපේ රුසියානු සංචාරයට පස්සේ එතුමා ඉංග්‍රීසි පුවත්පතකට දීලා තිබුණු සම්මුඛ සාකච්ඡාව. එතුමා ඉතාම පැහැදිලිව කිව්වා මේ පළාත් සභාවල අයවැය ප්‍රකාශයේදී විදේශීය පුහුණු සඳහා පළාත් සභා මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් කරනවා කියලා. මේ වතාවේත් අපි සතුටු වෙනවා. ඒක රුපියල් මිලියන 38 කට වැඩි කරලා තිබෙනවා. රුපියල් ලක්ෂ 338 ක් මුදල් වෙන් කරලා තිබෙනවා. හැබැයි, මේ මුදල් වෙන් කරන්න මේ නිලධාරීන් බය වෙනවා. පළාත් සභා ක්‍රමය පිළිබඳ අවබෝධයක් නැතිකමෙන් තමයි මේ දීනකමමතු වෙන්නේ. මේක පසුගිය වතාවේත් මතු වුණා. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්න ඕනෑ මේ ගෙවෙන අවුරුද්දේ මේ පළාත් සභාවේ නිලධාරීන් තුන් දෙනෙකුට එංගලන්තයේ පුහුණු ආයතනයක පුහුණුවක් සඳහා යන්න මුදල් වෙන් කරලා, මුදල් ගෙවීම් සිද්ධ කළාට පස්සේ, ඒ පුහුණුව කාලයක් තිස්සේ නතර කළා. ඒ පුහුණුව නතර වුණේ

[ගරු මහේෂ් අල්මේදා]

එවකට හිටපු ප්‍රධාන ලේකම්තුමිය මේ පුහුණුවට යවන්න අවශ්‍ය අනුමැතිය ගන්න ජනාධිපති ලේකම් කාර්යාලයට ලිපියක් ලිව්වා. තමන්ගේ බලය ගැන, පළාත් සභාවේ බලය ගැන දීන මානසිකත්වයෙන් බලන නිසා තමයි මේක සිද්ධ වුණේ. අවසානයේ, ඒ සංචාරය කාලයක් තිස්සේ පස්සට ඇදීගෙන ගියා. අද නිලධාරියෙක් පුහුණු කරන්න අවශ්‍ය වෙනවා නම් ඒක තව මාස 2 ½ ක් පස්සට යනවා කියන්නේ ඒ පුහුණුවේ අදාළ සේවාව ඒ නිලධාරීන්ට මේ ආයතනවලට දීගන්න බැරුව යනවා. ඒ නිසා අද නැවත වතාවක් චක්‍රලේඛ ආවාට පස්සේ අපි ලැහැස්ති වෙනවා නම්, ඒවා ලියලා ජනාධිපති කාර්යාලයෙන් අනුමැතිය ගන්න. අපේ බලය පිළිබඳව අපට අවබෝධයක් නැහැයි කියන එක තමයි මේ වෙලාවේ කියන්න තිබෙන්නේ. ආණ්ඩුකාරතුමා ඉතා පැහැදිලිව කිව්වා, මේ පළාත් සභාව සම්මත කරලා, මම අත්සන දීලා අනුමැතිය දෙන බලයන් පිළිබඳව වෙනත් ආයතනවලට තහංචි පනවන්න බැහැයි කියලා. එහෙම කියලා තමයි එතුමා අපට අවසරය දුන්නේ, රුසියානු සංචාරයට යන්න. ඒ නිසා ඔබතුමා දන්නවා, එවැනි ආණ්ඩුකාරවරයෙක් අපට ඉන්න බව. ඒ නිසා ඒ ආණ්ඩුකාරවරයාගේ තැන ශක්තිමත් කළ යුතුයි. මම සතුටු වෙනවා, ආණ්ඩුකාරතුමාට නිල නිවසක් හදන්න මුදල් වෙන් වීම ගැන. අපි දන්නවා. අපි කුළී නිවසක ඉන්නවා. අපේ තිබෙන මානසිකත්වය, පෞරුෂය කඩා වැටුණු එකක්. ඒ නිසා ආණ්ඩුකාරතුමාගේ නිල නිවස සැදීම සඳහා අපි මුදල් වෙන් කරලා තිබෙනවා. අපි සතුටු වෙනවා. අපි කියනවා ඉතාම ඉක්මණින් ඒ නිල නිවස හදලා, පෞරුෂයෙන් යුත් ආණ්ඩුකාරවරයෙක් විධියට වැඩ කරන්න පුළුවන් තැනක එතුමා තියන ඕනෑ කියන කාරණය.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මේ සභා ලේකම් කාර්යාලයට තිබෙන වගකීම. ඒ වගකීම නිවැරැදිවම තේරුම් ගන්න ඕනෑ. අපි දන්නවා. බලය ගොඩ නඟා ගැනීම කලාවක්. බලය ගොඩ නඟා ගැනීම සඳහා වූ Academic Lessonsලෝකයේ කොහේවත් නැහැ. ඉස්කෝලවල බලය ගොඩ නඟා ගන්න උගන්වන්නේ නැහැ. බලය ගොඩ නඟා ගැනීම උගන්වන විශ්ව විද්‍යාලවල පාඨමාලාවල් නැහැ. මේ ඉන්න මහජන මන්ත්‍රීවරු තමන්ගේ ජානවලින් ගේන හැකියාවන් පාවිච්චි කරලා, බලය ගොඩ නඟාගෙන තිබෙන්නේ. ඒක විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත්තු අයට කරන්න පුළුවන්කමක් නැහැ. ඒකට අපට ලංකාවේ ඕනෑතරම් උදාහරණ තිබෙනවා. බොහෝ ඉහළට ගිය සමහර මන්ත්‍රීවරු, ඇමැතිවරු ඉන්නවා. ඒ අය එන්නේ ජාතික ලැයිස්තුවෙන්. ඒ අයට බැහැ මිනිස්සු ළඟට ගිහිල්ලා ඡන්දය ඉල්ලලා, ඡන්දය දිනාගන්න. ඒ අය ඒ කලාව දන්නේ නැහැ. ඒක වෙනම කලාවක්. හැබැයි අපි දැනගන්න ඕනෑ, එකක් තිබෙනවා. මේ මන්ත්‍රීවරු තමන්ගේ සහජ හැකියාව, තමන්ගේ දක්ෂකම පාවිච්චි කරලා බලයට ආවට පස්සේ ඔවුන්ව දැනුවත් කරන එක, ඔවුන්ට දැනුම ලබා දීලා සංවර්ධනය කරන එක මේ මහජන නියෝජිත ආයතනවල වගකීමක්. ඒ වගකීම තමයි සභා ලේකම් කාර්යාලයට පැවරිලා තිබෙන්නේ. ඒ වගකීම ඉෂ්ට වෙනවාද කියන කාරණය පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සභා ලේකම් කාර්යාලයෙන් සංවිධානය කරනු ලබන සමහර පුහුණු පාඨමාලාවලදී දැඩි උනන්දුවක් මේ වෙනුවෙන් ඇති වෙන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරු නිරන්තර පුහුණුවට ලක් කරන්න ඕනෑ. අපි දන්නවා, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ මන්ත්‍රීවරු කොයි තරම් කාර්ය භාරයක් කරනවාද කියලා. ඒකේ කටයුතු කරන්න නම් ලංකාවේ මුදල් රෙගුලාසි, ලංකාවේ පරිපාලන රෙගුලාසි ඒ සියල්ල දැනගන්න ඕනෑ. මේ නිලධාරීන් සියලු දෙනා ලංකාවේ තිබෙන සංවර්ධන පරිපාලන ආයතනයේ අවුරුදු 04 ක් විතර AR එකයි FR එකයි පුහුණු කරවලා තමයි මේ නිලධාරී තත්ත්වයට පත් කරලා එවන්නේ. අපේ මන්ත්‍රීවරුන්ටත් එවැනි පුහුණුවක් නැතුව ඒ අය එක්ක කරට කර වැඩ කරලා මේ සභාව වෙනුවෙන් කරන්න තිබෙන කාර්ය භාරයන් ඉෂ්ට කරන්න ලැබෙන්නේ නැහැ. ඒ පුහුණුව නිරන්තරව නැත්නම්. ඒ නිසා ඒ පුහුණුව අත්‍යවශ්‍යයි. පුහුණුවට බය වෙනවා නම්. පුහුණුව කරන්න ඕනෑ නැහැ කියලා හිතෙනවා නම්. මේ පුහුණුව කළාට පස්සේ කාගේ හරි බලපෑම්වලට ලක් වෙයි. එහෙම නැත්නම් විගණන විමසුමක් එයි.එහෙම නැත්නම් ජනාධිපති කාර්යාලයට ලියයි. මෙහෙම කියලා බය වෙනවා නම්, මේ මන්ත්‍රීවරු යාවත්කාලීන කරවන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මන්ත්‍රීවරු යාවත්කාලීන කරවන්න ඕනෑ. මන්ත්‍රීවරුන්ට පවතින තත්ත්වයන් පිළිබඳව අවබෝධයක් දෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි මන්ත්‍රීවරුන්ගේ සේවාව මේ පළාත් සභාවේ යහපත වෙනුවෙන් ගන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා ඒක මේ සභා ලේකම් කාර්යාලයේ බරපතළ වගකීමක් විධියට තමයි අපි විශ්වාස කරන්නේ.

ඒ වාගේම තමයි අපි කියන්න ඕනෑ මේ සභා ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල. සභා ලේකම් කාර්යාලය කටයුතු කරන්නේ අපහසුතා මධ්‍යයේ තමයි. ඒක අපි පිළිගන්න. හැබැයි ඒකට අවශ්‍ය පහසුකම් සපයන අපේ ගොඩනැගිල්ල වඩා කාර්යක්ෂමව කරගන්න නම් අපි ඒක කඩිනමින් ගොඩ නඟා ගැනීම සිද්ධ කරන්න ඕනෑ. ඒකට රජය දෙනවා කියපු ප්‍රදාන, මේ අවුරුද්දේත් කියාපු ප්‍රමාණයට ලැබෙන්නේ නැහැ. අපි දන්නේ නැහැ ලබන අවුරුද්දේ ඒ ප්‍රමාණය ඒ අයුරෙන්ම ලැබෙනවාද කියලා. ඒ නිසා අපි මේ වෙලාවේ කියනවා. ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියනවා මේ රජය දෙන්න සූදානම් වෙලා තිබෙන මුදල්, දිය යුතු මුදල් ඉතාම කඩිනමින් අරගෙන, මේ ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කරවලා සභා ලේකම් කාර්යාලය පහසුකම් සහිත ස්ථානයකට ගෙනියන එක ඉතාම කඩිනමින් අපි කළ යුතුව තිබෙනවා. මොකද, ඒක අත්‍යවශ්‍යයි. සභාවේ ඉන්න බොහෝ මන්ත්‍රීවරුන්ට - දැන් මම සභා ලේකම් කාර්යාලයේ පුස්තකාලය පාවිච්චි කරන්න ඕනෑ කියලා කිව්වාට පස්සේ අපේ දීප්ති මහත්තයාට පුළුවන්කම තිබුණේ නැහැ - එතුමා රාජකාරී කරන තැන එක තැනක්. පුස්තකාලය තිබෙන්නේ තව තැනක. ඒ නිසා ඒ තිබෙන රාජකාරීත් එක්ක එතුමාගේ රාජකාරී වෙලාවේ ඇවිල්ලා මේ කටයුත්ත කරන්න අමාරුයි. ඒ නිසා එතුමාට පුළුවන්කම තිබුණේ, ඊයේ දවසේ තමයි පුස්තකාලය ඇරලා අපට පාවිච්චි කරන්න දෙන්න. ඒක බරපතළ ප්‍රශ්නයක්. පුස්තකාලය මන්ත්‍රීවරුන්ට අත්‍යවශ්‍යයි. මන්ත්‍රීවරු කියවන්න ඕනෑ. දැනුම ලබා ගන්න ඕනෑ. පසුගිය හැන්සාඩ් වාර්තා කියවන්න ඕනෑ. එහෙම නැති වුණොත් මන්ත්‍රීවරු යාවත්කාලීන වීම සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මේ පහසුකම් මහජන මන්ත්‍රීවරුන්ට සපයා දීම අත්‍යවශ්‍ය කාරණයක්.

අද අපි දන්නවා, සමාජයේ මහජන මන්ත්‍රීවරු ගැන තිබෙන ආකල්පය. ඒක ඉතාම වැරදි සහගත එකක්. ඒක වෙලා තිබෙන්නේ මන්ත්‍රීවරු එක්කෙනෙක්ගේ දෙන්නෙක්ගේ හැසිරීම නිසා මිසක සමස්ත මන්ත්‍රීවරුන්ගේ කටයුතු නිසා නොවෙයි. එක මන්ත්‍රීවරයෙක් වැරැද්දක් කළාම, ඒක සමස්තයට ආදේශ කිරීමට යාමෙන් තමයි මේ ප්‍රශ්නය මන්ත්‍රීවරුන්ට මතු වෙන්නේ. නමුත් බහුතරයක් මන්ත්‍රීවරු වැඩ කරන මන්ත්‍රීවරු. මහන්සි වෙන මන්ත්‍රීවරු. මේ සමාජය ඉහළට ගෙනියන්න තමන්ගේ දායකත්වය එකතු කරන මන්ත්‍රීවරු. ඒ නිසා ඒ මන්ත්‍රීවරු දැනුවත් කරන්න, යාවත්කාලීන කරන්න අවශ්‍ය පහසුකම් ටික සලසා දීම සිද්ධ කළ යුතුයි. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ලැබුණු බලය ගැන තවමත් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ සංශෝධනය සාමාන්‍ය බහුතරයකින් නොවෙයි. තුනෙන් දෙකේ බහුතරයකින් ව්‍යවස්ථාවට එකතු වුණු සංශෝධනයක් හරහා ලැබුණු බලයක්. මේක නීතිමය බලයක්. මේ ගැන ප්‍රශ්න කොහේවත් නැහැ. මේ ලැබිලා තිබෙන බලය පාවිච්චි කිරීමේ නීතිමය අයිතිය අපට තිබෙනවා. ඒ නිසා අපි සටන් කරලා, මේ අයිතිය දිනා ගන්න ඕනෑ. ඒ සටන ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ දවස්වල දෙනවා කියලා අපි මාධ්‍ය හරහා දැක්කා. අපට කපලා තිබෙන මේ මුදල් සියල්ල දිනා ගන්න පුළුවන් වෙන්නේ අපි නීතිමය වශයෙන් ඒවාට කටයුතු කළොත් විතරයි. ඒ වාගේම ව්‍යවස්ථාවේ සිද්ධ වන වෙනසේදී සමස්ත පළාත් සභාවට ජාතික අයවැයෙන් 40% ක මුදල් ප්‍රමාණයක් අනිවාර්යෙන්ම ලැබෙන්න ඕනෑ කියලා ව්‍යවස්ථාවට නීතිමය වශයෙන් ඇතුළත් කරන්න සූදානම් වෙනවා කියලා අපට ආරංචියි. එහෙම වුණොත් මුදල් අපහසුවකින් තොරව, කිසි ප්‍රශ්නයක් නැතුව මේ කටයුතු කරගෙන යන්න පළාත් සභාවට පුළුවන්කම ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ මම නැවත නැවතත් මතක් කරනවා. සභා ලේකම් කාර්යාලය මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. මම අර පුහුණුව ගැන කියද්දී, අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඔබතුමා ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සංවිධායකවරු මේ සියලු දෙනා මේ අදාළ පුහුණුවට යටත් කරලා, ඒ පුහුණුව නිවැරදිව නොදීපු නිසා තමයි ඊයේ දවසේ මගේ කථාව විනාඩි 02 කට සීමා වුණේ. ඒ නිසා මම නැවත නැවතත් කියනවා, මේ පුහුණුව දවසක්වත් ප්‍රමාද කරන්නේ නැතුව අද දවසට අවශ්‍ය කරන පුහුණු මේ ධුරධාරීන්ටත්, මන්ත්‍රීවරුන්ටත් ලබා දෙන්න සභා ලේකම් කාර්යාලය මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. මට ඒ සම්බන්ධව පොඩි අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ. ඔබතුමා දිගින් දිගටම සභා ලේකම් කාර්යාලයට චෝදනා කළා. සභා ගර්භයේ සහ මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ

[ගරු සභාපතිතුමා]

සාකච්ඡාව පිළිබඳව සභා ලේකම් කාර්යාලයේ ලේකම්තුමාට තීන්දු කරන්න බැහැ. ඒකකෝ මම තීන්දු කරනවා. නැත්නම් මට සහාය දක්වන නියෝජ්‍ය සභාපතිතුමා, සභානායකතුමා,විපක්ෂ නායකතුමා, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා,විපක්ෂයේ සංවිධායකතුමා ඉන්නවා. ඒ අය මට සහාය දක්වන්න ඕනෑ. සභා ලේකම්තුමාටවත්, නිලධාරී මහත්වරුන්ටවත් ඒ වගකීම ගන්න බැහැ. ඔබතුමා නිරන්තරයෙන් සභා ලේකම් කාර්යාලයේ ගැවසෙන මන්ත්‍රීවරයෙක්. ඒ අයත් එක්ක බොහොම සහයෝගයෙන් ඉන්න කෙනෙක්. මේ කථික ලැයිස්තු හදන එක ඒ අයට කරන්න බැහැ. ඒ කථික ලැයිස්තු හදන්නේ ඔබතුමාගේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මම දිගින් දිගටම කිව්වේ සභා රීති පිළිබඳ අවබෝධය දෙන පුහුණු වැඩ සටහන් සංවිධායන කිරීම සභා ලේකම් කාර්යාලයේ වගකීමක්. ඒ පුහුණුව නැති නිසා තමයි මගේ කථාව කපලා දැම්මේ. සභා රීතිය පිළිබඳව යම් අවබෝධයක් තිබුණා නම් ඊයේ දවසේ මට වෙලාව දෙන්න තිබුණා. සභාව තව පැය ½ ක් ඉස්සරහාට යන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශේෂයෙන්ම මේ කථා කරන මන්ත්‍රීවරුන් තමන්ගේ කාලය නියමිත වෙලාවට කළමනාකරණය කර ගන්න ඕනෑ. මම ගරු කරනවා, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට. එතුමාට කාලය අවසන් කිව්වාම, එතුමා තමන්ගේ කථාව අවසන් කරනවා. අපේ මන්ත්‍රීවරු එහෙම නොවෙයි. කථා කරන මන්ත්‍රීතුමන්ලා තමයි කාලය කළමනාකරණය කරගන්න ඕනෑ. ඒක කරන්නේ නැහැ. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට කාලය අවසන්, නවත්වන්න කිව්වාට එතුමාට ඇහෙන්නේ නැහැ. ඉතින් විපක්ෂයේ සංවිධායකතුමාට කිව්වාට එතුමා ගණන් ගන්නේත් නැහැ. එතුමාත් ඊයේ විනාඩි 07 ක් ගත්තා. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා විනාඩි 04 ක් ගත්තා. එහෙම කාලය ගියාම අන්තිමට අසාධාරණය වෙන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා වාගේ දක්ෂ කථිකයින්ට. ඒක මගේ රාජකාරියක් නොවෙයි. මේ ලැයිස්තු හදන්නේ මම නොවෙයි. මේ ලැයිස්තු හදන්නේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා සහ විපක්ෂයේ සංවිධායකතුමා. ඒ නිසා මේ සම්බන්ධව ඒ අය වගකීම ගන්න ඕනෑ. කවුද කථා කරන්නේ කියලා ඒ අය දාන්න ඕනෑ. මට අදාළ නැහැ කථිකයෝ කවුද කියන එක. මට එහෙම කථිකයෝ තෝරන්න බැහැ. ඒ නිසා ඒ සම්බන්ධව ඔබතුමා සභා ලේකම් කාර්යාලයට චෝදනා කරපු එක පදනම් විරහිතයි. ඇත්ත වශයෙන්ම මම ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. සභා ලේකම් කාර්යාලයේ හැම කෙනෙක්ම අපත් එක්ක ඉතාම සහයෝගයෙන් වැඩ කරනවා. එතුමන්ලා වැඩේ හරියට කරනවා. ඒ නිසා තමයි මම කාලය දීර්ඝ කරන්න සූදානම් නැත්තේ. න්‍යාය පත්‍රයට අනුව අපි පස්වරු 05.00 ට සභාව අවසන් කරන්න ඕනෑ. උදේ 09.00 ට පටන් ගන්න ඕනෑ. අද උදේ 09.00 ට පටන් ගත්තා. කවුද සභා ගර්භයේ හිටියේ? 07 දෙනයි හිටියේ. මේ එකපාරට ආපු දෙයක් නොවෙයි. සැලසුම් කරලා අපි න්‍යාය පත්‍රය හදලා තියෙන්නේ. ඒ වාගේම 05.00 ට අවසන් කරන්න ඕනෑ. මේ නිලධාරීන් උදේ 05.30 ට, 6.00 ට කෝච්චිවල, බස්වල ඇවිල්ලා ඒ අය 09.00 ට මෙතැනට සම්බන්ධ වෙනවා. ඒ නිසා 05.00 ට මේ වැඩේ අවසන් කරන්න ඕනෑ. නැතුව 05.30 ට අවසන් කරලා යන්න ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභාවට එන මන්ත්‍රීවරයා, කථා කරන මන්ත්‍රීවරයා ගැන අධ්‍යයනයක් සභා ලේකම් කාර්යාලයේ තියෙන්න ඕනෑ. ඒ අයට අවස්ථාව දෙන්න ඕනෑ. සභා ලේකම් කාර්යාලය ඒ පිළිබඳව මහ පෙන්වීමක් අයවැය කාලයේ සභා ලේකම් කාර්යාලයේ තියෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අයට මුකුත් කරන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අනවශ්‍ය දේවල්වලට කොයි තරම් වෙලාව දුන්නාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඒ වගකීම අප දෙදෙනාගේ තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක පිළිගන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

සංවිධායකවරුන්ට ඒ වගකීම තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභානායකතුමාත් සභාවේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

අපි දැන ගන්න ඕනෑ, කවුද කථා කරන මන්ත්‍රීවරු, කවුද වැදගත් මන්ත්‍රීවරු කියලා. අපේ වැරැද්දක් තිබෙනවා. ඒක පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මානුෂික වෙන්න. දැන් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ කාලය අවසන්. විනාඩි 05 ක් ගත්තා කියලා මම ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මානුෂික වෙන්න ගිහිල්ලා තමයි මට කථාව නැති වුණේ. ඒකයි බොහොම අමානුෂිකව කථා කරන්නේ. මානුෂික බවට මේ සභාවේ ඉඩක් තිබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට සභා ලේකම් කාර්යාලය මොකද කරන්නේ? මූලාසනය මොකද කරන්නේ? කථාව නවත්වන්නේ නැත්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභාපතිතුමාට තමයි ඒ වගකීම තිබෙන්නේ. සභාපතිතුමා දැන ගන්න ඕනෑ. විනාඩි 15 ක් විනාඩි 30 ක් වැඩි කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම වුණාට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වා. පුස්තකාලය පරිහරණය කරන්නේ නැහැයි කියලා. මට අපේ නිලධාරියෙක් කියනවා 50% ක් මේ හැන්සාඩ් එක අරගෙන යන්නේ නැහැයි කියලා. ඔබතුමා කියනවා උවමනා අය ඉන්නවාලු. එක්කෙනෙක් දෙන්නෙක් විතරලු. බලන්න මේසවල් උඩ 50% ක් විතර හැන්සඩ් තියෙනවා. අරගෙන ගිහිල්ලා නැහැ. තියලා යන්නේ. අරගෙන යන්නේ නැහැ. ඒකයි තත්ත්වය. මේක මගේ දෙයක් නොවෙයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේවා අනවශ්‍ය කාටවද කියලා වාර්තාවක් හදලා තියන්න. ඒ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරන්න. අනෙක් මන්ත්‍රීවරුන්ට ප්‍රමුඛතාවය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට දෙන්නෙක් ඉන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමාගේ මග පෙන්වීම කරන්න ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සංවිධායකවරුන්ට. කථා කරන, නැති අයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ගැන කථා කරන්න ඕනෑ. මේක බරපතළ ප්‍රකාශයක්. කථා කරලා වගකීමක් ගන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඊයේ පස්වරු 05.00 ට අවසන් කරන සභාවේ ප්‍රධාන ඇමැතිතුමාගේ කථාවේදී කාලය දීර්ඝ කළා. ඒක කොහොමද සිද්ධ වුණේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම දන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක තමයි ප්‍රශ්නය.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, දැන් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපෙන් විය යුතු කාර්ය භාරය අපි උපරිමයෙන් කරනවා. ඒකයි මම උදේ 08.30 ට මෙතැනට එන්නේ. මේ වැඩේ පටන් ගන්න ඕනෑ නිසා. එහෙම මමත් ක්‍රියාත්මක වුණොත්, ගණපූරණය සම්පූර්ණ වනකල් ඉන්න ගියොත් හෙට ඉඳල මේ සභාව පටන් ගන්න හම්බ වෙන්නේ නැහැ. මගේ රාජකාරියත් කරන්න ගියොත් ඒකයි වෙන්නේ. අපි හැම කෙනෙක්ම බොහොම කැපවීමෙන් මේ වැඩේ කරන්නේ. මම විතරක් නොවෙයි. සභා ලේකම්තුමා, අනෙක් නිලධාරී මහත්වරු සැම කෙනෙක්ම. මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.51]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ. වසර 28 ක් වන මේ පළාත් සභාවේ 2009 වසරේ ඉඳලා අපිත් මේ සභාව නියෝජනය කරන්න අවස්ථාව ලබාගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂ පිළිබඳව කථා කිරීමේදී ආණ්ඩුකාරවරයා, බස්නාහිර පළාත් සභාව සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ අදහස් දක්වමින්, මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. සම්ප්‍රදායික අදහස් දැක්වීම්වලින් බැහැරව අපි අලුත් දේවල් හිතන්න පටන් ගන්න ඕනෑ යුගයක් ඇවිල්ලා තිබෙන්නේ. දැන් විනාඩි 05 ක් ගැන කථා කරන්න, විනාඩි 10 ක් නාස්ති කරන යුගයක් නොවෙයි එන්න ඕනෑ. යම්කිසි වැරැද්දක් තිබෙනවා නම්, ඒක සාකච්ඡා කරලා විසඳා ගන්න ඕනෑ. විනාඩි 05 ක් ආරක්ෂා කරන්න, විනාඩි 15 ක් ඒ ගැන කථා කරනවාට අපි විරුද්ධයි. ඒ නිසා මේ ගැන සභාවේ අවධානය යොමු කරමින් මගේ කථාව පටන් ගන්නවා.

විශේෂයෙන්ම අපේ ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන කොට, පසුගිය කාල වකවානුවේ සිටම මේ ආණ්ඩුකාරවරුන්ගේ සේවාවන් ලබා දීමේදී - දැනටත් කුළියට ගත්ත ගොඩනැගිල්ලක ආණ්ඩුකාරතුමා ඉතාම අඩු පහසුකම් සහිතව තමයි කටයුතු කරගෙන යන්නේ. අපි හැමෝම දන්නවා, වාඩි වෙන්න ඉඩකඩක් නැහැ. අපේ මන්ත්‍රීවරු 100 ක් හදිසියේ ගියොත් 50 කටවත් වාඩි වෙන්න ඉඩකඩ නැහැ. එවැනි තත්ත්වයක ඉඳන් මේ රජය ගැන විවිධ විවේචන තිබෙනවා. සිවිල් සමාජයේ පහසුකම් ගැන මම හිතන්නේ, අසාධාරණ විධියට මන්ත්‍රීවරු විවේචනය කරනවා. අපි කාගෙන්වත් ලකුණු දාගන්න කියන්නෙත් නැහැ. කාටවත් රකින්න කියන්නෙත් නැහැ. නමුත් මේ ආණ්ඩුකාරවරයා සමස්ත තුනෙන් එකක් වන රටේ ජනතාවට සේවය කරන බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට එතුමාට තිබෙන පහසුකම් ඉතාම සුළුයි. ඉතාම අවමයි. ඒ නිසා අපේ නව ගොඩනැගිල්ල ඉක්මණින් ඉදි කිරීමට අපේ අවධානය යොමු කරන්නට ඕනෑ. ගරුත්වයක් ඇතිව ඒ පහසුකම් භුක්ති විඳින්න දෙන්න ඕනෑ. මම විශේෂයෙන් කියන්න ඕනෑ සිරස මාධ්‍ය ජාලයේ ඉන්නවා, බන්දුල කියලා මහත්මයෙක්. හැමදාම පටන් ගන්නේ දේශපාලඥයා හොරා. දේශපාලඥයාට පහසුකම් වැඩියි. එතුමාට මම කියනවා දේශපාලඥයින්ගේ ක්‍රියාකාරීත්වය ඇවිල්ලා බලන්න. දවසක් අපේ කාර්යාලයට ඇවිල්ලා බලන්න දේශපාලඥයෙක් කොහොමද වැඩ කරන්නේ. පාන්දර 04.00 ට නැඟිටිනවා. රෑ 12.00 ටත් මිනිස්සු ටෙලිෆෝන් කෝල් දෙනවා. මිනිස්සුන්ට ගහනවා. පොලීසිවලින් අල්ලගෙන යනවා. එහෙම නැත්නම් මාර්ගයක අනතුරක් වෙනවා. දේශපාලඥයා එතැනට දුවන්න ඕනෑ. සමහරවිට රියදුරුන් තුන් දෙනෙක් හිටියත් මදී. එක්කෙනෙක්ව පැය 08 ක සේවාවක් දෙන්න ගියොත් එහෙම, ඒ පැය 08 න් අපේ සේවය අවසන් කරන්න බැහැ. රාත්‍රියේ අවමංගල්‍ය උත්සවයක් කිව්වොත් යන්න සිද්ධ වෙනවා. සමහර තැන්වල ඉතා අසාධාරණ විධියට මේ දේශපාලඥයාව විවේචනය කරනවා. මම මේ සම්බන්ධයෙන් සිවිල්

ජනතාවට කියන්න ඕනෑ. මෙතැන අසාධාරණ විධියට කරන එක්කෙනෙක් දෙන්නෙක් ඇති. නමුත් බහුතර දේශපාලඥයෝ කරන සේවාව TV එකට ඇවිල්ලා පුටුවක ඉඳගෙන දොඩවන දෙයක් නොවෙයි. ප්‍රායෝගිකව ගත්තොත් මේ පළාත් සභාවලින් අපට වෙන් වෙන්නේ ලක්ෂ 35 යි. අපේ අයවැය අරගෙන බැලුවොත්, අපි හම්බ කරන හැම ශතයක්ම වියදම් කරලා පාරවල් හදනවා. බොක්කු දාන්න සල්ලි නැහැ කිව්වොත් ආණ්ඩුවෙන් සල්ලි පාස් වෙනකල් ඉන්නේ නැතුව අපි අතින් දෙනවා. මේ වනකොටත්, මම නිවාස තුනක් හදන්න යනවා. වතුර දෙන්න ළිඳක් හදාගෙන යනවා. මේවාට අපි හම්බ කරන සල්ලි ලක්ෂ 70 ක් විතර වියදම් කරනවා. එහෙම බැලුවොත් ඔය ජනමාධ්‍යවල කුටු කුටු ගාන අයට අපි කියනවා, ඇවිල්ලා නිරීක්ෂණය කරන්න. මේ දේශපාලඥයෝ මොනවාද කරන්නේ කියලා.

ගරු සභාපතිතුමනි, මම මේ ආණ්ඩුකාරවරයා ගැන කියන්නේ. මේ ආණ්ඩුකාරවරයාට වැදගත් විධියට මේ වෘත්තීය කරගෙන යන්න පහසුකම දෙන්න ඕනෑ. වාහනයක් ගත්තු ගමන් ඒක පත්තරේ දානවා. ඉතින් සමහර අය වාහනය ගෙදර තියාගෙන ඉන්නවාද දන්නේ නැහැ. වැඩ කරන අයට මේ වාහනය ඇත්තටම අවශ්‍යයි. මම මේක විශේෂයෙන් කියන්නේ, සමාජයේ කථිකාවක් ඇති වෙන්නේ, මේ දේශපාලඥයෝ වැඩිපුර සල්ලි අරගෙන මේක භුක්ති විඳිනවා කියලා. ඒ වාගේ තමයි කථා කරන්නේ. ඇත්තටම ඒ අයට ගෙදරක ඉන්න වෙලාවක් නැහැ. ඒ අයට ගෙවල්වල කෙනෙක් ගැන හොයන්න වෙලාවක් නැහැ. තමුන්ගේ ළමයා ඉස්කෝලයට යනවා. ඒ ළමයාව ගෙදරට ගේන්න වෙලාවක් නැහැ. පිටස්තර Drivers ලා ළමයි ගේන්නේ. සමහර වෙලාවට තමුන්ගේ අම්මා, තාත්තා ලෙඩ වෙලා. බලාගන්න විධියක් නැහැ. කොයි වෙලාවෙත් ගෙදරින් පිට ඉන්න සිද්ධ වෙන්නේ. මේවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. මම නම් භය නැහැ. මම මේ දේශපාලනයේ ලකුණු දාගන්න කථා කරන්නේ නැහැ. මම ඡන්ද වේදිකාවේත් කියන්නේ තමුන්නාන්සේලා කැමැති නම් ඡන්දයක් දුන්නොත් අපි ගිහිල්ලා කළ යුතු වැඩේ කරනවා. නමුත් ඔය ලකුණු දා ගැනීමට, සුදු හුණු ගැමට යන දේශපාලඥයෝ නොවෙයි අපි. ඒ නිසා තමයි මම ඡන්ද 20,000 කින් පළාත් සභාවට පළමුවෙන්ම පත් වෙලා ආවේ. දැන් ඡන්ද 55,000 ක් අරගෙන මනාප වැඩි කරගෙන ඉන්නවා. හැබැයි කොහේවත් අඩු වෙලා නැහැ. කිසිම දවසක තවම ඡන්ද අඩු කර ගත්තේ නැහැ. ඒ නිසා භය නැතුව කථා කරනවා. ඒ කථා කරපු නිසා තමයි එන්නේ. හැබැයි, පාර්ලිමේන්තුවට යන්න බැරුව ගියේ අර නළුවෝ ටිකක්, එහෙම නැත්නම් ක්‍රිකට්කාරයෝ ටිකක් ආපු නිසා. අපේ ජනතාවත් ඒ වාගේ අයට කතිර ගහන නිසා පාර්ලිමේන්තුවට යන්න බැරුව ගියා.

ඉතින් මම විශේෂයෙන් කියන්න ඕනෑ. ආණ්ඩුකාරවරයාගේ පහසුකම් දෙන්න කියනවා වාගේම ආණ්ඩුකාරවරයා යම්කිසි අවස්ථාවකදී මන්ත්‍රීවරයෙකුට හමු වෙන්න - මොකද, අපි වැදගත් කාර්ය භාරයක් කරන කොට ගැටළු මතු වෙනවා. සමහර ගැටළු ආණ්ඩුකාරවරයා මැදිහත් වෙලාත් විසඳන්න පුළුවන්. මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් ගැනීමේදී, යම් යම් ප්‍රමාදවලදී, ආයතනවල ප්‍රමාදවලදී ප්‍රශ්න මතු වෙනවා. මේ සම්බන්ධයෙන් අපි යම්කිසි ක්‍රමවේදයක් හදාගන්න ඕනෑ,ආණ්ඩුකාරවරයාව යම්කිසි දිනයක, බදාදා හරි මන්ත්‍රීවරුන්ට අවශ්‍ය වෙලාවට ගිහිල්ලා හම්බ වෙන්න පුළුවන් වෙන්න. ඒ වාගේ ක්‍රමවේදයක් හදන්න ඕනෑ.

ඒ වාගේම එක කාලයක් තිබුණා ඉඩම්, පොලිස් බලතල සම්බන්ධයෙන් උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විවිධ ප්‍රකාශ කරන කොට රටේ ආදෝලනාත්මක තත්ත්වයන් ඇති වුණා. මෙවැනි තත්ත්වයන්වලදී පළාත් නවයේම ඉන්න ආණ්ඩුකාරවරු එකට එකතු වෙලා කථිකාවක් ඇති කරන්න ඕනෑ. අපි රට ඉස්සරහාට යන ගමනක් මිසක් රට කඩාකප්පල් කරන ගමනකට යන්න බැහැ. ඒ නිසා මේ ආණ්ඩුකාරවරයා පත් වෙලා නිකම් ඉන්න නොවෙයි, රටේ උන්නතිය සඳහා ඒ ඒ ආයතන එක්ක කථා කරලා රටේ සමබරතාවයක් පවත්වාගෙන යන්න ඕනෑ. අපි පළාත්වලට බලය බෙදලා, මධ්‍යම ආණ්ඩුවේ බලය අරගෙන පළාත් සභාවලට දාලා ඒක ඔහේ ගමන් කරන්න දීලා ඉඳලා හරි යන්නේ නැහැ. පළාත් සංවර්ධනය කිරීමේදී ඒ පළාත්වල අදහස් - සමහර පළාත්වල සම්පත් තවත් පළාතකට අවශ්‍ය වෙනවා. තව පළාතක ශ්‍රමය, තව පළාතකට දෙන්න පුළුවන්කම තිබෙනවා. අන්තර් පළාත් සම්බන්ධතාවයක් ඇතුව මේ සංවර්ධන ගමනේදී ඉස්සරහාට යන්න මේ ආණ්ඩුකාරවරයාගේ අවධානය මම යොමු කරනවා. මම දන්නවා. එතුමා එහේ හිටියාට එතුමා මේ සෑම ප්‍රශ්නයක්ම, සෑම යෝජනාවක්ම, සෑම

[ගරු රෝස් ප්‍රනාන්දු ]

කථාවකටම ඇහුම්කන් දෙනවා. ඒවා කියවලා බලනවා. ඒ නිසා අපි අගය කරන ආණ්ඩුකාරවරයෙක් වුණත් එතුමන්ටත් මම කියනවා, අපි තවම නොදියුණු රටක් හැටියට ඉන්නවා නම් මේක දියුණු රටක් කරන්න. මේ ආණ්ඩුකාරවරයාට විධායක බලය තිබෙනවා. යම්කිසි තැනක මේ පළාත් සභාවල් එකතු කරගෙන ඉස්සරහාට යන්න ඕනෑ. මේ බලය බෙදා දුන්නේ, රටේ සංවර්ධනය වැඩි කරන්න. රටේ සංවර්ධන තීව්‍ර කරන්න. ජාති, ආගම්, කුලමල භේද පැත්තකින් තියලා රට දියුණු කරන්න. දශක දෙකක් ගත වෙලා තිබෙනවා. අසූ ගණන්වල අපි පළාත් සභා පිහිටුවලා මේ දශක දෙකක ගමනේදී අපි අවශ්‍ය තැනට මේ පළාත් සභා අරගෙන ගියාද? මධ්‍යම ආණ්ඩුව බලාපොරොත්තු වුණු, ඒ අරමුණු සාක්ෂාත් කර ගන්න, අපි පළාත් සභාවල් හැටියට ගමන් කළාද කියන එක ආණ්ඩුකාරවරුන් අතර කතිකාවක් ඇති වෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම බස්නාහිර පළාත් සභාව ගැන අපි කථා කරන කොට වැඩිම ජනගහණයක් ඉන්න පළාතේ පළාත් සභාව හැටියට අපි සභා කටයුතු කාරක සභාවේදී නිතර කථා කරනවා, මේ පළාත් සභාවේ ගමන් මග කොහොමද යන්න ඕනෑ කියලා. සභා කටයුතු විතරක් නොවෙයි. ජනතාව අතරට මේ පළාත් සභාව ගෙනිහිල්ලා ජනතාවගේ සේවාවන් ඉතාමත්ම කඩිනම්ව, කාර්යක්ෂමව සපයන්න අපි මොනවාද කරන්න ඕනෑ කියලා. එහිදී අපේ ජනමාධ්‍ය අංශයක් හදමු කියලා අපි කථා වුණා. ජනමාධ්‍ය අංශය මගින් තමයි ඔය සල්ලි දීලා පර්මිට් එකක් හදාගෙන, බොරු බේගල් ඇද බාන ජනමාධ්‍ය වෙනුවට හොඳ ජනමාධ්‍ය ඒ කියන්නේ ජනතාව අතරට ප්‍රවෘත්ති ගෙනියන්න පුළුවන් ඒකකයක් අපි හදන්න ඕනෑ. එතකොට සත්‍ය, නිවැරැදි ප්‍රවෘත්තිය ජනතාව අතරට යනවා. නැතන්ම් මේ රුපියල් 5000 ක් සාක්කුවේ දාගෙන, නැත්නම් රෑට කෑම එකක් දීලා මේක දාපන් කිව්වාම දාන ජනමාධ්‍ය අපට වැඩක් නැහැ. ඒ නිසා සැබෑ ජනමාධ්‍යයක් -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මන්ත්‍රීතුමිය කීය ගාණේද දෙන්නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එක එක ගණන්. ලොකු ලොකු හැටියට. පොඩි අයට 5000 යි. ලොකු අයට 10,000, 25,000 දෙන්න පුළුවන්. සමහර විට ඉඩම් කැල්ලක් දෙන්න පුළුවන්. ඉන්න ගෙයක් හදලා දෙන්න පුළුවන්. අමාත්‍යාංශයක රස්සාවක් දෙන්න පුළුවන්. සමහර ජනමාධ්‍යවේදීන් ඉන්නවා, අමාත්‍යාංශයෙන් පඩි ගන්නවා. ඊට පස්සේ එයා ගැන ලියනවා. ඒ නිසා මම මේ සියලු දේ විවේචනය කරනවා. මම කියන්නේ අපේ ජනමාධ්‍ය ඒකකයක් හැදෙන්න ඕනෑ. සත්‍ය තොරතුරු. අද පළාත් සභා පාරවල් හදනවා. පළාත් සභාව ජනතාවට විවිධ පහසුකම් දෙනවා. මේවා ජනතාවට යන්නේ නැහැ. කවුද? හදන්නේ, කවුද? කරන්නේ කියලා. ඒ නිසා මේ සියලු දේ ජනතාවට ලං වෙන්න අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය මදී. ඒ වාගේම නීති අංශයක් හදන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කාලය දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ. අපේ සංවිධායකතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම කිව්වා නීති අංශයක් හදන්න කියලා. නීති අංශයක් හදන්න කියන්නේ මොකටද? පළාත් පාලන ආයතනවල නීති ප්‍රශ්න හිර වෙලා තිබෙනවා. සමහර සංවර්ධන කටයුතු කරගන්න බැහැ. ආයතනවල ගැටළු තිබෙනවා. අපට ප්‍රබල නීති අංශයක් ඕනෑ. අද වනකොට මේකේ ඉන්න නීතිඥ මහත්ම මහත්මීන් තමයි කෙටුම්පත් හදන්නේ. ප්‍රඥප්ති හදන්නේ. ඒ අයගේ දැනුම පාවිච්චි කරලා. නමුත් ඒ වෙනුවට ප්‍රබල නීති අංශයක් හදන්න අවශ්‍යයි. එතකොට මේ ආයතනවල හිර වෙලා තිබෙන සියලුම ගැටළු - පළාත් පාලන ආයතනවලට පවා උපදෙස් දෙන්න පුළුවන් පළාත් සභාවේ නීති අංශයෙන්. එවැනි අංශයක් හදලා, ස්වෙච්ඡාවෙන් වැඩ කරන්න කැමැති දක්ෂ නීතිඥවරු

ඉන්නවා. සමහර අය කැමැත්තෙන් සමාජ සේවයට එනවා. එහෙම අය අරගෙන ඒ අයට ගමන් වියදමක් ගෙවලා හරි තමුන්ගේ වැඩේ කරලා දෙන්න කැමැති අය ඉන්නවා. එවැනි අංශයක් ගැන උනන්දු වෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපේ තාක්ෂණය භාවිතය. පළාත් සභාව හැටියට අපි තාක්ෂණය භාවිතා කරනවා මදී. ඒ කියන්නේ අද තාක්ෂණික යුගයක් ඇවිල්ලා. ගෙදර ඉඳන් බටින් එක ඔබලා බිල ගෙවන්න පුළුවන් වෙන්න ඕනෑ. ගෙදර ඉඳලා බටින් එක ඔබලා අපේ පළාත් සභාවට වාහන ආදායම ගෙවන්න පුළුවන් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය විෂයයට අදාළව කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විෂයය කියන්නේ, මම කථා කරන්නේ පළාත් සභාව වෙනුවෙන්. පළාත් සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමාගේ ඒ වැය ශීර්ෂයට කථා කරන්න. ඕවා පස්සේ කථා කරන්න. අපේ තාක්ෂණ අමාත්‍යාංශයක් තියෙනවා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ පළාත් සභාව ජනතාව අතරට යන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පොඩි උදව්වක් කළේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පළාත් සභාව ජනතාව අතරට යන්න ඕනෑ. ඒකයි කියන්නේ. ඒ තාක්ෂණය පළාත් සභාවෙන් ඉදිරිපත් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් නම් ඔබතුමියගේ කාලය අවසන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්ගෙන් මම ඉල්ලා සිටිනවා. පසුගිය කාලයේ කොමිෂන් සභාවලට කෙලින් ඉන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. සෑම නිලධාරියෙක්ම ස්වාධීනව ඒ කටයුතු කරන්න කියලා කොමිෂන් සභාවේසියලුම නිලධාරීන්ගෙන් මම ඉල්ලා සිටිනවා. එදා බෙල්ලෙන් අල්ලලා මිරිකන යුගයක් තිබුණා. දැන් බොහොම නිදහසේ තමන්ගේ රාජකාරී කරන්න පුළුවන් යුගයක් තිබෙනවා. කාටත් බය නැතුව ස්වාධීනව මේ සභාවල සේවය කරලා, ඒ කොමිෂන් සභාවලින් අපට අවශ්‍ය කරන ශක්තිය ලබා දීලා මේ රටේ දැවැන්ත ඉදිරි ගමනකට සූදානම් වෙන්න ඒ අයට ශක්තිය ධෛර්ය ලැබේවා කියනවා.

ඒ වාගේම විශේෂයෙන්ම සභාවේ සියලුම නිලධාරී මහත්වරුන්ට මා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ සභාපතිතුමා බොහොම කුඩා දරුවෙක් වාගේ අහිංසක විධියට සියලුම ප්‍රශ්නවලට (බාධා කිරීම්) මුහුණ දෙනවා. හැබැයි එතුමාට විවේචන තිබුණත්, එතුමා සෑම සභා කටයුතු කාරක සභාවකටම සහභාගී වෙමින් එතුමා කාර්යක්ෂම සේවාවක් සපයනවා. ඒකයි මම කිව්වේ එතුමාට කොපමණ විවේචන තිබුණත්, පොඩි ළමයෙක් වාගේ අහගෙන ඉඳලා එතුමා ඒ සේවය සපයනවා. ඒකත් අපි අගය කරන්න ඕනෑ. අපට ඕනෑම දෙයක් කථා කරන්න පුළුවන් සභාපතිවරයෙක් ඉන්නේ. ඒ නිසා බොරු විවේචන කරන්න එපා. විනාඩි 05 ක් දුන්නා කියලා එතුමාට බණින්න එපා. ආණ්ඩු පක්ෂය දෙකට බෙදිලා තරහා වුණාට ඒක එතුමාගේ පිටින් අරින්න එපා. ඒ නිසා මේ සභාව අපට ඉදිරියට ගෙනියන්න ඒ අවශ්‍ය ශක්තිය ධෛර්ය ඇතිව එකමුතුව වැඩ කරමු. මේ ආණ්ඩුකාරවරයා ආරක්ෂා කර ගනිමු. සභාව ආරක්ෂා කර ගනිමු. මේ කොමිෂන් සභාවේ වැඩ කරන නිලධාරීන්ට ඒ සඳහා ශක්තිය දෙන්න අපි එක්සත්ව ක්‍රියා කරමුයි කියමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට බොහොම ස්තුතියි. තව පොඩ්ඩක් කාලය ඉල්ලුවා නම් ඒත් දෙනවා. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.05]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ කථාවෙන් පස්සේ මට මේ අවස්ථාව ලැබුණා. ගරු සභාපතිතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මට මේ වචනය කියා ගන්න තිබුණා නම් හොඳයි. නමුත් එතුමා බැහැලා ගියත් මේ දේ සභාගත වෙන්න කියන්න ඕනෑ. ගරු සභාපතිතුමාගේ සහ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ වාග් ප්‍රහාරයේදී කියැවුණා නිතරම සභා ලේකම් කාර්යාලයේ ගැවසෙන කෙනෙක් හැටියට එහෙම කථා කරන එක හොඳ නැහැයි කියලා. හැබැයි මම හිතන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා නොවෙයි, සභාවේ නිතරම ගැවසෙනවා වාගේ පේන්නේ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියයි කියලා මට පේන්නේ. ඒ කියන්නේ සභාපතිතුමා එතුමියට කරපු සුවිශේෂී වරප්‍රසාදය හේතු කොටගෙන.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ, නැහැ. විනාඩි 10 යි දුන්නේ. අරයට 15 යි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කොහොම නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් මම මේ දිනවල මේ සභාවේ රැස්වීම්වලට සහභාගී වෙන්නේ හරි සැහැල්ලු කෙනෙක් හැටියට. සටහන් ලියාගෙන, පොත්පත් කරපින්නාගෙන එන කෙනෙක් නොවෙයි. නමුත් මම ඊයේ කල්පනා කළා බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව යම්කිසි දෙයක් කථා කරන්න ඕනෑ කියලා. යුතුකමක් හැටියට. මොකද, ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂයේ තිබෙන වැදගත්කම හුඟක් අය සැහැල්ලුවටයි සලකන්නේ. ඒ වාගේම අපේ අයවැය ලේඛනවල හැම වෙලාවේම සඳහන් වෙන්නේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය වැය බරක් හැටියට. ඒක වෙනත් හේතුවක්. නමුත් ඒක වැය බරක් වුණාට නූතන යුගයේ, වර්තමාන යුගයේ ආණ්ඩුකාරවරයාගේ කාර්යාලයට ආ ආණ්ඩුකාරවරයා අපට බරක් නොවෙයි කියන කාරණාව ප්‍රකාශ කරන්න ඕනෑ. සම්ප්‍රදායානුකූලව ආණ්ඩුකාරවරයා එක චකවානුවක අපි සංකේතයක් හැටියටයි සැලකුවේ. අපේ සමහර සැසිවාර පවත්වනවා. ආණ්ඩුකාරවරු ගෙන්නනවා. එතැනින් එහාට කිසිම සම්බන්ධයක් තිබුණාද කියන කාරණාව අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. නමුත් නූතන යුගයේ වර්තමාන ආණ්ඩුකාරතුමා කේ.සී. ලෝගේස්වරන් මැතිතුමා ඒ පුටුවට ආවට පස්සේ මා විශ්වාස කරනවා, ආණ්ඩුකාර භූමිකාව හරියටම කෙරෙන තැන එතුමාගේ ආණ්ඩුකාර ධුරයයි කියලා මම ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමාට කරන ගෞරවයක් හැටියට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමානයේ ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයෙන් වුණු සේවය පිළිබඳව අත්දැකීම් තිබෙන කෙනෙක් මම. මොකද, සභා කටයුතු කාරක සභාවේ නියෝජිතයෙක් හැටියට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ පළාත් සභාවේ තිබෙන යම් යම් කාරණා පිළිබඳව අපි සාකච්ඡා කළාම, එතුමාගේ තිබෙන සුභවාදීභාවය ඇතැම් විට නිලධාරීන් අභිබවලා, නිලධාරීන් කියන දේ නොසලකා සත්‍ය එතුමා පසක් කර ගනිමින් එතුමාගේ භූමිකාව, යුතුකම ඉෂ්ට කළා. ඔබතුමාත් ඒ අවස්ථාවලට සහභාගී වුණා. මුළු ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ සියලුම සේවකයින්ගේ පඩි වැඩි කරන කොට ඔබතුමාගේත්, මගේත්, අහිංසක සේවකයින්ගේ පඩි

වැඩි කිරීමට නිලධාරීන් මැලිකමක් දැක් වූවා. මම ඒකට නිලධාරීන්ට වරදක් පටවන්න හදනවා නොවෙයි. ඒ නිලධාරීන්ගේ තිබෙන බය, මේ මූල්‍යමය තත්ත්වය තුළ ඇති වී තිබෙන චකිතයට පසුබෑමක් ඇති වුණා. නමුත් අපි ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරලා, එතුමාට ඒක ඒත්තු ගැන්නුවාම එතුමා කිව්වේ, මට දැන් මේ නියම තත්ත්වය සලසලා දෙන්නම්. මම ඒත් එක්කම අත්සන ගහලා අනුමැතිය දෙන්නම් කියලා. ඒක එදා කළා. එදා තමයි මම ලෝගේස්වරන් ආණ්ඩුකාරතුමා ක්‍රියාශීලී ආණ්ඩුකාරවරයෙක් කියලා පසක් කර ගත්තේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැබැයි, මම විශ්වාස කරනවා එතුමාගේ භූමිකාව තුළ මේ සභාවේ මීට වඩා පුළුල් පරාසයක් තුළ විශාල සේවයක් ගන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි තවම එහෙම ගන්න හිතලා නැත්තේ ඇයි?අනාදිමත් කාලයක් තිස්සේ හිටපු ආණ්ඩුකාරවරුන්ගෙන් ඒ විධියේ පුළුල් පරාසයක් තුළ සේවය අරගන්නේ නැතුව නාම මාත්‍රිකව, සංකේතාත්මකව තියා ගත්තු නිසා සමහර විට අපේ මැති ඇමැතිවරු, ප්‍රධාන අමාත්‍යතුමා, නිලධාරීන් හිතනවා ඇති මේ ආණ්ඩුකාරතුමාත් එහෙම වෙන්න ඇති කියලා. නමුත් එහෙම නොවිය යුතුයි. ආණ්ඩුකාරතුමාගේ මෙහෙවර පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. නෛතික බලතල මත බස්නාහිර පළාත් සභා පරිපාලන ක්‍රියාවලිය සඵල සේවාලාභී සත්කාරයක් සඳහා අධීක්ෂණය, මෙහෙයවීම හා නියාමනය තුළින් තිරසාර සංවර්ධනයට දායක වීම. ඒ එතුමාගේ මෙහෙවර. එතුමාගේ කාර්යයන් සඳහන් කරලා තිබෙනවා.

*"පළාත් සභාවේ අදාළ ප්‍රඥප්ති සෑදීමට හැකි විෂයයන්ට අදාළව විධායක බලතල ක්‍රියාත්මක කිරීම. පළාත් සභා අරමුදලේ මූල්‍ය පටිපාටියට අදාළ විධායක බලතල ක්‍රියාත්මක කිරීම. පළාත් රාජ්‍ය සේවයේ සියලු කටයුතුවලට අදාළ තීරණ ගැනීම හා පළාත් සභා පනතින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම ආණ්ඩුකාරතුමාගේ කාර්ය භාරය වන්නේය."*

එතුමාගේ මෙහෙවර සහ ප්‍රධාන කර්තව්‍යයන් අපි තව තවත් ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ මේ පළාත් සභාවේ විශාල අර්බුද තිබෙනවා. ඇමැතිවරු වෙලාවට සභාවට එන්නේ නැහැ. මන්ත්‍රීවරු වෙලාවට සභාවට එන්නේ නැහැ. ඒ ධුරධාරීන් තමන්ගේ කර්තව්‍ය හරියට කරන්නේ නැහැ. මා විශ්වාස කරනවා ආණ්ඩුකාරතුමාගේ මෙහෙවර සහ කාර්ය භාරය තුළ ඒවාට යම්කිසි බලපෑමක් ඍජුව හෝ වක්‍රව කරන්න පුළුවන් කියලා. මම යෝජනාවක් කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ ලේකම්තුමාත් දන්නවා ඇති. කාර්ය පටිපාටි රීතිවලට අපි යෝජනාවක් ගෙනාවා. අතිගරු ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුවට සම්ප්‍රාප්ත වෙලා, ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව අමතන්න, පාර්ලිමේන්තුවට සහභාගී වෙන්න පුළුවන් කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය පැවරිලා තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට එහෙම බලයක් නැති වුණත් සභා රීතිවලට අපි ඇතුළත් කරන්න බලාපොරොත්තු වෙනවා, ආණ්ඩුකාරතුමාට ඕනෑම වෙලාවක මේ සභාවට ඇවිල්ලා අසුන් ගන්න පුළුවන් වන විධියේ රීතියක්. ඒකෙන් මම අදහස් කරන්නේ මොකක්ද? එතුමා හදිසියේ වෙන්න පුළුවන්, අපට දන්වලා වෙන්න පුළුවන් මේ සභා ගර්භයේ සුදුසු තැනක එතුමා අසුන් ගත්තාම අපේ හැසිරීම් රටාව, අපි කියන්නේ මොනවාද? නොකරන්නේ මොනවාද? ඒ පිළිබඳව එතුමාට අවධානයක් ඇති වෙනවා. දැන් විපක්ෂයෙන් මතුවන ප්‍රධානම මැසිවිලිවලින් එක්ක තමයි විපක්ෂයෙන් අහන ප්‍රශ්නවලට අපේ ඇමැතිවරු උත්තර දෙන රටාව හරි නැහැයි කියලා. ඒක තියෙනවා. ඒක හරිද, වැරැදිද කියන කාරණාව තේරුම් බේරුම් කරගෙන එතුමා මේ සභා ගර්භයේ ඉන්න අවස්ථාවකදී නම් එතුමාට පුළුවන් වෙනවා එතුමාගේ මෙහෙවර සහ කර්තව්‍යයන් තුළ ඒ අයට යම්කිසි අවවාදයක්, අනුශාසනාවක් එහෙම නැත්නම් බලපෑමක් කරන්න. මම මේකෙන් අදහස් කරන්නේ මොකක්ද? ආණ්ඩුකාරතුමාගේ සද්භාවයෙන් කෙරෙන භූමිකාව තුළ මේ පළාත් සභාවට යහපතක් කරන්නයි.

මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ යම් යම් අමාත්‍යාංශ තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ආණ්ඩු පක්ෂයේ වුණත්, අපට විශාල ප්‍රශ්න තිබෙනවා. විපක්ෂයේ වුණත් විශාල ප්‍රශ්න තිබෙනවා. මොකද, ඇතැම් අමාත්‍යවරුන්ගේ - අමාත්‍යතුමා හොඳ වෙන්න පුළුවන්. ලස්සන වෙන්න පුළුවන්. හැඩ වෙන්න පුළුවන්. කථා කරන විලාශය සුන්දර වෙන්න පුළුවන්. නමුත් ඒ අමාත්‍යාංශය වල සමහර විට අත්‍යවශ්‍ය නිලධාරීන් සහ අභ්‍යන්තරයේ කටයුතු කරන අය අපි බලාපොරොත්තු වන දේ ලබා දෙන්නේ නැහැ. ඔවුන්ට සම්බාධක පනවන්න,

[ගරු හෙක්ටර් බෙත්මගේ ]

ඔවුන්ට යම්කිසි බලපෑමක් කරන්න පුළුවන් වෙන්නේ ප්‍රධාන විධායකවරයා හැටියට ආණ්ඩුකාරවරයාටයි. අන්න ඒ අවස්ථාව ලබා ගන්න තමයි මම අර ඉහත කී යෝජනාව කළේ. විශේෂයෙන්ම අපි ආණ්ඩුකාරතුමාට ස්තුවන්ත වෙන්න ඕනෑ. එතුමාට හොඳ පෞද්ගලික ලේකම්වරයෙක් ඉන්නවා. මම නම කියන්නේ නැහැ. එහෙම වුණොත් හිතයි සුදු හුණු ගාන්න හදනවා කියලා. අපි දැකලා තිබෙනවා. අපි යම්කිසි කාරණයක් ඒ පෞද්ගලික ලේකම්වරයාට ඉදිරිපත් කළා නම්, ඒක නිසියාකාරයෙන් ආණ්ඩුකාරතුමාට යොමු කරලා අපට පෞද්ගලිකව කථා කරනවා. නැත්නම් පෞද්ගලික විසඳුම් තිබෙනවා. මම මේ දේ කිව්වේ අපේ පළාත් සභාවේ අමාත්‍යවරුන්ටත් හොඳ පෞද්ගලික ලේකම්වරු ඉන්න ඕනෑ. නැතුවා නොවෙයි. ඇතැම් අයගේ පෞද්ගලික ලේකම්වරු ජනතාවට ඇහුම්කන් දෙන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් දෙන්නේ නැහැ. අමාත්‍යතුමාට දුරකථන ඇමැතිතුමක් ගත්තාම එතුමා නැත්නම් අපි පෞද්ගලික ලේකම්වරයාට ගන්නවා. පෞද්ගලික ලේකම්වරයා හරි නම්, අපට සැලකිල්ලක් තිබෙනවා නම් පළාත් සභාවට ගෞරව කරනවා නම්, ඔහු පෙරළා අමාත්‍යවරයාට යොමු කරලා, නැවත අපට පෙරළා දුරකථන ඇමැතිතුමක් දෙන්න ඕනෑ. ඇතැම් අය එහෙම නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී මේ වැය ශීර්ෂයට අදාළ නොවෙන්න පුළුවන්. මගේ පණිවිඩය, යෝජනාව අමාත්‍යවරුන්ට යන්න ඕනෑ.අමාත්‍යවරුනි, ඔබතුමන්ලාගේ පෞද්ගලික ලේකම්වරු ඔබතුමන්ලාට සැබවින්ම හිතවත් පෞද්ගලික ලේකම්වරු වෙන්න ඕනෑ කියන කාරණාව. මම ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම්වරයාව ආදර්ශයට අරගෙන කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දිර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ පළාත් සභාවට අභිමානයක් ගේන්න ඒ වාගේම මේ පළාත් සභාවට ශක්තියක් දෙන්න, මේ පළාත් සභාව සැබවින්ම ශ්‍රී ලංකාවේ වැදගත්ම, උත්තරීතරම පළාත් සභාව බස්නාහිර පළාත් සභාව කරන්න නම් අපි අලුත් නිර්මාණශිලී ආදර්ශයක් හැටියට මේ පළාත් සභාව නියෝජනය කරන්න, මෙහි අසුන් ගන්න ආණ්ඩුකාරවරයාට අවස්ථාව ලබා දෙන්න නීතිරීති සම්පාදනය විය යුතු බව ප්‍රකාශ කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 10.15]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමා, බස්නාහිර පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව සාකච්ඡා වන මේ වෙලාවේ මම ප්‍රථමයෙන්ම ඊයෙ දවසේ වුණු සිදුවීම පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාව කපා දැමීම පිළිබඳව. මම ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා හැටියට බලවත් සේ කනගාටු වෙනවා. මන්ද, ඊයේ දවසේ ආණ්ඩු පක්ෂයට නියමිත වෙලාවල් අතර කථික ලැයිස්තුවට අමතරව තවත් විනාඩි 15 ක අතිරේක කාල සීමාවක් ඉඩ හැරලා තමයි කථික ලැයිස්තුව සූදානම් කරලා තිබුණේ. එතකොට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේත්, සුමිල්ලාල් මැන්ඩිස් ගරු ඇමැතිතුමාගේත්, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාගේත්, මගේත් කථා දැනුම් දීමකින් තොරව කපා හැරලා තිබුණා. එහිදී මා අහඹු ලෙස දැනගෙන සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාත් සමග සාකච්ඡා කරලා, මම කථාවට අවස්ථාව ලබා ගත්තා. නමුත් අනෙක් අයගේ කැපුවා කියලා දැන ගත්තේ ඊට පස්සේ. ඉතින් ඒක මූලාසනයෙන් සිදු වුණු වරදක්. කාලය කළමනාකරණය කිරීම මූලාසනයේ වගකීමක්. ඒක ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සංවිධායකවරුන්ගේ වගකීමක් නොවෙයි. ඒ නියමිත කාලයට අපි කථික ලැයිස්තු ඉදිරිපත් කරලා තිබෙනවා. මගේ පැත්තෙන් ඊයේ දවසේ විනාඩි 15 ක් වැඩියෙන් තිබුණා. කථික ලැයිස්තුවට අමතරව. ඒකේ වගකීම මූලාසනයේ. ඒ නිසා ආණ්ඩු පක්ෂයේ සංවිධායක හැටියට ඊයේ දවසේ ඒ සිද්ධ වුණු දේට වගකීම මම භාර ගන්නේ නැහැයි කියන එක බොහොම ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා නියමිත කාල සීමාව අරගෙන මූලාසනය නිවේදනය කළාට පස්සෙත් ඊට වැඩියෙන් කාලය ගන්නේ නැතුව තමන්ගේ කථාව අවසන් කරන්න කියන ඉල්ලීමත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ඒක ඔබතුමාට භාරයි. මූලාසනයට. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් අපේ වර්තමාන ආණ්ඩුකාරතුමා පිළිබඳව මම අවබෝධය ලබාගත්තේ අපේ වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමා අමාත්‍යාංශයේ වැඩ භාර ගන්න දවසේ තිබුණු උත්සවයට පැමිණි වෙලාවේ ආණ්ඩුකාරතුමා සභාව අමතලා කරපු කථාවත් එක්ක. මට මහ ලොකු අවබෝධයක්,චිත්‍රයක් එතුමා ගැන ඇති වුණා. ඒ වාගේම, මීට පෙර අවස්ථාවල අපි හිටපු ආණ්ඩුකාරවරුන්ට එහෙම අපහාසයක් කරනවා නොවෙයි. විශේෂයෙන් අලවි මවුලානා ආණ්ඩුකාරතුමා බොහොම සමාජශීලී. මහජනතාවත් එක්ක සම්බන්ධ වුණු වෘත්තීය සමිති නායකයෙක් විධියට බොහොම හොඳ සේවාවක් ගෙන ගියා. නමුත් පළාත් සභාව හැටියට, පළාත් සභාවේ කාර්ය භාරයන් පිළිබඳව මහජන නියෝජිතයාගේ වගකීම, නිලධාරීවරුන්ගේ වගකීම පිළිබඳව මනා අධ්‍යයනයක් කරමින් වර්තමාන ආණ්ඩුකාරතුමා, එතුමාගේ භූමිකාව කිරීම මම හිතන්නේ, මේ පළාත් සභාවේ ඉදිරි ගමනට විශාල ශක්තියක් හැටියට මා සඳහන් කරන්න කැමැතියි. ගරු ප්‍රධාන ඇමැතිතුමා වැඩ භාර ගන්න දවසේ එතුමා කරපු කථාව ආපස්සට හැරිලා බැලුවොත්, එතුමා සිංහලෙන් හැම දෙනාටම පිටපත් බෙදා හැරියා. පළාත් සභාව සහ මහජන නියෝජිතයා පිළිබඳව විශාල අවබෝධයක් එතුමාගේ ඒ භූමිකාව තුළ මම දකිනවා.

විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කරපු ආකාරයට මහජන නියෝජිතයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව එතුමා සමග තිබුණු සෑම සාකච්ඡාවකදීම බොහෝ සෙයින් මේවායේ තිබෙන සාධාරණත්වය අවබෝධ කර ගත්තු ආණ්ඩුකාරතුමෙක්. මම හිතනවා, එතුමාට ඉදිරියටත් මහජන නියෝජිතයින් පිළිබඳව සහ මේ සභාව පිළිබඳව ඒ තිබෙන සුභවාදී බව ඉදිරියටත් පවතියි කියලා. දැන් පොඩි ප්‍රශ්නයකුත් මතු වෙනවා. හැම කෙනාම මෙහෙම එතුමාගේ හොඳ කියන්න ගියාම එතුමා සමහර විට ටිකක් අහංකාර වුණොත් එහෙම, ගැටළුවකුත් මතු වෙන්න පුළුවන්. ඒක නිසා එතුමා එහෙම අහංකාර නොවී ප්‍රදේශයේ ජනතාවගේ සුභවාදී කටයුතුවලට ලබා දෙන දායකත්වය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ මහජන නියෝජිතයින් හැටියට එතුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත් අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. එතුමා පමණක් නොවෙයි. අපේ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමාගේ ආණ්ඩුකාර ලේකම්තුමා ප්‍රධාන පෞද්ගලික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල මේ පළාත් සභාවේ ඉදිරි ගමන වෙනුවෙන් ලබා දෙන දායකත්වය සුවිශේෂීයි කියන කාරණාව සඳහන් කරන්න පුළුවන්. විශේෂයෙන් අපට මේ මොහොත වනකොට වෙනත් පළාත්වල ආණ්ඩුකාරවරුන්ගේ හැසිරීම් සහ එතුමන්ලා කරන ප්‍රකාශයන් දිහා බැලුවාම මේ ආණ්ඩුකාරතුමා මොන තරම් බුද්ධිමත් ආකාරයෙන් ප්‍රදේශයේ ජනතාවට සේවාව සපයන්න අවශ්‍ය ඉඩකඩ ලබා දෙනවාද කියන කාරණාව ඉතාම වැදගත් කියලා මම මතක් කරනවා. ඒ වාගේම අපි හැමදේටම ආණ්ඩුකාරතුමා ළඟට දුවනවා නම් ඒකත් වැරැදියි. මම මේ මෑත ඉතිහාසයේ පළාත් සභාවේ අමාත්‍යාංශවල කරුණු කාරණා විපරම් කිරීමේදී මට ලැබුණු අවබෝධය තමයි බොහොම සුළු කාරණාවලටත් හැම අමාත්‍යාංශයකම අපේ ප්‍රධාන නිලධාරීන් ආණ්ඩුකාරතුමා වෙත දුවන ප්‍රවනතාවයක් වර්තමානයේ ඇති වෙලා තිබෙනවා. මම හිතන්නේ ඒක මහජන නියෝජිතයන්ගේ අයිතිවාසිකම් හෑල්ලුවට ලක් වන කාරණයක් බවට අනියමින් පත් වෙලා තිබෙනවා. ඒකත් යම් වරදක් කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සභා ලේකම් කාර්යාලය. එම කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දෙන සේවාවන් අපි ඉතාම අගය කොට සලකනවා. විශේෂයෙන්ම අපේ ඕනෑම කාරණයක් කියපු වෙලාවකදී බොහොම යුහුසුළුව, ප්‍රමාදයකින් තොරව ඒ කාර්යයන් අපට ඉෂ්ට කරලා දීම සම්බන්ධයෙන් අපි සභා ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයට ස්තුවන්ත වෙනවා. ඒ වාගේම සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ස්ථාන මාරු කිරීමේදී බරපතළ ගැටළු සහගත තත්ත්වයකට අපි පත් වෙලා තිබෙනවා. සභා කටයුතු කාරක සභා අවස්ථා කිහිපයකදී මේ පිළිබඳව සාකච්ඡා කරලා අපේ ගරු ආණ්ඩුකාරතුමා වෙත මේ කරුණු අපි යොමු කරලා තිබෙනවා. විශේෂයෙන් පළාත් සභාවට අයිති රජයේ වෙනත් ආයතනයක, දෙපාර්තමේන්තුවක රාජකාරී ස්වභාවය නොවෙයි සභා ලේකම් කාර්යාලයේ රාජකාරී ස්වභාවයන්. ඒ අයටම අනන්‍ය වූ සුවිශේෂී වූ රාජකාරී සමූහයක් සභා ලේකම් කාර්යාලයේ සිද්ධ වෙනවා. සුවිශේෂී හැකියාවන් තිබෙන, අවුරුදු ගණනාවක පළපුරුද්දත් එක්ක ඒ විෂයයන්ටම ප්‍රවීණයන් වුණු කාර්ය

[ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

මණ්ඩල හිටි හැටියේ කිසියම් හේතුවක් උඩ - එක්කෝ අවුරුදු 10 ස්ථාන මාරුවීම්වෙන්න පුළුවන්. අවුරුදු 05 වාර්ෂික ස්ථාන මාරු වෙන්න පුළුවන්. මොන ක්‍රමවේදයකින් හරි මනා පුහුණුවක් ලත් මේ සුවිශේෂී කාරණාවලට හැකියාව තිබෙන, ප්‍රවීණතාවයක් තිබෙන කාර්ය මණ්ඩලය මේ සභා ලේකම් කාර්යාලයෙන් වෙනත් ස්ථාන සඳහා ස්ථාන මාරු කිරීම සභා ලේකම් කාර්යාලයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යන්න තිබෙන අවස්ථාව අපෙන් මඟ හැරෙනවා. ආණ්ඩුකාර ලේකම්තුමා මේ අවස්ථාවේ මේ සභාව නියෝජනය කරනවා. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් එතුමාට අවධානයට යොමු කරනවා. සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය ස්ථාන මාරු කිරීමේදී මේ ඇති වෙලා තිබෙන ප්‍රායෝගික ගැටළු සහගත තත්ත්වයන් පිළිබඳව නැවත අවධානය යොමු කරලා, ඒ කළ යුතුම ඒවා පමණක් තිබේ නම්, ඒවා පමණක් කරන්නය කියන කාරණාව විශේෂයෙන් මම මතක් කරනවා.

ඒ වාගේම මේ සභාවේ බොහෝ මන්ත්‍රීවරු සඳහන් කළා වාගේ ගරු මන්ත්‍රීවරුන්ගේ සේවාවන් සහ අවශ්‍ය පහසුකම් සපයා දීම සම්බන්ධයෙන් ලංකාවේ වෙනත් පළාත් සභා එක්ක ගත්තාම, ලංකාවේ වැඩිම ආදායම උපදවන, පොහොසත්ම, ප්‍රධානම පළාත් සභාව වුණු බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ පහසුකම් වෙනත් පළාත් සභා සමඟ සැසඳීමේදී යම් අවම මට්ටමක තිබෙනවා කියන කාරණාව මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා පසුගිය සභා කටයුතු සහ අනෙකුත් කාරක සභාවලදී වෙනත් පළාත් සභා එක්ක ලබා දෙන පහසුකම් එක්ක අමාත්‍ය මණ්ඩලය වෙත විවිධ අමාත්‍යාංශ සංදේශ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමා මාර්ගයෙන් ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට සඳහන් කරනවා. මේ මන්ත්‍රීවරුන්ගේ පහසුකම් ලබා දීමේදී මීට වඩා ප්‍රමුඛ අවධානයක් ලබා දෙන්න කියන කාරණය. විශේෂයෙන් අද වර්තමාන පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයින්ට අතිවිශාල පහසුකම් ප්‍රමාණයක් ලබා දෙනවා. මෑතකදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වාහනයක් Rent එකට ගන්න ලක්ෂ 07 ක් දක්වා මුදල් වෙන් කරලා තිබෙන වකවානුවක් තුළ, Telephone දෙක තුනකට රුපියල් ලක්ෂ දෙකකට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙන තත්ත්වයක් තුළ, කාර්යාලීය පහසුකම්වලට රුපියල් ලක්ෂයක මුදලක් වෙන් කරලා තිබෙන තත්ත්වයක් තුළ එයින් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට අපට බරපතළ ගැටළුවක් තිබෙනවා.මුද්දර ගාස්තු වර්තමානයට කිසිසේත්ම ගැළපෙන්නේ නැහැ. මෙන්න මෙවැනි පහසුකම් පිළිබඳව, මන්ත්‍රීවරයෙකුට මහජනතාව වෙනුවෙන් නිසියාකාරයෙන් සේවාව සපයන්න බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ටත් එවැනි ඉඩකඩ පහසුකම් ලැබෙන ආකාරයට මේ කටයුතු ක්‍රියාත්මක කරන්න සභා ලේකම් කාර්යාලය හරහා අවශ්‍ය කටයුතු යෙදීම අවශ්‍යයි කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා.

විශේෂයෙන් අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සම්බන්ධව සඳහන් කළ කාරණාව ඉතාමත් වැදගත්. ඒක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. අධ්‍යාපන ඇමැතිතුමාත් ඉන්නවා. අපේ ගුරු පත්වීම්. එම පත්වීම් නිසි කලට වේලාවට ලබා දීමේදී සිද්ධ වුණු ප්‍රමාදය අදටත් අතිවිශාල ප්‍රමාදයක්. ගැටළු සහගත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලවලදී අපේ ප්‍රාථමික පාසල්වල ගුරු අවශ්‍යතාවය නිසියාකාරයෙන් කරගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබුණා. එතුමා කියනවා, දැන් ඒක විසඳිලා කියලා. විසඳිලා නම් සතුටුයි. නමුත් තවමත් ප්‍රාථමික ගුරුවරුන්ගේ බරපතළ අවශ්‍යතාවයක් අපේ කොට්ඨාශය තුළ තිබෙනවා. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මීට වඩා මේ කාරණා පිළිබඳව වැඩි ප්‍රමුඛත්වය, අවධානය යොමු කරලා, යුහුසුළුව ඒ සඳහා අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑ කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.25]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 අයවැයේදී ගරු ආණ්ඩුකාරතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන ඇත්ත වශයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම රැස්වීම් දෙක තුනකට ගියාට පස්සේ තමයි අපට ලැබිලා තිබෙන්නේ, හොඳම ආණ්ඩුකාරවරයෙක් කියලා මම දැන ගත්තේ. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වැඩ බලන සභාපති මෙරිල් පෙරේරා

ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. අපි ගිණුම් කාරක සභාවේ මන්ත්‍රීවරු 11 දෙනෙක් එක්ක ආණ්ඩුකාරතුමා හම්බ වෙන්න ගියා. ඇත්ත වශයෙන්ම මේක අපි සභාවට කියන්නත් ඕනෑ. මේ මන්ත්‍රීවරු 104 දෙනාම මේක දැනගන්නත් ඕනෑ. ආණ්ඩු පක්ෂයේ නම් මන්ත්‍රීවරු 08 දෙනයි ඉන්නේ. කියන්නත් දුකයි. ඇත්ත වශයෙන්ම ආණ්ඩුකාරතුමා කිව්වාම, අප කියන දෙයක් ඇහුම්කන් දෙනවා. අපට වචන දෙකක් කිව්වා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම මෙතැනින් එන හැම හාන්සාඩ් වාර්තාවක්ම අකුරෙන් අකුර කියවනවා කියලා කිව්වා. ඒක ලොකු දෙයක්. පාර්ලිමේන්තුවටත් වැඩිය බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරු ගොඩක් ප්‍රශ්න කරනවා කියලා කිව්වා. ඒකට උත්තරය තමයි ලැබෙන්නේ, ඒක නම් මට හරියට තේරෙන්නේ නැහැ. ගොඩක්ප්‍රශ්න අහනවා. බලන්නත් හරි ආසයි කිව්වා. ඇත්තටම ඒක කිව්වාට පස්සේ තමයි මමත් මේ සභාවේ මට කථා කරන්න පුළුවන් වුණත්, බැරි වුණත් නැඟිටලා වචන හතරක් කථා කරනවා. මේ වාගේ ආණ්ඩුකාරවරයෙක් තමයි අපට ශක්තිය දෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුකාරතුමාගේ තවත් විශේෂ දෙයක් තමයි, අපි කිව්වා. අධ්‍යාපන ඇමැතිතුමාට, දෙමළ මාධ්‍ය ගැන කථා කරන්න ආණ්ඩුකාරතුමා හම්බ වෙන්න යන්න කියලා. බස්නාහිර පළාත් සභාවේ දෙමළ මාධ්‍ය ගුරුවරු හයසිය ගණනක් පුරප්පාඩු තිබෙනවා. ඇත්තටම මේක කියන්නත් දුකයි. බස්නාහිර පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කය කියන්නේ, වැඩි හරියක් දෙමළ, මුස්ලිම් ජනතාව ජීවත් වන තැනක්. කොයි පාසලේත් ගුරු හිඟය තිබෙනවා. දෙමළ මාධ්‍යයට තිබෙන ගුරු හිඟය ලොකු ප්‍රශ්නයක්. මේ සාකච්ඡාවට ගිය වෙලාවේ ආණ්ඩුකාරතුමා ලස්සනට හැසිරුණා. කොහොමද ඒක කරන්න ඕනෑ. මේ දෙසැම්බර් මාසයට කලින් අපි මේ ප්‍රශ්න ටික ඉවර කරන්න ඕනෑ කියලා කිව්වා. අපේ මන්ත්‍රීවරුන්ට ආණ්ඩුකාරතුමාත් එක්ක කථා කරන්න දන්නේ නැති නිසා ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ඒක ලොකු ගැටළුවක් නොවෙයි. මම කියන්නේ, මේ වාගේ ඇත්ත වශයෙන් මන්ත්‍රීවරු කට්ටයක් ගිහිල්ලා ළඟට වෙලා, වාඩි වෙලා අපත් සමග පැය හායක් පැයක් කථා කරන්න, ඇහුම්කන් දීලා හොඳට තේරුම් ගන්න පුළුවන් ආණ්ඩුකාරවරයෙක් තමයි දැන් ලැබිලා තිබෙන්නේ. මීට කලින් හිටපු ආණ්ඩුකාරතුමා, අලවි මවුලානා මැතිතුමා මාත් එක්ක හරිම හිතවත්. එතුමා ගැන දොස් කියනවා නොවෙයි. එතුමාත් හරි හොඳ ආණ්ඩුකාරවරයෙක්. ඊටවත් වැඩිය අපේ මේ ඉන්න ආණ්ඩුකාරතුමා, යහපාලන රජයෙන් පත් වූ ආණ්ඩුකාරතුමා - විශේෂයෙන්ම කියන්න ඕනෑ යහපාලනයෙන් ආපු ආණ්ඩුකාරතුමෙක්. යහපාලනයෙන් ආපු ආණ්ඩුකාරතුමා එක එක දේවල් තේරුම් අරගෙන බස්නාහිර පළාත් සභාවට ගෞරවයක් තියලා මන්ත්‍රීවරයෙක් ආවොත් හොඳට සලකලා යවන ආණ්ඩුකාරවයෙක් තමයි අපට අද ලැබිලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මෙතැන මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ඉන්නවා. මේ සභාවේ 104 ක් ඉන්නවා. අපට Official Passport එක තිබෙනවා. විදේශ ගමන් බලපත්‍ර අපට තිබෙන්නේ, රාජකාරී ගමන් බලත්‍රය විධියට. මම විදේශ රටකට යනවා නම්, මම මගේ නෝනත් එක්ක යනකොට - අපට තිබෙනවා රටවල් හතළිස් ගණනකට වීසා අවශ්‍ය නැහැ. අපි නෝනාව එක්කරගෙන ගිහිල්ලා පෝලිමේ තියන්න ඕනෑ වීසා ගන්න. ඒකට දවස් පහක් ඉන්න ඕනෑ. අපට වීසා නැහැ. අපේ නෝනාට වීසා තිබෙනවා. මන්ත්‍රීතුමන්ලා මහත්තයාත් එක්ක යනවා නම්, එයා යන්න ඕනෑ වෙන පෝළිමක. මහත්තයා යන්න ඕනෑ තව පෝළිමක. මම මේක හැම සැරේම කථා කරපු දෙයක්. ඇත්ත වශයෙන්ම මේක ආණ්ඩුකාරතුමා යටතට තමයි භාර දෙන්න ඕනෑ. ඒක ආණ්ඩුකාරතුමා යටතේ තමයි ජනාධිපතිතුමාට යන්න ඕනෑ. ආණ්ඩුකාරතුමා කියන්නේ ජනාධිපතිතුමාගේ නිල බලය තිබෙන එක්කෙනෙක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොයි නෝනා එක්කද ගියේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මෙරිල් මන්ත්‍රීතුමා එක එක වෙලාවට එක එක නෝනලා එක්කරගෙන යනවා නේ? අපි නම් එහෙම නැහැ. අපට ඉන්නේ එක නෝනා කෙනෙක් විතරයි. ඉතින් ඇත්ත වශයෙන්ම මම කියන්නේ ඇමැති මණ්ඩලයට.මහ ඇමැතිතුමා මේ ගැන විශේෂ උනන්දුවක් අරගෙන, මේ ගැන සාකච්ඡා කරලා අපි හැම කෙනාටම Official Passport ටික ලැහැස්ති කරන්න කියලා කියන්න ඕනෑ. අපට ඕනෑම වෙලාවක කථා කරන්න පුළුවන් ආණ්ඩුකාරවරයෙක්

[ගරු එම්.එස්.එම්. ෆයිරෝස් ]

ඉන්නවා. මම නම් අපට තිබෙන ප්‍රශ්න ටික මෙතැන කථා කරන්නේ. මෙතැන කවුරුවත් නැඟිටලා යනවාද කියලාවත් - අපේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න නිලධාරී මණ්ඩලය. රාජකාරී කරන කට්ටියක්. ඒ ඔක්කෝම අයිති වෙන්නේ ආණ්ඩුකාරතුමාට. ඒකේ අඩුපාඩු කොපමණ තිබෙනවාද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දන්නවා අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රශ්න ගොඩක් තියෙනවා. ඒක අධ්‍යාපන ඇමැතිතුමාගේ අයවැය විවාදයේදී අපි තේරුම් කරලා දෙනවා. එතුමාට කොහොමද කියන්න ඕනෑ කියලා. කලාපයේ අධ්‍යක්ෂවරු කරන එක එක වැඩ ටික. හැම කලාපයේම වාගේ නොවෙයි. සමහර කලාපවල අධ්‍යක්ෂවරු කරන වැඩ නිසා ව්‍යූහ කමිටුවේ ඉන්න මන්ත්‍රීවරු දන්නෙත් නැහැ, මොකද? වෙන්නේ කියලා. ඒක ලොකු ඔළුවේ කැක්කුමක්. අපි ව්‍යූහ කමිටුවට ගිහිල්ලා වාඩි වුණා නම්, අපට තේරෙන්නේ නැහැ මොකද? වෙන්නේ කියලා. මෙතැන මන්ත්‍රීවරු කණ්ඩායමක් ඉන්නවා. අපි දන්නේ නැහැ මොකද වෙන්නේ කියලා. ඔක්කෝම යන්නේ කලාප අධ්‍යක්ෂතුමාට තමයි. කලාප අධ්‍යක්ෂතුමා තමයි මොකක්ද කරන්න ඕනෑ කියලා තේරුම් ගන්නේ. අපි බෝනික්කෝ වාගේ ගිහිල්ලා වාඩි වෙලා, රෝල්ස් එකක් කාලා, තේ එකක් බීලා නැඟිටලා එනවා. ඒක වැරැදියි. ඒ ක්‍රියා මාර්ගය වැරැදියි.

මේ බස්නාහිර පළාත් සභාවට මහජන නියෝජිතයෝ හැටියට මන්ත්‍රීවරු 104 දෙනෙක් පත් කරලා එවලා තිබෙන්නේ ජනතාවට සේවයක් කරන්න. අවශ්‍ය කරන මන්ත්‍රීවරු එක්කෙනෙක් දෙන්නෙක් ළඟ තියාගෙන වැඩ කරන්න නොවෙයි එතැනට නිලධාරීන් ඇවිල්ලා ඉන්නවා. එතැනට 10 දෙනෙක් එනවා නම්, 10 දෙනාම බලන්න ඕනෑ. කොළඹ කලාපයේ මන්ත්‍රීවරු කී දෙනෙක් ඉන්නවාද? එක උත්සවයක් තිබුණාම අවශ්‍ය කෙනාට විතරක් උත්සවයට කැඳවනවා. අවශ්‍ය කරන මන්ත්‍රීතුමාව විතරයි කොළඹ කලාපයේ තිබෙන හැම උත්සවයකට එක්කරගෙන යන්නේ. මැද කොළඹ ආසනයේ මම සංවිධායකවරයෙක්. මම මේ පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. අපට එක උත්සවයක්වත් කලාපයෙන්වත්, කොහෙන්වත් දන්වන්නේත් නැහැ. කියන්නේත් නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ජාත්‍යන්තර වෛරයක් තියෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

වෛරයක් නොවෙයි මන්ත්‍රීතුමා මේක. මේක වෛරයක් නොවෙයි. මේ වාගේ දේවල් කරන කොට ආණ්ඩුකාරතුමා මොනවා හරි කරන්න ඕනෑ. මේක අධ්‍යාපන ඇමැතිතුමාගේ අව වැඩක් වෙලා. අධ්‍යාපන ඇමැතිතුමා මේක බලන්න ඕනෑ. ඒක නිසා අපි කියන්නේ මෙතැන ඉන්න මන්ත්‍රීවරු 104 දෙනා දිහාම එක විධියට බලන්න කියලා. මේක තේරුම් ගන්න ඕනෑ. අපේ කලාපයට ඇවිල්ලා, අපේ පළාතට ඇවිල්ලා, අපේ මැද කොළඹට ඇවිල්ලා උතුරු කොළඹ සංවිධායක එක්ක ගියා නම් මේක වාසි ගන්න, දේශපාලන න්‍යාය පත්‍රය ගෙනියන්න ඉඩ දෙන්න බැහැ. මේක ඉස්සරහාට ලොකු ගැටුම්කාරී තත්ත්වයක් වෙන්න ඉඩ තිබෙනවා. ඒක නිසා මම අධ්‍යාපන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේදී මීටත් වැඩිය මම තේරුම් කරලා දෙනවා. කොපමණ වැඩ තියෙනවාද කියලා. මම මේක ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයේදී කියන්නේ, ආණ්ඩුකාරතුමා විශේෂයෙන් මේක බලනවා. අපි කථා කරන හැම දෙයක්ම ආණ්ඩුකාරතුමාගේ කණට යනවා. මේක තේරුම් අරගෙන ඉන්න ඕනෑ. ඒ නිසා මේ වාගේ නිලධාරීන් ඉන්නවා නම්, වහාම ක්‍රියා මාර්ගයක් ගන්න. මේකට මොනවාද කරන්න ඕනෑ? නැත්නම් ඒ අය ගෙනැල්ලා සාකච්ඡා මාර්ගයෙන් කියලා හරි, ඒ කලාපයේ මන්ත්‍රී කණ්ඩායම ගෙනැල්ලා සාකච්ඡා කරලා මේක හරි ක්‍රමයට හදන්න ඕනෑ. අපි කාත් එක්කවත් ඊර්ෂ්‍යාවෙන් නොවෙයි, කා එක්කවත් කෙළ ගන්න අපට අවශ්‍යතාවයක් නැහැ. ජනතාව අපෙන් අහනවා. මන්ත්‍රීතුමා මේ ඉස්කෝලයේ උත්සවයක් තිබෙනවා. ඔබතුමා ජේන්න නැහැ නේ?ඔබතුමා සභාවට යන්නේ නැද්ද? ඇයි ඔබතුමා ඉස්කෝලයට එන්නේ නැත්තේ? මේ ක්‍රියා මාර්ගය වැරැදියි. මේක කරන්නේ නිලධාරීන්. මන්ත්‍රීවරුන්ගේ වරදක් නොවෙයි. නිලධාරීන් කරන වැරැදි. නිලධාරීන් වැරැදි කරනවා නම් ඇමැතිතුමන්ලා දැන ගන්න ඕනෑ ඒ වැරැදි ටික හදාගන්න. ඇමැති මණ්ඩලය කියන්නේ, අපි ආණ්ඩුකාරතුමා ළඟට උස්සගෙන දුවනවා කියලා. ඒකයි මම කථා කරන්නේ. ඒක නිසා මම කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන් අපට වැරැදි

දේවල් තිබෙනවා. සභාවේ පොඩි පොඩි වැරැදි තිබෙනවා. ඒක අපට හදාගෙන යන්න පුළුවන්. මේක යහපාලන ආණ්ඩුවක්. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් වුණාට, එක්සත් ජාතික පක්ෂයේ සහායෙන් තමයි ජනාධිපතිතුමා වෙලා ඉන්නේ. එක්සත් ජාතික පක්ෂයේ 99% ක් ඡන්දයෙන් අතිගරු ජනාධිපතිතුමාව පත් කළේ. ජනාධිපතිතුමා මාර්ගයෙන් ආපු ආණ්ඩුකාරතුමා තමයි අද බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාවරයා වශයෙන් ඉන්නේ. කාටවත් කියන්න බැහැ අපි 66 ක් ඉන්නවා. අපි 74 ක් ඉන්නවා කියලා. අපිත් ඉන්නවා. මෙවර මොන ප්‍රශ්න ආවත් මේ ඇමැති මණ්ඩලයත්, මහ ඇමැතිතුමාත් ආරක්ෂා කරන්න එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම ඉන්නවා. අපි විරුද්ධත්වයක් පෙන්වන්නේත් නැහැ. අපට ඕනෑ බස්නාහිර පළාත් සභාවට වැඩක් කරන්න. අපට උදව් ඉල්ලලා හරි යන්නේත් නැහැ. අපි කාටවත් බය ගන්වන්නේත් නැහැ. කරන්නේ නැත්නම් තමයි ඊට පස්සේ අනිත් එක තියෙන්නේ. ඒකත් අපේ අතේ තිබෙන්නේ. ඒක නිසා මට මේ වෙලාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 10.35]

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම මතක් කරන්නට ඕනෑ දීර්ඝ කාලයක් පළාත් සභාවේ හිටපු කෙනෙක් හැටියට විශේෂයෙන් අද ආණ්ඩුකාර ධූරය පිළිබඳව - පළාත් සභාව පවුලක් නම් ඒ පවුලේ ගෘහ මූලිකයා තමයි ආණ්ඩුකාරතුමා. මේ ආණ්ඩුකාරතුමා නියෝජනය වෙන්නේ ඇත්ත වශයෙන් රටේ ජනාධිපතිතුමාගේ නියෝජිතයා හැටියට. ඒ නිසා රටේ ජනාධිපතිතුමා අපේක්ෂා කරන, ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති, ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ, ගමන් මාර්ගය, සැලසුම් ජාතික වැඩ සටහන් සියල්ල පළාත් සභාවේ භාවිතා කරන්නේ, නියාමනය කරන්නේ, ක්‍රියාත්මක කරන්නේ ආණ්ඩුකාරතුමා. ඒ නිසා මම සාමාන්‍ය පුරවැසියෙක් හැටියට, පාසල් ශිෂ්‍යයෙක් හැටියට ඉන්න කාලයේ ඉඳලාම මේ ආණ්ඩුකාරවරයා කියන කාරණාවට ටිකක් හිත ගිය කෙනෙක්. ඒ නිසාවෙන් මට ස්වභාවික අත්දැකීමට ආණ්ඩුකාරතුමාව හඳුනාගන්න පුළුවන් වුණේ පළාත් සභාවට මන්ත්‍රීවරයෙක් හැටියට ආපු කාලේ. මම මන්ත්‍රීවරයෙක් හැටියට, නියෝජ්‍ය සභාපති කෙනෙක් හැටියට, සභානායක වරයෙක් හැටියට, දැන් නම් මේ දෙවැනි ඇමැති ධූරය. කලින් සෞඛ්‍ය ඇමැති. මේ කාලය තුළ ආණ්ඩුකාරයා කියන කාරණාව පිළිබඳව සුවිශේෂී අවධානයක් තිබුණා.

මම මතක් කරන්න ඕනෑ. ඉගෙන ගන්න කාලයේත් මට ආණ්ඩුකාරවරයා කියන තනතුර පිළිබඳව ලොකු ඇල්මක් තිබුණා. බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය වුණු, යටත් විජිත පාලන සමයේ අපේ ලංකාව ඉංග්‍රීසි ජාතීන්ට නතු වුණු කාලයේ ඉඳලා තමයි මේ ආණ්ඩුකාර ධූරය තිබුණේ. මම ඊයේ රාත්‍රියේත් මේ සම්බන්ධයෙන් තොරතුරක් ගත්තා. මොකද, ක්‍රි.ව. 1795 තමයි ලංකාවේ ආණ්ඩුකාරවරු - මේක නිකම් නොවෙයි කියන්නේ. බ්‍රිතාන්‍ය ලංකාවේ ආණ්ඩුකාරවරු. මොකද, එතකොට ස්වෛරීත්වය, ස්වාධීනත්වය එහෙම අපට තිබුණේ නැහැ. අපට 1947 ඇති වුණු ගිවිසුම් ප්‍රකාරව,1948 ලැබුණු නිදහස, 1972 ඇති වුණු ව්‍යවස්ථාපිත තත්ත්වයත් එක්ක තමයි අපට ස්වෛරී, නිදහස් රාජ්‍යයක් ලැබුණේ. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කළේ, අද වර්තමානයේ මගේ ජන්ම භූමිය වන, අද දේශපාලන වගකීම දරන අගලවත්ත ආසනයේ හිටපු සංවිධායක, හිටපු අමාත්‍ය, ව්‍යවස්ථා සම්පාදකට කටයුතු ඇමැතිවරයා, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා කියන විශිෂ්ට ගණයේ දේශපාලඥයා. ඒ නිසාවෙන් 1795 මේ ආණ්ඩුකාර ධූරය පිහිටෙව්වේ. මේක අහෝසි වුණේ 1948 පෙබරවාරි 04 වැනිදා. 1796 බ්‍රිතාන්‍ය හමුදාව ලංකාව නතු කරගත්තු දවසේ ඉඳලා - 1796 දී තමයි ෆෙඩ්රික් නෝත් ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිත පාලනය, රැජිනගේ වගකීම ලංකාවේ බැලගැන්නුවේ. රැජිනගේ වගකීම. ඒ ආපු ආණ්ඩුකාරවරු ප්‍රමාණය. 1798 ඉඳලා ආණ්ඩුකාරවරු 29 ක් සහ වැඩ බලන ආණ්ඩුකාරවරු 24 දෙනෙක් හිටියා. 1948 පෙබරවාරි 04 දක්වාම. මම මතක් කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,කොළඹ ප්‍රදේශයේ බැලුවොත් හුඟක් මංවාවත් තවම තිබෙන්නේ, අපේ පැරණි ආණ්ඩුකාරවරුන්ගේ නාමයන්වලින්. ෆෙඩ්රික් නෝත් ආණ්ඩුකාරවරයා 1798. ශ්‍රීමත් තෝමස් මේට්ලඩ්. මේට්ලඩ් පෙදෙස කියලා එකක් තියෙනවා. එතකොට රොබට් බ්‍රවුන්රිග්. එඩ්වඩ් පැජට්. පැජට් රෝඩ් කියලා එකක් තිබෙනවා. අපි කවුරුත් පැජට් රෝඩ් එක දන්නවා. ඒ වාගේම මම කියන්න ඕනෑ එඩ්වඩ් බාන්ස්.

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

බාන්ස් ප්ලේස් තියෙනවා. තවම අපේ කටහඬේ තිබෙනවා. හෝර්ටන් ප්ලේස් තියෙනවා. මොකද, එතුමාගේ නම රොබට් ජෝන් විල්මට් හෝර්ටන්. ජේම්ස් ඇලෙක්සැන්ඩර් ස්ටුවට් මැකෙන්සි. මැකෙන්සි ප්ලේස් තියෙනවා. ඒ වාගේම ශ්‍රීමත් කොලින් කැම්බල්. කැම්බල් පාර්ක් තිබෙනවා. ටොරින්ටන් ප්ලේස් තියෙනවා. ටොරින්ටන් සාමිවරයා. ටොරින්ටන් සාමිවරයා හිටියේ 1847. 1847 තමයි එතුමා ආණ්ඩුකාරවරයා හැටියට බ්‍රිතාන්‍ය කිරීටය යටතේ ලංකාවේ පාලන අධිකාරිය සිදු කළේ. ඒ වාගේම ශ්‍රීමත් ජෝන් විලියම් ඇන්ඩර්සන්. ඇන්ඩර්සන් ප්ලේසස් කියලා හරියට ප්ලේස් තුන හතරක් තිබෙනවා. මම හිතන්නේ අපේ මන්ත්‍රීතුමා ඉන්න පළාතේත්, දෙහිවල පැත්තේත් ඇන්ඩර්සන් ප්ලේස් කියලා එකක් තිබෙනවා. ඒ වාගේම හෙන්රි ජෝර්ජ් වෝඩ්. වෝඩ් ප්ලේස්. ඔබතුමන්ලා දන්නවා වෝඩ් ප්ලේස්. වෝඩ් ප්ලේස් එකේ තමයි හුඟක් විශ්ව විද්‍යාල දරුවෝ සටන් මෙහෙය වන්නේ. උසස් අධ්‍යාපන ආයතනය.

මට මතකයි ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අභාවප්‍රාප්ත වුණු වෙලාවේ මම ගියා. මොකද, ඊට මෙහා පැත්තේ වෝඩ් ප්ලේස් එකේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට කලක ලලිත් ඇතුලත්මුදලි ඇමැතිතුමා හිටියා. මම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය නායකයෙක් හැටියට එදා ගිය වෙලාවේ මට කිව්වා. මල්ලි, මම අද ඇඩ්වර්ගාර්ඩ් වැඩක් කරන්නේ. මොකද, මට ඔයගොල්ලෝ කියන දේවල් තේරෙනවා. අපි ගිය කාලේ මහපොළ ආධාර මුදල වැඩි කරන්න - එතුමා මහපොළ නිර්මාතෘවරයා. මම අදත් ගෞරවයෙන් සිහිපත් කරනවා. විශ්ව විද්‍යාල දරුවන්ට විශාල මෙහෙවරක් කළා. ඒ වෝඩ් ප්ලේස්. ඊළඟට - වැඩියම කියන්නත් හොඳ නැහැ. විලියම් හෙන්රි ග්‍රෙගරි. ග්‍රෙගරි ප්ලේස්. මේ කවුරුත් දන්නවා නේ? අපි එන්නේ. ඒ වාගේම අනෙක් පැත්තෙන් ලොන්ඩන්. ශ්‍රීමත් ජේම්ස් රොබට් ලොන්ඩන්. ලොන්ඩන් ප්ලේස් තියෙනවා. හැමිල්ටන් ප්ලේස් තියෙනවා. හැව්ලොක් ප්ලේස් තියෙනවා. ආතර් එලිබෑන්ක් හැව්ලොක් ආණ්ඩුකාරවරයා 1890 තමයි ලංකාවේ මේ පාලනයට නතු වුණේ. ජෝශප් වෙස්ට් රිජ්වේ. ඉතින් මේ පහු කාලයේ මේ ආණ්ඩුකාරවරුන්ගේ (බාධා කිරීමක්) නාමයන් ඔක්කෝම තියෙනවා. මේ ඔක්කෝම කියන්න ගියොත් හෙට එළි වෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා අපේ ආණ්ඩුකාරතුමා ළඟට එනකොට කාලය අවසන් වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩි 15 ක් දුන්නා. බය වෙන්න එපා. මම හරියට කථා කරන්නම්. කිසි දේකට බය වෙන්න එපා. මම විනාඩි 15 න් හරියට කථා කරන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අලවි මවුලානා මාවත කොහේද තියෙන්නේ?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි එහෙම මාවතක් දානවා. ඔබතුමා බලාගෙන ඉන්න. අවංකවම දානවා. අලවි මවුලානා කියන්නේ කම්කරු නායකයෙක්. එතුමා කම්කරු නායකයෙක් හැටියට මේ රටේ ප්‍රතිගාමී බලවේගවලින් මහ පාරේ මැද පහර කාලා, කම්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කරපු විශිෂ්ට ගණයේ කම්කරු නායකයෙක් තමයි අපේ පළාත් සභාවේ ආණ්ඩුකාර ධූරයට පත් වුණේ. අවංකවම කියන්න ඕනෑ. අල්හාජ් අලවි මවුලානා මැතිතුමා. අපි ඒකත් ඉස්සරහාදී නම් කරනවා. එතකොට මේ වාගේ හුඟක් තිබෙනවා. එතකොට අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා කිව්වා වාගේ මේවා වැඩිය කියන්න හොඳ නැහැ. ඒ නිසාවෙන් අපි මතක් කරන්න ඕනෑ, මේ ආණ්ඩුකාරවරුන්ගේ කාලය තුළ ඇත්තටම රටේ පාලනය තිබුණේ බ්‍රිතාන්‍ය යටතේ. විශේෂයෙන් මම කියන්න ඕනෑ, දෙවැනි ලෝක යුද්ධය කාලයේදී ලංකාවට පැමිණියා අද්මිරාල් ශ්‍රීමත් ජෙෆ්රි ලේටන්. මේ ලේටන් ආණ්ඩුකාරවරයා තමයි ඒ කාලයේ - මම දේශනයක් කරන්න කැමැති නැහැ. නමුත් මම මේකට ආශ කරන නිසා කිව්වේ. ඒ කාලේ එතුමා තමයි ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කුලපති හැටියට - එතකොට විශ්ව විද්‍යාල දෙකක් තිබුණේ. මේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ඉගෙන ගත්තෙත් කොළඹ විශ්ව විද්‍යාලයේ. පේරාදෙණිය සහ කොළඹ විතරයි තිබුණේ. මොකද, රෝයල් කොලේජ් එකෙන් කැඩිලා පස්සේ තමයි කොළඹ විශ්ව විද්‍යාලය ආවේ. ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ ළඟින් ලස්සන

යුවතියක් වාඩි වෙලා හිටපු කථාවකුත් ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ඉතිහාසයේ සඳහන් කරලා තිබෙනවා. අර බෙන්ච් එකක, ගල් බංකුවක ජේ.ආර්. ජයවර්ධන මහත්තයා තරුණයෙක් හැටියට, විශ්ව විද්‍යාලයේ නීතිඥ අධ්‍යාපනය ලබපු කෙනෙක් හැටියට බංකුවක වාඩි වෙලා ලස්සන යුවතියක් එක්ක සුන්දර ආදරණීය වදන් දෙඩූ බවක් තමයි ඒකේ සඳහන් වෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ කාලේ ශ්‍රීනාත් පෙරේරා මහත්තයා හිටියේ නැද්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ශ්‍රීනාත් පෙරේරා මහත්තයාත් ඉන්න ඇති. ශ්‍රීනාත් පෙරේරා මහත්තයාටත් ඒ ආදරය සහ සෙනෙහස සමානයි කියලා මම විශ්වාස කරනවා. එතුමා විශේෂයෙන්ම මම අගය කරන කෙනෙක්. මොකද, එතුමා මේ රටේ ජනතාවට ආදරය කරන්න දන්න කෙනෙක්. ඒ නිසාවෙන් මම අද මතක් කරන්නට ඕනෑ, ලංකාව 1948 පෙබරවාරි 04 වැනිදා ඉඳලා 1949 ජුලි 06 වැනිදා දක්වා සර් හෙන්ඩ්‍රි මේසන් මුවර්. දැන් ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, ව්‍යවස්ථාදායක සභාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩි 05 ක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හැබැයි මට පේන හැටියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ වේලාවයි, මගේ වේලාවයි දෙකක් හැටියට මට පේන්නේ. දැන් ඊයේ ඉඳලා මගේ වෙලාව හොඳයි. ඒ නිසා අපේ ලංකාවේ අණ්ඩුකාරවරු පත් වෙලා, පත් වෙලා ඔබතුමන්ලාට මතක ඇති සර් විලියම් ගොපල්ලව ආණ්ඩුකාරතුමා. එතැනින් තමයි ජනරජ ව්‍යවස්ථාවත් එක්ක අග්‍රාණ්ඩුකාර ධූරය වෙනස් වුණේ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක බස්නාහිර පළාත් සභාවට 1988 දී ශර්වානන්ද ආණ්ඩුකාරතුමා පත් වුණා. එතකොට දැන් අපේ කැබිනට් ඇමැතිතුමා ඉන්නවා. එතුමා ස්වාමිනාදන් ආණ්ඩුකාරතුමා. එතුමා දෙවැනියාට පත් වුණේ. ඒ වාගේම වික්නරාජා ආණ්ඩුකාරතුමා. අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක්. පී. රාමනාදන් ආණ්ඩුකාරතුමා. මට මෙන්න මෙතැන පොඩි කෘතවේදීත්වයක් තිබෙනවා. පී.රාමනාදන් ආණ්ඩුකාරතුමා පත් වුණේ - මේ රටේ නිදහස් අරගලය සිංහල,ද්‍රවිඩ, මුස්ලිම් සියලුම නායකයින්ගේ දැඩි කැපවීමකින් දිනා ගත්තු නිදහසක්. මේ පී. රාමනාදන් ආණ්ඩුකාරතුමාගේ සීයා පොන්නම්බලන් රාමනාදන් අපේ නිදහස් අරගලයේ විශිෂ්ට නායකයෙක්. එතුමාගේ මුනුබුරා තමයි රාමනාදන් ආණ්ඩුකාරතුමා. මම මතක් කරන්න ඕනෑ අපේ හිටපු විපක්ෂ නායක ඇල්මන් පීරිස් මැතිතුමා. හිටපු ඇමැතිතුමටයි, අපටයි ඒ කාලේ ටෙලිෆෝන් එකට ලැබුණේ රුපියල් 2500 යි. ඉතින් අපට මේක මදි. අපි හැමදාම මේකට රණ්ඩු වෙනවා. රණ්ඩු වුණාම අපේ රුපියල් 2500 - නේද තිලකසිරි ඇමැතිතුමා?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඔව්. ඔව්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඊට පස්සේ 3000, 3500 අන්තිමට විශිෂ්ට ගණයේ සේවයක් කළා. අද ඉන්න ආණ්ඩුකාරතුමාට වුණත් ඒක ආදර්ශයක්. අපට කිව්වා. මට මතකයි සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, හුඟක් අය කථා කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාද අපට ලැබෙන්නේ නැහැයි කියලා. අපට මෙන්න මෙතැනදී තමයි රාමනාදන් ආණ්ඩුකාරතුමා, සම්පූර්ණ Full free, ඒ කියන්නේ සම්පූර්ණයෙන් නිදහස් දුරකථනයක් දුන්නා. දැන් ඔබතුමන්ලා දන්නේ නැති වුණාට පසුගිය කාලයේ මේක උදුර ගත්තා. මේක උදුර ගත්තා කියන්නේ මන්ත්‍රීවරුන්ට ටොෆි දුන්නා. 20,000 ක් දෙන්නම්. 15,000 ක් දෙන්නම්. දැන් ඔබතුමන්ලා ගන්න. ඔබතුමන්ලාට ලැබුණු නිදහස් දුරකථනය ඔබතුමන්ලා බද්දට දීලා - බද්දට කියන්නේ ආපහු දුන්නා. පළාත් සභාවට දීලා මම හිතන්නේ ඔබතුමන්ලා 15,000 ක හරි 20,000 ක හරි දීමනාවක් ලබනවා ඇති. මම දන්නේ නැහැ. මගේ ළඟ විතරක් අනුස්මරණීය දුරකථනයක් තිබෙනවා. මම කිව්වා මේක මම දෙන්නේ නැහැ. මේකට මමයි ඇල්මන් පීරිස් ඇමැතිතුමයි තමයි වැඩියෙන්ම සටන් කළේ. අපි මේක ගත්තේ මන්ත්‍රීවරු වෙනුවෙන්. මේක දුන්නේ රාමනාදන්

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

ආණ්ඩුකාරතුමා. ඒකයි අද මට කථා කරන්න ආස හිතුණේ. ඒ දීපු ටෙලිෆෝන් එක මගේ ළඟ තවමත් තිබෙනවා. මම මේ පළාත් සභාවේ ඉන්න තාක්කල් මම ඒක පළාත් සභාවට දෙන්නේ නැහැ. මට මේකෙන් ඕනෑ තරම් Call ගන්න පුළුවන්. මම එහෙම ගන්නේ නැහැ. ඕනෑතරම් ගන්න පුළුවන්. මම ගන්නේ නැහැ. ඉතින් ගන්න වෙලාවකුත් නැහැ නේ? ඊළඟට අපේ අලවි මවුලානා මැතිතුමා සහ අද ඉන්න ලෝගේස්වරන් ආණ්ඩුකාරතුමා ගැන මම කියන්න ඕනෑ. සර් කියලා කට පුරා කියන්න පුළුවන් ආණ්ඩුකාරවරයෙක් අද අපට ඉන්නවා. මෙතුමා අපේ පළාත් සභාවේ ආණ්ඩුකාර ධූරයට පත් වුණාට පස්සේ එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ එතුමාගේ වැඩ පිළිවෙළ අපට ගෙනාවා. මට මතකයි එතුමා ඉතාම ග්‍රාමීය, සුන්දර ප්‍රස්ථා පිරුළු කිහිපයක් ගෙනාවා. මට ගම්පහ ලස්සන දියණියක් ඉන්නවා. එයාට හොඳට ධන ධාන්‍ය තියෙනවා. කොළඹත් ඉන්නවා. එයාට නරක නැහැ. මගේ දුප්පත්ම දියණිය ඉන්නේ කළුතර. කළුතර ඉන්න ජනතාවට, කළුතර ඉන්න දරුවන්ට අනන්ත අප්‍රමාණ ගැටළු තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ප්‍රශ්න තිබෙනවා. සංවර්ධනයේ බොහොම අපහසුතාවයන්ට ගොදුරු වුණු පළාතක්. හැබැයි කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කථා කරනවා නම් ඔය වෙලාව ගැන රණ්ඩු වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට කරන්න දෙයක් නැහැ. දීපු කාලයත් එක්ක ඔබතුමාට විනාඩි 15 ක් දුන්නා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කථා කරන්න හිටියෙත් නැහැ. මම ඒකත් කියන්න එපැයි. මෙතැනට ආවාම කිව්වා කථා කරන්න කට්ටිය නැහැයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට කියන්න තව කාලය වැඩි කරන්න කියලා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ, නැහැ. කථා කරන්න අය නැහැයි කිව්වාම මම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මූලාසනයට කරන්න පුළුවන් උපරිම කාර්යය තමයි ඔබතුමාට තව විනාඩියයි තියෙන්නේ. විනාඩි 15 ක් ලබා දුන්නා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

මගෙන් විනාඩි 05 ක් දෙන්න.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

මහ ඇමැතිතුමාගෙන් විනාඩි 05 ක් ලබා දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි දෙන්නා කොහොමටත් යාළුවෝ. මම කියන්න ඕනෑ අද ආණ්ඩුකාරතුමා අපට පියෙක් වාගේ වැඩ කරන කෙනෙක්. මේ රාජ්‍ය පරිපාලන සේවයේ ඉතාම ඉහළ තනතුරු හොබවලා අත්දැකීම් බහුල කෙනෙක්. ඒක කියන්න ඕනෑ. ඒ නිසාවෙන් අපේ ශර්වානන්ද ආණ්ඩුකාරතුමාගේ කාලයේ හොඳ වැඩ පිළිවෙළක් තිබුණා. එතුමා හැම සති අන්තයේම සාකච්ඡාවක් සංවිධානය කළා. අමාත්‍යංශ ලේකම්වරු, ඇමැතිවරු ගෙනැල්ලා සාකච්ඡා කරලා ඒ සාකච්ඡාව තුළින් එතුමා හොඳ සංහිඳියාවක් ඇති කළා. දැන් එක්කෙනෙක් ඇවිල්ලා තව කෙනෙකුට කේලමක් කිව්වාම දැන් ඒක ලියලලා අතු රිකිලි දානවා. ඉතින් එලොව ගිහින් මෙලොව ආපු කතන්දර තමයි පස්සේ ආවේ. මොකද, ගිහිල්ලා කියනවා, ඔයාට මෙහෙම නේ? ඔයාට අහවලා මෙහෙම කිව්වා. ඒවා මුකුත් නැහැ. අපේ ශර්වානන්ද ආණ්ඩුකාරතුමා ඉන්න කොට හැම සති අන්තයේම ඉතා හොඳ සංහිඳියාවක් කළා. ඒ වාගේම අද

ඉන්න ආණ්ඩුකාරතුමාත් හොඳ දක්ෂ ආණ්ඩුකාරතුමෙක්. මම මතක් කරන්න ඕනෑ. මම එතුමාව හම්බ වුණු හැම වෙලාවේම එතුමා ඉතා කාරුණිකව අපට සහයෝගය දුන්නා. විශේෂයෙන් අපේ කැකෑරෙන ප්‍රශ්නයක් තිබෙනවා. දමිළ මාධ්‍ය දරුවන් වෙනුවෙන් මට ලොකු වගකීමක් තිබෙනවා. මම දින තුනක් සාකච්ඡා කළා. සාකච්ඡා කළ හැම වෙලාවේම එතුමා මට සහයෝගය දුන්නා. දැන් මේ දවස්වල දමිළ ගුරුවරුන් බඳවා ගැනීම සඳහා අපි අයදුම්පත් කැඳවලා දැන් දින අවසන්. මේ දවස්වල ලඟි ලඟියේ සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. එතකොට මට සම්පූර්ණ සහයෝගය දුන්නා. දීර්ඝ කාලයක් හොඳ නොවුණු තුවාලයක්. ඒ වාගේම අපි විශේෂ ව්‍යාපෘතියක් සකස් කළා. මගේ සහෝදර මන්ත්‍රීවරු සහභාගී වුණා. ඒ තමයි දමිළ මාධ්‍ය දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු නංවන්න විශේෂ ව්‍යාපෘතියක් හැදුවා. මොකද, අපට ලැබෙන ප්‍රතිපාදන මදී නිසාවෙන්. මම විශ්වාස කරනවා, එතුමා හොඳ දක්ෂ ආණ්ඩුකාරවරයෙක්. අපට හොඳට ඇහුම්කන් දීමක් කළා. අපි ඒක අගය කරනවා.

ඒ වාගේම අපේ පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය ගැන වචනයක් කියන්න ඕනෑ. මොකද, මම නම් දන්නවා. මම හිටපු සභානායක. නියෝජ්‍ය සභාපති. මගෙත් එක්ක හොඳටම වැඩ කළා අපේ හිටපු නිලධාරීන්. ඒ කාලේ හිටපු ඒකනායක මහත්තයාගේ ඉඳලා අද ඉන්න හේමන්ත සමරකෝන් මහත්තයා දක්වාම අපිත් එක්ක හොඳට වැඩ කළා. මේ කාර්යාලයේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමා හැර.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සභාපතිතුමා ටිකක් ගෞරවයට කැමැති කෙනෙක්. මම දන්නවා නේ? සභාපතිතුමා මගේ ගමේම කෙනෙක්. එකම ග්‍රාම සේවක වසමේ. ඔය ගම්පහට ඇවිල්ලා හිටියාට. ඒ නිසාවෙන් සභාපතිතුමා ගෞරවයට කැමැති කෙනෙක්. මම සභාපතිතුමාගේ රාජකාරියත් අවංකවම අගය කරනවා. මම කියන්න ඕනෑ හේමන්ත සමරකෝන් මහත්තයා දක්වාම අපි දිග ගමනයක් ඇවිල්ලා තිබෙනවා. අවුරුදු විසි ගණනක් අපත් එක්ක වැඩ කරපු - මම ළමයි කියලා ඒ අයට ආදරේට කියන්නේ. හුඟක් පල්ලෙහාම ඉන්න සේවකයෝ දක්වාම සභා ලේකම් කාර්යාලයෙන් අපට හොඳ සහයෝගය ලැබෙනවා. මම ඒක අද සතුටෙන් මතක් කරනවා. පුංචි හරි අඩුවක් තිබෙනවා නම් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමනි, අපට මැදිහත්කරුවෝ වෙන්න පුළුවන්. ඒක නිවැරදි කරන්න. ඒ නිසාවෙන් මම මීට වැඩිය අද කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සතුටින් මතක් කරන්න ඕනෑ අපි පැමිණි ගමනේ අපට ලොකු වගකීමක්, ලොකු නායකත්වයක් අපේ සියලු ආණ්ඩුකාරවරුන් දුන්නා. ඒ නිසාවෙන් අද අපේ ආණ්ඩුකාර ධුරයන් දැරූ සමහර ආණ්ඩුකාරතුමන්ලා අද ජීවතුන් අතර නැහැ. ඒක කියන්න ඕනෑ. විශිෂ්ට ගණයේ ආණ්ඩුකාර ධුරයක් හෙබවූවා අලවි මවුලානා මැතිතුමා. ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වාගේම රාමනාදන් ආණ්ඩුකාරතුමා ජීවතුන් අතර නැහැ. මම මේ කියෙව්වාට එංගලන්තේ කට්ටියත් -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැතුව ඇති.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒගොල්ලෝ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එංගලන්තයේ ආණ්ඩුකාරතුමන්ලාත් නැහැ. මම මේ කියන්නේ ඇත්ත. මට වෙනම දවසක් දෙනවා නම් මේකට උපදේශනයක් දෙන්න (බාධා කිරීමක්) ආණ්ඩුකාරවරුන්ගේ කාර්ය භාරය සහ ඔවුන්ගේ වගකීම පැහැදිලි කරනවා. අපි නිදහස දිනාගත්තු හැටි. ව්‍යවස්ථාදායක සභාව. ඒ හරහා ගොඩ නැඟුණු වැඩ පිළිවෙළවල්. ඩී.එස්. සේනානායක මහත්මයා, සර් ජෝන් කොතලාවල මහත්මයා, බණ්ඩාරනායක මහත්මයා, ඩී.ඒ. රාජපක්ෂ මහත්මයා, ලලිත් ඇතුලත්මුදලි මහත්තයාගේ පියාණන් ඩී.ඩී. ඇතුලත්මුදලිලා මේ ආපු ගමන් මග අපට පැහැදිලි කරන්න පුළුවන්. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.55]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න නොවෙයි හිටියේ. නමුත් මට ඊයේ රාත්‍රියේ හිතුණා, මේ වෙනුවෙන් විනාඩියක් හරි කථා කරන්න ඕනෑ කියලා. ඒ අනුව තමයි මම සංවිධායකතුමාටත් කථා කරලා කිව්වේ මට අවස්ථාවක් දෙන්න. එහෙම කථා කරන්න හේතුව තමයි මේ බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුකාරතුමා හමු වෙලා නැතුව ඇති. නමුත් මම පෞද්ගලිකව ආණ්ඩුකාරතුමා හමුවෙන්න යන කෙනෙක්. මම විවිධ අවශ්‍යතා හා විවිධ කාරණා වෙනුවෙන් එතුමා හම්බ වෙන්න ගිහිල්ලා තිබෙනවා. ඉතින් මගේ වගකීමක් සහ යුතුමක් තිබෙනවා එතුමා වෙනුවෙන් යම් හෝ වචනයක් කථා කරන්න. එතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන්. ඒ වාගේම සභා කටයුතු කාර්යාලය වෙනුවෙන්. ඒ නිසා තමයි මම අවස්ථාව ලබා ගත්තේ.

ඉතින් විශේෂයෙන් අපේ ගරු ඇමැතිතුමා කියන කොට අපට ආණ්ඩුකාරවරු ගැන ලොකු සතුටක් ඇති වුණා. යම් අධිරාජ්‍යවාදී යුගයක මේ රටේ හිටපු ආණ්ඩුකාරවරු ගැන. මට ඒ අවස්ථාවේ මතක් වුණා අපේ ඇමැතිතුමා අසවේදු ගැන කිව්වේ නැහැ. නුවර ගිනි බත් කරපු, බදුවලට විරුද්ධව ආපු ටොරින්ටන් ආණ්ඩුකාරවරයා මිනිස්සු දහස් ගණනක් මරපු හැටි කිව්වේ නැහැ. ආණ්ඩුකාරවයෙක් කිව්වාම අපට චිත්‍ර ගණනාවක් මැවෙනවා. එතකොට ඒ අනුව තමයි මේ ආණ්ඩුකාරවරයා කියන චරිතය අපි දකින්නේ. ඉතින් අපි මේ පළාත් සභාවට ආවට පස්සේ තමයි ආණ්ඩුකාරවරයා ගැන අවබෝධය අපට ලැබෙන්නේ. ඉතින් ඒ අනුව ආණ්ඩුකාරවරයාගේ කාර්ය භාරය මොකක්ද කියන එක අපි දන්නේ නැහැ. නමුත් මේ පළාත් සභාවට ආපු මුල් යුගයේ අපිත් හිතුවා ආණ්ඩුකාරතුමා කියන්නේ, මේකට පරිබාහිරව කටයුතු කරන, මේකට යම් යම් ගෙන එන තීන්දු තීරණවලට යම් අදහස් දක්වන, අපේ තිබෙන වරප්‍රසාද උල්ලංඝණය කරන්න කටයුතු කරන කෙනෙක් කියන එක. අපට මන්ත්‍රීවරු වශයෙන් හිතන්න පුළුවන්. ඉතින් මා හැමදාමත් විශ්වාස කරන දේ තමයි අපට තිබෙන වගකීම අපි ඉටු කරන්නට ඕනෑ. මන්ත්‍රීතුමන්ලා වශයෙන් අපේ වගකීම අපි හොඳින් තේරුම් ගන්නට ඕනෑ. බස්නාහිර පළාත් සභාව කියන්නේ මොකක්ද? අපේ වගකීම තේරුම් ගන්නට ඕනෑ. ආණ්ඩුකාරවරයා සහ ඇමැතිතුමන්ලා තම තමන්ගේ වගකීම් තේරුම් ගන්නට ඕනෑ. අපත් සමග සබඳතාවයක් ගොඩනැගෙන්නට ඕනෑ. ඒ අනුව අපේ බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා නේ, කෙනෙකුගේ ක්‍රියාව තමයි වැදගත් වෙන්නේ. ඔහු හොඳ මිනිහෙක්ද, වසලයෙක්ද, බ්‍රාහ්මණයෙක්ද වෙන්නේ ක්‍රියාව අනුව. එතකොට ආණ්ඩුකාරවරයා කියන පුද්ගලයා කෙරෙහි අපි දුර ඉඳලා බලලා තීන්දු කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ විශ්වාසය අපි ගොඩ නැඟුවා. ආණ්ඩුකාරවරයා කියන්නේ මෙහෙම කෙනෙක් කියලා. නමුත් අවසානයේ ඔහු ළඟට ගියාට පස්සේ තමයි තේරුණේ මේ ආණ්ඩුකාරවරයා කියන්නේ මේ ජන සමාජයේ අපි අගය කරන්නට ඕනෑ, ඉතාම මහත්මා ගතිගුණවලින් හෙබි ඉතාමත් නිහතමානී පුද්ගලයෙක් බව. ඕනෑම කෙනෙකුට හොඳට ඇහුම්කන් දෙනවා. මිත්‍රශීලීත්වය ඇති කරගෙන, ඒ කාරණය හොඳට තේරුම් අරගෙන ඒ වෙලාවේම තමන්ගේ නිලධාරීන් කැඳවලා තීන්දු කරනවා මෙන්න මේ අයුරින් කටයුතු කරන්න කියලා. සානුකම්පිතභාවය හොඳින් තිබෙන හොඳ ආණ්ඩුකාරවරයෙක්. ඒ නිසා එතුමාට ඒ ගෞරවය අපි දෙන්නට ඕනෑ. එතුමා මේ ආයතනය තුළ අපේ මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් කටයුතු කරන්න උත්සාහ කරනවා. අපේ අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පළාත් සභාවේ අපි යම්කිසි කරීකාවතක් ගත්තොත් එතුමා ඒක කියවනවා. ඒ ගැන අවබෝධය ලබා ගන්නවා. ඇමැතිතුමා කිව්වා වාගේ අනෙක් ආණ්ඩුකාරවරුන්ට වඩා ඉදිරියට ගිහිල්ලා මේ වපසරිය පිළිබඳව අවබෝධයක් ඇතුව - මමත් ගිය වෙලාවක මම කථා කළාම කිව්වා මන්ත්‍රීතුමා, අපට කළුතර පැත්තේ තමයි ගැටළුව තිබෙන්නේ. දුෂ්කර ප්‍රදේශ. ඒ ප්‍රදේශවලට යම් යම් සංවර්ධනයන් ගෙන එන්නට ඕනෑ කියලා. ඒ නිසා මට මතක් වෙන්නේ හුණුවටයේ කථාව ලියපු බර්ටෝල් බ්‍රෙස්ට් කියන නවකථාකරුවා. ඔහු ඒ කථාවේ කියන්නේ,

දෙයක් වේ නම් යම්
ලැබිය යුත්තේ සුදුස්සෙක්මය
මව් ගුණ ඇති අය
දරුවන් දිනිය යුතුමය
රියදුරු මනා වූ
ලැබිය යුතුමය අස්රිය කියලා

එතකොට ආණ්ඩුකාරතුමා ළඟට ගිය වෙලාවේ මෙන්න මේක යථාර්ථයක් වුණා. ඔහුගේ තිබෙන ඒ කාර්ය භාරය

අම්මා කෙනෙක් වාගේ, හොඳ රියදුරෙක් වාගේ මේ බස්නාහිර පළාත් සභාව හරි තැනට ගෙනියන්න උත්සාහ කරනවා. එහෙම නම් එතුමා ගන්න උත්සාහයට අපි පළාතේ සභාව වශයෙන් අපි කොහොමද අනුගත වෙන්නේ? අපි කොහොමද මහජනතාවට සේවාවන් සපයන්න කටයුතු කරන්නේ කියන එක මම නැවතත් අවධාරණය කරනවා. අපි මහජනතාවගේ ඡන්දයෙන් ඇවිල්ලා ඒ වරප්‍රසාදවලට ගොනු වෙලා අපි යම් යම් අඩුපාඩු සිදු කරමින් බස්නාහිර පළාත් සභාව ගෙනියන්න බැහැ. ආණ්ඩුකාරතුමාගේ ඉඳලා අපි සියලු දෙනා දම්වැලක පුරුක් වාගේ එකට එක් වෙලා, ශක්තිමත් වෙලා තමයි මේ අභිමානය ගොඩ නගන්න පුළුන්කම ඇති වෙන්නේ. ඒ නිසා මම දීර්ඝව කථාවක් කරන්න බලාපොරොත්තු නොවෙන්නේ එතුමාට ඒ ගෞරවය දක්වන්නට, ඒ කෘතවේදීභාවය දක්වන්නට අවශ්‍ය නිසා.

ඒ වාගේම තමයි සභා ලේකම් කාර්යාලය. සභා ලේකම් කාර්යාලයත් සමග අපේ නිරන්තර සම්බන්ධතාවයක් තිබෙනවා. අපි ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ නායකත්වය තුළ, ගරු සභාපතිතුමාගේ නායකත්වය තුළ කාර්ය පටිපාටි රීති කාරක සභාවට අපි සතියකට දෙපාරක්, තුන්පාරක් එකතු වෙනවා. අපි පෙත්සම් කාරක සභාවට ඇවිල්ලා ඉතාම නිවැරදිව, ඒ වාගේම වඩාත් සාධාරණ තීන්දු දෙන්න උත්සාහ කරනවා. එතකොට මෙවන් කටයුතුවලට මේ කාරක සභාවලට එනවා. ඒ වාගේම තවත් විවිධ සාකච්ඡාවලට අපි සහභාගී වෙනවා. අපේ ලේකම්තුමා ප්‍රධාන ඒ කාර්ය මණ්ඩලය හොඳ මෙහෙයක් ඉටු කරනවා වාගේම එතැන ගැටළුවක් තිබෙනවා. අද මේ කළමනාකරණ සේවය - රාජ්‍ය සේවය තුළ යම් ප්‍රමාණයකට හෝ දුරස්වන දෙයක් තමයි ලඝු ලේඛන ක්‍රමය. ඉතින් මේවාට නිලධාරීන් ඉන්නවා. මේ අය හරි වැටුප් තලවල පිහිටුවලා නැහැ. මේ අයගේ වැටපු තලය පිළිබඳ ගැටළුවක් තිබෙනවා. මේ අය ලොකු සේවයක් කරනවා. නමුත් මේ ඉහළ නිලධාරීන් මේ ගැන හොයලා බලලා ඒ අයටත් සාධාරණයක් ඉටු කරන්න ඕනෑ. ඒ වාගේම මේ කමිටුවලට - ඊයේ අපේ සිරිකමල් පිලීෂියන්ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා. පළාත් සභාවේ ක්‍රියාත්මක වන යම් යම් කාරක සභාවලට හරි ගෙවීමක් කෙරෙන්නේ නැහැ. අපි ඔබතුමාට පැහැදිලි කළොත් අපි රීති කාරක සභාවට සතියකට දෙපාරක් විතර එනවා. පෙත්සම් කාරක සභාවක් මාසයකට තුන් වතාවක් විතර පැවැත්වෙනවා. අපි බදාදා දවසේ යම් යම් රාජකාරිවලට කොළඹ එන්න ඕනෑ. අපි උපදේශක කාරක සභාවලට එනවා. එහෙම බලනකොට අපි මාසයකට දින 15 ක් 20 ක් පමණ කොළඹ නගරය කරා එනවා. එහෙම එනකොට අපට යම් යම් බාධක කම්කටොළු ගණනාවක් තිබෙනවා. නමුත් අපි මහජනතාව ප්‍රමුඛ කරලා කටයුත කරන නිසා ඒ සියල්ල අමතක කරලා ආවත් යම් වරප්‍රසාදයක් තිබෙනවා නම් ඒවා සභා කටයුතු කාර්යාලයට වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාටත් ලබා දෙන්න කටයුතු කරනවා නම් වඩාත් සුදුසුයි කියන එක මම විශ්වසා කරනවා.

ඒත් එක්කම අපත් සමග වැඩිපුර සම්බන්ධතාවයක් ගොඩ නඟාගෙන නැති වුණත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන කියන්න ඕනෑ. යම් දෙයකට අපට කෙනෙක් කථා කළාම අපි නිරන්තරයෙන් කොමිෂන් සභාවේ ලේකම්තුමියට කථා කරනවා. යම් යම් කාර්යයන් කර ගැනීමට. ඉතින් මේ සබඳතා ටික හොඳට ගොඩ නැඟී තිබෙන නිසා අපට පුළුවන් වුණා ඒ කාර්යාලයෙන් වුණත් වැඩක් කරගන්න. ඒ නිසා මම කියන්නේ රාජ්‍ය සේවය කියන්නේ පරණ ගතානුගතිකභාවයට යන්නේ නැතුව තැපෑලෙන් ඇවිල්ලා, ෆයිල් එකෙන් ඇවිල්ලා, ලියුම ඇවිල්ලා, සීල් එක ගහලා අදාළ නිලධාරියා අතට එන්නේ නැතුව මෙන්න මේ රටේ තිබෙන තාක්ෂණික දියුණුව පාවිච්චි කරලා ඒ තාක්ෂණික දියුණුවත් එක්ක ඒවා අවබෝධ කරගෙන පහළ නිලධාරියාගේ මනස සංවර්ධනය කරලා මේ කාර්යයන් කරන්නට ඕනෑ ගතානුගතික භාවයෙන් නොවෙයි. මෙන්න මේ කාර්යක්ෂමතාවය ඇති කරලා, නවීන ආම්පන්න පාවිච්චි කරලා මෙන්න මේ කාර්යයන් ඉටු කරන්න කියලා කිව්වොත් අපි හිතන්නා වූ යම් යම් ප්‍රමාදයන් අවම කර ගැනීම හැකියාව තිබේ කියන විශ්වාසයත් තිබෙනවා. ඒ නිසා මම දීර්ඝ පැහැදිලි කිරීමක් කරන්න උත්සාහ කරන්නේ නැහැ. මේ වැය ශීර්ෂයේදී මට අවශ්‍යතාවය තිබුණේ ආණ්ඩුකාරතුමාගෙනුත්, සභා ලේකම් කාර්යාලයෙනුත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙනුත් අපට වන සේවය අගය කිරීමයි. ඒ සඳහා අවස්ථාව ලබා දුන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා ප්‍රධාන ඔබ සැමට ස්තූතියි.

[පූ.භා. 11.03]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී පොඩි අදහසක් මතු කළා. මේ සභාවේ මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. නමුත් මේ සභාවේ කටයුතුවලට සක්‍රීයව දායක වන මන්ත්‍රීවරු පිළිබඳව මේ සභාවේ සටහනක් තබා ගන්නවා නම් හොඳයි කියන අදහස එතුමා මතු කළා. ඒ මතු කරපු අවස්ථාවේදී කිව්වා. සමහර මන්ත්‍රීවරුන්ගේ මේසවල තබා තිබෙන හැන්සාඩ් වාර්තාවවත් ගෙනියන්නේ නැහැයි කියලා. ඒක අපි දැකලා තිබෙනවා. ඇත්ත. ඉතින් ඒක නිසා අවස්ථාවක් ලබා දෙන කොට - එතුමාට ඊයේ වුණු අසාධාරණය ගැන තමයි එතුමා කථා කළේ. අවස්ථාවක් ලබා දෙන කොට මන්ත්‍රීවරු පිළිබඳව වැඩිපුර සැලකිලිමත් වෙනවා නම් හොඳයි කියන අදහස තමයි එතුමා දරුවේ. මම හිතන්නේ මගෙත් එකඟතාවය පළ කරමින් විශේෂයෙන්ම අපේ ආණ්ඩුකාරතුමා පිළිබඳවත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ.

අපේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරපු දා ඉඳලා ආණ්ඩුකාරවරු බොහෝ පිරිසක් ඉඳලා තිබෙනවා. බොහොම හොඳ ආණ්ඩුකාරවරු බිහි වෙලා තිබෙනවා. ඒ අතරින් මේ වර්තමාන ආණ්ඩුකාරතුමා අපත් සමග බෙහොම සමීපව කටයුතු කරන ආණ්ඩුකාරවරයෙක් හැටියට අපි දැකලා තිබෙනවා. අපේ තිබෙන අයිතිවාසිකම් ලබා දෙන්න කටයුතු කරන ආණ්ඩුකාරවරයෙක් හැටියට. නමුත් මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරලා, අවුරුදු 27 ත් 28 ක් විතර වෙනවා. අපි ලැජ්ජ වෙන්න ඕනෑ. මේ සභාව එක්සත් ජාතික පක්ෂයට දීලා තිබෙන්නේ අවුරුදු පහයි. ඉතිරි සෑම කාලයක්ම මේ පළාත් සභාව පාලනය කරලා තිබෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයයි. අද වන තෙක් ආණ්ඩුකාරවරයාට ස්ථිර නිල නිවාසයක් නැහැ. අපි ඉන්නේත් කුලියට. ආණ්ඩුකාරවරයා ඉන්නේත් කුලියට. ආණ්ඩුකාර කාර්යාලය පවත්වාගෙන යන්නේත් කුලියට. මට මතකයි, පසුගිය කාලයේ ආණ්ඩුකාරවරයාට තමයි නිල නිවාසය හැදුවේ. ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් සිටින කොට අද ප්‍රධාන අමාත්‍යවරයා පාවිච්චි කරන නිල නිවාසය හැදුවේ, ආණ්ඩුකාරවරයාගේ නිල නිවාසය විධියට. එහෙම තමයි ඒක හැදුවේ. අනිවාර්යෙන්ම ප්‍රධාන අමාත්‍යවරයාටත් නිල නිවාසයක් තිබෙන්න ඕනෑ. ඒ ගැන කිසි තර්කයක් නැහැ. නමුත් හැදුවේ ආණ්ඩුකාරවයාගේ නිල නිවාසය. ඒ වෙලාවේ අලවි මවුලානා මැතිතුමාට නිල නිවාසයක් පිළිබඳව එපමණම ලොකු අවශ්‍යතාවයක් තිබුණේ නැහැයි කියලා එතුමාට නිල නිවාසයට දීමනාවක් දීලා, ඒ නිල නිවාසයේ ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිවරයා පැළපදියම් වුණා. ඒක දිගින් දිගටම යනවා. ඒ ගැන වරදක් නැහැ. නමුත් (බාධා කිරීම්) දැනට ප්‍රධාන අමාත්‍යවරයා පාවිච්චි කරන නිල නිවාසය හැදුවේ ආණ්ඩුකාර නිල නිවාසය විධියට. එදා හැදුවේ. බොහොම පැහැදිලිව ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ කාලයේ නිල නිවාසය හැදුවේ, ආණ්ඩුකාර නිල නිවාසය හැටියට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ බොරුවක්. ඔබතුමා බොරුවක් කියන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නමුත් පස්සේ කාලයක ඒක පරිවර්තනය වුණා ප්‍රධාන අමාත්‍ය නිල නිවාසය කියලා. ඒක වරදක් නොවෙයි මම කියන්නේ. මම කියන්නේ, ආණ්ඩුකාර නිල නිවාසයක් අත්‍යවශ්‍යයි කියන එකයි. ආණ්ඩුකාර නිල නිවාසයක්, ප්‍රධාන අමාත්‍ය නිල නිවාසයක් -

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මෙතුමාට කියන්නකෝ මුදල් ඇමතිතුමාගෙන් සල්ලි ඉල්ලලා හදලා දෙන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අලුත් එකක් හදන්න කියලා ඔබතුමා යෝජනා කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැහැ. එහෙම නොවෙයි කියන්නේ. ආණ්ඩුකාර නිල නිවාසයක්, ආණ්ඩුකාර කාර්යාලයක් මේ පළාත් සභාවේ තිබෙන්න ඕනෑ. මේක තමයි ලංකාවේ පොහොසත්ම

පළාත් සභාව. අවුරුදු 28 ක් මේ පළාත් සභාව පවත්වාගෙන යනවා. අපි කුලියට ඉන්නේ. ඒ පිළිබඳවයි මම මේ කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක නිවැරදි වෙන්න ඕනෑ. නැත්නම් ඕක මාධ්‍යවලට ගිහිල්ලා බොහොම ආන්දෝලනාත්මක වෙන්න පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැහැ. බොහොම පැහැදිලිව. අතීතය හාරා අවුස්සලා බලන්න.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

නැහැ. අතීතය -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ආණ්ඩුකාර නිල නිවාසය විධියට හැදුවේ. මුදල් පාස් කර ගත්තේ ඒකට. සොයලා බලන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ මේක මාධ්‍යයට ගියොත් හොඳ නැහැ. මේ ආණ්ඩුකාර නිල නිවාසයේ මහ ඇමතිතුමා පදිංචි වෙලා කියලා. මේ සභාවට ඉදිරිපත් කරලා,ආණ්ඩුකාර නිල නිවාසයක් නොවෙයි හැදුවේ. ආණ්ඩුකාරතුමාට නිල නිවාසයක් අවශ්‍ය නැහැයි කියපු නිසා තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉඩම අරගෙන නිල නිවාසයක් හැදුවේ. ආණ්ඩුකාර නිල නිවාසයක් හැදුවේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ආණ්ඩුකාර නිල නිවාසයක් අවශ්‍ය නැහැයි කියලා කවුද කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හිටපු ආණ්ඩුකාරතුමා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි මමත් කියන්නේ. හිටපු ආණ්ඩුකාරතුමා තනිව ජීවත් වුණු පුද්ගලයෙක් නිසා.කොහොම වුණත් ආණ්ඩුකාරවරයාට නිල නිවාසයක් අවශ්‍යයි කියන එක මේ සභාවේ පිළිගැනීමක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුකාරවරයාට නිල කාර්යාලයක් තිබෙන්න ඕනෑය කියන එක. ආණ්ඩුකාරවරයාට නිල කාර්යාලයක් තිබෙන්න ඕනෑ කියන එක.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඒක හරි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම කියන්නේ ඒකයි, අවුරුදු 28 ක් ගිහිල්ලත් අපට බැරි වෙලා තිබෙනවා. අපි අපොහොසත් වෙලා තිබෙනවා. තවමත් අපි කුලියට ඉන්නේ පළාත් සභාවක් හැටියට. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. අපි මහා විශාල ගොඩනැගිලි හදනවා. තවමත් අපි ඉන්නේ, ඒ අසරණ තත්ත්වයේ. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලීම කරනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ආණ්ඩුකාර නිල නිවසට ඉස්සෙල්ලා මේ පැල්පත් ටික ඉවත් කර ගන්න පුළුවන් නම් ඊට වඩා හොඳයි මම හිතන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව්. පැල්පත් ඉවත් කරන්නත් ඕනෑ. ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැනත් වචනයක් කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යභාරය ගැන යම්කිසි ප්‍රමාණයකට අපි සතුටු වෙන්න ඕනෑ. පිට පළාත්වලින් ගුරුවරු මාරු වෙන්න. විශේෂයෙන් ගුරුවරු සහ පළාත් රාජ්‍ය සේවය සඳහා එන්න, මේ පළාතට එන්න විශාල ප්‍රමාණයක් ඉල්ලුම් කරනවා. ඒක බොහොම මන්දගාමී ස්වරූපයෙන් තමයි ක්‍රියාත්මක වෙන්නේ. මීට වඩා මේක වේගවත්ව

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා ]

ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මොකද, අවුරුද්දකට එක වතාවක් දෙවතාවක් නොවෙයි. අනික් පළාත්වල ඉඳලා මේ පළාතට එන්න, මේ පළාතෙන් ඒ පළාත්වලට යන්න අය ඉන්නවා. ඒක ක්‍රියාත්මක වෙන කොට මීට වඩා වේගවත් විධියට, මේ රාජ්‍ය සේවකයන්ගේ අන්තර් මාරු වීම් පිළිබඳව කටයුතු ඉක්මන් කරන්නය කියන ඉල්ලීම මම වෙලාවේ ඉතාමත් ඕනෑකමින් කරනවා.

ඊළඟට අපේ මේ පළාත් සභාවේ විශේෂයෙන්ම වර්තමාන සභා ලේකම්තුමා ඉතාමත් සක්‍රීයව මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් එක්ක කටයුතු කරනවා. අතීතයත් එක්ක සංසන්දනය කරලා බලද්දී, අපේ තිබෙන අවශ්‍යතාවයන් පිළිබඳව ඉතාමත් හොඳ හැඟීමකින් කටයුතු කරනවා. අපේ තිබෙන අවශ්‍යතාවයන් බලනවා. අපේ තිබෙන යල් පැන ගිය අවශ්‍යතාවයන් පිළිබඳව නැවත වතාවක් හාරා අවුස්සලා බලනවා. අපි දන්නවා. උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාත් කථා කළා, මේ සභාවේ ක්‍රියාත්මක වන කාරක සභා පිළිබඳව. එක එක කාරක සභාවලට එක එක විධියට තමයි සලකන්නේ. ගිණුම් කාරක සභාවට එක විධියකට. පෙත්සම් කාරක සභාවට එක විධියකට. සභා කටයුතු කාරක සභාවට එක විධියකට. සමානව සැලකිල්ලක් නැහැ. මේ ගෙවීම් කටයුතුද, ඒ පිළිබඳව දෙන වරප්‍රසාද ද මේවා පිළිබඳව මම හිතන්නේ, සමානව සලකන්න ඕනෑ. ඒ නිසා ඒ පිළිබඳව කටයුතු කරන කොට සමාන සැලකිල්ලක් තිබෙන්න ඕනෑ. සමාන වරප්‍රසාද තිබෙන්න ඕනෑ. සමහර විට කාර්යභාරය වෙනස් වෙන්න පුළුවන්. අපි දැක්කා. එක අවස්ථාවකදී පෙත්සම් කාරක සභාවේදී අපි ස්ථානීය පරීක්ෂණයකට ගියා. ඒ ස්ථානීය පරීක්ෂණයට ගියාම විශාල කලකෝලාහලයක් එතැන. කැති, පොලු උස්සාගෙන ආවේ. ජීවිත අවදානමක් තිබුණා. කවුද වගකියන්නේ?ගම්පහ දිස්ත්‍රික්කයේ. ඒ නිසා මේ පිළිබඳව කටයුතු කරද්දී, ඒ ජීවිත ආරක්ෂාව පිළිබඳවත් කටයුතු කරන්න තිබෙන නිසා අනික් කාරක සභාවල තිබෙන වරප්‍රසාද, දීමනා, කාර්ය මණ්ඩලයට ගෙවන දීමනා පිළිබඳව නැවත වතාවක් සලකා බලලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

විශේෂයෙන්ම සභා ලේකම් කාර්යාලය. අපේ සභාපතිතුමා, සභා ලේකම්තුමා අපේ අවශ්‍යතාවයන් ඉෂ්ට කරලා දෙන්න දැඩි වෙහෙසක් ගන්නවා. ඒ තිබෙන සීමිත ඉඩකඩ සහ ඒ තිබෙන සීමිත සම්පත් අනුව. එක වාහනයයි තිබෙන්නේ. ඒ වාහනය තමයි හැම තැනම යන්නේ. ධුරධාරීන්ට නම් ඊයේ පෙරෙයිදා ලොකු වාහන එහෙම හම්බ වුණා. නමුත් කාර්ය මණ්ඩලයත් එක්ක සන්සන්දනය කරද්දී බොහොම අපහසුතාවයකින් තමයි කටයුතු කරන්නේ. හදිසියට ගිහිල්ලා අපට ලියුමක් ටයිප් කරලා දෙන්න කිව්වාම මොන විධියෙන් හරි - (බාධා කිරීම්) ඒ ධුරධාරීන් කියලා කියන්නේ, විපක්ෂ නායකතුමායි, විපක්ෂයේ සංවිධායකතුමයි - නමුත් කොහොම හරි ඇමතිවරුන්ට හම්බ වුණානේ? ගිහිල්ලා ඉල්ලීමක් කළාම කොයි වෙලාවකවත් පැකිලීමක් නැතිව ඒ අවශ්‍යතාවය ඉෂ්ට කරලා දෙනවා. හදිසියේ ලියුමක් ටයිප් කරලා දෙන්න කිව්වාම. ඒ ඉන්න කාර්ය මණ්ඩලය බොහොම කාරුණිකයි. නම් වශයෙන් කියනවා නම් ලසිත් මහතා, දීප්ති මහතා, සභා ලේකම්තුමා කිසිම වෙලාවක පැකිලෙන්නේ නැහැ. ඒ තිබෙන සීමිත ඉඩකඩ, ඒ තිබෙන වරප්‍රසාද අනුව කොයිම වෙලාවකවත් ඒ තමන්ගේ තිබෙන අපහසුතාවයන් ගැන සලකන්නේ නැතිව, ඒ කටයුත්ත කරලා දෙනවා. ඒ නිසා මේ තිබෙන වරප්‍රසාද, මේ තිබෙන පහසුකම් වැඩි කරන්න ඕනෑ.

ඒ වාගේම දැන් මේ අලුත් ගොඩනැගිල්ලක් හැදෙනවා. මම විශ්වාස කරනවා, ලබන අවුරුද්ද අවසාන වෙන්න ඉස්සෙල්ලා කොහොම හරි මේ ගොඩනැගිල්ල ස්ථිරව හදලා අවසන් කරන්න. දැන් අමාත්‍යාංශ තිබෙන්නේ තැන් තැන්වල. සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයට යන්න ගියාම අපි නාවලට යන්න ඕනෑ. ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට යන්න ගියාම තවත් තැනකට යන්න ඕනෑ. මේවා එක තැනකට ගොනු කළා නම්, ලැබෙන ඉන්ධන දීමනාව අනුව කල්පනා කරලා බලන කොට අපට ඉන්ධන වියදමත් අඩු වෙනවා. ඒ නිසා එක තැනකට මේ කාර්යාල ටික ආවාම ලබන අවුරුද්දේ මේ ගොඩනැගිල්ල අවසාන වන කොට විශාල පහසුවක් වෙනවා. ඒ නිසා දැන් මෙරිල් මන්ත්‍රීතුමා ඉල්ලීමක් කරනවා, මේ සල්ලි ටික අරන් දෙන්නය කියලා. සල්ලි ටික ලැබෙයි. පොරොන්දු වුණු දේවල් ලැබෙයි. පොරොන්දු වුණු දේවල්වලින් ලැබෙන්නේ නැති දේවල් ගැන කථා කරන්නේ නැහැ. 2011 දී, 2012 දී, 2013 දී, 2014 දී දෙන්නම් කියපුවා ලැබුණාද නැද්ද කියන එක හෘද සාක්ෂියට තට්ටු කරලා බලන්න. පරණ ලිපි ලේඛන එකතු කරලා බලන්න. ඒවා ගැන කථා කරන්නේ නැහැ.

තමුන්නාන්සේලා හරියට ක්‍රියාත්මක කරනවා නම් මේ සභාවේ සැබෑ ඒකාබද්ධ විපක්ෂය හැටියට, අර පාර්ලිමේන්තුවේ කටයුතු කරන ඒකාබද්ධ විපක්ෂය විධියට. අන්න හරියට ක්‍රියාත්මක කරනවා. අන්න හරියට පාර්ලිමේන්තුවේ ඒකාබද්ධ විපක්ෂය ක්‍රියාත්මක වෙනවා. ඒකේ ඉන්න මන්ත්‍රීවරු ටික හරියට ක්‍රියාත්මක වෙනවා. මේකේ ඉන්නේ නපුංසකයෝ ටිකක්.

**ගරු ගුණසිරි ජයනාත්-** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

මේකේ විපක්ෂය නපුංසකයෝ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේකේ විපක්ෂය ඔයගොල්ලෝ නපුංසකයෝ ඔයගොල්ලෝනේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහ ඇමතිතුමාගේයි ඇමතිවරුන්ගෙයි බෙල්ල මිරිකගෙන ඒ සාරය උරා බොන්න හදනවා. අපි විපක්ෂය විධියට සහයෝගය දෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්-** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

කොන්දක් නැති විපක්ෂය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේලාට ඒක කරන්න දෙන්නේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එහෙම කියන්න එපා. ඇමතිවරුන්ගේ බෙල්ල මිරිකගෙන වැඩ ගන්නේනැහැ අපේ මන්ත්‍රීවරු කවුරුවත්. ඔබතුමා එහෙම කියන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේලාව භය ගන්නාගෙන ඉන්නේ. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ චෝදනාව දිගින් දිගටම කරනවා. මහ ඇමතිතුමාගේ, ඇමතිවරුන්ගේ බෙල්ල මිරිකාගෙන ඉන්නවාය කියලා. සම්පූර්ණ අසත්‍යයක්. කවුරුවත් අපේ බෙල්ල මිරිකාගෙන ඉන්න අවශ්‍යතාවයක් නැහැ. මට මන්ත්‍රීවරු 67 දෙනෙක් ඉන්නවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හොඳයි. එහෙම නැත්නම් හොඳයි.

**ගරු ගුණසිරි ජයනාත්-** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

පැහැදිලිවම නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය-** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ඔබතුමාට එපමණ අමාරුවක් තිබෙනවා නම් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි සහයෝගය දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

භයට දෙන්නේ. භයට සහයෝගය දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි යහපාලනයේ. යහපාලනයේ හින්දා දෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි යහපාලනයේ නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඕගොල්ලන්ගේ ඡන්ද අපට එපා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පසුගිය දිනක අපේ නායකතුමා මේ බස්නාහිර පළාත් සභාවේ අපිව ගෙන්වලා කිව්වා, පාර්ලිමේන්තුවේ තිබෙන යහපාලනය මේ පළාත් සභාව ඇතුළෙත් තිබෙනවාය කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අප්‍රේල් මාසේ බලමු.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මේක වැරදියි. අගමැතිතුමා මේගොල්ලන්ට -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපේ අගමැතිතුමා අපට උපදෙස් දීලා තිබෙනවා ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාට සහයෝගය දෙන්නය කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ කරන්න දෙයක් නැති නිසා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

අගමැතිතුමා කිව්වේ, යහපාලනයට සහයෝගය දෙන්න නොවෙයි. ඉසුරට ඡන්දය දෙන්න කියලා කිව්වේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි සුද්ද සිංහලෙන් කිව්වේ. ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාට සහයෝගය දෙන්න කියලා. ශුද්ධ සිංහලෙන් කිව්වේ ඒක තමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ කරන්න දෙයක් නැති නිසා. 28 න් කී දෙනාද ඉන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ට දෙන වරප්‍රසාදවලින් සාමාන්‍ය සම්ප්‍රදාය වෙනවා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගිය පාර යහපාලනයෙන් බේරා ගන්න එපැයි.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, දිවයින පත්තරේ තිබෙනවා, ජනාධිපතිතුමා මැදිහත් වුණා කියලා. ගිහිල්ලා බලන්න.

**ගරු ගුණසිරි ජයනාත්-** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

දූකට කෑ ගහනවා. ඔච්චර කෑ ගහන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාදවලින් සාමාන්‍ය සම්ප්‍රදායක් තිබෙනවා,පළාත් සභා මන්ත්‍රීවරුන්ට එයින් අඩක්වත් තිබෙන්න ඕනැය කියලා. එහෙම තමයි මේ අවුරුදු 28 ක් තිස්සේම සාමාන්‍ය විධියට මේ සභාවල ක්‍රියාත්මක වුණේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට තිබෙන කාර්යභාරයට නොදෙවෙනි කාර්යභාරයක් තමයි මේ ගං රටවල පළාත් සභා මන්ත්‍රීවරු සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වෙන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මළ ගෙදරක යනවාට වැඩිය අපේ පළාත් සභා මන්ත්‍රීවරු යනවා. මඟුල් ගෙවල්වලට යනවා. කොටහළු මඟුල් ගෙවල්වලට යනවා. අපේ පළාත්වල, කතෝලික පළාත්වල ළමයි දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුවාම තිබෙන උත්සවවලටත් අපි, මෙරිල් මන්ත්‍රීතුමන්ලා එහෙම ඒවාට සහභාගී වෙනවා. නමුත් අර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද අපට ලැබෙන්නේ නැහැ. ඒගොල්ලෝ ගහන පෙට්‍රල්ම තමයි අපිත් ගහන්නේ. ඒ ෂෙඩ්වලින්ම තමයි අපිත් ගහන්නේ. අපේ වාහන දුවන්නේත් ඒවාවලින්ම තමයි. අපට ලැබෙන්නේ ඉන්ධන දීමනාව ඊට වඩා අඩුවෙන්. දැන් ඊයේ

පෙරෙයිදා අගමැතිතුමා බොහොම ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ තිබෙන වැඩ කටයුතු නිසා රුපියල් ලක්ෂයක දීමනාවක් දෙන එක සාධාරණයි කියලා. ඒක බොහොම සාධාරණ කථාවක්. එතකොට ඒ වරප්‍රසාදයම තමයි මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් ලැබෙන්න ඕනෑ. මම මේක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. මේක කොයි මාධ්‍යයක මාව විවේචනය කළත් කමක් නැහැ. මොකද, හොරකම් කරන මන්ත්‍රීවරුත් ඇති. සමහර තැන්වල. අපි බොහොම අල්පේශාක්‍ය ජීවිත ගත කරන මන්ත්‍රීවරු. බොහොම අය ඇති. නමුත් අපට එහෙම චෝදනා නැහැ. අපි කොන්ත්‍රාත් කරන්නේ නැහැ. කොන්ත්‍රාත්වලින් කොමිස් ගන්නේ නැහැ. අපටත් මේ තිබෙන සියලුම කතන්දර එනවා. පල්ලියේ මංගල්‍යය ආවාම, පන්සලේ උත්සවය ආවාම, මළ ගෙයක් වුණාම, මඟුල් ගෙදරක් ආවාම මේ සියලුම දේට අපි සහභාගී වෙන්න ඕනෑ. අපි ජනතාව අතර ඉන්න මන්ත්‍රීවරු. ඉතින් ඒ නිසා මේ දෙන වරප්‍රසාද අඩුවක් නැතිව අපටත් ලැබෙන්න ඕනෑ. ඒ නිසා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරන කොට රු. 88,000 කට එදා තිබුණු ඒ පැජරෝ වාහනය ගෙවීමේ ක්‍රමයට තමයි පළාත් සභා මන්ත්‍රීවරුන්ට ගෙනැත් දුන්නේ. මෙතැන ඉන්නවා සමහර වෙලාවට මතක ඇති ගාමිණී තිලකසිරි ඇමතිතුමාට එහෙම කොහොමද ඒවා ගෙනත් දුන්නේ කියලා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු මන්ත්‍රීතුමා, රුපියල් දහයේ මුද්දරේට දුන්නේ. ෆුල් ටැන්ක් තෙල් ගහලා දුන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව්. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මහ ඇමති වුණාම ඒ විධියට ගෙනැත් දුන්නා. මේ විධියට මේ පළාත් සභා හයේම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේටත් මේ වරප්‍රසාද හම්බ වෙනවා. විනාඩියක් අහගෙන ඉන්න. ඒ නිසා පළාත් සභා මන්ත්‍රීවරුන්ට මේ පසුගිය පළාත් සභා පහේම මේ වාහනය ගෙනැත් දුන්නා. එදා ගරු අගැමතිතුමා හමු වුණු වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ අපේ කණ්ඩායම ඉල්ලීමක් කළා. ගරු අගමැතිතුමනි, මේක දෙන්නය කියලා. ඒක එතුමා පිළිගත්තා. මේක වරප්‍රසාදයක් විතරක් නොවෙයි. මේක අයිතිවාසිකමක්. මොකද, මේවා පාවිච්චි කරන්නේ මේ මහජනතාව වෙනුවෙන්. මහජනතාව වෙනුවෙන් තමයි අපි ගිහිල්ලා වැඩ කරන්නේ. ඒ නිසා මේක ආභරණයක් නොවෙයි. මේක අවශ්‍යතාවයක්. පත්තරවලින් ගහයි. පත්තරවලින් කියන්න අන්න මෙපමණ ගණනක් හම්බ වුණා කියලා. මේ වරප්‍රසාදය රජයේ සේවකයින්ට, රජයේ නිලධාරීන්ටත් ලැබෙනවා. හැබැයි, කිසි කෙනෙක් ඒවා ගැන කථා කරන්නේ නැහැ. මොකද, රජයේ නිලධාරීන්ට ලැබෙනවා. රජයේ නිලධාරීන්ට අවුරුදු 10 කට වරක් ලැබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මහ නායක හාමුදුරුවරුන්ටත් ලැබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු මන්ත්‍රීතුමා ඒක රජයේ සේවකයින්ට ලැබෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සමාවෙන්න. රජයේ නිලධාරීන්ට දෙනවා. ඒක අයිතිවාසිකමක්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

රජයේ නිලධාරීන්ටත් ලැබෙන්නේ මාණ්ඩලික ශ්‍රේණිවලට විතරයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හරි මාණ්ඩලික ශ්‍රේණිවල අයට හරි ලැබෙනවා නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සභාපතිට, ලේකම්ට විතරයි ලැබෙන්නේ. අනික් අයට ලැබෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉස්සර ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ට දුන්නා. ප්‍රාදේශීය සභාවල උප සභාපතිවරුන්ටත් දුන්නා මේවා. ඒ නිසා මේවා සාමන්‍ය දේවල්. අද මේ තාක්ෂණික ලෝකයක්. ඉස්සර ටයිප් රයිටරය දුන්න එකට අද දෙන්නේ කම්පියුටර් එකක්. අද මේ වැඩ කටයුතු කරන්න ඕනෑ කරන වරප්‍රසාද ටික මේ පළාත් සභාව හරහා ලැබෙන්න ඕනෑ. 2017 වර්ෂයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙන වරප්‍රසාද මොනවාද? මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට අයිතිවාසිකම තිබෙන්නේ මොනවාද? අනික් පළාත් සභාවල මොනවාද තිබෙන්නේ කියලා සොයලා බලලා කටයුතු කරන්නය කියන කාරුණික ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.20]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ආණ්ඩුකාරතුමාගේත්, පළාත් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන වැය ශීර්ෂවලදීත් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. මගේ කථාව අවසාන වුණොත් මට මේක කියා ගන්න බැරි වුණොත් කියලා, මුලින්ම මම මේක කියනවා. මගේ හිතවත් කල්‍යාණ මිත්‍රයා අපේ සිරිකමල් සිල්වා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, අපේ බලය තිබුණු පසුගිය කාලයේ අපේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා - බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන ඇමතිවරයා හැටියට එදා හිටිය නිමල් ලාන්සා ගරු ඇමතිතුමා, ප්‍රධාන අමාත්‍යවරයාට තමයි ඒ නිල නිවාසය හැදුවේ. ඔබතුමාට මතක ඇති එදා අධිකාරියෙන් - හිටපු ආණ්ඩුකාරතුමාට නිවසක් අවශ්‍ය නැහැයි කියන ප්‍රකාශයකළා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හිටපු ආණ්ඩුකාරතුමා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒක තමයි. නිකම් ගෙවල් හදලා පැත්තක තියන්න ඕනෑ නැහැ නේ? අපි වාර ගණනාවකදීම, හැමදාම කථා කළේ, අලවි මවුලානා මැතිතුමාට නිවසක් දෙන්නය කියලා. හැබැයි, එතුමා ඒක ප්‍රතික්ෂේප කළා. එතුමා දරුවන් සමඟ ජීවත් වුණේ දෙහිවල ප්‍රදේශයේ. ඒ නිසා එතුමාට අනවශ්‍යයි කියන වෙලාවක, එතුමාට නිවසක් හදන එක තේරුමක් නැහැ. ඒ නිසා අපි ඒක පසුගිය කාලයේ කළේ නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඒ නිවස හැදුවේ. ආණ්ඩුකාරතුමාට අයිති නිවස ගත්තා නොවෙයි. එතුමාට නිවසක් අවශ්‍ය නිසා ප්‍රධාන අමාත්‍යවරයා හැටියට එදා ඒ නිවස හදා ගත්තා මිස, ආණ්ඩුකාරතුමාගේ නිවස ගරු ප්‍රධාන අමාත්‍යතුමා එදා ගත්තේ නැහැයි කියන එකත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් කවුද ඉන්නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දැන් ඉන්නේ ප්‍රධාන අමාත්‍යතුමා. ඒ කාලෙයේ අපේ ප්‍රධාන අමාත්‍යතුමා හිටියේ ජාවත්ත ප්‍රදේශයේ. ඒ නිසා ඒකේ වැරැද්දක් නැහැයි කියන එකයි, මම ගරු මන්ත්‍රීතුමාට ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් දැනුම් දීම කරන්නේ.දැන් ආණ්ඩුකාරතුමාට නිල නිවාසයක් නැහැයි කියන එක මේ සියලුම මන්ත්‍රීවරු ප්‍රකාශ කළා. සත්‍ය සිද්ධිය. හැම මන්ත්‍රීවරයෙකුම ඒ ගැන කථා කළා. මේ අවස්ථාව වන කොට ගරු සභාපතිතුමනි, ඒ අවශ්‍යතාවය වෙනුවෙන් පිළියම් යොදලා තිබෙන්නේ. බුලර්ස් රෝඩ් එකෙන් පර්චස් 30 ක ඉඩමක් එතුමාට ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ඒක දැන් එතුමාට ලැබිලා අවසානයි. මධ්‍යම රජයෙනුත්, පළාත් සභාවෙනුත් ගන්න අවශ්‍ය තීන්දු තීරණ අරගෙන ඒ නිවාසය වෙනුවෙන් පර්චස් 30 ක ඉඩමක් වෙන් කරලා තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු ඇමතිතුමා, කිරිමණ්ඩල පාරේ අපේ ඉඩමක් තිබෙනවා නේද?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒකට මොකද වෙන්නේ?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ඒක කෘෂිකර්ම අමාත්‍යාංශයට අයිති එකක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ සියලුම මන්ත්‍රීවරුන්ගේ කථාවලදී කිව්වා, එතුමාට නිවසක් නැහැයි කියලා. නිවස සඳහා අවශ්‍ය වන බිම් ප්‍රමාණය අපි පසුගිය මාස කිහිපය තුළ අරගෙන, වෙන් කරලා දීලා තිබෙන්නේ. දැන් අවශ්‍ය වෙන්නේ එතුමාට ඒ නිවස සාදා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවෙන් ඒ අවශ්‍ය ප්‍රතිපාදන 2017 දී ලබා දුන්නොත්, එතුමාගේ නිවස මාස කිහිපයක් තුළ හදලා වෙන් කරලා දෙන්න පුළුවන්. එතකොට අපේ ගැටළුව අවුරුදු ගණනාවකට විසඳෙනවාය කියන එක මම සඳහන් කරනවා. මින් ඉදිරියට ඒ මාතෘකාව කථා කරන්න එපා. මම ඉල්ලා සිටිනවා -

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මුදල් වෙන් කරලා තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මුදලුත් වෙන් කරලා තිබෙනවාලු. ඒ නිසා ඒ ප්‍රශ්නය ගැන කථා කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ. ආණ්ඩුකාරතුමා ගැන කථා කරන කොට මම නම් ඈත අතීතය, අවුරුදු ගණන් පස්සට අතීතයට යන්නේ නැහැ. හැබැයි, අපේ මනුස්සකමක් තිබෙනවා, අපේ යුතුකමක් තිබෙනවා, මිනිහෙක් නැති වුණා හෝ ඉන්න කාලයේදී හරි එතුමා ගැන වචනයක් සඳහන් කිරීම අපේ මනුස්සකමක්. මේ ආණ්ඩුකාරතුමා එන්න ප්‍රථම අපේ ආණ්ඩුකාරතුමා වශයෙන් හිටියේ අලවි මවුලානා මැතිතුමා. එතුමා වෙනුවෙන් අපි සියලු දෙනාම අනන්ත වාරයක් කථා කරන්න ඇති. එතුමා යම්කිසි සේවාවක් ඉෂ්ට කළා. පසුගිය දවස්වල එතුමා අභාවප්‍රාප්ත වුණා. යහපාලන ආණ්ඩුවෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අපේ වර්තමාන ආණ්ඩුකාරතුමා පත් කළා. අතිගරු ජනාධිපතිතුමා පත් කරන්නේ තමන්ට හිතවත්, එතුමා නියෝජනය කරන්න තමයි මේ ආණ්ඩුකාරවරු පත් වෙන්නේ. නිතර දෙවේලේ ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරන්න බැහැ. ජනාධිපතිතුමාගේ නියෝජිතයා හැටියට තමයි මේ ආණ්ඩුකාරතුමා පත් කරන්නේ. ඇත්ත වශයෙන්ම කථා කරනවා නම්, ඒ තනතුර සඳහා මේ ලංකාවේ ඉතාමත්ම සුදුසුම ආණ්ඩුකාරවරයා තමයි පත් කරලා තිබෙන්නේ අපේ මේ ආණ්ඩුකාරතුමා තමයි සුදුසුම කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ආණ්ඩුකාර තනතුර කිව්වාම බොහොම ලොකු තනතුරක් හැටියට මිනිස්සු හැම දෙනාම හිතනවා. අද ආණ්ඩුකාරතුමා මුණ ගැහෙන්න පෞද්ගලික මිනිස්සුත් ගිහිල්ලා පෝලිමේ ඉන්නවා. මේ අමාත්‍යාංශවල කෙරෙන යම් යම් දේවල්වලදී සමහර වෙලාවට ඇමතිතුමා හමු වෙන්නෙත් නැහැ. මහ ඇමතිතුමා හමු වෙන්නෙත් නැහැ. මිනිස්සුන්ගේ ලොකු විශ්වාසයක් තිබෙනවා, ආණ්ඩුකාරතුමා ළඟට ගියාම මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න පුළුවන් කියලා. පසුගිය කාල සීමාව තුළ, අපේ බස්නාහිර පළාත් සභාව තුළ යම් යම් ප්‍රශ්න ආවා. අධ්‍යාපනය වෙන්න පුළුවන්. වෙනත් දෙයක් වෙන්න පුළුවන්. සමුපකාර වෙන්න පුළුවන්. මොකක් හෝ ප්‍රශ්නයකදී ඇත්ත වශයෙන්ම මැදිහත්කරුවෙකු වශයෙන් ඒ තමන්ගෙන් ඉෂ්ට වෙන්න තිබුණු යුතුකම හරියටම ඉෂ්ට කරන ආණ්ඩුකාරවරයෙක් කියන එක මම ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම එතුමා මගේ අමාත්‍යාංශයට බොහොම ලැදියි. ඒක මම මගේ අමාත්‍යාංශ වැය ශීර්ෂයේදී කියන්න හිටියත් අද මේ වෙලාවේදී කියන්න ඕනෑ. කෘෂිකර්මාන්තය කෙරෙහි එතුමා ලොකු ආදරයක් දක්වනවා. එතුමා තමයි කළුතර දිස්ත්‍රික්කයේ බෝඹුවල ශ්‍රවණාගාරයක් හදන්න - ඇමතිතුමා, මගේ තිබෙන ප්‍රතිපාදන ටික හරි මම දෙන්නම්. එතැන ගොඩනැගිල්ලක් හදන්න ප්‍රතිපාදන වෙන් කරන්න කිව්වා. එතුමා බොහොම උවමනාවකින් මේ පළාත් සභාවේ විෂයයන් තුළ එතුමා බොහොම හොඳින් බලාගෙන ඉන්නවා. අපි නොහිතන්න පුළුවන්. හැම අමාත්‍යාංශයක් පිළිබඳවම හොඳ අවබෝධයකින් කටයුතු කරන කෙනෙක්. සමහර අවස්ථාවල එතුමා අපෙන් විමසනවා. ඇමතිතුමා, ඔබතුමා ටිකක් පරණ කෙනෙක් නේ? මෙහෙම එකක් තිබෙනවා නේද? කියලා

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා ]

ඇහුවාම, අපි එතුමාට දෙන්නේ සත්‍ය තොරතුරු. කිසිම වෙලාවක එතුමාව පැත්තකට යොමු කරන්නේ නැතිව, මධ්‍යස්ථව කළ යුතු දේ එතුමා අනිවාර්යයෙන්ම ඒ තීන්දු තීරණ අරගෙන කරනවාය කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

අද අපේ හිතවත් ගරු මන්ත්‍රීතුමා, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ ගුරු පත්වීම් ලබා දීමට කටයුතු කිරීමේදී ඒවා පැහැර හරිනවාය කියලා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව තිබෙන්නේ - අධ්‍යාපන අමාත්‍යාංශය කිව්වොත් අපට මේ තරම් ප්‍රමාණයක් ගුරුවරු අවශ්‍යයි කිව්වාම, ඒ අවශ්‍ය ප්‍රමාණය ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කිරීම පමණයි. ඒ නිසා ගුරුවරුන් බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රමාණය පිළිබඳ තීන්දු තීරණ කරන්නේ අධ්‍යාපන අමාත්‍යවරයා නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශය. අපි දන්නවා. මුළු රට පුරාම අද හැම තැනම බැලුවොත් ගුරු හිඟයක් තිබෙනවා. සෑම පාසලකම ගුරුවරයෙක්, දෙන්නෙක් අඩුයි. දෙමව්පියෝ පිකටිං කරනවා. කලාප කාර්යාලවලදී කෑ ගහනවා, මේවාට මොකක් හරි විසඳුමක් දෙන්නය කියලා.

මම දැක්කා පසුගිය දවස්වල අගමැතිතුමා කියලා තිබෙනවා. අවුරුද්ද මතක නැහැ. ඒ අවුරුද්දේ ඉඳලා මේ කටයුතුසියලුම පුරප්පාඩු පුරවනවාය කියලා. එතෙක් අපට බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. මේ 2017 වන කොට අපි දන්නවා, මේ බස්නාහිර පළාත්සභාවට අවශ්‍ය ගුරු ප්‍රමාණය මොන ක්‍රමයකින් හරි අධ්‍යාපන අමාත්‍යාංශය මේකට විසඳුමක් නොදුන්නොත් ඉදිරි අනාගතයේදී මේක තමයි ලොකුම ගැටළුව. තමන්ගේ දරුවෙකුට අධ්‍යාපනය ලබා දෙන්න පාසලට ගියාම ගුරුවරයා නැත්නම් දෙමව්පියන් මොන තරම් මානසික තතත්වයකට වැටෙනවාද කියලා තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා ඉතාමත්ම අත්‍යවශ්‍යම කටයුත්තක් තමයි අපට මේ ගුරුවරුන්ගේ ප්‍රශ්නය අනාගතයේදී. මගේ හිතවත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා. අපි කලාප කාර්යාලයේදී දෙමළ මාධ්‍ය ගුරුවරු - එතුමා නියෝජනය කරන අවිස්සාවේල්ල කොට්ඨාශයේ දෙමළ ගුරුවරුන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳව අපි යම් තීන්දු තීරණ අනුව මොකක් හරි හෝ දෙයකින් මේ ඉදිරි කාලය තුළදී 2016 දී දරුවන්ට අවශ්‍ය කරන ගුරු ප්‍රමාණය ලබා දීමට අපි කටයුතු කළ යුතුයි. අධ්‍යාපන වැය ශීර්ෂය නොවුණත්, මම එය සඳහන් කළේ ඒකයි.

ඒ වාගේම අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා උපදේශක කාරක සභා ගැන කථා කළා. සමහර අමාත්‍යාංශවල හරියට උපදේශක කාරක සභාවක්වත් තියලා නැහැයි කියලා කිව්වා. එතුමා කිව්වේ පොදුවේ. හැබැයි, මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට කියනවා. මම නිතිපතා සෑම උපදේශක කාරක සභාවක්ම පවත්වලා තිබෙනවාය කියන එකත් මම සඳහන් කරනවා. එතුමාගේ කථාව ඇත්ත. උපදේශක කාරක සභාවක් පවත්වන්නේ නැත්නම් මේ බස්නාහිර පළාත් සභාවේ කොහොමද අමාත්‍යාංශයක් ගෙනියන්නේ? ඒ අයගේ කීම, තීන්දු තිරණත් එක්ක තමයි අමාත්‍යවරයෙකුට වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නැතිව පෞද්ගලිකව අමාත්‍යතුමාගේ තීන්දු තීරණ අරගෙන මේ ගමන යන්න බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපදේශක කාරක සභාවලින් අපව කොයි තරම් දැනුවත් කිරීම් කරනවාද? මොකද, මම කෘෂිකර්මාන්තය කියලා පොළොව යටට ගිය කෘෂිකර්මාන්තය දන්න කෙනෙක් නොවෙයිනේ? ඒ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන යෝජනා, අදහස් එක්ක තමයි මේ ගමන යන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. ඒක වෙන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් මගේ අමාත්‍යාංශය තුළ නම් මම එහෙම වෙන්න ඉඩ තියලා නැහැයි කියන එක මම සඳහන් කරනවා. ඒ අද ආණ්ඩුකාරතුමා පිළිබඳව අපි හැමෝම බොහොම ආදරයෙන්, ගෞරවයෙන් කථා කළා. ඒ වාගේම තමයි එතුමාගේ ලේකම්තුමා. ඒ පිළිබඳවත් කිව යුතුයි. ගරු ආණ්ඩුකාරතුමා මේ හැම දෙනාගේම අවශ්‍යතාවයන් ඉෂ්ට කරන්න ඉතා මැදිහත්ව කටයුතු කරන කෙනක් කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. අද මේ මාතෘකාවන් කිහිපය පිළිබඳව කථා කිරීමේදී ආණ්ඩුකාරතුමා පිළිබඳව බොහොම අදහස් දැක්වුවා.

ඒ වාගේම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපේ සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය පිළිබඳව.

මේ කාර්ය මණ්ඩලයේ ඉන්න මේ ළමයි, අපේ මහත්වරු දිහා බැලුවාම දීර්ඝ කාලයක් තිස්සේ මේ කටයුත්ත ගැන බොහොම අවබෝධයකින් කටයුතු කරන නිලධාරීන්පිරිසක් ඉන්නේ. මොකද, මමත් සභානායකවරයා හැටියට මාස හයක්, හතක් සිටි කාලයේදී මම දැන ගත්තා මේ කාර්ය මණ්ඩලය ගන්නා වූ උත්සාහය. ඒ නිසා ඒ පිළිබඳවත් මම දැනුවත් කළ යුතුයි. සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය විශාල උත්සාහයක් ගන්නවා. යම් යම් පොඩි පොඩි අඩුපාඩු තිබෙන්න පුළුවන්. නමුත් 2017 වසරේදී අපි සියලුම දෙනා එකතු වෙලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව බස්නාහිර පළාත් සභාවේ වැඩ කටයුතු ඉතාමත් හොඳින් කර ගෙන යැමට සියලු දෙනාම සහයෝගය ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[පූ.භා. 11.31]

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද ආණ්ඩුකාරතුමාගේ, ඒ වාගේම පළාත් සභාව පිළිබඳව තිබෙන විවාදයේ වචන ස්වල්පයක් කථා කරන්න සභා කටයුතු අමාත්‍යවරයා වශයෙන් මට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, මම දැන් අවුරුදු 18 කට වැඩිය මේ පළාත් සභාව නියෝජනය කරලා පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය හරහා සම්බන්ධ වෙලා අපි විශාල වැඩ කොටසක් බස්නාහිර පළාතේ ගරු මන්ත්‍රීවරන්ගේ අවශ්‍යතාවයන්, මහජනතාවගේ අවශ්‍යතාවයන් නොපිරිහෙලා කටයුතු කරන ආයතනයක් තමයි මේ සභා ලේකම් කාර්යාලය. මේකේ කාරක සභා කිහිපයක් තිබුණත් මම මේකේ දකින්නේ විශේෂයෙන්ම පෙත්සම් කාරක සභාව තමයි ජනතාවට බොහොම සම්බන්ධ වෙලා යන කාරක සභාව. අපි දන්නවා, මේ පෙත්සම් කාරක සභාව පිළිබඳව අපේ බස්නාහිර පළාතේ මහජනයා දන්නේ නැහැ. මේක දන්නේ අපේ මන්ත්‍රීවරු විතරයි. මේ පෙත්සම් කාරක සභාවෙන් ප්‍රදේශයේ තිබෙන ප්‍රශ්න විසඳන්න පුළුවන්. ප්‍රාදේශීය සභාවට විසඳන්න බැරි ප්‍රශ්න, නගර සභාවට විසඳන්න බැරි ප්‍රශ්න ගිහිල්ලා විසඳන්න පුළුවන් බලයක් තිබෙන කාරක සභාවක් තමයි මේ පෙත්සම් කාරක සභාව. මට මතකයි. අලුත්කඩේ උසාවියේ තිබුණු එක්තරා නඩුවකදී, ඒ නඩු තීන්දුවේදී තීන්දු කරලා තිබුණා අපිත් සහභාගී වුණු පෙත්සම් කාරත සභාවකදී ගත් තීන්දුවක්. ඒ තීන්දුව තමයි හරි කියලා. ඒ නිසා මහජනයාට උසාවියට මුදල් වියදම් කරලා, අපේ පෙරකදෝරු මහත්වරුන්ට මුදල් වියදම් කරලා නඩු කියනවාට වැඩිය විශාල සහනයක් මේ පෙත්සම් කාරක සභාව හරහා අපේ මහජනයාට අපට සේවය ලබා දෙන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා. මේ පෙත්සම් කාරක සභාව පිළිබඳව දැනුවත් කිරීමක් මේ මාධ්‍ය තුළින් කරන්න ඕනෑ. එතකොට මේ මහජනයාගේ ප්‍රශ්න අපට නිරාකරණය කරලා දෙන්න පුළුවන්. ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතාවයන් තිබෙන නිසා. විශේෂයෙන් දුප්පත් මනුස්සයෙකුගේ පාරක් ලබා ගැනීම, පාරක් අවහිර කිරීම, විදුලිය ලබා ගැනීම වාගේ කටයුතුවලදී අපට මැදිහත් වෙන්න පුළුවන්. මම පෙත්සම් කාරක සභාව නියෝජනය කරන කාලයේ ස්ථාන පරීක්ෂණ ගණනාවකට ගිහිල්ලා තිබෙනවා. ඒවායේදී අපට තේරුණා මේ පෙත්සම් කාරක සභාව මහජනතාවට කොපමණ ප්‍රයෝජනවත් වෙනවාද කියලා. ඒ වාගේම සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, අපේ ලසිත් මහතා ඇතුළු ඒ සියලුම කාර්ය මණ්ඩලය බොහොම උනන්දුවෙන් මේ වැඩ කටයුත්ත කරනවා.

ඒ වාගේම අපේ ගරු ආණ්ඩුකාරතුමා පිළිබඳව මම හිතන්නේ අපේ මන්ත්‍රීවරු සියලුමදෙනා අවබෝධයෙන් කටයුතු කරනවා. එතුමාගේ කටයුතු ස්වාධීනව කර ගෙන යන්න බස්නාහිර පළාතේ අපි ඇමතිවරු හැටියට එතුමාට පූර්ණ සහයෝගය දීලා අපි වැඩ කරනවා. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ බස්නාහිර පළාතේ අපට තිබෙන බලය තවම අපි හරියට තේරුම් අරගෙන නැහැයි කියලා. ඒක මමත් දකිනවා. මම මේ ඇමති ධූරය භාර අරගෙන දැන් මාස 10 ක් පමණ වෙනවා. වැඩ කටයුතු කර ගෙන යන කොට මට තේරෙනවා, බස්නාහිර පළාතේ මම දැකලා තිබෙන විදියට, මම දන්නා විදියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන විදියට අමාත්‍ය මණ්ඩලය ගන්නා වූ තීරණයක් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන්නේ නම් එයට උසාවියකට ගිහිල්ලා හෝ අභියෝග කරන්න බැහැයි කියලයි තිබෙන්නේ. ඒ නිසා මේ පළාත් සභාවේ වැරදි දේවල් නොවෙයි. මහජනයාට අපේ මන්ත්‍රීවරුන්ගේ තිබෙන වරප්‍රසාද පිළිබඳව අපි එකතු වෙලා අපේ කැබිනට්

[ ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා ]

මණ්ඩලයෙන් ඒ තීන්දු ගන්න පුළුවන්. ඒ නිසා අපි ඉදිරියේදීත් මේ පිළිබඳව විශ්ලේෂණයක් කරලා, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ වාගේ අයගේ සහයෝගය අරගෙන, ඒ වාගේම අපේ අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අරගෙන අපි මේ වැඩ පිළිවෙළ තවත් ඉදිරියට ගෙනියන්න අපි කැබිනට් මණ්ඩලය වශයෙන් කටයුතු කරන බව සඳහන් කරනවා.

ඒ වාගේම අපේ අනෙකුත් කාරක සභාවල කටයුතු කරන මන්ත්‍රීවරු. මම හිතන්නේ, උපදේශක කාරක සභා පිළිබඳව කථා කළා. ඒ උපදේශක කාරක සභාවල කටයුතු කරන මන්ත්‍රීවරුන්ගේ අදහස් අපට බොහොම වටිනවා. ඒ අදහස් අරගෙනත් අපට ඉදිරියට මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන්න පුළුවන්. ඒ නිසා 2017 වර්ෂයේ වෙන් වෙලා තිබෙන මුදල් ක්‍රමානුකූලව වියදම් කරන්න වැඩ පිළිවෙළක් යොදන්න ගරු මහ ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා ඉදිරියේදී කටයුතු කරන බව සඳහන් කරමින් මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

[පූ.භා. 11.36]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම ආණ්ඩුකාරවරයා, පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වැය ශීර්ෂයන් සම්බන්ධව කථා කරන්න මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම පළමුවෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා සඳහන් කළ ආකාරයට, එතුමාගේ කථාව ආරම්භ කළ ආකාරයටම ඊයේ කථික ලැයිස්තුවේ ඇති වුණු යම් යම් අවහිරතාවයක් නිසා, මටත් අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් ඇති වුණු ප්‍රශ්නය සම්බන්ධව පළමුවෙන්ම කථා කරන්න ඕනෑ. ඇත්තටම ඒ අවස්ථාවේදී මගේ ලේඛනයේ ඒ නම් ලැයිස්තුව ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙන කොට, ඒ වෙලාවම ප්‍රශ්නයක් මතු වුණා. ඒ වෙලාවේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා තමයි මූලාසනයේ කටයුතු කළේ. මම ඔබතුමාගෙන් උපදෙස් අරගෙන ගරු සභාපතිතුමාගේ නිල කාමරයට ගිහිල්ලා අපි විනාඩි 10 ක් කල් ගනිමු කියන ඉල්ලීම මම කළා. එතැනදී මම සඳහන් කළා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත්, ලෙනාඩ් කරුණාරත්න අපේ ගරු මන්ත්‍රීතුමාත් කථා කරන්න දෙපැත්තෙන් ඉන්නවා. ඒ අවස්ථාව ලබා දෙන්න පුළුවන්ද කියලා. මොකද, ඒ මන්ත්‍රීවරුන් දෙදෙනාම වටිනා අදහස් ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන් දෙදෙනෙක් නිසා. ගරු සභාපතිතුමාගේ නිගමනය වුණේ කල් ගන්න එපා කියන එකයි. කෙසේ වෙතත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට විනාඩි දෙකක හෝ අවස්ථාවක් ලැබුණත් එතුමා හරි කනගාටුවට පත් වුණා. එතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම හිටපු අමාත්‍යවරයෙක්. ඒ වාගේම අපේ නවක මන්ත්‍රීවරයෙකු වන ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා කියලා කියන්නේ, පළාත් පාලන ක්ෂේත්‍රයෙන් ඉහළට ආපු කෙනෙක්. අද මාත් එක්ක පෞද්ගලිකව තරහා වෙලා ඉන්නේ. මම දැන් පෞද්ගලිකව කථා කළා. මම ඒක ඊයේ එතැනදී ඇවිස්සුවේ නැත්තේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් පොඩි අපහසුතාවයකට පත් වෙනවා මම මේක ඒ වෙලාවේ කථා කළා නම්. එතුමාගේ ලැයිස්තුවේ නම තිබුණා. දෙන්නාම ඉවත් කරනවාය කියලා එතුමාට විනාඩි දෙකක් හෝ දීලා එතුමා ප්‍රශ්නයකට මැදි වුණා වාගේම, අපේ ගරු මන්ත්‍රීතුමාට විනාඩියක්වත් කථා කරන්න බැරි වුණා. කෙසේ වෙතත් මම ඉල්ලීමක් කරන්නේ මේ සම්බන්ධව කථා කරනවා නම්, ආණ්ඩු පක්ෂ සංවිධායකතුමාත්, විපක්ෂයේ සංවිධායකතුමාත් වශයෙන් අපි මේක මෙහෙයවනවා. අපි පුළුවන්තරම් මන්ත්‍රීවරුන්ට කථා කරන්න අවස්ථාව ලබා දෙනවා. හොඳ මන්ත්‍රීවරු දාන්න තමයි අපිත් උත්සාහ කරන්නේ. ඒත් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදත් ආරක්ෂා කර ගෙන තමයි අපි මේක හදන්නේ. මේ කථා කරන මටවත් කථා කරන්න වෙලාවක් තිබුණේ නැහැ. මගේ අවස්ථාවත් මම අනික් මන්ත්‍රීවරුන්ට දුන්නා. එහෙම කැප වෙලා තමයි මම කථා කළේ. ඒ නිසා මම මූලාසනයෙන් ඉල්ලීමක් කරනවා, මීන් ඉදිරියට එවැනි අවස්ථාවක් නොවෙන්න අපි කටයුතු කරමුය කියලා.

ඒ වාගේම ගරු ආණ්ඩුකාරතුමා පිළිබඳව අපේ සියලුම මන්ත්‍රීවරු පක්ෂ භේදයකින් තොරව දීර්ඝ වශයෙන් කථා කළා. ඉතාම හොඳ විධියට තමයි කථා කළේ. අපි අගය කරනවා. මීට පෙර මමත් පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි ආණ්ඩුකාරතුමාට - එවකට හිටපු එක් ආණ්ඩුකාරවරයෙකුට දේශපාලනය කරනවා කියලා තමයි මම කථා කළේ. මම ඒක විවෘතව ප්‍රකාශ කරනවා. ඒත් අද අපි සියලුම දෙනා එකා වාගේ

ගරු ආණ්ඩුකාරතුමා පිළිබඳව කැමැත්තෙන් කථා කරනවා. එයට හේතු ගණනාවක් තිබෙනවා. නිහතමානීකම, උගත්කම, ක්‍රියාශීලී බව, ප්‍රායෝගික බව, ඒ වාගේම ත්‍රෛයිභාෂාව පිළිබඳ දැනුම, ඒ ඔක්කොම දැන ගෙන කථා කරන තත්ත්වයට අපි පත් වෙලා තිබෙනවා. මේක තමයි වෙන්න ඕනෑ. මේ පුටුවට යන්න ඕනෑ කෙනා අද ඒ පුටුවට ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් අපි ඒක ආරක්ෂා කර ගන්න ඕනෑ. එතුමාගේ වරප්‍රසාද දෙන්න උත්සාහ කරනවා වාගේම, එතුමා අපට දෙන ශක්තිය අපි අගය කරන්න ඕනෑ. අපි දකිනවා, සාමාන්‍යයෙන් මම මේ පළාත් සභාවට කාලයක සිට එන කොට මම දැක්කා සැසිවාර ආරම්භ කිරීම් මේ පළාත් සභාවේ තිබුණා. නව සැසිවාර ආරම්භ කරනවා. මේ නව සැසිවාරය අපි ආරම්භ කළේ BMICH නැත්නම් නොයෙකුත් ස්ථානවල. එතකොට ආණ්ඩුකාරතුමා එනකොට ජනාධිපතිතුමා එනකොට වාගේ අශ්වාරෝහකයින්ගෙන් යුත් පෙරහැරකින් එනවා. ඒ වාගේ අවස්ථා තිබුණා. දැන් මේ ආණ්ඩුකාරතුමාට එහෙම අවස්ථාවක් ලැබුණේ නැහැ. මේ වාගේ පිළිගැනීමක් ලැබුණේ නැහැ. අපට ඒ වාගේ හැඟීම් බර අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒකට අපි ප්‍රතිපත්තියක් හදලා, නැත්නම් රීතියක් දාලා, හැම අවුරුද්දකම පළමුවැනි සැසි වාරය ආරම්භ කරන අවස්ථාවක් බවට පත් කර ගන්න. මට දැන ගන්නට ලැබුණා, එය රීති කාරක සභාවට දාලා තිබෙනවා කියලා. එවැනි අවස්ථාවක් ඇති කර ගන්න ඕනෑ.

ඒ වාගේම හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා හොඳ අදහසක් ප්‍රකාශ කළා. අපි දකිනවා, එතුමාටත් මේ සභා ගර්භයේ ස්ථානයක් ඇති කරන්න ඕනෑය කියලා. අපි දකිනවා, පාර්ලිමේන්තුවේ ගත්තාම ජනාධිපතිතුමා ඇවිල්ලා සහභාගී වෙනවා. හැබැයි, මෙතුමාට සහභාගී වෙන්න බැරි වෙන්න පුළුවන්. අපේ ආණ්ඩුකාරතුමාටත් නිරීක්ෂණ අවස්ථාවකට හරි එන්න අවස්ථාව ලබා දිය යුතුයි. ගැලරියට හරි එන්න අවස්ථාව තිබෙනවා. ආවොත් දකිනවා මේ ඇමතිවරු ඉන්නවාද? නැද්ද? මේ ප්‍රශ්නවලට උත්තර දෙනවාද? නැද්ද? ප්‍රශ්නවලට උත්තර දෙන එක මග අරිනවා. මාස ගණන් ගන්නවා. මාස පහ, හය ගන්නවා. මේ කිව්වාට මෙහෙම දේවල් මෙතැන වෙනවා. මේක වෙන්න ඕනෑ. මම ඉල්ලීමක් කරනවා, මේක හැන්සාඩ් ගත කරන්න කියලා. අපි ගිණුම් කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන්න ගියාම එතුමා කිව්වා, මේ හැම හැන්සාඩ් එකකම මම කියවනවා කියලා. අපිත් හරි සතුටු වුණා. ඉතින් එතුමා විසින්ම මේවා දැක්කාම කොහොමද? ඇවිල්ලා ගැලරියේ ඉන්නවානේ? ඇවිල්ලා බලනවා. තමුන්ගේ නායකත්වය තිබෙන තැනක්. මේක බලන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළ දකින්න ඕනෑ. එතකොට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඒක ශක්තියක් වෙනවා. ඒ ශක්තිය තුළ හරියට ගමනක් යන්න පුළුවන්. අද යහපාලනයත් එක්ක - මොනවා කිව්වත්, අපි භේද වෙන්න හොඳ නැහැ. අපි එක අරමුණකට යන්නේ. 2017 දී අපේ ගරු ගාමිණී තිලකසිරි ඇමතිතුමා කිව්වා වාගේ අපි එකතු වෙලා එක ගමනක් යන්නේ. අපි මේ පළාත්සභාව තුළ වාද භේද වුණාට එළියට ගියාම - කොඩිකාර ගරු මන්ත්‍රීතුමා එක්ක මගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. එහෙම නම් මීට පෙර අපේ ප්‍රධාන අමාත්‍යතුමා එක්ක තමයි මගේ ප්‍රශ්න ඇති වුණේ. මම මෙතුමාට කියපු වචන අද අමුතුවෙන් කියන්න ඕනෑද? මම එහෙම කිව්වා. එහෙම කිව්වාට එතුමාත් එක්ක මගේ පෞද්ගලික තරහක් නැහැ. ඒත් මට ඊයේ පෙරෙයිදා දැන ගන්න ලැබුණා. කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියලා තිබෙනවා. අතේ තිබුණු දෙයකින් ගහනවා කියලා. මම නම් හිතන්නේ නැහැ එතුමා එහෙම කියන්න ඇති කියලා. එතුමා එක්ක මගේ පුද්ගලික තරහක් නැහැ. කිසිම පුද්ගලික තරහක් නැහැ. මම ඉල්ලීමක් කරනවා. (බාධා කිරීම්) මම ඒ සම්බන්ධව කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. එතුමා දැන් මහරගම කාපට්වලින් යට වෙලා ඉවරයි. දැන් තණකොළ උඩ එනවාලු. දැන් එතුමා ගැන අපි කථා කරන්නේ නැහැ. අපේ ප්‍රධාන අමාත්‍යතුමා කාපට්වලින් එතුමාව යට කළා. මම ඒ ගැන කථා කරන්නේ නැහැ. එතුමාගේ ආදරණීය බිරිඳයි එතුමායි පොහොට්ටුව යට කරලා ඉවරයි. ඊට වඩා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. මම ඉල්ලීමක් කරනවා. ආණ්ඩුකාරතුමා කියන්නේ හොඳ පුද්ගලයෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් නැගිටින්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

දැන් නැගිටින්න බැහැ. ඉදිරියේදී බලා ගන්නකෝ. ප්‍රාදේශීය සභා ඡන්දයේදී. ඒක බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ නම කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර වාඩි වෙන්න. කාලය නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඒ වාගේම අපේ උපදේශක කාරක සභා හා අනෙකුත් කාරක සභා සම්බන්ධව කථා කරන්න ඕනෑ. කාරක සභාවලට දීමනා තිබෙනවා. ගිණුම් කාරක සභාව වෙන්න පුළුවන්. කාර්ය පටිපාටි රීති කාරක සභාව වෙන්න පුළුවන්. පෙත්සම් කාරක සභාව වෙන්න පුළුවන්. ගෘහ කාරක සභාව වෙන්න පුළුවන්. සභා කටයුතු කාරක සභාව වෙන්න පුළුවන්. ඒවාට ලබා දෙන දීමනා එක මට්ටමක නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා. කැබිනට් තීන්දුවක් මාර්ගයෙන් එක මට්ටමකට ගේන්න. අපි දකිනවා, දැන් පාර්ලිමේන්තුවේ පැමිණීමේ දීමනාව රු. 2,500 ක් කරලා තිබෙනවා. ඒ නිසා ඒවාත් ගැන සැලකිලිමත් වෙලා ඉදිරියට ඒ ශක්තිය අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම වාහන ආනයන බලපත්‍රය සම්බන්ධවත් සියලුම මන්ත්‍රීවරු කථා කළා. ඒ සම්බන්ධවත් කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන්, අපේ පළාත් පාලන අමාත්‍යතුමා මාර්ගයෙන් ජනාධිපතිතුමාට යොමු කරන්නය කියලා මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මුද්දර වෙන්න පුළුවන්. අනෙකුත් දීමනා. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ඇති කරන්න, එය ශක්තියක් කර ගන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම අපි දකිනවා, ධූරධාරීන් කියලා පරිපූරක ඇස්තමේන්තුවක් දාලා මුදල් අනුමත වුණත්, අපේ ධූරධාරීන් හතර දෙනෙකුට මේ අවස්ථාව නොලැබී තිබෙනවා. ලේකම්තුමා ක්‍රියාත්මක වෙනවා. වැඩ පිළිවෙළ අපි දකිනවා. ඒ අතරතුර අලුත් වාහන හයක් එනවා නම් ඒ ධූරධාරීන් හතර දෙනාට ඇමතිවරුන්ගේ පරණ වාහන ලබා දෙන්නය කියලා, ඒ කාල සීමාව ලබා දෙන්නය කියලත් මේ අවස්ථාවේදී මම ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

[පූ.භා. 11.48]

**ගරු ඉසුර දේවප්‍රිය-** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු ආණ්ඩුකාරතුමා, පළාත් සභාව ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන කථා කරන වෙලාවේදී විශේෂයෙන්ම පැහැදිලි කරන්න ඕනෑ. අපි සැලසුම් කරලා තිබෙන විධියට ලබන අවුරුද්දේ අවසාන වන කොට අපි මේ නව ගොඩනැගිල්ල භාර ගන්න තමයි සූදානමින් ඉන්නේ. ගරු සභාපතිතුමනි, ඒ අනුව තමයි දැන් වැඩ නිම කරමින් යන්නේ. අපි දන්නවා, අද විශේෂයෙන්ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හරි වෙනත් ආයතනයකට හරි ගත්තාම ගරු මන්ත්‍රීවරුන්ට හරි අපේ රාජ්‍ය සේවකයන්ට හරි විවිධ තැන්වලට යන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක මම හිතන්නේ, පළාත් සභාවක් හැටියට බරපතළ කාරණාවක්. ඒ වාගේම මේ පළාත් සභාවේ විශාල මුදලක් කුලී වශයෙන් ගෙවන්න වෙලා තිබෙනවා. ඉතින් මේකත් අපට තිබෙන ලොකු අභියෝගයක්. ඒ නිසා මම හිතනවා, දැන් විශේෂයෙන්ම ආණ්ඩුකාරතුමාගේ නිල නිවාස ප්‍රශ්නය විසඳිලා ඉවරයි. දැන් ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය. ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ අවශ්‍ය පහසුකම් නව ගොඩනැගිල්ලේ තිබෙනවා. ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන්

සභාවත් නව ගොඩනැගිල්ලේ ස්ථාපිත වෙනවා. එතකොට ගරු ආණ්ඩුකාරතුමා, ගරු අමාත්‍යවරුන් සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇතුළු ආයතන විශාල ප්‍රමාණයක් එක ගොඩනැගිල්ලකට ඒම තුළ පළාතේ ජනතාවගේ සේවාව පුළුල් කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මම හිතන්නේ, ඒක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ආණ්ඩුකාරතුමා ගැන කථා කරන කොට පැහැදිලිවම කියන්න ඕනෑ, අපේ රටේ ඉන්න ආණ්ඩුකාරවරුන් අතරින් ගත්තොත් ප්‍රධාන අමාත්‍යවරයා සමඟ එකඟතාවයෙන් කටයුතු කරන ආණ්ඩුකාරවරයෙක් අපේ බස්නාහිර පළාතට ඉන්නවා. ඒ වාගේම එතුමා දීර්ඝ කාලීනව පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියෙකු හැටියට කටයුතු කරමින් ලබා තිබෙන අත්දැකීම් අපේ පළාතේ ඉදිරි ගමනට මහත් පිටුවහලක් වෙලා තිබෙනවා. ඒක අපට ආශිර්වාදයක් වෙලා තිබෙනවා. අපි ඒක අගය කරනවා. එවැනි දක්ෂ ආණ්ඩුකාරවරයෙක් විශේෂයෙන්ම මම ප්‍රධාන අමාත්‍යවරයා හැටියට කටයුතු කරන කාලයේ අපට ලැබීම පිළිබඳව. එතුමා වෙනුවෙන්, ඒ ආණ්ඩුකාර කාර්යාලය වෙනුවෙන් කළ හැකි යම් කාර්යභාරයක් මේ පළාත් සභාව තුළ තිබෙනවා නම්, අපි ඒක නොපිරිහෙලා ඉටු කරන්නත් පසුබට වෙන්නේ නැහැයි කියන කාරණාව මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අපි විශ්වාස කරනවා. ආණ්ඩුකාර කාර්යාලය සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව එකම ගොඩනැගිල්ලක අපත් සමඟ කටයුතු කිරීම ඉතාමත්ම වැඩදායී කියලා. ඒ වාගේම තමයි දැන් අපේ මන්ත්‍රීවරු කථා කළා පුස්තකාල පහසුකම් පිළිබඳව. ඒකට ගරු සභාපතිතුමා විස්තරයක් දුන්නා. නමුත් මම හිතනවා, එතුමා ඒ කාරණාව කියපු එක ගැන මම මොකුත් කියන්න යන්නේ නැහැ. හැබැයි, පාර්ලිමේන්තුවට සමාන අංග සම්පූර්ණ පුස්තකාලයක් තිබෙනවා නම්, අපේ මන්ත්‍රීවරු එතැනට යන්න පෙළඹෙනවා. ඉතින් මම ඔබතුමා මගින් අපේ ගරු මන්ත්‍රීවරුන්ට කියන්න කැමැතියි. අපි අංග සම්පූර්ණ පුස්තකාලයක් නව ගොඩනැගිල්ලේ ඉදි කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මන්ත්‍රීවරුන්ට තිබෙන විශාල ප්‍රශ්නයක් තමයි, තමන්ගේ වාහනය ගාල් කර ගන්න තිබෙන අපහසුතාවය. අපි වාහන 200 ක් කිසිම කරදරයක් නැතිව ප්‍රධාන ගොඩනැගිල්ලේ ගාල් කරන්න අවශ්‍ය පහසුකම් ඇති කරලා තිබෙනවා. ඒ වාගේම කමිටු රැස්වීම්. අපි දන්නවා අද කමිටු රැස්වීම් පවත්වන කොට අද නම් තරමක් දුරට හොඳයි. ඉස්සර ටොරින්ටන් කාර්යාලයේ තිබෙන කාලයේ ගරු සභාපතිතුමාට තමන්ගේ කටයුතු කර ගන්නවත් බැහැ, කමිටු රැස් වෙන කොට. එවැනි අපහසුතා තිබුණා. මෙතැනත් අපට ප්‍රමාණවත් පහසුකම් නැහැ. අපි ඔබතුමා මගින් පැහැදිලිව කියන්න කැමැතියි, අංග සම්පූර්ණ කමිටු ශාලා තුනක් නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන්න සියලු කටයුතු සැලසුම් කරලා තිබෙනවා. ඒ වැඩ දැනටමත් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අද මේ පළාත් සභාවේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අංග සම්පූර්ණ විශාල රැස්වීම් ශාලාවක් නොමැති වීම. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. අපි නව ගොඩනැගිල්ලට ගිහිල්ලා නව සභා ශාලාව පාවිච්චි කරන්න ගත්තාට පස්සේ මේ තිබෙන ගොඩනැගිල්ල අංග සම්පූර්ණ ප්‍රධාන රැස්වීම් ශාලාවක් බවට පරිවර්තනය කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපි දැක්ක තවත් දෙයක් තමයි. අපේ සේවකයන්ගේ පැත්තෙන් ගත්තොත් එහෙම ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමාගේ යටතේ සිටින සභා ලේකම් කාර්ය මණ්ඩලය. ඒ සේවකයන් මේ දවස් වල අයවැය වාගේ විශේෂ දවස්වලදී දිවා රෑ නොතකා කටයුතු කරනවා. මම දන්නවා. අපේ සභා ලේකම් කාර්යාලය පිළිබඳව කථා කරන කොට ලේකම්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලය, සේවකයෝ ඉතා කැපවීමෙන් වැඩ කරනවා. මම හිතන්නේ, මේගොල්ලන්ගේ අතිකාල දීමනාවල පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට සාධාරණයක් කරන්නය කියලා මම ඔබතුමා මගින් අපේ ප්‍රධාන ලේකම්තුමාට දැනුම් දෙනවා. සභා ලේකම්තුමා සමඟ කථා කරලා ඒගොල්ලන්ට යම් අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒකට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්නය කියලා දැනුම් දෙනවා. ආණ්ඩුකාර කාර්යාලය පිළිබඳව අපට ගැටළුවක් නැහැ. ගරු මන්ත්‍රීවරුන්ට තිබෙන පහසුකමුත්, ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙනුත් විවිධ අදහස් ප්‍රකාශ වුණා. ඒවායේ අවශ්‍ය කටයුතු අපි සාකච්ඡා කරලා ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අද පත්තරේ තිබෙනවා, ඊයේ අයවැය විවාදයේදී සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයන් කිහිපයක් පිළිබඳව. විශේෂයෙන්ම මම මෙතැන සිටින අමිත් මධුරංග කියන මාධ්‍යවේදියාට කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි. මොකද, මේ පළාත් සභාවේ මීට වඩා වැදගත් දේවල් සාකච්ඡා වුණා. අපට මූල්‍ය අඩුපාඩුවක් වෙලා තිබුණත්, අපි 11% ක මූල්‍ය තත්ත්වයක් ප්‍රාග්ධන වියදම්වල අපි වර්ධනයක් ඇති කර ගෙන තිබෙනවා. එතකොට එවැනි තත්ත්වයන් තුළ ගරු සභාපතිතුමනි,

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

මෙවැනි ප්‍රකාශයන් පුවත්පත්වල පළ කිරීමෙන් අපේ පළාත් සභාවේ ගෞරවයට හානියක් වෙන විධියට තමයි මේ ප්‍රකාශ - මම මාධ්‍යවේදීන්ට කනගාටුව ප්‍රකාශ කරනවා. මම හිතන්නේ, මේ මන්ත්‍රීවරු සියලු දෙනා කරපු කථාවල වැදගත් දේ නොවෙයි අරගෙන තිබෙන්නේ. වැඩක් නැති කථාවක් තමයි අරගෙන හයිලයිට් කරලා තිබෙන්නේ. මේක හරිම කනගාටුදායක කාරණයක්. අනික් එක මෙතැනදී තවත් එකක් තිබෙනවා. මගේ නමත් සඳහන් කරලා මේ වාලම්පුරි කථාවක් සමහ. මමවත්, අපේ සංචාරක අමාත්‍යාංශයේ සභාපතිතුමාටවත් පන්සල් ගණනේ ගිහිල්ලා වාලම්පුරි විකුණන්න ඕනෑ නැහැ. ගරු සභාපතිතුමනි, මේ වාලම්පුරි වැඩේට මගේ සම්බන්ධතාවයක් නැහැ. අනික් එක මේක තිබුණේ පන්සල්වලට. පන්සල්වලට ගිහිල්ලා අපට බලපෑමක් කරන්න - මේ වාගේ දෙයකට අපි පන්සල්වලට ගියා නම් - සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මේ ගැන කියන්න ඕනෑ නැහැ. එහෙම නම් මේ රටේ සමාජය මේවා එක ගැන කථා කරයි. ඒ නිසා මගෙත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා නම් ගරු සභාපතිතුමනි, ඒක විවෘතව කථා කරලා විසඳගන්න ඕනෑ. මේ දිගින් දිගටම මේ පළාත් සභාවට මම නැති වෙලාවේ ඇවිල්ලා මඩ ගහන එක වැරදියි. මොකද, අපි යම්කිසි ආත්ම ගරුත්වයක් ඇතිව ජීවත් වන අය. මොකද, අපි මෙවැනි පහත් ආකාරයට කටයුතු කරන්නේ නැහැ. මම මේ ගැන පළමුවෙන්ම ඔබතුමා මගින් මේ කථාව ලියපු මාධ්‍යවේදියාට මගේ කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම මේ ගරු මන්ත්‍රීතුමා කියලා තිබෙනවා මූල්‍ය ප්‍රගතිය ගැන. දැනටමත් අපේ මන්ත්‍රීවරුන් අපි කමිටු හදලා මේ ප්‍රගතිය අද ඉහළ තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. එතකොට මේ මුදල් ඇමතිතුමා එදා 22 වැනිදා සාකච්ඡාවේදී එකඟ වුණා, අපට ලබා දුන්නේ නැති මුදල් 2016 නොවැම්බර් මාසේ අන්තිමට ලබා දෙන්න. එතකොට එතුමා අන්තිම මුදල් ටික නිදහස් කරනවාය කියලා කිව්වේ, දෙසැම්බර් 10. සාමාන්‍යයෙන් අපේ රටේ ක්‍රමය අනුව මූල්‍ය ප්‍රගතිය 100% ක්ම අපේක්ෂා කරන්න පුළුවන් වෙන්නේ දෙසැම්බර් 31 වැනිදාට. මොකද, අපේ රටේ පුරුදු වෙලා තිබෙන්නේ ඒ ආකාරයට. ඒ නිසා එවැනි තත්ත්වයක් තිබියදී දැන් මම මේ වන කොට භෞතික ප්‍රගතිය අරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි ඉහළ අගයක ඉන්නේ. කරුණාකර මේ ගරු මන්ත්‍රීවරු මේ පළාත් සභාව ගැන විවේචනයක් කරනවා නම්, පහත් විධියට කරන්න වටින්නේ නැහැ. දැන් සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයෙකුට යුතුකමක් තිබෙනවා, යම් අමාත්‍යාංශයක ප්‍රගතිය ගැන කථා කරන්න ඉස්සෙල්ලා ඒ අමාත්‍යාංශයේ ඉන්න ලේකම්තුමාගෙන් අහලා කරන්න ඕනෑ. එහෙම කරන්නේ නැතිව -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ලේකම්වරුන්ගෙන් අහලා තමයි ඒ ප්‍රකාශය කළේ. අපි පෞද්ගලිකව ප්‍රකාශ කළේ නැහැ. අපේ හිතුමතේට යම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න එපා. තව විනාඩි 02 ක කාලයක් තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමාට ඕනෑ දෙයක් කියන්න දීලා අපි කට වහගෙන ඉන්න ඕනෑද?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මම කථා කරන්නේ මේ පුවත්පතේ තිබෙන දේනේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ සභාවේ කථා කරන්න තිබෙන අයිතිය නැති කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නැති කරන්නේ නැහැ. ඔබතුමාට අවස්ථාව දුන්නානේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපට ඕනෑ ඉලක්කම් කිව්වේ නැහැ. නිලධාරීන්ගේ ඉලක්කම් මම කිව්වේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

මේ පත්තර වාර්තාව. මගේ කනගාටුව ප්‍රකාශ කරන්නේ මේ අමිත් මධුරංග කියන පත්තර වාර්තාකරුට. මේ අයවැය ගැන පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරු ඉතා ඉහළින් මේ විවාදයට සම්බන්ධ වුණේ. ගරු සභාපතිතුමනි, ඉහළ අගයක මේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු හිටියේ. රණ්ඩු වුණේ දේශපාලන කාරණාවලට විතරයි. නැතිව මේ ප්‍රගතිය - අපට යම් මූල්‍ය අර්බුදයක් තිබෙද්දීත් අපි 11% ක ප්‍රගතියකට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා මේ වාගේ පහත් විධියට මේ වාගේ පුවත්පත්වල වාර්තා කරන්න එපාය කියලා ඔබතුමා මගින් මේ අදාළ මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලනවා. මොකද, අපට මාධ්‍යවේදීන් ගැන මීට වඩා ගරුත්වයක් තිබෙනවා. මාධ්‍ය නිදහස ඉල්ලන මාධ්‍යවේදීන් මේ වාගේ පහත් විධියට මේ වාගේ ලිවීම අපි වාගේ වැඩ කරන පළාත් සභාවකට කරපු බලවත් අසාධාරණයක්.

ඒ වාගේම මෙතුමා කියලා තිබෙනවා, ලක්ෂ 24 ක් ගැන. ගියවරත් ලක්ෂ 25 යි මධ්‍යම රජයෙන් අපට ලැබුණේ. හැබැයි, මම ලක්ෂ 25 ක් නොවෙයි දුන්නේ. පටන් ගන්න කොටම ලක්ෂ 50 ක් සියලුම මන්ත්‍රීවරුන්ට දුන්නා. මේ මන්ත්‍රීතුමාත් මේක අරගෙන තිබෙනවා. එතකොට කිසිම හේතුවක් නැතිව ලක්ෂ 24 ක් ගැන කියනවා. අපි තවම තීන්දුවක් අරගෙන නැහැ, අපි ලබන අවුරුද්දේ කීයක් දෙනවාද කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වාගේ පහත් විධියට මේ සභාවේ විවාදයට එකතු වෙලා, පහත් විධියට අපේ ආත්ම ගරුත්වය කෙළසෙන විධියට කවුරුහරි යම් ප්‍රකාශ කරනවා නම් ඒකත් වැරදියි. හැබැයි, ඒවා සොයන්නේ බලන්නේ නැතිව පුවත්පත්වල පළ කරන එකත් අපට කරන බලවත් අසාධාරණයක්. ඒ නිසා කරුණාකරලා ඔබතුමා මගින් මම මේ සියලුම මාධ්‍යවේදීන්ට දැනුවත් කරන්න කියනවා. මේ සභාවේ ඉඳගෙන පහත් විධියට මේ පුවත්පත් වාර්තා ලියන්න එපාය කියලා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ඔබතුමාට කාලය දෙන්න අමාරුයි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මට පුංචි දැනුවත් කිරීමක් කරන්න තිබෙනවා. ගරු සභාපතිතුමනි, මාධ්‍යට අත දික් කරනවාට වඩා හොඳයි - මාධ්‍යවේදීන් මේකේ හැන්සාඩ් වුණු වාර්තාවක් නේ ගෙනහැර දක්වන්නේ. සමස්ත මාධ්‍යවේදීන් හරහා අපේ මන්ත්‍රීවරුන්ට විශාල සේවාවක් වෙනවා. මන්ත්‍රීවරුන් මේවා ප්‍රකාශ කරන කොට හරියට හරි වැරදි තිබෙනවාද කියලා සොයලා බලලා ප්‍රකාශ කළා නම් හොඳයි. එහෙම නැත්නම් වෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලි කිරීම්වලට කාලය දෙන්න බැහැ. තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි,මාධ්‍යවේදීන් මේ රටේ මාධ්‍ය නිදහසක් ඉල්ලනවා නම්, ඒගොල්ලෝ ඊට වඩා ආචාරශීලී විධියට ලියන්න ඕනෑ. ඒ නිසා මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. පුද්ගලිකව අපි පළාත් සභාවේ මෙපමණ වැඩ කරනවා. අපව අපහසුතාවයට ලක් වෙන විධියට කටයුතු කරන්න එපාය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, 101 බස්නාහිර පළාත් සභාව, 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන වැය ශීර්ෂයන් සම්බන්ධ සාකච්ඡාව අවසන් කිරීමේ මොහොතටයි අපි ළඟා වෙලා තිබෙන්නේ. එම වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඉතාම හරවත්, වැදගත් දේශණ පවත්වමින් සාකච්ඡාවට අවතීර්ණ වුණා. ඒ පිළිබඳව මම ඒ හැම මන්ත්‍රීවරයෙකුටම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මගෙත් විශේෂ ස්තූතියක් පිරිනමන්නට ඕනෑ. අපේ ගරු ආණ්ඩුකාරතුමාට. ඒ වාගේම මම හිතන්නේ, අපේ හිටපු ආණ්ඩුකාරතුමා වන අලවි මවුලානා මැතිතුමාත් හරිම සරල ආණ්ඩුකාරවරයෙක්. හැම කෙනාත් එක්කම සහයෝගයෙන් කටයුතු කරපු, වෘත්තීය සමිති

[ගරු සභාපතිතුමා ]

ව්‍යාපාරයේ කටයුතු කරපු හොඳ ආණ්ඩුකාරවරයෙක්. ඒ නිසා ඊටත් එහාට ගිහිල්ලා අපේ වත්මන් ආණ්ඩුකාරතුමා, විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමන්ලා පිළිබඳව හොඳ අවධානයකින් කටයුතු කරන්නේ. මොකද, මම එතුමාව හමු වෙලා තිබෙනවා. එතුමා මේ සෑම හැන්සාඩ් වාර්තාවක්ම කියවනවා. අපි ගිය වෙලාවේත් එතුමා කිව්වා, ගරු මන්ත්‍රීතුමන්ලා හොඳ ප්‍රශ්න අහනවානේ? කියලා. ගිණුම් කාරක සභාව හොඳට ප්‍රශ්න කරනවානේ? එතුමා හරි සතුටින් කථා කළේ. ඉතින් මම විශ්වාස කරනවා, ඒ වාගේ ආණ්ඩුකාරවරයෙක් අපට අවශ්‍යයි. ඒ නිසා අපි එතුමා වෙනුවෙන් විශේෂයෙන් මගේ ගෞරවය සහ ස්තුතිය පිරිනමනවා. එතුමා පළාත් සභාවේ මන්ත්‍රීවරු වෙනුවෙන් ඒ කරන මෙහෙවර වෙනුවෙන්.

ඒ වාගේම අපේ ගරු මහ ඇමතිතුමා ඉතාම කල කිරීමෙන් කථා කළා. කනගාටුවෙන් කථා කළා. ඒ පිළිබඳව විශේෂයෙන්ම මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා, අසත්‍ය ප්‍රකාශ පළ කරන්න එපා. ඒක ලොකු හානියක්. එතුමන්ලාගේ කීර්තිනාමයට කරන හානියක්. ඔබතුමන්ලාට හැන්සාඩ් වාර්තා අවශ්‍ය නම් මට කියන්න. අද දවසේ විවාදයේදී සාකච්ඡා වුණු, කථා කරපු ගරු ඇමතිවරයෙකුගේ හරි, ගරු මන්ත්‍රීවරයෙකුගේ හරි මොනවා හරි අහගන්න තිබෙනවා නම්, මගෙන් ඉල්ලන්න. මම ඔබතුමන්ලාට දෙන්නම්. ඒ විවාද සම්බන්ධව මම පිටපතක් දෙන්නම්. එහෙම නැතිව ඊට වඩා බාහිරව දේවල් ලියන්න යන්න එපා. ඒක බරපතළ හානියක් කරන්නේ ඒ මන්ත්‍රීතුමාට, ඇමතිවරුන්ට. ඒකයි මහ ඇමතිතුමා ඉතාමත් කලකිරීමෙන් කථා කළේ. මොකද, අපි දන්නවා, මාධ්‍යවේදීන් අපට අවශ්‍යයි. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත්, උදේ ඉතාමත් ද්වේශ සහගතව මාධ්‍යයට කථා කළේ. එතුමිය අල්ලස් ගැන පවා කථා කළා, ඇත්තෙන්ම මාධ්‍ය සම්බන්ධයෙන්. අල්ලස් ගන්නවා. සල්ලි ගන්නවා. බොන්න දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇත්ත සිද්ධි කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මාධ්‍ය ඒ මට්ටමට ගියාම, ඒක පහත්. මාධ්‍යය කියන එක බොහොම උතුම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම ඇතැම් අය ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා මම ඒ ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ. ඒ වාගේම විශේෂයෙන්ම මම ඉල්ලා සිටිනවා. දැන් මෙතැන් සිට අපි අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡාව. ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාත්, විපක්ෂයේ සංවිධායකතුමාත් ප්‍රකාශ කළා, ඒක එතුමන්ලාගේ වරදක් නොවෙයි. මූලාසනයේ වරදක් කියලා. මමත් දැන් හරියටම මූලාසනයේ කටයුතු කරනවා. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාටත් කියනවා. වෙලාවටම අවසන් කරන්න. ගැටළුවක් තිබෙනවා නම්, කිසි දෙයක් නැතිව කපලා අයින් කරන්න. මොකද, මූලාසනයේ වගකීමක් නේ? අපේ වගකීමක් නේ? එතුමන්ලා දැන් අපට අභියෝග කළානේ? කාලය කළමනාකරණය කිරීම මූලාසනයේ වගකීමක්. ඒ නිසා කිසිම ප්‍රශ්නයක් නැහැ. කථික ලැයිස්තුව දුන්නත් කමක් නැහැ. කවුරු තරහා වුණත් කමක් නැහැ. වෙලාවට අවසන් කරලා කපලා දාන්න. මම ඒ ගැන වගකීමක් ගන්නවා. මම අහගෙන හිටියේ. ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කියනවා මම අහගෙන හිටියේ. අපි බොහොම සාධාරණව වැඩ කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පසුව අවස්ථාව දෙන්නම්. ඒ නිසා අපි සහයෝගයෙන් වැඩ කරමු. දැන් සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා, එතුමන්ලාට අවසරය ලැබුණාය කියලා ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාට

සහයෝගය දක්වන්නය කියලා. ඒ නිසා අපි ඔක්කොම මේ ගමන සහයෝගයෙන් යමු. අපි වැඩක් කරමු. ඒකයි අවශ්‍ය වෙන්නේ. ඒ අනුව ශීර්ෂ අංක 100, 101, 102 සාකච්ඡාව අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් ඉල්ලන්නේ නැහැ. ඒ අනුව මෙම වැය ශීර්ෂයන් සභා සම්මත වූ වැය ශීර්ෂයන් බව ඉතා සතුටින් ප්‍රකාශ කරනවා. ඒ වාගේම මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, ගරු ආණ්ඩුකාරතුමාටත් මේ විවාදයේ පිටපතක් ලැබෙන්න සලස්වන්නය කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ආණ්ඩුකාරතුමා ගැන කථා කරද්දීඅපට අවස්ථාවක් ගන්න බැරි වුණා. නමුත් මෙතැන හුඟක් තරුණ නවක මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. නමුත් එතුමා හමු වෙලා අපට වචනයක්වත් කථා කරන්න අවස්ථාවක් ලැබිලා නැහැ. අපි ඉල්ලා සිටිනවා, එතුමාව ගෙන්වලා සම්බන්ධ කරලා දෙන්නය කියලා, මහ ඇමතුමා මාර්ගයෙන්. එතුමා කළු ද සුදු ද කියලා අපි දන්නේ නැහැ. හැමෝම හොඳයි කියලා කියනවා. අපටත් කථා කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. කීප දෙනෙක් කථා කරලා තිබෙනවා, සැසියක් තියමු කියලා. ඒ නිසා මහ ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා, එතුමාගේ සහයෝගය ලබා ගෙන අපි ජනවාරි මුල තමයි අපි ඊළඟ සභාව ආරම්භ වෙන්නේ. ඔබතුමාත් උදව් කරන්න. අපි සැසියක් තියන්න උත්සාහ කරමු. එතකොට ගරු මන්ත්‍රීතුමන්ලාට පුළුවන් එතුමාව හඳුනාගෙන කටයුතු කරන්න.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 104** | - | **පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 109** | - | **ප්‍රධාන ලේකම් කාර්යාලය** |
| **ශීර්ෂ අංක 110** | - | **ඉංජිනේරු කාර්යාංශය** |
| **ශීර්ෂ අංක 111** | - | **ආදායම් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 112** | - | **පළාත් පාලන දෙපාර්තමේන්තුව** |
| Head No 104 | - | Ministry of Local Government, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs. |
| Head No 109 | - | Chief Secretary’s Office |
| Head No 110 | - | Engineering Organization |
| Head No 111 | - | Department of Revenue |
| Head No 112 | - | Department of Local Government |

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, *“ශීර්ෂ අංක 109, 110, 111 සහ 112 වැය ශීර්ෂවලින් රු. 10/- ක් කපා හැරිය යුතු යැයි”* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විවාදයට සම්බන්ධ වෙන්නය කියලා ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.07]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා නියෝජනය කරන පළාත් පාලන හා පරිසර කටයුතු අමාත්‍යාංශය යටතේ මේ විවාදය ආරම්භ කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම, මගේසමකාලීන දේශපාලන මිත්‍රයා, අද මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධූරය දැරීම පිළිබඳව මට විශේෂ සතුටක් තිබෙනවා. අපි දෙන්නාම එකටයි දේශපාලනය ආරම්භ කළේ. 1991 දී එතුමා මහරගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියටත්, මම වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියටත් ඒ කාලේ අපේ ගාමිණී තිලකසිරි මැතිතුමා කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියටත්, අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා පානදුර

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

ප්‍රාදේශීය සභාවේත් පත් වුණු අය. අපි බොහෝ දෙනෙක් පළාත් පාලන ආයතන නියෝජනය කරලා මේ පළාත් සභාවට පත් වුණු මන්ත්‍රීවරු. පළාත් පාලන ක්ෂේත්‍රය පිළිබඳව අත්දැකීම් තිබෙනවා. අද අපට මේ සභාවේ 2017 අයවැය ලේඛනය පිළිබඳව කථා කරන්න කලින් අපේ අතිගරු ජනාධිපතිතුමා, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම පසුගිය සෙනසුරාදා පාර්ලිමේන්තුවට කැඳවලා, බොහොම පැහැදිලි උපදෙසක් දුන්නා. ඉසුර දේවප්‍රිය ප්‍රධාන අමාත්‍යතුමාට 2017 දී මේ බස්නාහිර පළාත් සභාවේ මුදල් ප්‍රකාශය සම්මත කර ගන්න, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ සහයෝගය ලබා දෙන්නය කියලා.

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

එහෙම නම් මේ විවාදය අවශ්‍ය නැහැ නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

විවාදයක් තිබෙන්න ඕනෑ. මේකේ ඉන්නවා එතුමාගේ කකුලෙන් අදින කට්ටියක්. ඒ නිසා ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මහත්මයාණෙනි ඔබතුමන්ලාගේ කණ්ඩායම එතුමාට සහයෝගය දෙන්නය කියලා කාරුණික ඉල්ලීම කළා. ඒ කාරුණික ඉල්ලීමට එකඟතාවය පළ කරමින් විවේචනාත්මක විවාදයක නිරත වෙන්න තමයි මගේ අදහස. ඒ නිසා මම විශේෂයෙන්ම එතුමාගේ විෂය පථයට අයත් වන පළාත් පාලන ක්ෂේත්‍රයේදී විශේෂ ඉල්ලීමක් විධියට මගේ කථාව ආරම්භයේදීම මම කියනවා පළාත් පාලන ආයතනයකින් ආපු මන්ත්‍රීවරයකු හැටියට, අද වන කොට ඉතාම සෝචනීය තත්ත්වයක් මේ පළාත් පාලන ආයතන හරහා තිබෙනවා. විශේෂම කාරණාව තමයි මේ පළාත් පාලන ආයතනවල මැතිවරණ නොපැවැත්වීම. මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මධ්‍යම රජයේ විෂය භාර අමාත්‍යතුමාගෙන්, අතිගරු ජනාධිපතිතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරන්න. කරුණාකර ඒ නිර්දේශය දෙන්න. 2017 වර්ෂයේ මුල් කාර්තුවේදී මේ රටේ තිබෙන සෑම පළාත් පාලන ආයතනයකම මේ මහජන නියෝජිතයන්ගෙන් සැදුම් ලත් පළාත් පාලන ආයතන මැතිවරණය පවත්වන්නය කියලා. ඒක බොහොම වැදගත්, කාරුණික ඉල්ලීමක්. අද අයාලේ යන පළාත් පාලන ආයතන තිබෙන්නේ. මොකද, මහජන නියෝජනයක් නැහැ. විශේෂ කොමසාරිස්වරු හරහා පාලනය වෙන්නේ. තම තමන්ට හිතු හිතු විධියට වැඩ කරනවා. හැමෝම නොවෙයි. සමහර අය.

බොහොම නියාමනයක් කරන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා උත්සාහ කරනවා. නමුත් සමහර අය තමන්ගේ හිතු මනාපයට වැඩ කරනවා. මේවා කියන්න කනගාටුයි. ඒගොල්ලන්ට අත්දැකීම් නැහැ. ඒ නිලධාරීවාදය තිබෙනවා. මහජනතාවත් එක්ක ගැටීමක් නැහැ. කවුරු හරි නියෝගයක් දුන්නොත්, ඒක කරනවා. මහජනතාවගේ අවශ්‍යතාවය නොවෙයි, ඉෂ්ට වෙන්නේ. ඒ නිසා මේ වසර දෙකකට ආසන්න කාලයක් මේ පළාත් පාලන ආයතනවලින් සාමාන්‍ය මහජනතාවට වෙන්න ඕනෑ සේවාවන් හරියට ඉෂ්ට වෙන්නේ නැහැ. ඒ නිසා අද මෙය අවස්ථාවක් කර ගන්නවා. නව මැතිවරණ ක්‍රමය දැන් ස්ථාපිත කරලා අවසානයි. ඒක මම හිතන්නේ, ඉතාමත් හොඳ ක්‍රමයක්. සමානුපාතික ඡන්ද ක්‍රමයත්, කේවල ඡන්ද ක්‍රමයත් දෙකම එකට එකතු කරලා තමයි මේ මැතිවරණය පවත්වන්න තීරණය කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ ක්‍රමයට මම හිතන්නේ හොඳ මහජන නියෝජිතයෝ පත් කර ගන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවා. මහජනතාවට සේවය කරන්න පුළුවන් වන විධියට ඒ මැතිවරණය පවත්වන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ නිසා මේ වකවානුවේදී අපි දන්නවා. අපේ පළාත්වල විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා, නගර සභා මාර්ගවල තත්ත්වය ඉතාමත්ම අසතුටුදායක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද වන කොට පළාතේ ප්‍රාදේශීය සභා මාර්ග කොන්ත්‍රාත් දීලා හදන කොට - මම උදාහරණයක් කියන්නම්. සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂයක්. ලක්ෂයකට හදන්න බැහැ පාරවල්. මම මේ උදාහරණයක් කියන්නේ. ලක්ෂයකට හදන්න කොන්ත්‍රාත් එක දුන්නාම ඇස්තමේන්තුව සකස් කරනවා. මොකද, කොන්ත්‍රාත්කරුවාට යහපතක් වෙන විධියට නේ මේක හදන්න ඕනෑ. එතකොට ඒ මිනිහාට ලාභයක් එන්න හදන්න ඕනෑ. මේක අඩුම තරමින් 20% ක් වත් කොන්ත්‍රාත්කරුවා ලාභයක් තියාගෙන තමයි වැඩේ කරන්නේ. එතකොට ලක්ෂයකට ඇස්තමේන්තුව හැදුවාම රුපියල් අසූ දාහක පමණ වැඩක් තමයි වෙන්නේ. එතකොට සාමාන්‍යයෙන් මෙය ගමේ සමිතියකට දෙනවා. ටෙන්ඩර් කරන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම අද ටෙන්ඩර් පටිපාටියක් සිද්ධ වෙන්නේ නැහැ. එතකොට ගමේ සමිතියට 10% ක් දෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

5% යි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

5% හරි 10% හරි. TO මහත්තයාට දෙන්න ඕනෑ. දේශපාලන අධිකාරියේ අය ඉන්නවා. ප්‍රාදේශීය සභාවලට ගිහිල්ලා බලන්න. එතැනට වෙලා කාක්කෝ වාගේ ඉන්නවා. ගිහිල්ලා බලන්න මම මේ කියන්නේ බොරුද කියලා. 30% ත් 35% ක් නිරපරාදේ මේ වෙන් කරන මුදල්වලින් යනවා. අර ගමේ වැඩේ වෙන්නේ නැහැ. රුපියල් ලක්ෂයක් වෙන් කළාම රු. 60,000 ක 65,000 ක වැඩක් තමයි වෙන්නේ. සමහර විට රු. 55,000 ක් විතර වාගේ වෙන්නේ. ඒ නිසා මේ ක්‍රමය සම්පූර්ණ අසාර්ථකයි. මෙවැනි වැඩ කරද්දී මීන් ඉදිරියට මේ තාර දාන වැඩ - අපේ කාලයේ දෙපාර්තමේන්තු ක්‍රමයකින් කියලා එකක් තිබුණා. දෙපාර්තමේන්තු ක්‍රමයට වැඩ කරන්න පුළුවන් හොඳ තාක්ෂණ නිලධාරීන් හිටියා. මේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන්න. පාරවල් කොන්ක්‍රීට් කිරීමේදී, කාපට් කිරීමේදී දීර්ඝ කාලීනව කරන්න පුළුවන්. මිල ටිකක් වැඩි වෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම ඒවායේ ඵලදායීතාවය තිබෙනවා.

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මම දැක්කා. ඔබතුමා පසුගිය අවුරුද්දේ මහරගම ඇතුළු ඔබතුමාගේ ඒ වපසරිය තිබෙන ප්‍රදේශයේ ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. ඒක සාධාරණයි. දැන් උපාලි කොඩිකාර හිටපු ඇමතිතුමා ඊයේ කිව්වා. මෙපමණ ප්‍රමාණයක් කරලා තිබෙනවා, මගේ නෝනා ඉන්න කාලයේ කියලා ලොකු ප්‍රකාශයක් මෙතැන කළා. බලන්නකෝ එතකොට මහරගම කොහොමද? එතුමාගේ නෝනා ඉන්න කොට එහෙමයි. දැන් අපේ මහ ඇමතිතුමා ඉන්නවා. මහරගම බැබළෙනවා ඇති. ඒ වාගේ තමයි. අනික් මන්ත්‍රීවරුත් ආසයි. දැන් ජා-ඇළට ගිහිල්ලා බලන්නකෝ. ජා-ඇළ තිබෙන්නේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ බෝඩ් විතරයි. වෙන කාගේවත් නැහැ. එතුමා ඇත්තටම දක්ෂයි. හොඳටම හදලා තිබෙනවා. මට ඇත්තටම සන්තෝෂයි. පාරවල් එකකවත් තාර දාලා නැහැ. හොඳ කාපට් පාරවල් හදලා තිබෙන්නේ. ඒක කියන්න ඕනෑ. කොහෙන් හරි සල්ලි හොයලා කාපට් පාරවල් හදලා තිබෙනවා. වත්තල පාරවල් හැදෙනවාට මම කැමැති නැද්ද? ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කැමති නැද්ද? කැමැතියි. ඒ නිසා ඒ වරප්‍රසාදය අනික් මන්ත්‍රීවරුන්ටත් දෙන්න. ඔබතුමාට තමයි ඒ බලය තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, කියන්න ඕනෑ. මම මහරගම පාරවල් කාපට් කරලා තිබෙන්නේ, පළාත් සභා සල්ලිවලින් විතරක් නොවෙයි. මොකද, නගර සභාවේ සල්ලිවලින් තමයි මම පාරවල් කාපට් කරලා තිබෙන්නේ. ඒක මම මගේ කථාවේදී පැහැදිලි කරන්නම්. අනික් පළාත් පාලන ආයතනවලත් ක්‍රියාත්මක කරනවා. ගරු සභාපතිතුමනි, කොන්ක්‍රීට් කරනවාට වඩා ලාභයි කාපට් කරන එක.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි කිව්වේ. පාරවල් කොන්ක්‍රීට් දාන්නේ නැතිව කාපට් කරන්නය කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

පළාත් සභාවේ සල්ලි නොවෙයි. මම මහරගම නගර සභාවේ තිබෙන සල්ලි ප්‍රමාණයක් අරන් කාපට් කරලා තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමා ඒ මහරගමට කරන දේම තමයි අපි ඉල්ලන්නේ අනික් පළාත් පාලන ආයතනවලටත් මේක කරන්න. මේක දීර්ඝ කාලීන වැඩ සටහනක්. එතකොට මුදල් නාස්ති වෙන්නේ නැහැ. කොන්ත්‍රාත්කරුවන් ගසා කන්නේ නැහැ. අතරමැදියෝ ගසා කන්නේ නැහැ. නිකම් සමිතිවලට සල්ලි දෙන්න උවමනා නැහැ. දෙපාර්තමේන්තු ක්‍රමයට කරන්න. මේවා අපි අත්දැකීම් ඇසුරින් කියන්නේ. ඒ නිසා ඒ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න උවමනා කරන ශක්තිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ලැබෙන්නය කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම දැන් මේ පාරවල්වල වීදි ලාම්පු නඩත්තු කරන්නේ නැහැ. ගිහිල්ලා කිව්වාම කියනවා දැන් ටියුබ්

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

ලයිට් දාන්නේ නැහැ. දැන් තිබෙන්නේ මර්කරි ලයිට්. මර්කරි බඩු ගේන්නේ නැහැ, එක එක්කෙනාට ඕනෑ විදියට. අපේ පළාත්වල ප්‍රදූමාකාර කරදරයක් තිබෙනවා. පල්ලියේ මංගල්‍යවලට පාරවල් සුද්ද කරන්න ඕනෑ. වීදි ලාම්පු ටික දාන්න ඕනෑ. කඨින පිංකම් තිබෙනවා. පසුගිය ටිකේ පුදුම කරදරයක්. මේවා ගිහිල්ලා කිව්වාම කරන්නේ නැහැ. නියමිත කම්කරු ප්‍රමාණය වැඩ කරන්නේ නැහැ. මේවා පිළිබඳව නියාමනයක් නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරන්නේ. මොකද, මේවා ගිහිල්ලා කිව්වාට ඒ ලේකම්වරුන්ට ලොකු උවමනාවක් නැහැ. ඒ අය මහජනතාව අතරින් ආපු අය නොවන නිසා. මේ බඩු ගේන කොට ඇත්ත වශයෙන්ම නියම ප්‍රමිතිය නැහැ. ඒ නිසා මේවා පිළිබඳව කටයුතු කරද්දී මීට වඩා ටිකක් සැලකිලිමත් වෙන්න ඕනෑ. දැන් මහජන නියෝජිතයෝ ඉන්න කොට කාට හරි වගකීමක් තිබෙනවා. දැන් මේ වගකීමෙන් ටිකක් බැහැර වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දැන් පළාත් පාලන ආයතනවල වීදි ලාම්පු සවි කරන කොට විදුලි බල මණ්ඩලයට සහ අපේ පළාත්වල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයයි තිබෙන්නේ. නියමිත වෙලාවට අවසාන කරන්න. ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මට කරන්න දෙයක් නැහැ. මට කාලය සීමා කරන්න සිද්ධ වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි දෙකක් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි දෙකක් දෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මම අවසාන කරන්නම්. ඒ නිසා ඒ පිළිබඳව සොයා බැලීමක් කරන්න. ඒ වාගේම සන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රශ්නය. මම බොහොම සන්තෝෂ වුණා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ මීතොටමුල්ලේ තිබෙන කුණු කන්ද ගැන දැඩි තීරණයක් ගත්තා. අපි දැක්කා. බ්‍රිතාන්‍ය සමාගමක් ගෙනැල්ලා රූපවාහිනියෙන් ලොකුවට පෙන්වලා, එතුමාට වඩා හුඟාක් උස සුදු මහත්වරු වගයක් ඇවිල්ලා ෆොටෝ ගහලා, රූපවාහිනියෙන් පෙන්වලා දැන් මේ කුණු කන්ද කළමනාකරණය කරන්න ලොකු වැඩ සටහනක් ගියා. නිර්භීත පියවරක් ගත්තා. දැන් මේක ලොකු විශාල කරීකාවක් නේ? හැබැයි, ඒක එතැන ලත් තැනම ලොප් වුණා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

බාධා කරනවා නොවෙයි. ගරු සභාපතිතුමනි, අගමැතිතුමා ඒක මීතොටමුල්ලයි කරදියානයි ආර්ථික කමිටුව හරහා ඉල්ලලා තිබෙනවා. දැන් ඒ වැඩේ කර ගෙන යනවා. ලත් තැනම ලොප් වෙලා නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැහැ. අපි මේක දැන ගන්න එපැයි. එදා ඒ වැඩ සටහන පටන් ගන්න කොට අපි හිතුවේ මේක පහුවෙනිදාම ක්‍රියාත්මක වෙයි කියලා. එතුමා ඉල්ලුවා පර්චස් 40 ක් දෙන්න. මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්නය කියලා. මමත් ඒ ගැන සන්තෝෂයි. මොකද, මේක දැන් තිබෙනවා. මෙගා පොලිස් එක යටතේ දෙන්නේ නැහැයි කියලා අදහසක් අපට ආවා. වත්තල තිබෙනවා අක්කර 40 ක්. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ඉන්න කාලයේ සාමයික කේන්ද්‍රයක් හදන්නය කියලා, ඉන්දියාවට පේන්න ලොකු පිළිමයක් හදන්නය කියලා අක්කර 40 ක් තිබෙනවා. මේ අක්කර 40 න් එක අක්කර 10 ක් දුන්නා නම් මේ කුණු හොඳට කළමනාකරණය කරන්න පුළුවන්. වත්තල කියන්නේත් නාගරීකරණයට ලක් වුණු ප්‍රදේශයක්. වත්තල, ජා-ඇළ කෙළින්ම එහා පැත්තේ. අපි සන්තෝෂයි දෙන්න කියලා. දැන් මේ අමාත්‍යවරු ඔක්කොම යහපාලන ආණ්ඩුවේ ඉන්න අමාත්‍යවරු නේ? කථා කරලා ගන්න පුළුවන්කම තිබුණා නේ? මම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාටත් මේ ගැන පුද්ගලිකව කිව්වා. මේක පුළුවන්නම් අරගෙන දෙන්නය කියලා. මේක ජාතික ප්‍රශ්නයක්. ජා-ඇළට කුණු ටික ගියාම ඒ පළාතේ ඉන්න

මන්ත්‍රීවරු විරුද්ධ වුණා. අගමැතිතුමා එදා අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාටත් දොස් කිව්වා, මේක කරන්න දුන්නේ නැහැයි කියලා. එහෙම තැන් තැන්වල කුණු හලලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මේක නිසි පරිදි කළමනාකරණය කරන්න ඕනෑ. ඒ නිසා මේකට විසඳුමක් දෙන්න. මේ කුණු ප්‍රශ්නය නිසා හිටපු මහ ඇමතිවරු කී සැරයක් රට ගියාද? සොයලා බලන්න. රටවල් 40 කට විතර ගියා මේ කුණු කළමනාකරණය ගැන බලන්න. අපිව කේරලේටත් යැව්වා. ඉන්දියාවට කී සැරයක් ගියාද? පළාත් සභාවේ මන්ත්‍රීවරු විදේශීය රටවලට යැව්වේ, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩිදුර පුහුණුව සඳහා. රෙජිනෝල්ඩ් කුරේ හිටපු මහ ඇමතිතුමා පින්ලන්තයටත් ගියා. ඒත් කුණු ගොඩ එහෙම්මමයි. කුණුවලට මුකුත් වුණේ නැහැ. ඒ නිසා කුණුවලට තිත තියන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝධ ශක්තිය, යෝධ හයිය ගරු අගමැතිතුමාගේ මාර්ගයෙන්වත් ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, වත්තලට කුණු ගෙනියන්න ඕනෑ නැහැ. වත්තල මහා කුණු කන්දක් ඉන්නවා. ජෝන් අමරතුංග.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ජෝන් අමරතුංග මැතිතුමා කුණු කන්දක් නොවෙයි. එතුමා හොඳ කතෝලික ඇමතිවරයෙක්. තමුන්නාන්සේ වාගේ කුණු කන කෙනෙක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ආණ්ඩු පක්ෂය වශයෙන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.18]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රධාන අමාත්‍යවරයාගේ පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු හා සංචාරක අමාත්‍යාංශය වෙනුවෙන් අදහස් දැක්වීම සඳහා විනාඩි 10 ක කාලයක් ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විෂයයන් ගණනාවක් තිබුණත්, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා අන්තිමට කථා කළ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙනුවෙන් තමයි කථා කිරීමට බලාපොරොත්තු වෙන්නේ. මොකද, අපි දන්නවා. 1999 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තිය පිහිටුවලා 2004 දී මේ අධිකාරිය පිහිටෙව්වා. ඒ වාගේම 2007 දීත්, 2009 දීත් අංක 01 වශයෙන් සංශෝධන ගණනාවක් කළා. ඒ වාගේම තමයි අද මේ වන කොට ලංකාවේ තිබෙන අපේ නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය බැලුවොත් 60% ක්ම ජනනය වෙන්නේ අපේ මේ බස්නාහිර පළාතේ. එක දිනකට ගත්තොත් මෙට්‍රික් ටොන් 3500 ක් විතර මේ වන කොට අපේ බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය ජනනය වෙනවා.

ඒ වාගේම වාර්ෂිකව ගත්තොත් ප්‍රතිශතයක් හැටියට 1% ක් 2% ක් ප්‍රමාණයකින් තමයි වැඩි වෙන්නේ. ඒ වාගේම මේ වන කොට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මම හිතන්නේ, 2050 වන විටවත් ඒගොල්ලෝ බලාපොරොත්තු වෙනවා, නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය වන කොට මෙට්‍රික් ටොන් 5000 දක්වා ප්‍රවණතාවයකින් පැවැත්වෙයි කියලා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. මොකද, පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. මහ නගර සභා 07 ක්, නගර සභා 14 ක් සහ ප්‍රාදේශීය සභා 27 ක් තිබෙනවා. ඒ වාගේම ගම්පහ 19 ක්, කොළඹ 13 ක්, කළුතර 16 ක්. මේ පළාත් පාලන ආයතනවලින් විශේෂයෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හරහා අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්. මොකද, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට අද බස්නාහිර පළාත් සභාවට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, මේ කුණු කසළ ප්‍රශ්නය. 2004 සිට මේ වන කොට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවලා අවුරුදු 12 ක් වෙනවා. අද වන කොට ගත්තොත් එහෙම මුළු බස්නාහිර පළාතේම එකතු වන කුණු සංඛ්‍යාව මෙට්‍රික් ටොන් 2051.75 ක්.

[ගරු මෙරිල් පෙරේරා ]

කොළඹ දිස්ත්‍රික්කයේ ආයතන 13 ක් තිබෙනවා. එතැනින් මෙට්‍රික් ටොන් 1421 ක්. ඒ වාගේම ගම්පහෙන් මෙට්‍රික් ටොන් 428 ක්. ඒ වාගේම කළුතරින් මෙට්‍රික් ටොන් 202 ක්. ඒ වාගේම මේ වන කොට කොම්පෝස්ට් අංගන හැටියට මේ පළාත් පාලන ආයතන 48 න් 22 ක පිහිටුවලා තිබෙනවා. ඒ වාගේම අපේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හරහා කොම්පෝස්ට් අංගන හැටියට අධිකාරියට අයිති තවත් ආයතන 03 ක් තිබෙනවා. එතකොට සියලු ආයතන 25 ක් තිබෙනවා. ඒ වාගේම තමයි කොම්පෝස්ට් අංගනවලට කොළඹින් මෙට්‍රික් ටොන් 85 කුත්, ඒ වාගේම ගම්පහින් මෙට්‍රික් ටොන් 63 කුත්, කළුතරින් මෙට්‍රික් ටොන් 51 කුත් එකතු වෙනවා. එතකොට එක දිනකට එකතු වන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 200 ක් විතර වෙනවා. ඒ වාගේම ප්‍රතිචක්‍රීකරණය කරන්න කොළඹින් මෙට්‍රික් ටොන් 98 කුත්, ගම්පහින් මෙට්‍රික් ටොන් 20 කුත්, කළුතරින් මෙට්‍රික් ටොන් 12 කුත් එකතු වෙනවා. ඒකේ එකතුව බැලුවොත් මෙට්‍රික් ටොන් 131 යි. හැබැයි, දවසකට කොළඹ ඉතිරි වෙනවා මෙට්‍රික් ටොන් 1237 ක්. ගම්පහින් 344 ක්. ඒ වාගේම කළුතරින් 138 ක්. දැන් ප්‍රධාන අමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, අපි දකින දේ තමයි කසළ බැහැර කිරීම. අපි ගත්තොත් මේ වන කොට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් කොම්පෝස්ට් බින් බෙදා දෙන එක, ට්‍රැක්ටර්වලට මුදල් ලබා දෙන එක, ට්‍රැක්ටර් නඩත්තු කරන්න මුදල් ලබා දෙන එක මහා අපරාධයක්. ඊට එහා වැඩ සටහනකට මේ බස්නාහිර පළාත ක්‍රියාත්මක කරන්න ඕනෑ. පළාත් පාලන ආයතනවලින් මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. මොකද, එක ට්‍රැක්ටරයකට කුණු ගෙනියන්න පුළුවන් උපරිම ප්‍රමාණය ටොන් 02 යි.

සාමාන්‍යයෙන් අද පළාත් පාලන ආයතනයක් පවත්වාගෙන යන කොට කසළ එකතු කරන්නේ ටොන් 1.5 ක්. නමුත් අපි කම්පැක්ට් කරන රථයක් අරන් දුන්නොත් පළාත් පාලන ආයතනයකට, ටොන් 08 ක් මේ කම්පැක්ට් කරන රථයට එකවර අරගෙන යන්න පුළුවන්. ඒ නිසා අපි විශ්වාස කරනවා. ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියනවා. ලබන අවුරුද්දේ මේ වාගේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වෙනවා. මොකද, ආයතන 48 යි තිබෙන්නේ. කම්පැක්ට් රථ අඩුම ගණනේ 48 ක් මේ නගර සභා, ප්‍රාදේශීය සභාවලට ලබා දුන්නොත් අපි මේ ට්‍රැක්ටර්වලට වෙන් කරන මුදල අයින් කරලා මේ රථවලින් - මොකද, ඒ රථයෙන් අරන් යන කොට අද පිටරට තිබෙනවා. අපි දකිනවා. බිමට පෙරෙන්නේ නැහැ. ඒකට අවශ්‍ය උපකරණ හයි කරලා තිබෙනවා. එක බින්දුවක්වත් බිමට වැටෙන්නේ නැහැ. ගඳ එනේ නැහැ. ඒ වාගේම පාරවල්වල හලා ගෙන යන්නේ නැහැ. අද මේ ට්‍රැක්ටර් රථවලින් අරයන් යන එකෙන් එක පැත්තකින් පාරවල් අපවිත්‍ර වෙනවා. එක පැත්තකින් ගඳ ගහනවා. එක පැත්තකින් මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන කොට ඒ කම්කරුවන් විශාල අපහසුවකට පත් වෙනවා. ඒ නිසා ඒ වාගේ වැඩ පිළිවෙළක් මේ පළාත් සභාව තුළින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් ක්‍රියාත්මක කරන්නය. මොකද, ඒක අත්‍යවශ්‍යම දෙයක්.

ඒ වාගේම තමයි ආයතනවලට කසළ බැහැර කරන්න ඉඩම් ලබා දෙන්න ඕනෑ. ඉඩම් ගත්තොත් කොළඹට තිබෙන ආයතන 13 න් ඉඩම් තිබෙන්නේ 07 යි. ආයතන 06 කට ඉඩම් නැහැ. ඒ වාගේම ගම්පහට ආයතන 19 ටම ඉඩම් තිබෙන්නේ දෙකයි. ආයතන 17 කට කසළ බැහැර කරන්න ඉඩම් නැහැ. ඒ වාගේම කළුතර ආයතන 16 ටම ඉඩම් තිබෙන්නේ 10 යි. ආයතන 06 කට ඉඩම් නැහැ. මේ කසළ අපහරණය, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හරහා කසළ අපහරණය කරන්න නම් විශේෂයෙන්ම එක පැත්තකින් මේ කම්පැක්ට් රථ ටික ලබා දෙනවා වාගේම ඒ වාගේම අනික් පැත්තෙන් අපට අත්‍යවශ්‍ය ඉඩම් ටික ලබා දෙන්න ඕනෑ, මේ කසළ අපහරණය කරන්න. අපි විශේෂයෙන්ම ගිණුම් කාරක සභාවේදී, පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වයෙන් අයවැය සම්බන්ධව කථා කරද්දී අපි දැකපු දෙයක්තමයි. මේ කසළ අපහරණය නිසා පෞද්ගලික ආයතනවලට විශාල මුදලක් වෙන් කරනවා. ඒ නිසා ඒ මුදල් ටික වෙන් නොකර එක මුදලක් වෙන් කරලා බැංකුවකින් ණයක් අරන් හරි ඉඩමක් අරගෙන දුන්නොත් තමන්ගේ ඉඩමකටම කසළ අපහරණය කරන වැඩ සටහන ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේ ගැන ගරු ප්‍රධාන අමාත්‍යතුමා අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය එතුමාට අයිති නිසා.

ඒ වාගේම තමයි අනික් පැත්තෙන් මේ කොම්පෝස්ට් ආයතන වැඩි දියුණු කිරීම. මේ වන කොට මේ පළාත්

සභාව තුළින් මේ අවුරුදු 12 තුළ ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ යටතේ තිබුණු මේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හරහා පළාත් පාලන ආයතන 22 කට කොම්පෝස්ට් අංගන 22 ක් හදලා තිබෙනවා. මේ 22 ට මීට වඩා ප්‍රමාණයක් කොම්පෝස්ට් පොහොර හදන්න සහ ප්‍රතිචක්‍රීකරණය කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. අන්න ඒ පහසුකම් ටික ලබා දෙන එකත් අත්‍යවශ්‍ය එක කරුණක්. ඒ වාගේම තමයි අද පළාත් පාලන ආයතනවලින් මීට වඩා ක්‍රියාත්මක කරන්න ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, පළාත් පාලන ආයතනවලට වෙන් වෙන් වශයෙන් දෙන පොලිතින් බෑග් ටික ගෙවල්වලට ලැබෙන්න සැලැස්සුවොත් මේ ගෙවල්වලින්ම දිරන අපද්‍රව්‍ය සහ නොදිරන අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් ගන්න පුළුවන්. අපි අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් කොම්පෝස්ට් බින් කියලා බාස්කට් වගයක් බෙදනවා. ඒ බාස්කට් එකට කවදාවත් කුණු දාන්නේ නැහැ. අලුත්ම බාස්කට් එකක් දුන්නාම ඒක වෙන දේවල්වලට පාවිච්චි කරනවා. ඒක අපරාධයක්.

ඒ වාගේම මම දැක්කා, තවත් එක් එක් වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා. නමුත් ග්‍රාම සේවක කොට්ඨාශ මට්ටමින් මේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හරහා පළාත් පාලන ආයතන එකතු කර ගෙන ගමට ගිහිල්ලා, ජනතාව දැනුවත් කරලා මේ කොම්පෝස්ට් බින් දෙන්නේ නැතිව මේ පොලිතින් බෑග් ලබා දුන්නොත් ඒ පොලිතින් බෑග් ටිකේ කුණු ටික වෙන් කරලා ගෙවල් ඉස්සරහා තියයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, ඒ වන කොට මේ කම්පැක්ට් රථය හෝ ට්‍රැක්ටර් රථය ගිහිල්ලා මේ වෙන් වන කුණු ටික අරගෙන ආවොත් දිරන සහ නොදිරන කුණු ටික වෙන් වෙන් වශයෙන් ලැබුණොත්, මේ ටොන් ප්‍රමාණය එක පැත්තකින් අඩු කරන්න පුළුවන්. ඒ වාගේම කොම්පෝස්ට් අංගනයට සහ අපි කසළ බැහැර කරන එකට වෙන් වෙන් වශයෙන් ලැබුණාම මීටත් වඩා දිගටම ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ නිසා අපි විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ප්‍රධාන අමාත්‍යතුමාට දන්වනවා. මේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හරහා හැම වසරකම මුදල් වෙන් වෙනවා. මේ මුදල් වෙන් වීමේදී ඒකට අවශ්‍ය පහසුකම් ලබා දීමට අවශ්‍ය මුදල් ටික වෙන් කරලා මේක ක්‍රියාත්මක කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ. එතුමා කිව්වා, වර්තමාන අගමැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට කථා කරලා ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමතිතුමාට සහයෝගය දෙන්නය කියලා කිව්වා කියලා. එතුමන්ලාට කියන එක හරි. මොකද, එතුමන්ලා ඉන්නේ විපක්ෂයේ. ආණ්ඩු පක්ෂයේ නොවෙයි. විපක්ෂයක් හැටියට එතුමන්ලාට සහයෝගය දෙන්නය කියන එක එතුමන්ලාගේ නායකතුමාගේ වගකීමක්. මොකද, පැහැදිලිව කියන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ඒකාබද්ධ විපක්ෂය කියලා කියන්නේ, විපක්ෂයක් නැති නිසා ඒකාබද්ධ වෙලා විපක්ෂය හැටියට පෙනී සිටින එකක්. මේකේ විපක්ෂය, එක්සත් ජාතික පක්ෂය සහ අනෙකුත් පරාද වුණු, විපක්ෂයට පත් වුණු ඉන් ගිහිල්ලා තිබෙන මන්ත්‍රීවරු. අපි ඉන්නේ ආණ්ඩු පක්ෂයේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

එතකොට ඔබතුමන්ලාගේ විපක්ෂයක් නැද්ද? පොහොට්ටුවක් නැද්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට කරදර කළේ නැහැ නේ? ඒ නිසා කරුණාකරලා අහගෙන ඉන්න. මම ඊයෙත් මේක කිව්වා. 2014 වසරේ පළාත් සභා මැතිවරණය පවත්වලා සන්ධානයෙන් ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරු 56 කුත්, වෙනත් පක්ෂවල මන්ත්‍රීවරුන් 05 දෙනෙකුත් එකතු වෙලා මෙතැන 61 ක් ඉන්නවා. හැබැයි, අපට කවුරුවත් කථා කරලා එන්නය කියලා ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සහයෝගය දෙන්න එපාය කියලා කිව්වෙත් නැහැ. ඒගොල්ලන්ට කියලා තිබෙනවා. අපට කිව්වේ නැහැ. අපට කියන්න දෙයක් නැහැ. අපි සන්ධානයේ ඉන්නේ. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. මෙතුමන්ලාත් කාලයක් ඉන්න කොට මෙතුමන්ලාට කැමැති නායකයින්ට ගිහිල්ලා වැඩ කළා. එතකොට අපි ඇහුවේ නැහැ නේ කොහේද ඉන්නේ කියලා. අපි අවශ්‍ය වෙලාවට කැමැති තීන්දුව ගන්නම්. මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් මතක් කරනවා. අපට කවදාවත් කවුරුවත් නායකයින් කථා කරලා උපදෙස් ලබා දීලා නැහැ. ඒ නිසා අපි මේ පළාත් සභාවේ 2014 දී පත් වුණු ප්‍රධාන අමාත්‍යතුමාට සහ අමාත්‍ය මණ්ඩලයට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම ජනවාරි 09 වැනිදායින් පසු, අගෝස්තු 15 වැනිදායින් පස්සේ

[ගරු මෙරිල් පෙරේරා ]

පත් කරපු අමාත්‍ය මණ්ඩලයට අපි සහයෝගය ලබා දුන්නා. ගියවර නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අපි සහයෝගය නොදුන්නේ, එතුමා අපගේ සන්ධානයේ කණ්ඩායම් රැස්වීමේ යම්කිසි එකඟතාවයන්ට ඇවිල්ලා එතුමාට ඕනෑ විධියට ප්‍රකාශ කරපු නිසා එතුමාව පරාජය කළා. හැබැයි, ඒ වෙලාවේ යහපාලන ආණ්ඩුව කියලා එකක් තිබුණා නම් එතුමාව බේරා ගන්න තිබුණා. ඒ වෙලාවේ එතුමන්ලාට අගමැතිතුමා - අපි ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. ඒ වාගේම ඊයේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා, ප්‍රධාන ඇමතිතුමා කැමැති වුණත් අකමැති වුණත් අප්‍රේල් මාසේ මේකේ යහපාලන ආණ්ඩුවක් ඇති කරනවා කියලා. අපි හිතනවා. මේ උපදෙස් දීලා, අප්‍රේල් මාසේ යම්කිසි කොටසක් ඇමතිකම් ගන්න බලාගෙන ඉන්නවා නම්, මේ පළාත් සභාවේ 2019 වන තෙක් ඇමතිකම් ගන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේකේ කවුරු හරි ඇමතිකමක් ගන්නවා නම්, මේ ඇමතිවරයා වෙනුවෙන් අපි පෙනී සිට අපි මේකේ ජයග්‍රහණය කරලා පෙන්වනවාය කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

මේ වගකීමෙන් කථා කරන මන්ත්‍රීවරයෙක්ද කියලා මම දන්නේ නැහැ. අද දිවයින පත්තරේ මුල් පිටුවේ තිබෙනවා, ජනාධිපතිතුමා උපදෙස් දුන්න ආකාරය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපට දීලා නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

දිවයින පත්තරේ බලන්න. මේ කියන දේ ද කෙරෙන්නේ කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපව කවුරුවත් කැඳවලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට අදාළ නැහැ. අයවැය ගැන කථා කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ජනාධිපතිතුමා කිව්වා කියලා තිබෙන්නේ අද පත්තරේ. මුල් පිටුවේ තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට එම්.එස්.එම්. ෆයිරූස් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.30]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල වැය ශීර්ෂවලට කථා කරන්න, විශේෂයෙන්ම පළාත් පාලන විෂයයන් ගැන කථා කිරීමට ලැබුණු මේ අවස්ථාව ගැන මම ඇත්තටම බොහොම සතුටු වෙනවා. මොකද, අපේ ගරු ප්‍රධාන ඇමතිතුමා ඇතුළු මේ සභාවේ ඉන්න හුඟක් මන්ත්‍රීවරු වාගේම මමත් පළාත් පාලන ආයතනයක් හරහා දේශපාලනයට මුල පුරපු කෙනෙක්. ඒ නිසා මේ රටේ පොදු ජනතාවගේ ජීවිත එක්ක සමීපව කටයුතු කරන පළාත් පාලන ආයතන ගැන, ඒවායේ අනාගතය ගැන කථා කරන්න ලැබීම භාග්‍යයක් ලෙස මම සලකනවා. ඊට කලින් මම කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ කථාවට පස්සේ මෙතැන පොඩි ප්‍රශ්නයක් මතු වුණා. අපි අපට පක්ෂයෙන් අපේ නායකතුමා අපව ගෙන්වලා කථා කරලා කිව්වේ, බස්නාහිර පළාත් සභාවේ ඒකාබද්ධ විපක්ෂයක් නොවෙයි මේකේ තිබෙන්නේ. අපි විපක්ෂය වුණාට මේක යහපාලන ආණ්ඩුවක්. මහ ඇමතිතුමා යහපාලනයේ. ඇමතිවරු හතර දෙනා යහපාලනයේ. මෙතැන මන්ත්‍රී කණ්ඩායමක් ඉන්නවා, යහපාලනයේ. අපි සම්පූර්ණයෙන්ම 39 ක් ඉන්නවා. අපි යහපාලනයේ ඉන්නේ. මේකත් යහපාලන සභාවක්. ඒක මෙතැන ඉන්න මන්ත්‍රීවරු තේරුම් ගන්න ඕනෑ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

හැබැයි, එහෙම හිතාගෙන හිටියාට, එහෙම නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මෙකේ 2014 ගැන කථා කරනවා. අපිත් ඒක පිළිගන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි යහපාලනයේ නොවෙයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපිත් ඒක පිළිගන්නම්. 2014 දී ප්‍රසන්න රණතුංග මැතිතුමා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ මහ ඇමති වුණා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔය යහපාලනය කොහේද තිබෙන්නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

2015 ජනවාරි මාසේ 08 වැනිදායින් පස්සේ ඒ සෙල්ලම නතර වුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අගෝස්තු මාසේ පාර්ලිමේන්තු මැතිවරණය තිබ්බේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අගෝස්තු මාසේ පාර්ලිමේන්තුව පත් වුණා. ඒත් අද ඉන්න මහ ඇමතිතුමා අපේ මහ ඇමතිතුමා. අද මේ රටේ ඉන්න ජනාධිපතිතුමා අපේ ජනාධිපතිතුමා. එක්සත් ජාතික පක්ෂය 100% ක් ම ඡන්දය දීලා මේ රටේ බලයට එන කොට එතුමා අපේ ජනාධිපතිතුමා. (බාධා කිරීම්) මෙතැන ඉන්න ඇමතිවරු හතර දෙනාම ජනාධිපතිතුමා පත් කරපු අය.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath- Chief Government Whip

කෝ මේකේ විපක්ෂය.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපි විපක්ෂයේ ඉන්නවා. අපි කවදාවත් ඇමතිකමක් බලාපොරොත්තුවෙන් මෙතැන වාඩි වෙන්නේ නැහැ. අපට ඇමතිකම් ඕනෑ නැහැ. කවදාවත් අපි ගිහිල්ලා වරප්‍රසාද ඉල්ලා ගෙන මහ ඇමතිතුමාගේ කාර්යාලයට යන්නේ නැහැ. එක දවසක් හරි තිබෙනවාද මහ ඇමතිතුමා ළඟට ඇවිල්ලා ලිපියක් අත්සන් කර ගත්තා කියලා. කියන්න බැහැ. අපි යන්නේ නැහැ. අපට ඕනෑ නැහැ. අපට ඕනෑ සභාව අරගෙන යන්න. අපි යහපාලන ආණ්ඩුවක්. අපට කාවවත් භය ගන්වන්න ඕනෑ නැහැ. මේ අයවැය ඡන්දයේදී ගරු මහ ඇමතිතුමාටයි, මේ ඇමතිවරු හතර දෙනාටයි අපේ පැත්තෙන් 39 දෙනාම 100% ක් අත් දෙකම උස්සලා මේ සභාවේදී ඡන්දය දෙනවා. අපට කාවවත් භය කරන්න ඕනෑකමක් නැහැ. අපට කාගෙන්වත් වරප්‍රසාද ඉල්ලන්න අවශ්‍යතාවයක් නැහැ. අපට ඒ ශක්තිය තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ජය වේවා. විපක්ෂය ඔහොමයි ඉන්න ඕනෑ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා හැම වෙලාවේම කියනවා, (බාධා කිරීම්) මැතිවරණය තිබ්බෙ 2014 දී කියලා. අපි කථා කරන්නේ 2015 ගැන. ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාව යටතේ පවතින පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

කොළඹ ව්‍යුහ කමිටුවේ සභාපතිකම් දෙකක් දෙනවා, ෆයිරුස්ට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු මහ ඇමතිතුමනි, ඒකත් අපි ඉල්ලන්නේ නැහැ. අපි කොයි වෙලාවෙත් ඔබතුමාගේ පැත්තේ ඉන්නවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ හිටපු ගරු ඇමතිතුමාට කරපු විධියට මෙතැන එක එක ඇමතිවරුන්ව තියාගෙන හය කර ගෙන වැඩ කරන්න අපි දෙන්නේ නැහැ. ඒක එතැනින් ඉවරයි. අපි එක ඇමතිවරයෙක්වත් හය කර ගෙන වැඩ කරන්න දෙන්නේ නැහැ. මෙතැන මන්ත්‍රීවරු විසි ගණනක් ඉන්නවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් එක්ක. (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කෝ? කොහේද? එහෙම ඉන්නවා නම් නැගිට්ටවලා පෙන්වන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපි 39 ක් ඉන්නවා. මෙවර ඡන්දය වෙලාවේදී එක්කෙනෙක්වත් නැති වෙන්නේ නැහැ. අපි 39 ම ගේනවා. ඒ නිසා මෙවර හය කරන්න බැහැ. ඒ නිසා අපි මහ ඇමතිතුමාට කියන්නේ. ගරු මහ ඇමතිතුමනි, ඔබතුමාගේ තිබෙන බලය පාවිච්චි කරලා දෙන දෙයක් තිබෙනවා නම් විපක්ෂය, ආණ්ඩු පක්ෂය කියලා ඔබතුමා බලන්න එපා. අපිව අයින් කරන්නත් එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක කෙළින්ම කිව්වා නම් ඉවරයි නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒක හරියට කරන්න. මෙතුමන්ලාට ඕනෑ විධියට ගිහිල්ලා, ලියුම් අත්සන් කරලා, ඕනෑ විධියට වෙන්න දෙන්න එපා. හය වෙන්නත් එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ. කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මම තවම කථා කළෙත් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට ඉතින් මට කරන්න දෙයක් නැහැ. ඔබතුමා වෙන දේවල් කථා කළාට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම කුණු ප්‍රශ්නය සම්බන්ධව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කළා. කොළඹ මහ නගර සභාවට විශාල ප්‍රදේශයක් අයිති වෙනවා. මම හිතන්නේ කොළඹ මහ නගර සභාවේ මේ ළඟදී දවසක වම්පික රණවක ඇමතිතුමා ඇවිල්ලා පෙන්නුවා, කුණු ටික කොටස් තුනකට වෙන් කරලා ගන්නය කියලා. ඒක කිව්වාට වැඩක් නැහැ. ගරු මහ ඇමතිතුමනි, ඒවාට අපි මොනවා හරි ගෙවල්වලට දෙන්න ඕනෑ. පොලිතින් බෑග් එකක් හෝ භාජනයක් හෝ. අඩුම වශයෙන් පොලිතින් බෑග් එකක්වත් දෙන්න ඕනෑ. මෙරිල් මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. විශේෂයෙන් කොළඹ වාගේ ප්‍රදේශයකට දෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, කොළඹ කියන්නේ එක වත්තක් ඇතුළේ ගෙවල් එකසිය හැට ගණනක් තිබෙනවා. ඒවා ඇතුළට ට්‍රැක්ටර් අරගෙන යන්න බැහැ. ඒක ඇතුළට කරත්තයක් අරගෙන යන්න බැහැ. 80% ක් දුප්පත් ජනතාව ඉන්නේ. එතැන හමුදාවත් පොලීසියත් ගිහිල්ලා, නගර සභාවේ කට්ටියත් ගිහිල්ලා හය කරලා කුණු එකට දැම්මා නම් අපි දඩ ගහනවා කියනවා. මේක ලොකු ප්‍රශ්නයක්. ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මේක පොඩ්ඩක් තේරුම් ගන්නය කියලා. මේකට අනිවාර්යයෙන්ම කොමසාරිස්තුමා මාර්ගයෙන් - අද පළාත් පාලන ආයතනවල නියෝජිතයෝ නැති නිසා කොළඹ මහ නගර සභාවේ කොමසාරිස්තුමාට ඔබතුමා කියන්න. ගරු සභාපතිතුමනි, කොළඹ මහ නගර සභා සීමාව තුළ බදු ගෙව්වේ නැත්නම් මාස හයක් ගියාම රතු නිවේදනයක් යවනවා ගේ වෙන්දේසි කරනවාය කියලා. ඉතින් මෙපමණ බදු එකතු කරනවා. ඒ ගෙවල්වලට ගිහිල්ලා මාසයකට අවශ්‍ය කරන ප්‍රමාණය දෙන්න පුළුවන් නේ? ඒකට පොඩි මුදලක් අය කළත් ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා මේක විශේෂයෙන්ම -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

නැහැ. එතුමාගේ කථාව ඉවරයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාටත් අවස්ථාව තිබෙනවානේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ඉන්නකෝ කියන්න. ගරු සභාපතිතුමනි, නැත්නම් මේ මන්ත්‍රීවරු මම කථා කරන වෙලාවට නැහැ. ඒ නිසා මම ඔබතුමාට ගෞරවයෙන් කියන්නේ. එතුමා ඒ කරපු කථාවයි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ අදහසයි එක්ක ගත්තාම මම හිතන්නේ මේ මලු ක්‍රමය මමයි හඳුන්වලා දුන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මගින් ගරු ප්‍රධාන ලේකම්තුමාට හා අමාත්‍යාංශ ලේකම්තුමියට දැනුම් දෙනවා. මේ බෑග් එක අපේ කසළ කළමනාකරණ අධිකාරියෙන් නිෂ්පාදනය කරලා සාධාරණ මුදලකට බෙදලා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ගරු මහ ඇමතිතුමාට ස්තූතිවන්ත වෙනවා. නමුත් ගරු මහ ඇමතිතුමනි, මේක නරක පූර්වාදර්ශයක් වෙනවා. මොකද, ඔබතුමාටත් අවස්ථාව තිබෙනවා නේ? ඔබතුමා මන්ත්‍රීතුමාගෙන් මන්ත්‍රීතුමාගෙන් කථාවලට උත්තර දෙන්න ගියොත් එහෙම -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

හරි මම සමාව ගන්නම්කෝ? ඔබතුමා එහෙම නම් මන්ත්‍රීවරුන්ගේ කාලය කපා දමන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කාලය කපන්නේ නැහැ. මීළඟට සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. දැන් ඒ මන්ත්‍රීතුමන්ලාගේ කථා අනුව - විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා අනුව අපට පෙනී යන්නේ, දැන් ඔබතුමන්ලා දෙගොල්ලෝම එකට සම්බන්ධ වෙලා ආණ්ඩුවක් කර ගෙන යන එකක් තමයි පේන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපේ නම් එහෙම එකක් නැහැ. අපි විරුද්ධයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ නිසා විපක්ෂයේ කාර්යභාරය කරන්න දැන් අයිතිය තිබෙන්නේ අපට. ඔබතුමා සැලකිල්ලට ගන්න ඕනෑ කාරණයක් මේක. ඒ නිසා විපක්ෂ නායකකම ජනතා විමුක්ති පෙරමුණට ලබා දෙන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂයේ සංවිධායකකමත් ගන්න. විපක්ෂයේ සංවිධායකකම සරත් ෆොන්සේකා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ අනික් අය මොනවා කිව්වත්, මම නම් ඒ අගමැතිතුමාගේ රැස්වීමට ගියෙත් නැහැ. මම විපක්ෂයේ කාර්යභාරය කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, එහෙම නම් එතුමියත් ඒකාබද්ධ විපක්ෂය හැටියට අපට ඒ කණ්ඩායමට එකතු කර ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.41]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, මගෙන් ඒ කාලය අඩු කරන්න එපාය කියලා ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. අඩු කරන්නේ නැහැ. ඔබතුමාට කාලය දෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

විශේෂයෙන්ම සතුටු වෙනවා, අපි වාගේ තරුණ මන්ත්‍රීවරුන්ට මේ වාගේ අවස්ථාවක් ලබා දීම පිළිබඳව. 104, 109, 110, 111, 112 කියන වැය ශීර්ෂයන් යටතේ සංඛ්‍යාලේඛනත් එක්ක පොඩි අදහසක් ඉදිරිපත් කරන්න අවසරය ඉල්ලනවා. විශේෂයෙන්ම මේ මුදල් ප්‍රකාශය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපි දන්නවා කේන්ති ගන්නේ නැති ප්‍රධාන ඇමතිවරයෙක් හැටියටත්, ඒ වාගේම ඇහුම්කන් දෙන ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියටත්, මම හිතන්නේ එතුමා හැම වෙලාවකදීම අපට අවස්ථාව දීලා තිබෙනවා, හැම දෙයක් පිළිබඳවම සොයලා බලලා සාධාරණ පැහැදිලි කිරීම් කරන්න. ඒ පිළිබඳව සතුටු වෙනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ අයවැය ලේඛනය දිහා අපි බැලුවාම අපි දැක්කා, ඒ අයවැය ලේඛනයේදී හැම වැය ශීර්ෂයකටම ඒ වෙන් කරලා තිබෙන මුදල්වලට අදාළව ව්‍යාපෘතියක් නම් කරලා තිබෙනවා.

ඒ වාගේම ඒ ව්‍යාපෘතිය කරන අමාත්‍යාංශය පැහැදිලිව සටහන් කරලා තිබෙනවා. ඒ පූර්වාදර්ශය අපි පළාත් සභාව හැටියටත් ලබා ගත්තොත් හොඳයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ වාගේම මම මුලින්ම මම අදහස් ප්‍රකාශ කරන්නේ, 104 වැය ශීර්ෂය පිළිබඳව. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශය යටතේ මුළු අයවැයෙන් 0.9% ක් වෙන් වෙලා තිබෙනවා. 2015 සත්‍ය වියදමට වඩා 2017 ඇස්තමේන්තුව මිලියන 73 ක වැඩි වීමක්. 14% කින් වැඩි කරලා තිබෙනවා. 2016 ඇස්තමේන්තුවට වඩා 2017 ඇස්තමේන්තුව 8.8% කින් අඩු කරලා තිබෙනවා. මිලියන 35 ක අඩු වීමක්. ඒ වාගේම පුනරාවර්තන වියදම්වල 2015 සත්‍ය වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 12 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 9% කින් වැඩි කරලා තිබෙනවා. 2016 ඇස්තමේන්තු වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 7 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 5% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම්වල 2015 සත්‍ය වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 61 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 16% කින් වැඩි කරලා තිබෙනවා. 2016 ඇස්තමේන්තු වියදමට වඩා 2017 ඇස්තමේන්තුව රුපියල් මිලියන 63 ක අඩු වීමක්. ඒක 12% කින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමාගේ 104 වැය ශීර්ෂය අනුව විෂයයන් හයකට මේ මුදල් වෙන් කරලා තිබෙනවා. ඒකේදී විශේෂයෙන්ම සභා ආදායම්, ප්‍රාග්ධන යෙදවුම් අංක 12 වැය ශීර්ෂය යටතේ අංක 13 සභා ආදායම්

සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම් PDG. ඒ වාගේම 14 වැය ශීර්ෂය යටතේ පළාත් සංවර්ධන ප්‍රදාන. PSDG කියන වැය ශීර්ෂ යටතේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයයන්වල මුලින් වෙන් කරලා තිබෙන්නේ මුදල් පළාත් පාලන ආයතනවලට. ඒ වාගේම සංචාරක අමාත්‍යාංශය සහ ග්‍රාමීය විදුලිය කියන විෂයයන්වලට තමයි මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම අනෙක් විෂයයන් තුනට, විශේෂයෙන්ම පරිසර කටයුතු, ආර්ථික ප්‍රවර්ධන, ජල සම්පාදන හා ජලපවාහන කියන ඒවාට PSDG වලින් මුදල් වෙන් කරලා නැහැ. ඒක ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. PSDG වලින් මුදල් වෙන් කරලා නැහැ. අපි හිතනවා, PDGවලින් ඒ විෂයයන් සඳහා මුදල් වෙන් කරන්න කටයුතු කරයි කියලා. ඒ වාගේම 104 වැය ශීර්ෂය යටතේ PDG වලින් සභා ආදායම් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම්වලට මිලියන 350 ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, විශේෂයෙන්ම බන්දුල මහතාටත්, ප්‍රධාන ලේකම්තුමාටත් මතක් කරන්න ඕනෑ, මේ යෙදවුම් මොන විෂයයන්වලටද යොදවන්නේ කියන එක පිළිබඳව 2018 මුදල් ප්‍රකාශය තුළ සටහන් කළොත් හොඳයි. මොකද, මේ පිළිබඳව දැනුවත් වීමක් සිද්ධ වෙලා, අංක 13 ට මෙන්න මෙපමණ මුදලක් වෙන් කරනවාය කියන එක ඒ විෂයයන් යටතේ වැය ශීර්ෂයන් යටතේ යොදවලා තිබෙනවා. ඒ වාගේම PSDGයටතේ පළාත් සංවර්ධන ප්‍රදාන පළාත් පාලන ආයතනවලට රුපියල් මිලියන 66 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අංක 12 යටතේ සභා ආදායම් ප්‍රාග්ධන යෙදවුම් සඳහා රුපියල් මිලියන 3 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම සංචාරක විෂයයට PSDG යටතේ රුපියල් මිලියන 10 ක් වෙන් කරලා තිබෙනවා. ග්‍රාමීය විදුලියට PSDG යටතේ රුපියල් මිලියන 7 ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ විධියට තමයි අමාත්‍යතුමාගේ ඒ වැය ශීර්ෂවල මුදල් වෙන් කරලා තිබෙන්නේ.

ඒ වාගේම විශේෂයෙන්ම විදුලි බල හා බල ශක්තිවලට 2016 දී රුපියල් මිලියන 13 ක් වෙන් කරලා තිබුණා. නමුත් රුපියල් මිලියන 15 ක් මේ වසර තුළ 2017 වර්ෂයට වෙන් කරන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම පරිසර කටයුතු සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාගේ අයවැය කථාව තුළත් මේ PSDG හෝ PDG වල මුදල් වෙන් කිරීමක් කරලා නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. පරිසර කටයුතුවලට PDG වල මුදල් වෙන් කිරීමක් කරන්නය කියලා. ඒ වාගේම ජල සම්පාදන හා ජලපවාහනවලට රුපියල් මිලියන 30 ක් 2016 දී වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 30 ම මේ අවුරුද්දේ, 2017 දී වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඝන අපද්‍රව්‍ය අධිකාරිය. මම හිතන්නේ, විශාල මැදිහත්වීමක් සිද්ධ කරනවා, පළාතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කරන්න. මධ්‍යම රජය උනන්දු වෙන්නේ නැහැ. අද පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය නැත්නම් අද හැම තැනම කුණු ගොඩවල් ගොඩ ගැහිලා. නමුත් ඒ පිළිබඳව කථා කරන කොට බස්නාහිර පළාතේ නාගරික ඝන අපද්‍රව්‍ය ජනනය දිනකට මෙට්‍රික් ටොන් 3500 යි. සෑම වසරකම 1% ක් 2% ක් අතර ප්‍රමාණයකින් වර්ධනය වෙනවා. පසුගිය වසර 10 ක කාලය තුළ රුපියල් මිලියන 1000 ක් මේ සඳහා වැය කරලා තිබෙනවා. ඒ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා. 2017 වර්ෂය තුළ රුපියල් මිලියන 64 ක් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා පළාත් පාලන ආයතන පිළිබඳව අයවැය ලේඛනය සකස් කරන්න අපට අවස්ථාව ලබා දුන්නා. ලේකම්තුමාත් දන්නවා. නීති නිලධාරීතුමියත් දන්නවා. ඒ නිසා මම හිතන්නේ, හැම පළාත් පාලන ආයතනයකටම අපි කිව්වේ, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ඉඩමක් ගැනීමට මුදල් වෙන් කරන්නය කියලා. හැම අයවැය ලේඛනයකම පළාත් පාලන ආයතන 48 ම අපි මේ මුදල වෙන් කරන්න - වැය ශීර්ෂවලට මුදල් වෙන් කරන්නය කියන උපදෙස් ලබා දුන්නා. මේ වන කොට ඒක කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි ඉතාමත්ම සතුටු වෙනවා.

ඒ වාගේම අපි කියන්නට ඕනෑ. අද පළාත් පාලන ආයතනවල ඵලදායිතා වැඩ සටහන් කරලා, ලොකු වෙනසක් සිද්ධ වෙලා තිබෙනවා. එදා අපි පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් හැටියට වැඩ කරන කොට ජනතාව දිහා බැලුවා. පාරවල් හැදුවා. ප්‍රජා ශාලා හැදුවා. නමුත් ආයතනික ප්‍රශ්න පිළිබඳව අපි සොයා බලා කටයුතු කළේ නැහැ. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ හිටපු ලේකම්තුමා, ප්‍රධාන ලේකම් හැටියට පත් වන කොට නව ලේකම්තුමියත්, නීති නිලධාරීතුමාත් විශාල මහන්සියක් අරගෙන අද පළාත් පාලන ආයතනවල ආයතනික ව්‍යුහයේ ලොකු වෙනසක් සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම විගණන විමසුම් බැලුවොත් විගණන විමසුම් 44 කට හොඳ මතයක් ලබා ගන්නට පුළුවන්කම

[ගරු සහන් ප්‍රදීප් විතාන ]

ලැබිලා තිබෙනවා. ඒ වාගේම අද බැලුවොත් පළාත් පාලන ආයතන සියල්ලේම වාගේ ඇතුළේ තිබෙන ව්‍යුහය පිළිබඳව සතුටු වෙන්න පුළුවන්. ඒ ජයග්‍රහණය ලබන්න පුළුවන් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි ඉතාමත්ම සතුටු වෙනවා.

ඒ වාගේම ප්‍රධාන ලේකම් කාර්යාලයේ 109 වැය ශීර්ෂය. මේක 49% කින් වැඩි කරලා තිබෙනවා. 2016 ට වඩා 49% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ඒ පිළිබඳව විශ්ලේෂණයක් කළොත් සභා ආදායම්, ආයතනික ප්‍රාග්ධන යෙදවුම් සඳහා විශේෂයෙන්ම අංක 12 යටතේ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවලට රුපියල් මිලියන 75 ක්. ගොඩනැගිලි ඉදිකිරීම්වලට රුපියල් මිලියන 50 ක්. වාහන ගන්න රුපියල් මිලියන 60 ක්. ඉඩම් වැඩි දියුණුවට රුපියල් මිලියන 50 ක්. ඒ වාගේම මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ප්‍රසම්පාදන වාහන සඳහා ණය මුදලට ආපසු ගෙවන රුපියල් මිලියන 55 ක්. මේ විධියට රුපියල් මිලියන 298 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම PDG යටතේ පළාත් ආදායම් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම් යටතේ ගොඩනැගිලි ඉදිකිරීම්වලට රුපියල් මිලියන 479 ක්, කාර්යාල උපකරණවලට රුපියල් මිලියන 59 ක්, පුහුණු ධාරිතා සංවර්ධනයට රුපියල් මිලියන 36 ක්, වෙනත් ආයෝජන යටතේ රුපියල් මිලියන 427 ක් වශයෙන් මුළු රුපියල් මිලියන සංඛ්‍යාව රුපියල් මිලියන 1010 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම PSDG යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පසුගාමී හා හුදෙකලා ගම්මාන සඳහා මම හිතන්නේ හොඳ වැඩක් කරලා තිබෙනවා. රුපියල් මිලියන 90 ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, මහ ඇමතිතුමනි, ඌණ සේවා සංවර්ධන ගම්මානවලට PSDG වලින් සල්ලි වෙන් කරලා නැහැ. ප්‍රාදේශීය අසමතුලිතතා ඉවත් කිරීමේ විශේෂ ව්‍යාපෘතියට PSDG වලින් සල්ලි වෙන් කරලා නැහැ. හැබැයි, නම්‍යශීලී වැඩ සටහන් සඳහා රුපියල් මිලියන 11 ක් වෙන් කරලා තිබෙනවා. මේ විධියට රුපියල් මිලියන 101 ක් වෙන් කරලා තිබෙනවා. උපමාන පාදක සඳහා රුපියල් මිලියන 218 ක් වෙන් කරලා තිබෙනවා. මේ විධියට අනික් සියලුම වැය ශීර්ෂයන් පිළිබඳව පුනරාවර්තන වියදම්වල යම් සුළු වැඩි වීමක් සිද්ධ වුණාට ප්‍රාග්ධන වියදම්වල වැඩි වීමක් සිද්ධ වෙලා නැහැ.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම කමිටු පත් කරලා, ආදායම් රැස් කිරීම, ඒ වාගේම අමාත්‍යාංශවල ප්‍රගතිය සොයා බැලීම සඳහා කමිටු පත් කරලා කටයුතු කිරීම පිළිබඳව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ප්‍රධාන ලේකම්තුමාටත් අපේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාව ගෙන්වලා, රනිල් වික්‍රමසිංහ මහත්තයා ඡන්දය දෙන්නය කියලා කිව්වේ. මොකද, විශ්වාසයක් නැහැ අපේ ප්‍රධාන අමාත්‍යතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත් ඡන්දය දෙයි කියලා. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමා අපට මොනම අවස්ථාවකවත් කියලා නැහැ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට ඡන්දය දෙන්න එපාය කියලා. බැසිල් රාජපක්ෂ මැතිතුමා එහෙම කියලා නැහැ. ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමා කියලා නැහැ. ඒ නිසා අපේ සියලුම මන්ත්‍රීවරුන්ගේ පූර්ණ සහයෝගය ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඇමති මණ්ඩලයටත් ලබා දෙනවාය කියන එක මතක් කරමින් ඔබතුමාට සුභ පතනවා. බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ප්‍රකාශයක් කළා, අද දිවයින පත්තරේ මෙහෙම ප්‍රකාශයක් කරලා තිබෙනවාය කියලා. ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ. මේකේ තිබෙන්නේ,

*"ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මහතා ඊයේ හය වැනිදා පෙරවරුවේ ජනපති නිල නිවාසයට ගෙන්වා සිදු කළ සාකච්ඡාවකින් පසු පළාත් සභා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කර සෝමවංශ මහතාගේ වැය ශීර්ෂයේදී ඡන්ද විමසීමේදී ජයග්‍රහණය කිරීමට එකඟතාවයට පත් වූ බව ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් දිවයිනට පැවසීය"* කියලා.

මෙතැන ඉන්න මන්ත්‍රීවරු දන්නවා. ඔබතුමාත් දන්නවා. මම දන්නේ නැහැ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රකාශයක් කරයි ගියාද නැද්ද කියන එක. මේ කිසිම මන්ත්‍රීවරයෙකුව කොහේටවත් කැඳවලාවත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපව කැඳවලාවත් කිසිම සාකච්ඡාවක් මේ ගැන පැවැත්වුවේ නැහැ. එතකොට මේ පත්තරේ සම්පූර්ණ

ප්‍රකාශයක් - මෙතුමා නැගිටලා කිව්වොත් එතුමාව කැඳෙව්වේ නැහැයි කියලා, මේ පත්තරේ තිබෙන්නේ බොරුවක්. අපව එහෙම කවුරුවත් කැඳවලා උපදෙස් දීලා නැහැ. එතකොට ජෝර්ජ් පෙරේරා මැතිතුමාට පැහැදිලිව කියනවා -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

මම ඒකයි කියන්නේ, මාධ්‍ය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එතකොට මේකේ පැහැදිලිව තිබෙනවා. මේක වරප්‍රසාදයක් නේ? බොරුවක් ප්‍රකාශ කළානේ? ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පත්තරේ දිහා බලලා තමයි කිව්වේ. නමුත් අපි වගකීමෙන් මේ සභාවේ කියනවා. කිසිම මන්ත්‍රීවරයෙකුව කැඳවලා නැහැ. ප්‍රධාන ඇමතිතුමා නැගිටලා කිව්වොත් එතුමාව කැඳෙව්වේ නැහැයි කියලා, මේක බොරුවක් කියන එක මෙතැනම ඔප්පු වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

එහෙම ජනාධිපතිතුමා - එහෙම නැහැ. අපේ පක්ෂයේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, දැන් මෙහෙම බොරුවක් කියලා තිබෙනවා නම් මාධ්‍යයට දැන්මම ඒගොල්ලන්ව කැඳවලා කියන්න. වහාම හෙට දිනයේ මේක නිවැරදි කරන්න කියන්න. ඒ වාගේම සාවද්‍ය ප්‍රකාශයක් පළ කළොත් ජනමාධ්‍යවේදීන් බැඳිලා නැහැ ඒගොල්ලන්ගේ මූලාශ්‍ර හෙළි කරන්න. හැබැයි, මේ වාගේ සාවද්‍ය එකක් පළ කළොත් අපට කරුණු විමසන්න පුළුවන්. අපට පුවත්පත් කොමිසමට දැනුම් දෙන්න පුළුවන් මෙහෙම සාවද්‍ය දෙයක් පළ කරලා තිබෙනවාය කියලා. වහාම ඔබතුමා ඒගොල්ලන්ගෙන් ඉල්ලන්න, මේක නිවැරදි කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ පුවත්පත් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාවත්, අපේ පක්ෂ නායකතුමෙක්වත් මාත් එක්ක ඒ කාරණය සම්බන්ධයෙන් දුරකථනයෙන්වත් කථා කළේ නැහැ. අනික් එක අපි ඒ වාගේ ඇමතිවරයෙක් ඉවත් කරන්න එහෙම කිසිම දෙයක් සාකච්ඡා වුණේ නැහැ. ඔබතුමාත් දන්නවා නේ? කට කතා පමණයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි හිටියා නේ? මාධ්‍යවේදියාගේ නම මොකක්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

චමින්ද සිල්වා. දිවයින පත්තරේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, එහෙම කරනවා නම් ඔබතුමා හෝ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ නිල ප්‍රකාශය කරන්න ඕනෑ. එහෙම නොවෙයි නම්, ඔබතුමන්ලා කැඳවලා මාධ්‍යයට දැන් කියන්න, අපේ විවේක කාලයේදී කියන්න, වහාම මේක නිවැරදි කරන්නය කියලා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, පුවත්පත් කොමිසමට පැමිණිලි කිරීමේ අවස්ථාවක් සලසා ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පුවත්පත් කොමිසමට පැමිණිලි කරන්න. අපි දැන් අයවැයේ වැඩ ටික කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ලේකම්තුමාට උපදෙස් දෙනවා ඒ සම්බන්ධව -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya- Chief Minister

ජෝර්ජ්ව සංවිධායකකමෙන් අයින් කළා කියලත් තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ කාරණාව බරපතළ ප්‍රශ්නයක්. දැන් අද පත්තරේ මෙතුමාට විරුද්ධව දාලා තිබෙනවා. දිවයින පත්තරේ තවත් එකක් දාලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මේ සභා ගර්භයේ ඒ මාධ්‍යවේදියා ඉන්නවා නම්, කරුණාකරලා ඒක ඉවත් කරන්න. හෙටම නිවැරදි කිරීමක් කරන්න, ඒක බොරුවක් කියලා. මෙතැන ඉන්නවා නම් කරුණාකර ඒ දේ කරන්න. ඊළඟට රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.55]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. මගේ කථාව ආරම්භ කරන්න ඉස්සෙල්ලා අටුවා ටීකා ගැන මොනවා හරි කිව්වේ නැත්නම් හොඳ නැහැ. මොකද, දැන් මෙතැන පක්ෂ විපක්ෂ සහ තව කට්ටිය විපක්ෂයේවෙන්න උත්සාහ කරනවා. අපි ඇත්ත වශයෙන්ම අවබෝධ කර ගන්න ඕනෑ සහ දැන ගන්න ඕනෑ. මේ අපි විපක්ෂයේ කාර්යභාරය අතහැරලා නොවෙයි. මෙතැන අපි විපක්ෂයේ කාර්යභාරය සියයට දෙසීයක් හරියට කරනවා. ඒ කරන ගමන් මේ රජය පවත්වාගෙන යාමේදී, සංවර්ධන කටයුතුවලදී මේ ආණ්ඩුව හෝ පළාත් ආණ්ඩුව අසරණභාවයකට පත් වෙන්නේ නැතිව රට ඉස්සරහාට යන්න ඕනෑය කියන තැන්වලදී අපි සහයෝගය දෙනවා. ඒ පැහැදිලි කිරීම තේරුම් ගන්න ඕනෑ. විපක්ෂයේ කාර්යභාරය අපි හෙට අතඅරින්නෙත් නැහැ. හැබැයි, මේ පළාත් ආණ්ඩුව නොබෝ දිනකින් අපේ අතට පත් වෙනවාය කියන එකත් කියලා මම කථාව පටන් ගන්නවා.

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන, සංචාරක කටයුතු වැය ශීර්ෂයන් ගැන කථා කරන කොට මම දන්නවා, මේ විනාඩි 10 ක කාලය තුළ කථාවට සැරසෙන්නවත් බැහැ. ඒ නිසා මම සීමා කර ගන්නවා මේ ඉඩම් කියන කාරණාව සම්බන්ධයෙන් කථා කරන්න. මේ අමාත්‍යවරුන් විෂයයන් වෙන් වෙන් වශයෙන් කථා කරනවා නම් මම හිතන්නේ ප්‍රයෝජනවත් වෙනවා. මෙහිදී මම ගරු සභාපතිතුමා මගින් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කර සිටිනවා. අපි මේ ප්‍රදේශය තුළ ඉඩම් ගැන කථා කරන්න යන්නේ. මේ ඉඩම් අරගෙන බැලුවාම, දැනට සමහර ප්‍රාදේශීය ලේකම්වරු රජයේ ඉඩම් බදු දීලා තිබෙනවා. සමහර තැන්වල ඉතාම අඩු මුදලට - (බාධා කිරීම්) මේ වෙලාවේ තිබෙන්නේ අයවැය විවාදය. බාධා කරන්න එපා. වෙන ඒවා පස්සේ කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ වෙලාවේදී මම කියන්න ඕනෑ, රජයේ ඉඩම් ඉතාම අඩු මුදලකට බදු දීලා තිබෙනවා. මේ බදු මුදල එකතු කරන්නේ නැහැ. දැන් අපි පළාත් සභාවක් හැටියට ආදායම් උපයන්න ඕනෑ, මහජන සේවාවන් කරන්න. දැන් මේ අපේ විගණන වාර්තාවේත් කියනවා, මේ බදු මුදල් එකතු කිරීම ගැන. ගරු සභාපතිතුමනි, බදු මුදල් එකතු කිරීම විතරක් නොවෙයි. මම කටාන කොට්ඨාශය විතරක් අරගෙන බැලුවොත්, රජයේ ඉඩම්වල පදිංචිකරුවන් ඉඩම් අල්ලාගෙන තිබෙනවා. ඉඩම් කැබලි තුන හතර අල්ලා ගෙන තට්ටු ගෙයකුත් හදලා මේක කුලියට දෙනවා. මෙයාට ඉන්න හොඳ ගෙයක් වෙනම තිබෙනවා. අර කුලියට දීලා සල්ලි ටික ගන්නවා. එතකොට අපේ රජයට මොනවා හරි ව්‍යාපෘතියක් කරන්න ඉඩම් ඕනෑ වුණාම අපි ඉඩම් කුලියට ගන්නවා. ගොඩනැගිලි කුලියට ගන්නවා. තමන්ගේ අතේ තිබෙන සම්පත් ටික ප්‍රයෝජනයට ගන්නේ නැතිව වෙනත් මිනිස්සුන්ට පුද්ගලිකව හම්බ කර ගන්න දීලා තිබෙනවා. මේවා පසුගිය ආණ්ඩු කාලයේ වුණු දේවල් තමයි. කනගාටුවෙන් වුණත් ඒක කියන්න ඕනෑ. මගේ ඡන්ද බල ප්‍රදේශයේ. රාජපක්ෂ පුරයේ. පොලීසියේ අය තට්ටු ගෙවල් හදා ගෙන ඉන්නවා. ගරු ඇමතිතුමා දන්නවා. පොලීසියේ අය තට්ටු තුනේ ගෙවල් හදාගෙන ඉන්නවා. මෙහෙම ඉඩම් අවභාවිතයක් කරන කොට අපේ කිසිම ක්‍රමවේදයක් නැහැ. මේක මධ්‍යම රජයත් එක්ක සම්බන්ධ වෙලා ක්‍රමවේදයක් හදන්න ඕනෑ. මේ ඉඩම් එක්කෝ නැති බැරි පවුලක් වෙනුවෙන් - අහිංසක මිනිස්සු කුලියට ඉන්නවා. මේ අයට පර්චස් හය බැගින් හරි බෙදලා දෙන්න, ඉඩම් ඔප්පුවක් දෙන්න අපි පළාත් සභා හැටියට පියවර අරගෙන නැහැ.

ඒ වාගේම තවත් විශාල වශයෙන් ඉඩම් තිබෙනවා. ජම්බුගස්වත්ත කියලා ප්‍රදේශයක් උතුරු කටානේ තිබෙනවා. අක්කර දහයක පමණ රජයේ ඉඩමක්. වැලි, මැටිවලට කපලා විනාශ කරලා දැම්මා. කිසිම නීතියක් ක්‍රියාත්මක වුණේ නැහැ. ප්‍රාදේශීය ලේකම්වරු හිටියා. ග්‍රාම සේවකවරු හිටියා. ගොවිජන සේවා නිලධාරීවරු හිටියා. මේ සියලු දේ කරන තෙක් කට වහගෙන හිටියා.

ඒ වාගේම අද වන කොට මේ ඉඩම් අවභාවිතය විශාල වශයෙන් සිද්ධ වෙනවා. මෑතකදී ගං වතුරට ගිහිල්ලා ඇළ මාර්ගයක් කපන්න යන කොට ඇළ මාර්ගයේ සිතියම් නැහැලු. එතකොට මම අහන්නේ, මේ ඉඩම් ගැන අඩුම ගණනේ සංඛ්‍යාලේඛන ටිකක්වත් හරියට හදලා මේ නිලධාරීන් තියාගෙන නැහැ. අපේ ගරු මන්ත්‍රීවරු අදහස් දක්වද්දී කිව්වා, ඒගොල්ලන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරද්දී, බලධාරියාව සොයා ගන්න බැරිව යනවා. ඒ කියන්නේ රජයේ කාර්යාල භාරයේ අවශ්‍ය කරන ලේඛනය නැහැ. එහෙම තත්ත්වයක් තියා ගෙන අපි මේ ලෝකය අල්ලන්න කථා කරනවා. ගෙදර මොකද වෙලා තිබෙන්නේ? තමුන්ගේ ගෙදර තිබෙන ඉඩම්කඩම් ටික අපි දන්නේ නැහැ. පළාත් සභා සීමාවේ තිබෙන ඉඩකඩම්වල ප්‍රමාණය. මේක පාවිච්චි කරන ආකාරය. කිසිම වැඩ පිළිවෙළක් නැහැ. මම ඇත්ත වශයෙන්ම දේශපාලන කටයුතුවලට සම්බන්ධ වෙලා, සමාජ සේවා කටයුතු කරන කොට බරපතළ විධියට මේ අවභාවිතයන් දැකලා තිබෙනවා. විශේෂයෙන්ම මේ විගණන වාර්තාව තිබෙනවා. දැන් මීගමුව ප්‍රදේශය ගත්තොත් ඉඩම් රු. 12 ට, රු. 15 ට සමහර වෙරළ ආසන්නයේ ඉඩම්, කෝටි ගණන් වටිනා ඉඩම් දෙනවා. සංචාරක ව්‍යාපාරය සඳහා අච්ච තපින මධ්‍යස්ථානයක් හදන්න කියලයි ගන්නේ. මම හිතන්නේ ලියුම දීලා ප්‍රකෝටි ගණනක් වටින ඉඩමක මේගොල්ලෝ ලොකු හෝටලයක් ගහනවා. බැලුවාම රු. 12, රු. 15 බදු තිබෙන්නේ. ඉතින් මේ විධියට ඉඩම් භාවිතා කරන්න දුන්නොත් මේ රජයට ලැබෙන විශාල ආදායමක් අහිමි වෙනවා. එහෙම නම් අපට කරන්න පුළුවන් සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ගරු මහ ඇමතිතුමාට මම යෝජනා කරනවා. මේ හිස් ඉඩම් එක්කෝ සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය කරන ආපන ශාලා හරි මොනවා හරි හදලා අපේ පාලනය යටතේ තියාගෙන, අපේ පළාත් සභා පාලනය යටතේ තියාගෙන සේවකයෝ දාලා මේවා නඩත්තු කළොත් ඕනෑම මිනිහෙකුට සාධාරණව කාලා බීලා, මේ රටට ඇවිල්ලා යන්නත් පුළුවන්.

ඒ වාගේම මම කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අපි ආර්ථික වශයෙන් රටක් නංවන කොට අපට පුළුවන් යම්කිසි ණය මුදලක් - රස්සාවල් නැතිව තරුණ තරුණියෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ අයට යම්කිසි මුදලක් දීලා මෙවැනි ස්ථානයක් නිර්මාණය කරන්න. සංචාරක ප්‍රවර්ධන ස්ථානයක් නිර්මාණය කරනවා. එහි කළමනාකරණය ඒ තරුණයාට හෝ තරුණියට දෙනවා. එයා එතැනින් ආදායමක් සොයා ගෙන, රටටත් ආදායමක් සොයලා රට දියුණු කරනවා. මේ වාගේ වැඩ පිළිවෙළකට යන්න පුළුවන්. අපේ එහෙම ක්‍රමවේදයක් නැහැ. අපි හැමදාම මොකක්හරි ප්‍රශ්නයක් ආපු වෙලාවට නඩුව දාන්න ගියාමත් කාර්යාලය භාරයේ ලිපි ලේඛන නැහැ. හේතුව, කවුරු හරි හොරට ඉන්න මිනිහා කීයක් හරි දීලා අර ලිපි ලේඛන ටික උස්සනවා. ඉතින් අනාදිමත් කාලයේ විදේශිකයෝ මේ රටට ඇවිල්ලා හදපු ඇළ මාර්ගවලවත් ඉඩම්වලවත් ඔප්පුවක් ලියවිල්ලක්, ගැසට් එකක් නැහැයි කියලා කියන ආයතන තමයි අපේ තිබෙන්නේ. මම වැවක් සම්බන්ධයෙන් සංවර්ධන වැඩ කටයුත්තක් කළා. ඒ වැව සම්බන්ධයෙන් වැඩ කටයුත්ත කර ගන්න විධියක් නැහැ. එක්කෙනෙක් කියනවා, මේක ගොවිජන සේවා එකට කියලා. තවත් කෙනෙක් කියනවා, ඒගොල්ලෝ ළඟ ප්ලෑන් නැහැයි කියලා. ඉතින් මෙවැනි අර්බුද රාශියක අතරමං වෙලා තිබෙනවා. ඉතින් මේකේදී විශේෂ කමිටුවක් හරි දාලා විශේෂයෙන් රජයට අයිති ඉඩම් ප්‍රමාණය ගැන යම්කිසි ක්‍රමවේදයක් ඇති කර ගන්න ඕනෑ. අනිවාර්යයෙන්ම මේ අයවැයෙන් පසු ලබන අවුරුද්ද වෙන කොට අපට මේ ගැන කථා කරන්න තියන්නේ නැතිව ක්‍රමවේදයක් සකස් කරන්නය කියලා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාට මම යෝජනා කරනවා.

ඒ වාගේම සංචාරක ප්‍රවර්ධන වැඩ සටහන් සම්බන්ධයෙන් අපේ පළාත් සභාව දක්වලා තිබෙන උනන්දුව ඉතාමත්ම අඩුයි. අපි වෙන් කරන මුදල් ප්‍රමාණයත් අඩුයි. අපට මේ වන කොට රජයේ රැකියා දෙන්න පුළුවන්කම තිබෙන්නේ, සීමිත ප්‍රමාණයයි. එතකොට ගරු මහ ඇමතිතුමාගේ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තිබෙනවා. ක්‍රමෝපායන් හදන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් අපේ වැඩ පිළිවෙළක් නැහැ. අවුරුද්දකට පාසලකින් ඉවත් වන දරුවෝ ලක්ෂ ගණනක් ඉන්නවා. මේ අය වැඩිහිටියෝ වෙන කොට රට ඇතුළේ මේගොල්ලොන්ට කරන්න ආර්ථික ක්‍රියාදාමයක් නැහැ. එතැනින් තමයි මේ වියුක්තිය ඇති වෙන්නේ. ඊට පස්සේ තමයි මේ කුඩු කියන්නේ. ඊට

[ගරු රෝස් ප්‍රනාන්දු ]

පස්සේ තමයි ගංජා කියන්නේ. මේ හැම වෙලාවේම අපි ව්‍යසන ඇති වුණාට පස්සේ ව්‍යසනවලට උත්තර සොයන්න ගන්නවා. මේ ව්‍යසනය ඇති වෙන්න මුල ඇයි කියලා සොයන්නේ නැහැ. ඉතින් එහෙම ක්‍රමවේදයක් තිබුණා නම්, අපේ තරුණයෝ අතරමං වෙන්නේත් නැහැ. තරුණියෝ අතරමං වෙන්නේත් නැහැ. අපට මේ විධියට අනවශ්‍ය ප්‍රශ්න ඇති වෙන්නේත් නැහැ. ඒ නිසා මම ඔබතුමා මඟින් විශේෂ අවධානය යොමු කරනවා. අපේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න ඕනෑ නම්, අපේ ඇළවේලි ටික පිළිවෙළකට හදා ගන්න ඕනෑ. ඒවා කුණු දාන ස්ථාන නොවෙයි, සංචාරකයින්ට ගිහිල්ලා වාඩිවෙලා නරඹලා විනෝද වෙලා එන්න පුළුවන් තැනක් බවට පරිවර්තනය කරන්න ඕනෑ. ඒ වාගේම අපේ සංස්කෘතික අංගත් ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් අවශ්‍යයි. වෙනම අමාත්‍යාංශයකට අයිති වුණත් ඒවා එකට සම්බන්ධීකරණය කරලා අපි ආර්ථික වශයෙන් නැඟිටින වැඩ පිළිවෙළකටයි මේ අයවැය හරහා යන්න ඕනෑ. ලැබෙන සල්ලි ටික කොහොමද වියදම් කරන්නේ කියලා පොතක ලියලා, මේක කථා කරලා ඉවර කරලා, වැඩක් නැහැ. අපට සල්ලි සොයන ක්‍රමවේද තිබෙනවා. විශාල වශයෙන් ආදායම් ලබන්න පුළුවන් ක්‍රමවේද තිබෙනවා. ඒවා අතහැරලා අපි නැතිබැරිකම ගැන කියලා, පිටරටවලින් ණය ටිකක් ඉල්ලා ගෙන ,එදා වේල ටුවර්ස් වාගේ ඒක වියදම් කරලා ඉවර කරනවා. මේකෙන් කවදාවත් රට හැදෙන්නේ නැහැ. ඒ නිසා අපට සම්පත් තියාගෙන මෙවැනි තත්ත්වයකට පත් වීම ගැන අපි අතිශයින් කනගාටු වෙනවා. ඒ වාගේම විශාල වශයෙන් කථා කරන්න කරුණු තිබෙනවා. නමුත් වෙලාව මදී. විනාඩි 10 ප්‍රමාණවත් වෙන්නේ නැහැ. වෙලාව දෙනවා නම් තව කථා කරන්න හුඟාක් දේවල් තිබෙනවා.

ඒ වාගේම නීතිය හා සාමය. දැන් නීතිය හා සාමය සම්බන්ධයෙන් අපේ පළාත් සභාව නීති පනවලා තිබෙනවා. විශේෂයෙන්ම රථවාහන නීතිය පිළිබඳව ප්‍රඥප්තිය මම අරගෙන බැලුවා. ඒ එකක්වත් අද උසාවියක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මධ්‍යම ආණ්ඩුවේ රථ වාහන නීතියට තමයි තවම නඩු දාන්නේ. මේ නඩුවකට නිවැරදිකරු කියලා මිනිහෙක් කිව්වොත් ඒ නඩුව කියන්න බැහැ. මොකද, පළාත් සභාවේ නීතිය වෙනයි. මහා ආණ්ඩුවේ නීතිය වෙනයි. එතකොට ඒ නඩුවෙන් අපට නිදහස් වෙන්න පුළුවන්. මිනිස්සු දන්නේ නැහැ. දන්නවා නම් ඔක්කොම නිවැරදිකරු කියනවා. එහෙම වුණොත්, දඩ හම්බ වෙන්නෙත් නැහැ. ඒ නිසා මේ පළාත් සභාව පනවන නීති ක්‍රියාත්මක වන භාවයකට පත් වෙන්න ඕනෑ. ඒක මධ්‍යම ආණ්ඩුවත් එක්ක කථා කරලා, පොලීසිය හා ඒ ආයතන දැනුවත් කරලා වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. එහෙම දෙයක් නැහැ. මේ කථාව කරන අතරතුර වෙලාව ප්‍රශ්නයි, වෙනත් ප්‍රශ්නයි, ගරු මහ ඇමතිතුමාටයි සංවිධායකතුමාටයි බේරා ගන්න බැරි ප්‍රශ්න. මම තවදුරටත් කාලය ගන්නේ නැහැ. විනාඩි 10 ත් ඉවර වෙලා. මෙවැනි විවාදවලදී අපට පැයක් විතර දෙන්න ඕනෑ. හොඳ හරවත් කථාවක් කරලා මේ රට සංවර්ධනය කරන්න පුළුවන් තත්ත්වයකට කථා කරන්න. පැයක්වත් දෙන්න ඕනෑ. ඒ නිසා මින් ඉදිරියට අනවශ්‍ය කථා කරලා, මේ අයවැයේ උපරිම ප්‍රයෝජනයක් ගන්න, මේ විවාදය යොදා ගන්නය කියලා කියමින් සියලුම දෙනාට ස්තූති කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී දිවා ආහාර විවේකය සඳහා ප.ව. 2.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් ඇ.භා. 02.04 ට යළිත් රැස් විය.***
*Accordingly the Whole Council Suspended and. it resumed at 2.04 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට පොඩ්ඩක් සමාවෙන්න. මේ අවස්ථාවේදී සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා මූලාසනයේ අසුන් ගන්නා ලෙස. ඒ වාගේම අද ප.ව. 2.45 ට විශේෂ සභා කටයුතු කාරක සභාවක් මගේ නිල කාමරයේ

පැවැත්වෙනවා. ඒ සඳහා සහභාගී වන ලෙස ආරාධනා කරනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, විනාඩි 15 ක කාලයක් වෙන් කර ඇති බව සංවිධායකතුමා දැනුම් දුන්නා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.05]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අඩන්න ඕනෑ නේ කිරි එරෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දශකයකට පමණ පසුව රටේ පළාතේ ප්‍රධාන දිස්ත්‍රික්කයට ගරු ප්‍රධාන අමාත්‍ය ධූරය ඉසුර දේවප්‍රිය මැතිතුමාට හිමි වීමත් සමඟම එතුමාගේ අමාත්‍යාංශය පිළිබඳ නවකයෙක් ලෙස මේ සභාවේ කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ, මේ පළාත් සභාව දේශපාලන තවානක් විධියට, මේ රටට විශාල දේශපාලන නායකයින් රැසක් බිහි කරපු සභාවක්. ඇමතිවරුන්, ආණ්ඩුකාරවරුන්, ඒ වාගේම අගමැතිවරුන්, ජනාධිපතිවරුන් බිහි කරපු මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධූරය වර්තමානයේ උසුලන්නේ, මේ රටේ පළාත් පාලන ආයතනයක සභාපති ධූරයක් දරපු කෙනෙක් වීම සුවිශේෂයි කියන එක මම මේ මොහොතේ මතක් කරනවා. 1991 දී ප්‍රධාන අමාත්‍යතුමා, ගාමිණී තිලකසිරි ඇමතිතුමා, මූලාසනය හොබවන ඔබතුමා පළාත් පාලනයට තරග කරද්දී, පළාත් පාලනයට තරග කරමින් තමුන්නාන්සේලා සභාපතිවරු වෙද්දී ඓතිහාසික සීතාවක පුරයේ විපක්ෂ නායක ධූරය හොබවපු අප, අපේ පන්තියේ කෙනෙකු ප්‍රධාන අමාත්‍යවරයා වීම පිළිබඳව සතුට පළ කරනවා.

ඒ වාගේම මේ අවස්ථාවේ අපේ රටේ ප්‍රධානම පළාත 56% ක් වැනි සොච්චම් භූමියක ජනගහනයෙන් 28.7% ක් වාසය කරනවා. ඒ වාගේම මුළු භූමියෙන් ¼ කට වැඩි ජනගහනයක් නියෝජනය කරන අපේ පළාතේ දළ දේශීය නිෂ්පාදනයේ 42% ක පංගුවකටඅපේ පළාත අයිතිවාසිකම් කියනවා. ඉතිරි පළාත් අටටම ඉතිරි කරලා තිබෙන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් 58% ක් පමණයි කියන එකත් ගෞරවයක් විධියට මා සිහිපත් කරනවා. ඒ වාගේම 851,000 ක් ජීවත් වන, මහ නගර සභා 07 ක්, ඒ වාගේම නගර සභා 14 ක්, ප්‍රාදේශීය සභා 27 ක් ඒ වාගේම සමස්ත පළාත් පාලන ආයතනවලින් 43% ක භූමි භාගයක වගකීම තමයි අප වෙත පැවරෙන්නේ කියන එකත්, අපි සිහිපත් කරනවා. ගරු සභාපතිතුමනි, 5.6% ක භූමි ප්‍රමාණයක් ආශ්‍රිත සම්පත්වලින්, ජනගහනයෙන් 28.7% ක් මුළු සභා සංඛ්‍යාවෙන් සමස්ත රටේම ¼ ක පංගුවක් නියෝජනය කරන අපේ පළාත් සභාව මෙවන් සුවිශාල ජනගහනයක් ඉතා කුඩා බිම් කඩක වාසය කිරීමේ පසුබිම සකස් කිරීමේ අභියෝගය තමයි අපේ පළාත වෙත පැවරී තිබෙන්නේ, කියන එකත් සිහිපත් කරනවා. අපට තිබෙන ප්‍රධාන අභියෝගය මෙයයි. නමුත් අපේ පළාතට අන් කිසිදු පළාතකට නොමැති සුවිශේෂී අවස්ථා විශේෂයෙන්ම ආර්ථික ඒ වාගේම පරිපාලන, සමස්ත රටේම මරමස්ථාන ටික අපේ පළාත තුළ රැඳී තිබීම අපට මේ ප්‍රශ්න වලින් මිදෙන්න යෝධ ශක්තියක් වන බවත් මේ අවස්ථාවේදී අපි මතක් කරන්න කැමැතියි. පොකුරු නගර, ඒ වාගේම අධික ජනගනත්වයක් ඇති ජනගහනයත් එක්ක දළ දේශීය නිෂ්පාදනයේ මහා දැවැන්තම එකතු කිරීම සිදු කරන අපට විශාල අභියෝග රැසකට මුහුණ දෙන්න සිදු වුණත්, ඒ විශාල අභියෝග අභියස දැවැන්තම අභියෝගය වන්නේ ඝන අපද්‍රව්‍ය යයි කියන එකත් මේ මොහොතේ සිහිපත් කිරීමට කැමැතියි. ඒ විෂයත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයයට එක්ව තිබෙනවා කියන එකත් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කුඩා කළ පාසල් යද්දී අපි වතුර බෝතලයක් ගෙන ගියේ නැහැ. හැබැයි, අද අපේ දරුවන්ට වතුර බෝතලයක් ගෙනි යන්න අනිවාර්ය තැනකට පත් කරලා. එක තැනක වතුර බෝතලේ. මුළු පිට පුරා දැවැන්ත පොත් බෑග් එකත් එක්ක නීල් ආම්ස්ට්‍රෝං

[ගරු සුමිත් විජයමුණි ද සොයිසා ]

හදට යනවා වාගේ තමයි අද දරුවන් පෙර පාසල් යන්නේ කියන එකත් මේ මොහොතේ අපි මතක් කරනවා. එපමණක් නොවෙයි. අපට තව ටික දවසක් යන කොට සිද්ධ වෙයි, මුඛය වසාගත්ත, නහය වසා ගත්ත, අහස් කුස මහා බරපතළ ලෙස පරිසර දූෂණයට ලක් වන බැවින්, ඒ ගඳ නිසා, කුණු නිසා මුඛයයි, නහයි දෙකම වසාගත්ත මුඛ වාඩම් ප්‍රදානය කිරීමේ අවස්ථාවකටත් මේ පළාත් සභාව මේ අභියෝගයට මුහුණ දෙනවා කියන එක අපි මේ මොහොතේ සිහිපත් කරනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, 42% ක දළ ජාතික නිෂ්පාදනයේ ආදායම් උත්පාදනය කරන,මිලියන ගණනක දැවැන්ත බාහිර ජන කොටසක් මේ වාසය කරන සියලු අය සමඟ තරගයට මේ පළාත තුළ කැළි කසළ ගොඩ ගසමින්, ඒ වාගේම මිලියන ගණනක් අපේ පළාත තුළ ආදායම් උපදවාගෙන දිවා කාලයේ රැඳී සිට පිටත්ව යමින් මේ එක්වන අභියෝගයට, මම නියෝජනය කරන ප්‍රදේශය වුණු සීතාවක පුරවරයේ, කොළඹ දිස්ත්‍රික්කයේ එකම රාජ්‍ය සේවා ගම්මානය පවා මහා දැවැන්ත කුණු කන්දක් අභියස හුස්ම ගන්න බැරි, මැස්සෝ ගැවසෙන ඒසමගම තිබෙන කොම්පොස්ට් අංගනයත් එක්ක අපි කොළඹ දිස්ත්‍රික්කයේ ඇත කෙළවරේ අවිස්සාවෙල්ල නගරය පවා අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියන එකත් මේ මොහොතේ මම මතක් කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව අපේ යෝජනාවක් තිබෙනවා. ඒ යෝජනාව තමයි, මීට ඉහත ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ මධ්‍යම රජයේ සහාය පළාත් සභාවට, පළාත් පාලන ආයතනවල 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ලැබුණු බලය උදුරා ගැනීමකට නොව මේ සඳහා දැවැන්ත මැදිහත් වීමකින් පළාත් සභාවට ශක්තිය සපයන්න මධ්‍යම රජයට විශාල වගකීමක් තිබෙන බව මේ මොහොතේ මතක් කරනවා. ඒ වාගේම මේ අයවැය පිළිබඳව අපි කපා හැරීම් ගැන බරපතළ සාකච්ඡා කරනවා. කපා හැරීම් සිදු වෙලා තිබෙනවා. ඒ කපා හැරීම් ප්‍රධාන පළාත තුළ සිදු නොවිය යුතුයි කියන විශ්වාසයේ අපි ඉන්නවා. ඒ වාගේම ඒ කළු වළාකුළු අස්සේ රිදී රේඛාවලුත් සැඟව තිබෙනවා කියන එකත් සිහිපත් කරනවා. විශේෂයෙන්ම ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු වශයෙන් ලබා දෙන මුදල 25.7% කින් වැඩිවීම පිළිබඳව පුංචි සතුටකුත් අප තුළ එකතු වන බවත් මතක් කරමින්, කපා හැරීම් තිබුණත්, අපි පළාත් සභා ආදායම් පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රුපියල් මිලියන 2379 ක් අයෝජනය කිරීමට අපේක්ෂා කරන 93% ක වර්ධනය සාර්ථක වේවායි කියන ප්‍රාර්ථනය අපි මේ සභාවේදී කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට නොවැම්බර් මස 31 වැනි දිනට ලබා දුන්නු මෙම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයෙන් රුපියල් මිලියන 489.81 ක මූල්‍ය ප්‍රගතිය තිබුණේ 46% යි. භෞතික ප්‍රගතිය 64% යි තිබුණේ. ඒ වාගේම වෙන් කළ මුදලින් රුපියල් මිලියන 264.39 ක් වැය කර නැත. නොවැම්බර් 01 වැනිදාට මම ඉල්ලා සිටියා. නමුත් මට ලැබුණේ නැහැ. මම මෙය සඳහන් කළේ, අන් කිසිවක් නිසා නොවෙයි. මෙතෙක් කල් අපි අනුගමනය කරපු ක්‍රියා මාර්ගය අර සීමිත පන්දුවාර තරගවල අවසන් ඕවරවල තමයි දැවැන්ත ලකුණු රැස් කිරීම්වලට ගියේ. මෙතෙක් කල් අපිත් අපේ අයවැය තුළ අවසන් මාස දෙකේ තමයි මූල්‍ය සහ භෞතික ප්‍රගතියට යෝධ පියවර තැබුවේ. එය වෙනස් කරන්න ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා අදහස් එක් කරමින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා දැවැන්ත ප්‍රවිෂ්ටයක් හත් වැදෑරුම් පිළිවෙතක් තුළ ක්‍රියාත්මක කිරීම අපි බරපතළ ලෙස අගය කරනවා කියන එක මේ මොහොතේ මතක් කරනවා. ඒ යෝධ ප්‍රවිෂ්ටය තුළ අපට අවසන්පන්දු වාර තුළ නොව මුල් පන්දු වාර තුළ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඇති කරමින් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මුළු ලෝකයටම එදා සීමිත ඕවර් තරගවල ලබා දුන්නු ජයග්‍රහණයට යන මාවත මෙයයි කියන ආකාරය මේ පළාත් සභාව තුළින් එක් කිරීමට ලැබීම අපි ලද ජයග්‍රහණයක් කියන එක මතක් කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපේ ගෞරවය ස්තූතිය අපි නැවතත් පුද කරන්නට, ඒ වෙනුවෙන් කැප වන සමස්ත නිලධාරීන්ට, ඒ ක්‍රම වෙනසට අනුගත වන මැදිහත්වන ක්‍රියාත්මක වන සමස්ත නිලධාරීන්ටත් අපේ ගෞරවය පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ශ්‍රී ලංකාව තුළ වේගයෙන්ම දියුණු වන ආර්ථික අංශය වන්නේ සංචාරක ව්‍යාපාර යයි. මේ වසරේ සංචාරකයින් මිලියන 2.2 ක් බලාපොරොත්තු වෙද්දී ඇමරිකානු ඩොලර් මිලියන 3600 ක ආදායමක් අපි බලාපොරොත්තු වෙනවා. මේ මිලියන 2.2 ම අපේ මව්බිමට පා තබන්නේ අපේ

බස්නාහිර පළාතටයි. 99.9% ක්ම. මේ 99.9% ක් වුණු අපේ මව් බිමට පා තබන සංචාරකයින්ව අපේ පළාත තුළ, හසුරුවා ගැනීම, ඔවුන් සතුටු කිරීම, ඒ වාගේම ඔවුන් නැවත අපේ මව් බිමට කැඳවීමේ වගකීම මේ පළාත් සභාව තුළ පැවරෙනවා කියන එක අපි මතක් කරනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ සංචාරක ප්‍රවර්ධන ඒකකයක් ගොඩනගලා සංචාරක ව්‍යාපාරය ඉන් උත්පාදනය වන රැකියා අවස්ථාවන් තරුණ තරුණියන්ට අවස්ථාව සලසා දීම, විරැකියාවට හොඳම මංපෙතක් කියන එකත් මේ මොහොතේ මම මතක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා කථා කළා වාගේ සීතාවක කුමරි ඇල්ල, මාකෙළි ඇල්ල, ඒ වාගේම වැවේ ජලේ ව්‍යාපෘතිය, ඒ වාගේ අපේ පළාත තුළ අලුතින් ඉදිවුණු තෙත් කලාපීය උද්භිත උද්‍යානය, කොළඹ දිස්ත්‍රික්කයේ අපේ ආසනයේ මේ ආශ්‍රිතව තිබෙන අපේ පළාතෙන් වැටෙන ප්‍රධාන ගංගාවල් කිහිපයක් තිබෙනවා. කැලණි ගඟ, කළු ගඟ, දඬු ගඟ මෙයත් සංචාරක ප්‍රවාහන අංශ වෙනුවෙන් මැදිහත් කර ගැනීමේ අවස්ථාවක් සලසා ගන්න පුළුවන් වර්ෂයක් වේවායි කියා අපි ප්‍රාර්ථනය කරනවා.

එසේ ප්‍රාර්ථනය කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි පළාත් පාලනය. පළාත් පාලන නියෝජිතයින් නැතිව අද පළාත් සභාව වෙත සහමුලින්ම පැවරී ඇති මේ පළාත් පාලනය ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභාවල ජනතා මෙහෙවර බිඳකුදු අඩු වෙන්න ඉඩ නොතබා පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මැදිහත්ව ඒ ජනතා මෙහෙවර නිලධාරීන් තුළින් මැතිවරණයක් පවත්වන තෙක් - මැතිවරණය ඉක්මන් කළ යුතුයි. හැබැයි, ඒ මැතිවරණය ඉක්මන් කිරීමේදී අපි එකක් මතක් කරනවා. මේ රටේ සමස්ත දේශපාලනයේ ජරා ජීර්ණ කුණු ගොඩක් බවට පත් කරපු මේ අසමත්ජාති සමානුපාතික මනාප මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුයි කියලා මතක් කරනවා. එසේ මතක් කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවේ බලය හැම පාලනයක් විසින්ම උදුරා ගත්තා. ප්‍රාදේශීය ලේකම්වරයාගේ සිට ඒ වාගේම විවිධ අමාත්‍යාංශ බිහි කරමින්, BTT ආදායම උදුරා ගනිමින් ඒ වාගේම ඉඩම්වල බලය, ඒ වාගේම බොහෝ බලතල උදුරාගත් යුගයක අපේ පාසල් පද්ධතියේ වැසිකිළිය, කැසිකිළිය පවා ප්‍රාදේශීය ලේකම්වරු හදපු යුගයකුත් තිබුණා. අපේ පළාතේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කථා කරලා අවසන් කරන්න. දැන් විනාඩි 15 ව අවසානයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අවසාන කිරීමට එක් අවස්ථාවක් ඉල්ලා සිටමින්, මේ පළාත් සභාව තුළ ගරු ප්‍රධාන අමාත්‍යවරයා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා අසුන් ගනිද්දී මේ පළාත් සභාව තුළ මන්ත්‍රීවරුන් සම්බන්ධීකරණ කමිටුවල සම සභාපතිවරුන් බවට පත් කරන්න මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කටයුතු කිරීම පළාත් සභා ක්‍රමය බලවත්කිරීමක් කියන එක සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 02.21]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඉන්න ඇති ඊයේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා තමන්ට ලැබුණු විනාඩි දෙකේ කථාවේදී එතුමා ප්‍රකාශ කළා, ආර්ථිකමය පැත්තෙනුත්, දේශපාලනමය පැත්තෙනුත්, සමාජමය වශයෙනුත්අයවැය විග්‍රහ කරගන්නපුළුවන් කියලා. දැන් එතුමා සිටියා නම් හොඳයි. ඒ විග්‍රහ කර ගනිද්දී ඒ හැම කාරණයක්ම ඓතිහාසිකවත්, ඒ වාගේම විෂයය මූලිකවත් පවතින තත්ත්වයට අනුගතවත් විග්‍රහ කර ගත්තොත් තමයි අපට නිවැරදි උත්තරයක් සොයා ගන්න පුළුවන් වන්නේ. එතුමාට තමයි මම මේ පැහැදිලි කිරීම කළේ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[ගරු සරත් පතිරණ ]

මේ අයවැය විග්‍රහ කර ගනිද්දී මධ්‍යම රජයේ අයවැයෙන් පරිබාහිරව අපට මේ අයවැය ගැන කථා කරන්න බැහැ. එතකොට මධ්‍යම රජය තුළ මේ දිනවල විවාදයට පත් වන අයවැය කෙබඳු එකක්ද? ඒ ඉතිහාසයේ දැවැන්තම, දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දෙමින් සකස් කරපු අයවැය වාර්තාවක් තමයි, අයවැය විවාදයක් තමයි අද පාර්ලිමේන්තුවේ මේ දිනවල පැවැත් වෙන්නේ. එය තමයි අපි විද්‍යුත් මාධ්‍යවල නරඹමින් ඉන්නේ. එතකොට මෙන්න මේ දැවැන්තම ආර්ථික අර්බුදය හමුවේ හදපු අයවැය අන්න අර කියන විග්‍රහයට අනුව විග්‍රහ කර ගත්තාට පස්සේ ඓතිහාසිකවත්, විෂයය මූලිකවත්, පවතින තත්ත්වයට අනුගතවත් විග්‍රහ කර ගත්තාට පස්සේ අපට පැහැදිලිව පෙනෙන එක් කාරණයක් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට අපේ රටේ - අගමැතිතුමාම පාර්ලිමේන්තුවේ පිළිගත්ත විධියට අපේ රටේ 43% ක්, දෛනික ආදායම ඩොලර් 02 ක් ලබන බහුතර ජනතාවක් ඉන්න රටක මේ වාගේ ආදායම් බෙදී යාමේ විෂමතාවය ඉතාමත් තිව්‍ර වුණු රටක මෙන්න හදපු මේ අයවැය ලියවිල්ලෙන් අපට එන්නේ දඩ, බදු සහ ණය නම් බස්නාහිර පළාත් සභාවේ අයවැයට ඊට පරිබාහිරව අපට කටයුතු කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ඒ නිසා මේ අයවැයේ මොනතරම් සුන්දර වචන තිබුණත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය ලියවිල්ල ඉදිරියේදී අපි දකිනවා, බස්නාහිර පළාත් සභාව පඩිනඩි ටික ගෙවා ගත්තාට පස්සේ වෙන කිසිවක් කරන්න මේ අයවැයට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැයි කියලා. මොකද, අද ඩොලර් එක ඉතාමත්ම වේගයෙන් ඉහළ යනවා. රුපියල අවප්‍රමාණය වෙමින් කඩා වැටෙනවා. එතකොට අපි ඒ විදේශයන්ගෙන් ගෙන්වන, ඒ පරිභෝජනවාදී රටක ජීවත්වන මිනිස්සු හැටියට අපි කිසිවක් නිෂ්පාදනය නොකරන රටක, පළාතක ජීවත්වන මිනිස්සු හැටියට අපට අධික මිල ගණන් යටතේ මේ සියලුම බඩු මිලදී ගැනීම්, ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ ඉදි කිරීම් කටයුතු සඳහා අලුතෙන් එකතු වුණු වැට් මුදලත්, ඒ වාගේම මෙන්න මේ සියලු කාරණාත් එක්ක මේ අයවැයෙන් කරන්න පුළුවන් කෙන් ගෙඩියක් නැහැයි කියන එක අපට මේ අවස්ථාවේ පැහැදිලි කරන්න වෙනවා.

ඒ වාගේම මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අයවැය ප්‍රකාශනයේ තිබෙනවා, කැලණි ගඟේ ජලය දූෂණය වීම සම්බන්ධයෙන් එතුමා විශේෂ මැදිහත්වීමක් කරන්න වැඩ කටයුතු කරනවා කියලා. ඇත්තටම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය විවිධ අවස්ථාවලදී අමාත්‍යවරුන් දෙදෙනෙක් යටතේ ඉදිරිපත් කළා. හැබැයි, මේ පිළිබඳව අවධානය යොමු කරපු එකම ගරු ප්‍රධාන අමාත්‍යවරයා වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා තමයි. එතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් තේරී පත්වීම ගැනත් අපි සතුටුයි. මේ කැලණි ගඟ සඳහා මැදිහත්වීම සම්බන්ධයෙන් එතුමාව මම අගය කරනවා. එතුමා වැඩමුළුවක් සකස් කළා. ඊකට මේ ගරු මන්ත්‍රීවරුන් ආවේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාමත් වැදගත් විද්වත් සාකච්ඡාවක් එතැන පැවැත් වුණේ. එහිදී තමයි අපි දැන ගත්තේ කැලණි ගඟේ ජලය මොනතරම් අපවිත්‍ර වෙලාද කියලා. ඒ වාගේම කැලණි ගඟ ආශ්‍රිතව කොළඹ දිස්ත්‍රික්කයේ ළිංවල - අපි හිතනවා, අනේ අපි නම් ටැප් එකෙන් වතුර බොන්නේ නැහැ. නළ ජලය පාවිච්චි කරන්නේ නැහැ. අපි බොන්නේ අපේ ළිඳේ වතුර ටික කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වැඩමුළුවේදී ඒ විද්වතුන් ප්‍රකාශ කර සිටියේ දැන් කොළඹ දිස්ත්‍රික්කයේ, ඒ වාගේම බස්නාහිර පළාතේ ළිංවල PH අගය අඩු වෙමින් පවතිනවා කියන එකයි. ඒ කාරණය තමයි ඒ විද්වතුන් පැහැදිලි කළේ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ තත්ත්වය යටතේ කැලණි ගඟ අපි සුරක්ෂිත කර ගත්තේ නැත්නම්, හෙට දවසේ අපට මේ ළිං වල ජලය පරිභෝජනය කිරීමට නොහැකි තත්ත්වයට පත් වෙනවා නම් ඉතාමත්ම ඉක්මණින් - මේ සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් වෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේ කටයුත්ත ඉතාමත්ම වේගවත් කරන්න ඕනෑ. ඉක්මන් කරන්න ඕනෑ. විද්වත් කමිටු වාර්තාව මාර්තු මාසයේ තමයි එනවා කියලා තිබෙන්නේ. එතැනින් පස්සේ වැඩ පිළිවෙළක් සකස් වෙද්දී, මේ අවුරුද්ද ගෙවිලා ඉවර වෙයි. ඒ නිසා ඉතාමත්ම ඉක්මණින් මේ කැලණි ගඟේ ජලය පාවිච්චි කර ගැනීමේ වැඩ සටහනට ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. ඒ මැදිහත්වීම වේගවත් කරන්න ඕනෑ.

ඊළඟට අපි මුහුණ දෙන බරපතළම අර්බුදය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කරන්න දැන් අපට තැනක් නැහැ. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ඒ භාණ්ඩ පරිභෝජනය වේගවත් වෙලා තිබෙනවා. වැඩි වෙලා තිබෙනවා. දැන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කරන්න, ඔය ටීවී රෙපායාර් කරන තැන්, පරිගණක අලුත්වැඩියා කරන තැන්, දූරකථන අලුත්වැඩියා කරන තැන්වල, ඒ අයට එකතුවන උපකරණ, පරිහරණය කරගන්න බැරි වන උපකරණ තමන්ගේ ආයතනවල විශාල ප්‍රමාණයෙන් ඔවුන් ගොඩගහගෙන ඉන්නවා. හැබැයි, ඔවුන්ට ඒවා දෙන්න තැනක් නැහැ. ඒවා මිලදී ගන්න වැඩ පිළිවෙළක් නැහැ. එක්කෝ ඔවුන් ඒවා හොරෙන් ගිහිල්ලා කොහේ හරි වළ දානවා. මම දන්නවා, බොහෝ ඒවා කැලණි ගඟට අපේ පාලම උඩින් අතහරිනවා. ඒ නිසා මෙන්න මේ තත්ත්වය වෙනස් කර ගන්න බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා හැටියට මේ ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බැහැර කිරීමට නිසි වැඩ පිළිවෙළක් සකස් නොකළොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනාගතයේ බරපතළ ඛේදජනක තත්ත්වයකට අපේ පළාත, අපේ රට මුහුණ දෙනවා. ඒ සඳහා දැම්ම මැදිහත් වන්න. වහ වහා මැදිහත්විය යුතු කාරණයක් හැටියට මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් අපේ ගරු මහ ඇමැතිතුමාව දැනුවත් කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම මාසයකට කලින් අහපු ප්‍රශ්නයකට ඉතාම ඉක්මණින් එතුමා මට පසුගිය සභා වාරයේදී පිළිතුරක් ලබා දුන්නා. සංචාරක අමාත්‍යාංශය සම්බන්ධයෙන්.සංචාරක අමාත්‍යාංශයේ සභාපතිවරයාගේ කල් කිරියාව සම්බන්ධයෙන් තමයි මම ප්‍රශ්න අහලා තිබුණේ. බස්නාහිර පළාත් සභාවේ අපේ සංචාරක අමාත්‍යාංශය කියන්නේඉතා වැදගත් අමාත්‍යාංශයක්. වැදගත් අමාත්‍යාංශයක සභාපතිවරයෙක් ගැන තමයි මම මේ ප්‍රශ්නය ඇහුවේ. එතුමා, එතුමාගේ ව්‍යාපාරික කටයුත්තක් සඳහා තලවතුගොඩ පාරේ අංක 94 දරන ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදි කළා. ඒ ඉදි කිරීම සම්බන්ධයෙන් - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වේලාව මදි වුණොත් අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් ලබා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම වෙලාව ලබා දෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

තලවතුගොඩ පාරේ, අංක 94 දරන ස්ථානයේ තමයි මේ ඉදි කිරීම කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදි කිරීම කරද්දී, මොහු අවසර ගත්තේ දෙමහල් ගොඩනැගිල්ලකට. හැබැයි මේ ගොඩනැගිල්ල නිම කරලා අවසන් වන කොට තට්ටු පහක ගොඩනැගිල්ලක් බවට පත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තලවතුගොඩ ප්‍රදේශය කියලා කියන්නේ, පාර්ලිමේන්තුව ආසන්නයේ තිබෙන ඉතාමත් ආරක්ෂිත කලාපයක තිබෙන බිමක්. එතකොට මේ පස් මහල් ගොඩනැගිල්ල - මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් අහපු ප්‍රශ්නවලදී එතුමා උත්තර දෙනවා, පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බව දනිමි. ඊළගට මගේ ප්‍රශ්නය, *එම වෙනස්කම් සිදු කිරීමේදී කෝට්ටේ මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අනුමැතිය ලබා දී තිබේද?* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන තුනෙන්ම අනුමැතිය ලබා ගත යුතුයි. මෙතැන ඉදි කිරීමක් මේ කරන්නේ. තට්ටු පහක ගොඩනැගිල්ලකට යන්න බැහැ. උපරිම තට්ටු දෙකයි දෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කාගෙද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපේ සංචාරක අමාත්‍යාංශයේ සභාපති කීර්ති දිසානායක මහත්මයාගේ ඒ වාලම්පුරි ව්‍යාපාර කටයුතු සඳහා තමයි නමෝ නාරායන මන්දිරය ගොඩනැගිල්ල ඉදි කරන්නේ. එතකොට මෙන්න මේ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම සැලසුමෙන් පරිබාහිරව තමයි ඉදි කළේ. ඉදිරිපත් කරපු වර්ග අඩි ගණන සම්පූර්ණයෙන් වෙනස් වෙලා. උස වෙනස් වෙලා. පරිමාව වෙනස් වෙලා. සැලසුම් සියල්ල වෙනස් වෙලා. හැබැයි, ඒ තට්ටු පහේ ගොඩනැගිල්ල, මෙන්න මේ ආයතනවලින් අනුමැතිය ලබා නොගෙන තමයි මේ ඉදි කිරීම කරලා තිබෙන්නේ. එහෙමනම් මේ ගොඩනැගිල්ල අනවසර ඉදි කිරීමක්.

අද මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමා, පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයෙක්. මෙතැන පළාත් පාලන ආයතවල සභාපතිතුමන්ලා බොහොමයක් ඉන්නවා.

[ගරු සරත් පතිරණ ]

ඔබතුමා දන්නවා. එතුමන්ලා දන්නවා, අනවසර ඉදි කිරීමක් සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන නීතිය මොකක්ද කියලා. මම ඉල්ලා සිටිනවා, ඒ නීතිය අනුව කටයුතු කරන්න. කවුරුත් නීතිය දන්නවා. ඒ නීතිය අනුව කටයුතු කරන්න. මෙතුමාට විශේෂ වරප්‍රසාද දෙන්නේ කොහොමද? එතුමාට එහෙම දෙන්න පුළුවන්කමක් නැහැ. පසුගිය දවස්වල අපේ රටේ ප්‍රධාන පුවත්පතක - අපේ රටේ වැඩි දෙනෙක් කියවන පුවත්පතක්. සත් හඬ පත්තරය. මේ සත් හඬ පත්තරේ තනිකර පිටුවක වාර්තාවක් ගියා. අපේ බස්නාහිර පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයේ සභාපතිවරයා සම්බන්ධයෙන්. එතකොට එතුමා මේ ගොඩනැගිල්ල ඉදි කළේ - අපට මේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොහේ හරි මුල්ලක ගිහිල්ලා ඉදි කළා නම් අපට කමක් නැහැ. මොකද දැන් චීන්නුන්ට අක්කර පහළොස් දාහක් දෙන්න යනවා නේ?ඉතින් ඒක නිසා ඒක කමක් නැහැ. ඒක චීනයට හරි අයිති වෙයි නේ?හැබැයි, මේ ඉදි කරන්නේ රටේ ආරක්ෂිතම වැදගත් කලාපයක. පාර්ලිමේන්තුව අසළ. කොන්ත්‍රාත්කරුවාටත් ගෙවලා නැහැ. කෝටි හතරක ද කොහේද පොල්ලක් තියලා තිබෙන්නේ. මේ පොලුකාරයෝ තමයි සභාපති ධූරයන්ට පත් කරගෙන තිබෙන්නේ. අපි කියනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ගෞරවයටත් ඒක අපකීර්තියක්. මෙවැනි වංචාකාරීන් සභාපති පුටුවල ඉඳ ගැනීම තුළන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යම්කිසි ගෞරවයක් තිබෙනවා නම් ඒකත් නැති වෙනවා. ඒ නිසා මේකට සුදුසුකම් නැද්ද? ඕකට තිබෙන සුදුසුකම මොකක්ද? සංචාරක අමාත්‍යාංශයේ සභාපතිකම එතුමාට දෙන්න තිබෙන සුදුසුකමක මොකක්ද? නමෝ නාරායන මේ වාළම්පුරි විකුණන එකද එතුමාගේ සුදුසුකම.

ඇත්තටම අපි විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාළම්පුරියක් කියලා කියන්නේ, ඒක වටිනාකම තිබෙන්නේ වමට කැරකුණු එකක්. හැබැයි, මෙතුමා දකුණට කැරකුණු ඒවා විකුණන්නේ නමෝ නාරායන මන්දිරයේ. දකුණට කැරකුණු ඒවා ඕනෑ තරම් ඉන්දියාවෙන් කන්ටේනර් ගණන් ගෙන්වන්න පුළුවන්. රුපියල් දහ පහළොස් දාහක් දුන්නාම කන්ටේනරයක් ගේන්න පුළුවන්. එහෙම වංචාකාරයෙක් අපේ බස්නාහිර පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයේ ඉන්නේ. එහෙම අයෙක් සභාපති පුටුවක ඉඳගෙන අපට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට වැඩිපුර විනාඩි දෙකක් දීලා තිබෙනවා. ඒ නිසා කථාව අවසන් කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම පළාත් පාලන නීතිය අනුව මේ පළාත් සභාවේ ගරු මහ ඇමැතිතුමා කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. එහෙම නැත්නම් අපට අධිකරණ ක්‍රියා මාර්ගවලට යන්න සිද්ධ වෙනවා. මේ වාර්තාව අනුව එතුමා වංචාකාරයෙක්. දූෂිතයෙක්. හොරෙක් කියලා අපට ඔප්පු කරන්න පුළුවන්. මේ සියලු කාරණා එක්ක කොන්ත්‍රාත්කාරයාට කෝටි හතරක පොල්ලක් තියලා තිබෙනවා. කොන්ත්‍රාත්කරුට අපි අපේ සහයෝගය ලබා දෙනවා. මොකද, ඔහුට කෝටි හතර ලබා දෙන්න නොවෙයි. ඒ ගනුදෙනු වෙනම එකක්. හැබැයි, මේ වංචාකාරයා නිසා ඔහුට අසාධාරණයක් වෙලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොන්ත්‍රාත්කාරයාත් දකුණට හරෝලා තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

නීතිය නමලා කොහොම ක්‍රියා කරයිද කියලා අපි දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොලිස්පතිතුමාගේ යාළුවෙක්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පොලිස්පතිතුමාට, මේ සර්ලා කථා නොකරනවා නම්, නීතිය සාධාරණය ඉෂ්ට වෙනවා නම්, මේ සභාපතිවරයා හෙට දවසේ හිරේ ඉන්න ඕනෑ පුද්ගලයෙක් අපි සභාපති පුටුවේ තියාගෙන ඉන්නේ. ඒ නිසා වහාම මොහු ඉවත් කරන්නය කියලා මම ඔබතුමා මඟින් අපේ ගරු මහ

ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තූතියි.

[අ.භා. 02.34]

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම සතුටු වෙනවා. මම කාලයකින් තමයි පළාත් සභාවේ කථා කරන්න ආවේ. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දෙවන අයවැය ඉදිරිපත් කරන්නේ. 2016 වසර පුරාම ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා බස්නාහිර පළාත් සභාවේ සියලු පාර්ශවවල සහයෝගය ලබාගෙන එක්සත් ජාතික පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, තව ඒකාබද්ධ විපක්ෂයේත්, පොහොට්ටුවලත් සියලු දෙනාගේම සහයෝගයෙන් බස්නාහිර පළාත් සභාව ශක්තිමත්ව ඉදිරියට ගෙනි යනවා. මම අනිකුත් දේවල් ගැන කථා කරන්න ඉස්සෙල්ලා කසළ ප්‍රශ්නය ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මොකද, මෙය ගොඩක් දොම්පේ ආසනයට වැදගත් වන නිසා. අද හැම දෙනෙක්ම වාගේ කථා කළේ, කසළ කළමනාකරණය ගැනයි. ඒකේ තිබෙන අඩුපාඩු ගැනයි. ඒ තුළින් තිබෙන බරපතළ ලෙස තමුන්ගේ ආසන මුහුණ දීලා තිබෙන තත්ත්වය ගැනයි.

බස්නාහිර පළාතේ මුලින්ම මේ කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කළේ දොම්පේ. ඒ ආරම්භ කරන අවස්ථාවේදී කොරියානු රජයෙන් මිලියන 600 ක ව්‍යාපෘතියක් දෙන්න සූදානම් කරන කොට සියලුම දෙනා විරුද්ධ වුණා. සීතාවක, අත්තනගල්ල, බියගම,කැලණිය,කඩුවෙල ඔය ප්‍රාදේශීය සභාවන්වල නායකයන් උද්ඝෝෂණ පවත්වලා මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. මේක ගේන්න එපා. මේක ගෙනාවොත් සම්පූර්ණයෙන්ම විනාශ කරනවා. ගිනි තියනවා. නමුත් මේකේ වටිනාකම හඳුනාගෙන දීර්ඝ කාලීනව ජනතාවට තිබෙන විශාල ප්‍රශ්නයකට විසඳුමක් හැටියට මෙය හඳුනාගෙන දොම්පේ ආසනයේ මාළිගාවත්තේ මේක ආරම්භ කරන්න කියලා කිව්වා. මේක ආරම්භ කරන කොට මේකට සියලුම දෙනා විරුද්ධ වුණා. දොම්පේ ආසනයේ අය පමණක් නොවෙයි. ඔය අනිකුත් ආසනවල කට්ටියත් විරුද්ධ වුණා. බියගම, අත්තනගල්ල. මම හිතන්නේ, මහරින් නම් සහන් මන්ත්‍රීතුමන්ලා ආවේ නැහැ. සීතාවක ඔය හැම කෙනෙක්ම ආවා. හට් ගහගෙන, මැස්සවල් ගහගෙන විශාල උද්ඝෝෂණ පැවැත් වූවා. අපේම පළාත් සභාවේ මන්ත්‍රීවරු, අපේම ඇමැතිවරු කළු කොඩි දාගෙන මේ වටිනා ව්‍යාපෘතිය පිළිබඳව ඒ දවස්වල දේශපාලන අධිකාරිය බැසිල් රාජපක්ෂ මැතිතුමන්ලා මේවා වීඩියෝ කරලා, ෆොටෝ ගහලා මේකේ වටිනාකම පෙන්නුවා. හාමුදුරුවන්ට ගිහිල්ලා කිව්වා. නමුත් ඒත් කවුරුවත් ඇහුවේ නැහැ. ඒදවස්වල මහ මැතිවරණය තිබුණා. තේමාව තිබුණේ, කසළ ව්‍යාපෘතිය නතර කරන්න නම් උපාලි ගුණරත්න ගෙදර යවන්න කියලා. මෙය දීර්ඝ කාලීන ජනතා විසඳුමක් නිසා ඒත් මම කෙළින් හිටියා. අවසානයේදී මම ගෙදර ගියා. හැබැයි, කසළ ව්‍යාපෘතිය ආරම්භ වුණා. අද මෙය මුළු බස්නාහිර පළාතටම - අනික් පැත්තෙන් මේක ජේන්න බැරුව තිබෙන එකක්. ඔක්කෝම දැන් මේකේ රිංගන්න හදනවා. මම මගේ බෙල්ලත් දීලා, මගේ මන්ත්‍රීකමත් දීලා මේක ආරම්භ කළා. හැබැයි, අපි එක කොන්දේසියක් විශේෂයෙන් දැම්මා. ඒ කාලයේ තිබුණු ප්‍රශ්නය තමයි මේකට පිටින් කුණු ගේනවා කියලා. නමුත් දොම්පේ ජනතාවට අපි කිව්වා, පිටින් කුණු ගේන්නේ නැහැයි කියලා. අපි අවසානයේදී උසාවි නියෝගයක් ගත්තා, මෙයට පිටින් කිසිම විධියකින් කුණු ට්‍රැක්ටරයක්වත් ගේන්නේ නැහැයි කියලා. එහෙම කියලා තමයි අපි මේක ආරම්භ කළේ. දැන් අද ඉතාමත්ම මනා කළමනාකරණයක් ඇතිව මාළිගාවත්ත කසළ ව්‍යාපෘතිය පවත්වාගෙන යනවා. දැන් මේක ජේන්න බැහැ. මේක ලොකුයි. මේකේ ඉඩ තියෙනවා කිය කියා හැම මිනිහාම, හැම ආසනයක්ම දැන් මේකට රිංගන්න හදනවා. ඒකට ඉඩ දෙන්න බැහැ. ස්තූතියි, මගේ ගරු මන්ත්‍රීවරුන්ට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලොකු නම් රිංගුවාට මොකද වෙන්නේ?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ලොකු නම් ඒක දොම්පෙට නේ ලොකු. කාටවත් තිබෙන අමාරුව මොකක්ද? දැන් මේ කියන්නේ මෙහි ඉඩ තිබෙනවා කියලා. හරි. ඉඩ තිබෙනවා නම් අනික් අයටත් දාගන්න තිබුණා නේ. ඒක නිසයි අපේ සියලුම සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල කථා කරලා තිබෙන්නේ. මේක තියන්න එපා. අපේම පළාත් සභාවේ

[ගරු උපාලි ගුණරත්න ]

ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, ලොරි ගිනි තියනවා කියලා. දැන් අතිවිශාල ජනතා විරෝධයක් මේකට පෙළ ගැහෙනවා. මට කරන්න තිබෙන එකම දේ තමයි ඒ ජනතා විරෝධයත් එක්ක අපිත් පෙළ ගැහෙන්න වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වත්මන් ජනාධිපතිතුමා දෙන්න කිව්වාලු.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

නැහැ, නැහැ. ජනාධිපතිතුමා කියන්නේ නැහැ.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ජනාධිපතිතුමා මට පුද්ගලිකව කිව්වා, පැත්තෙන් දාන්න දෙනවා කියලා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ජනාධිතිතුමා කියන්නේ නැහැ. ජනාධිපතිතුමා දන්නවා, ජනතා හඬ මොකක්ද කියලා. මුළු දොම්පේ ආසනයම විරුද්ධයි.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ඒ වුණාට ජනාධිපතිතුමා විරුද්ධ නැහැ නේ? ගරු මන්ත්‍රීතුමා අපට කිව්වා, ලොකු නිසා පැත්තෙන් ටිකක් දාන්න කියලා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

නැහැ. නැහැ. පැත්තෙන් දාගන්න බැහැ. පැත්තෙන් එහෙමනම් වෙන කොහේ හරි ගිහිල්ලා දා ගන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉඩ තිබෙනවා නම් පැත්තෙන් දෙන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අවසාන වශයෙන් මම ඒ ගැන කථා කරන්නම්. මම කියනවා, මමත් එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මැතිතුමාත් දොම්පේ ජනතාවත් සියලුම දෙනා දොම්පේ ආසනයට කුණු ට්‍රැක්ටරයක්වත් ගේන්න දෙන්නේ නැහැ. මොකද එහෙම නම්, අනික් කට්ටියට පටන් ගන්න තිබුණා නේ?කවුරුත් පටන් ගත්තේ නැහැ නේ?සීතාවක, අත්තනගල්ල, කඩුවෙල. අපි පටන් ගත්තේ අපට කරන්න. ඒ නිසා වෙන කාටවත් කුණු දාන්න බැහැ. මම ඒ ගැන ඊට වැඩිය කථා කරන්නේ නැහැ. (බාධා කිරීම්)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාව අගය කරනවා. එතුමා සියලු දෙනාමගේම සහයෝගය අරගෙන මෙම පළාත් සභාව කරගෙන යනවා. පළාත් සභාවක ප්‍රධාන අමාත්‍ය ධූරය දරනවා කියන්නේ, ලෙහෙසි වැඩක් නොවෙයි. මම සාමාන්‍යයෙන් ඔය මුරුංගා අත්තේ තියන කෙනෙක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, තව පොහොට්ටුවෙත් සහයෝගය අරගෙන කරගෙන යනවා. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත්, එක්සත් ජාතික පක්ෂයෙත් නම් කොන්දේසි නැහැ. පොහොට්ටුවේ කොන්දේසි තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. හැබැයි, මේ සියලු දෙනාම ආරක්ෂා කරගෙන යන්න ඕනෑ නේ?එහෙම යන ගමනක්. හැබැයි, මම විශේෂයෙන් මතක් කරනවා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා පොහොට්ටුවේද නැද්ද කියන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම තරම් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම තරම් මහින්ද රාජපක්ෂ මැතිතුමාට වැඩ කරපු කෙනෙක් මෙතැන නැහැ. මම එතුමා අගය කරනවා. මම එතුමා ගැන හොඳට දන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ කාලයේ පස් කැපුවේ ඒක නේ?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මෙතුමන්ලා දන්නේ නැහැ නේ මොනවද කළේ කියලා. කතරගම පා ගමනට ගිය අය මෙතැන ඉන්නවාද? මුල්කිරිගල මැතිවරණයට ගිය අය මෙතැන ඉන්නවාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

NSB එකේ Chairman වුණේ ඒක නේ?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම NSB එකේ Chairman වුණාට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම්බුව ආරක්ෂා කරලා ගෙදර ආවා. මම චන්ද්‍රිකා මැතිනිය ඉන්න කාලයේ රූපවාහිනියේ සභාපති වෙලා සිටියා. සතොසේ සභාපති වෙලා හිටියා. ඔක්කොමගේම හිටියා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පස් කැපුවේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

පස් කැපුවා තමයි ඉතින්. හැබැයි, ඒවා නීත්‍යානුකූලව කැපුවේ. ඒ අවුරුද්දේ මම පස් කපලා ලක්ෂ 52 ක් බදු ගෙව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වැලි කැපුවේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ලක්ෂ 52 ක් බදු ගෙව්වා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ කරන්නේ නැහැ. මේ පොහොට්ටුකාරයෝ බලාගෙන හිටියාට වැඩක් නැහැ. ඔක්කොටම වැඩිය මම එතුමා ගැන දන්නවා. එතුමා කවමදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ කරන්නේ නැහැ. එතුමා පක්ෂයට පාඩු වන වැඩක් කවදාවත් කරන්නේ නැහැ. එතුමා හැමදාම සාකච්ඡා මාර්ගයෙන් එකඟයි. තමුන්නාන්සේලාට මම එක කථාවක් කියන්නම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට විනාඩි දෙක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම වැඩිය කථා කරන්නෙත් නැහැ නේ? මම කාටවත් බාධා කරන්නෙත් නැහැ නේ?ඉතිහාසය පොඩ්ඩක් අහගන්න. තමුන්නාන්සේලාගේ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා ගැන කියන්නම්. එතුමා මගෙත් නායකයා වෙලා හිටියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන්?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

දැන් මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නේ?එතුමා කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හානි කරන්නෙත් නැහැ. ඒ නිසා මම එතුමාට ආදරෙයි. මම එතුමා ගැන කියන්නම්. එතුමා ගැන ඔබතුමන්ලා දන්නේ නැහැ නේ?එතුමාත් සමග ගිය කතරගම පා ගමන ගැන කිව්වා. මුල්කිරිගම Election එකට ගිය කවුරුත් මෙතැන ඉන්නවාද? ඒකට ගිය කට්ටිය කවුද මෙතැන ඉන්නේ? හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා

[ගරු උපාලි ගුණරත්න ]

ගියා. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාත් පා ගමනට ආවා. මෙතුමන්ලා මොනවාද දන්නේ? ඊයේ පෙරෙයිදා බබාලා. මම ඉතිහාසය පොඩ්ඩක් කියන්නම්. (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උපාලි ගරු මන්ත්‍රීතුමා ඒක නොවෙයි අහන්නේ. පැත්තෙන් පොඩ්ඩක් දා ගන්න පුළුවන්ද කියලා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

පොඩ්ඩක් ඉන්න කෝ. කරුණාකර මේවා අහගන්න. නැත්නම් ඔබතුමන්ලාට මේවා අහගන්න හම්බ වෙන්නේ නැහැ. 1985 දී සිරිමා බණ්ඩාරනායකමැතිනියට උවමනා කරලා තිබුණා, පක්ෂයේ මහ ලේකම් තේරීමට. ඒ අවස්ථාවේදී එතුමිය ධර්මසිරි සේනානායකව තමයි යෝජනා කරන්න සිටියේ. ධර්මසිරි සේනානායක හිටපු ඇමැතිතුමා. නමුත් සියලුම දෙනාම මහින්ද රාජක්ෂ මැතිතුමාට ඉදිරිපත් වෙන්නය කියලා කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මොකටද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

පක්ෂයේ මහ ලේකම් තනතුරට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂයය මොකක්ද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මේ ඉතිහාසය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විෂයය ඉතිහාසය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පළාත් පාලන වැය ශීර්ෂයය කථා කරන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අපි හැම කෙනාම කිව්වා.මහින්ද රාජපක්ෂ මැතිතුමා අනිවාර්යයෙන් මැතිනියට විරුද්ධව ගියා නම් එතුමා ඒකෙන් දිනනවා. නමුත් ධර්මසිරි සේනානායක මැතිතුමා දාන්න මැතිනියට උවමනාව තිබුණා. මම ගිහිල්ලා මැතිනියට කිව්වා, මැතිනිය ඡන්දයකට යන්න එපා. අනිවාර්යයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනනවා. මම එතකොට මැතිනියගේ විධායක කමිටුවේ. බෙත්මගේ මැතිතුමාත් මැතිනියගේ විධායක කමිටුවට පත් කරලා සිටියා. මම හිතන්නේ, එතකොට මෙතුමන්ලා ඉපැදිලත් නැහැ. ඉපදෙන්න හදනවා. ඕකට ඉංග්‍රීසියෙන් කියමනක් තිබෙනවා. මම කියන්නේ නැහැ. එතකොට මැතිනියට කථා කරලා මම කිව්වා, ඡන්දයකට ගියොත් මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනනවා. ඒ අවස්ථාවේදී මැතිනිය මොකක්ද කළේ? මැතිනිය මහින්ද රාජපක්ෂ මැතිතුමාට කථා කරලා කිව්වා, මට ධර්මසිරි සේනානායක පත් කරගන්න ඕනෑය කියලා. එතුමා අයින් වුණා. අයින් වෙලා මැතිනියට ඕනෑ කෙනෙක් පත් කරගන්න ඉඩ දුන්නා. ඒ වාගේ තමයි මේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩන්නේ නැහැ. ඕනෑ නම් කට ඇරගෙන බලාගෙන ඉන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩන්නේ නැහැ. මෙතුමන්ලාගේ හිතේ මේ පොහොට්ටු - එතුමා ඔය පොහොට්ටු පත්තු කරන්න යන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මේ මොකක්වත් කියන්න දෙන්නේ නැහැ නේ?මම එකක් කියන්නම්. ඔය පොහොට්ටුකාරයෝ කොච්චර දැගලුවත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ කරන්නේ නැහැ. තුන් වරක් බස්නාහිර පළාතේ එතුමාගේ හොඳ සංවිධායක වෙලා හිටියේ මම. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කීයටවත් දෙකඩ වන්නේ නැහැ. මම ශ්‍රී ලංකා

නිදහස් පක්ෂයේ නායකයාත් එක්ක ඉන්නේ. මම මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක හිටියා. චන්ද්‍රිකා මැතිනිය එක්ක හිටියා. සිරිමාවෝ මැතිනියත් එක්ක හිටියා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ අයවැය ගැන නොවෙයි නේ කියන්නේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

එහෙම තමයි. අයවැය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමාගේ විෂයය ඉතිහාසය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමාගේ කාලය අවසානයි. එතුමාට කථාව අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඕවා තියන්න පක්ෂ තිබෙන්න ඕනෑ. මෛත්‍රීපාල ලොක්කා නැත්නම් තමුන්නාන්සේලාට ඉතින් ආණ්ඩුවක් පිහිටුවා ගන්න හම්බ වෙන්නේ නැහැ නේ?වැඩිය දඟලන්න එපා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඇරියා නම් මහින්ද රාජපක්ෂ මහත්මයාට. ඕගොල්ලන්ට අරින එක මෙහෙම කරලා ඇරලා දානවා.

[සභාවේ ඝෝෂා]

දඟලන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඔබතුමන්ලා මතක තියා ගන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කියන්නේ ලෙහෙසි පුතෙක් නොවෙයි. ඔබතුමන්ලා නටන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රනිල් වික්‍රමසිංහ කියන්නේ ඊට වැඩිය වැඩ්ඩෙක්.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගෝඨාභය රාජක්ෂ මහත්මයාට, බැසිල් රාජපක්ෂ මහත්මයාට, මහින්ද රාජපක්ෂ මහත්මයාට ඔක්කෝටම ඇරියා නම් ඔබතුමන්ලාට ඇල කරලා අරින්නේ. පැත්තෙන් අරින්නේ. ඒක නිසා -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම දන්නවා, මම අවුරුදු ගණනක් තිස්සේ මෛත්‍රීපාල ජනාධිපතිතුමා ගැන. ඔබතුමන්ලා නටන්න ලැහැස්ති වෙන්න එපා. ඔබතුමන්ලා මේ විහිළු කරන්න ලැහැස්ති වන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමා හොඳ මන්ත්‍රීවරයෙක්. කාලය අවසානයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

යහපාලනය, - බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.47]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 10 ක කාලය ප්‍රමාණවත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම 2017 වර්ෂයේ අයවැය විවාදයට සම්බන්ධ වන්නට අදහසක් ප්‍රකාශ කරන්නට, මට ඊයේත් අවස්ථාව ලැබුණේ නැහැ,ඒ කථික ලැයිස්තුවේ තිබුණු තදබදය නිසා. ඒ කෙසේ වෙතත් අද මට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2014 වර්ෂයේ තමයි හයවැනි පළාත් සභාවට ආධුනික මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත් වන්නේ. අද වන විට වසර 2 ½ ක් ගත වෙලා තිබෙනවා. අද වන විට මට මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇති වෙලා තිබෙන හැඟීම ගත්තොත් මට දුක, සතුට ඒ වාගේම කනගාටුව, ප්‍රීතිය මේ සම්මිශ්‍රණ හැඟීමක් තමයි තිබෙන්නේ. අර සිද්ධාර්ථ කුමාරයා දැකපු අසිත තවුසාට ඇති වුණු හැඟීම තමයි මටත් වසර 2 ½ ට පස්සේ තිබෙන්නේ.

මට සතුටක් තිබෙනවා, මූලාසානරූඪ ගරුමන්ත්‍රීතුමනි. මම පළාත් පාලන ආයතනයක විපක්ෂ නායකවරයෙක්, සභාපතිවරයෙක් වශයෙන් ඉඳලා මීට වසර 2 ½ ට පෙර පළාත් සභාවට තේරී පත් වුණු නිසා දේශපාලන ජීවිතයේ ඉදිරි ගමනක් එන්නට ලැබීම ගැන සතුටු වෙනවා. හැබැයි, මට කනගාටුවක් තිබෙනවා,ජනතාව අපෙන් පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් බලාපොරොත්තු වුණු සේවාව මට පෞද්ගලිකව ඉටු කර දීමට හැකියාව ලැබුණාද? නැද්ද? කියන එක පිළිබඳව. මට ඒ සම්බන්ධයෙන් මා පිළිබඳව ගැටලුවක්, කනගාටුවක් තිබෙනවා. මම හිතන්නේ ඒකට හේතුව මම මේ විපක්ෂයේ අසුන් ගෙන සිටීමම නොවෙයි කියන එක මම විශ්වාස කරනවා. ඒකත් එක ප්‍රධාන හේතුවක් කියන එක අපි පිළිගන්නවා. නමුත් ඒක එකම හේතුව නොවෙයි. අපි විපක්ෂයේ අසුන්ගෙන සිටින විට අපි අවබෝධ කරගෙන තිබෙනවා, පාලක පක්ෂයේ අසුන්ගෙන සිටින මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාද අපට ලැබෙන්නේ නැහැයි කියලා. අපි ඔවුන් ලබන වරප්‍රසාද ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය කණ්ඩායමෙන් ඉල්ලන්නෙත් නැහැ. හැබැයි, අපි අවස්ථාව ඉල්ලනවා. අපව මෙතැනට පත් කරලා එවපු ජනතාවට සේවයක් කරන්න අවස්ථාව ඉල්ලනවා. හැබැයි, ඒ අවස්ථාව සමව ලැබෙන්නේ නැහැ. අපි ඒ පිළිබඳව කනගාටු වෙනවා. ඉදිරියේදී එය නිවැරැදි කරයි කියන එකත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ එක්කම මට මහජන මන්ත්‍රීවරයෙක් වශයෙන් ජනතාවට සේවය කරන්නට හැකියාව නොලැබුණු තවත් එක හේතුවක් තමයි මේ පළාත් සභාවේ වර්තමානයේ පවතින අකාර්යක්ෂමතාවය. ඵලදායිතාවය අඩුවීම. එහෙම ගැටලුවක් තිබෙනවා. ඒ පිළිබඳව මගේ විතරක් නොවෙයි. මේ විපක්ෂයේ සිටින සහ පාලක පක්ෂයේ සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන් ඒ පිළිබඳව කථා කරනවා. අපි දැක්කා. ගිය මාසයේ අපට ත්‍රිකුණාමලයේ පවත්වපු වැඩමුළුවේදී හැමෝගෙම ඒ පිළිබඳව දැඩි විවේචනයක් තිබුණා. සෑම අමාත්‍යාංශයකම වැය ශීර්ෂ පිළිබඳව විවේචනයක් තිබුණා. භෞතික ප්‍රගතිය පිළිබඳව දැඩි විවේචනයක් තිබුණා. එහෙමනම් දැනට මේ පළාත් සභාවේ පවතින අකාර්යක්ෂමතාවය පිළිබඳව සහ ඒ අඩු ඵලදායිතාවය පිළිබඳව මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් හඬ නඟනකොට ඒ රාවය, ඒ හඬ රාව ප්‍රතිරාව නැංවිලා මේ පළාත් සභාවෙන් එළියේ මහජනතාව අතරටත් ගමන් කරනවා. අපි පිළිගන්නවා. පළාතේ ජනතාව, රටේ ජනතාව පළාත් සභාව පිළිබඳව වඩාත් සුභවාදීව සහ සාධනීයව අදටත් බලන්නේ නැහැ. අපේ රටේ පවතින භූගෝලීය සහ ජනගහන සාධකය මත අදටත් දේශපාලන, පරිපාලන ව්‍යූහයට ව්‍යවස්ථාදායකය, පළාත් සභාව සහ පළාත් පාලන ආයතනය නමින් ආයතන තුනක් අවශ්‍යද කියන එක පිළිබඳව ආර්ථික, සමාජ දේශපාලන කථිකාවත් ඇති වෙමින් පවතින මොහොතක්. ඒක එහෙමනම්, මේ අවස්ථාවේදී අපේ වගකීමක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු මහ ඇමැතිතුමා ඇතුළු ඒ අමාත්‍ය කණ්ඩායමට, පාලක පක්ෂයට වගකීමක් තිබෙනවා. ඒ ජනතාව අතර මේ ගොඩනැගෙමින් පවතින කථිකාව පළාත් සභාව සුදු අලියෙක්ද? කියන ඒ කථිකාවත, ඒ මතය නිශේධනය කරන්නට.ඒ සෘණාත්මක මතවාදය නිශේධනය කරන්නට ඔවුන්ටත් සුවිශේෂී වගකීමක් තිබෙනවා. විරුද්ධ පක්ෂයේ හිටියත්, අපටත් ඒ වගකීම තිබෙනවා. ඉතින් ඒ නිසා අපි බොහොම පැහැදිලිව ගරු මහාමාත්‍යතුමාට කියන්න ඕනෑ,අපි ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලබා දෙනවා. මෙතැන ඉරක් ගහලා දෙකට බෙදලා අපි මේ විපක්ෂයේ කණ්ඩායමක් වශයෙන් මේ පැත්තේ වාඩි වුණාට අපි එක දෙයක් අවබෝධ කරගෙන තිබෙනවා. මේක තමයි සත්‍යය.

අද ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා ඇතුළු ඒ අමාත්‍ය කණ්ඩායම මෙතැනට අද මේ පළාත් සභාවේ වගකීම භාර අරගෙන තිබෙන්නේ, මධ්‍යම රජයේ පසුගිය කාල පරිච්ඡේදයේ ඇති වුණු ඒ දේශපාලන විපර්යාසයත් සමඟ. මධ්‍යම රජයේ පවතින ඒ සම්මුතිවාදී දේශපාලන සංයුතිය මත තමයි ගරු මහ ඇමැතිතුමා ඇතුළු මේ කණ්ඩායම අද මේ බස්නාහිර පළාත් සභාවට නායකත්වය දෙන්නේ. අපි නියෝජනය කරන්නේ, මේ සම්මුතිවාදී රජය. වර්තමාන මේ රජය. එහෙමනම් අපි බොහොම පැහැදිලිව හදවතින්ම ප්‍රධාන අමාත්‍යතුමා මේ පළාත් සභාව ශක්තිමත් කරන්නට යම්කිසි වැඩ පිළිවෙළක් ගෙන යනවා නම්, ඒකට අපි දායකත්වය සහ සහයෝගය, කැපවීම ලබා දෙනවා. හැබැයි, මේ පළාත් සභාවේ දේශපාලන අර්බුදයක් තිබෙනවා. මේ අකාර්යක්ෂමතාවයට, මේ අඩු ඵලදායිතාවයට හේතුවක් තිබෙනවා. පසුගියදා පැවැති වැඩමුළුවේදී පාලක පක්ෂයේ මන්ත්‍රීවරු දැඩිව විවේචනය කරපු, ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරු දැඩිව විවේචනය කරපු මේ අඩු ඵලදායිතාවයට හේතුවක් තිබෙනවා. හේතුව මොකක්ද? ඒක ගරු මහ ඇමැතිතුමා අවබෝධ කරගත යුතුයි. හේතුව මොකක්ද? තමන්ට මේ ඉදිරි ගමන යන්නට නම්, තමන්ගේ සැලසුම්වලට, ඉලක්කයට ගමන් කරන්න අවශ්‍ය නම් ගරු මහ ඇමැතිතුමාට භෞතික සම්පත් අවශ්‍යයි. මානව සම්පත් අවශ්‍යයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

දේශපාලන සම්පත් අවශ්‍යයි. හැබැයි, ගරු මහ ඇමැතිතුමාට සියලු සම්පත් තිබෙනවා. හැබැයි, ගරු මහ ඇමැතිතුමාට තමන් වටා ඉන්න කණ්ඩායම නිවැරැදිව අවබෝධ කරගන්නට තවම හැකියාව ලැබිලා නැහැ. ඒක තමයි ගැටලුව. ගරු මහ ඇමැතිතුමනි, ඔබතුමාගේ දීර්ඝ කාලීන දේශපාලන ඉතිහාසයත් සමඟ විශාල මිතුරන් ප්‍රමාණයක් ඉන්නවා. හිතවතුන් සිටිනවා. සිය දහස් ගණනක් සිටිනවා. මේ පළාත් සභාවෙත් සිටිනවා. එළියෙත් ඉන්නවා. හැබැයි, ඒ සියලු කණ්ඩායම් ඔබත් සමඟ පෞද්ගලික හිතවත්කම් තිබුණාට, ඔබගේ දේශපාලන - විශේෂයෙන්ම ඔබගේ ඒ පෞද්ගලික හිතවත්කම් සමඟ ඔබට සහයෝගය ලබා දුන්නාට, මේ පළාත් සභාව, බස්නාහිර පළාත් සභාව ඉලක්කයට සැලසුම් ගතව ඉදිරියට ගමන් කිරීමට ආශිර්වාදය ලබා දෙන්න සහ ඒ වෙනුවෙන් කැපවන කණ්ඩායමක් නොවෙයි. ඒක තමයි ඇත්ත. ඔවුන් එළියට ගිහිල්ලා, වර්තමාන පළාත් සභාව පසුගිය ආණ්ඩුවේ පළාත් සභාව වාගේ නොවෙයි. කඩා වැටිලා, අකාර්යක්ෂම වෙලා කියලා බොහොම පැහැදිලිව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන පිරිස. නමුත් අද මේ කණ්ඩායම තමයි ඔබතුමා වටා ඉන්නේ. අන්න ඒ නිසා අපි කියන්නේ, අපි සියලු දෙනාම මිත්‍රයෝ. හැබැයි දේශපාලනයේදී අපි තේරුම් ගන්න ඕනෑ, මිතුරු පස මිතුරු කණ්ඩායම. පක්ෂ ප්‍රතිපක්ෂ කණ්ඩායම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කාලය ඇවිල්ලා,ඉර ගහලා, වෙන් කරලා අපත් සමඟ මේ ගමන යන්නට.මමහිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ අනිකුත් ගරු අමාත්‍යවරුන්ට ඒ සඳහා කාලය එළැඹිලා කියලා මම විශ්වාස කරනවා.

[සභාවේ ඝෝෂා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මට කාලය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. එහෙම නැතිව ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මධ්‍යම රජයට බැණ වැදිලා හරි යන්නේ නැහැ. මධ්‍යම රජයෙන් පළාත් සභාවට ලබා දෙන ප්‍රතිපාදන අඩු වුණයි කියලා හැමෝගෙම චෝදනා තිබෙනවා, අපි දැක්කා. මේකට හේතුව මොකක්ද? අපි යථාර්ථවාදීව මේ පිළිබඳව සොයා බලන්න ඕනෑ. අපි හිතන්නට ඕනෑ. මේ පවතින රජය 2015 භාර ගත්තේ මොකක්ද? ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන්, සමාජයීය වශයෙන් කඩා වැටුණු ආණ්ඩුවක්. ඒක නැවත නඟා සිටුවීමේ අභියෝගය මේ රජයට තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මේ මධ්‍යම රජය විවේචනය කර කර ඉන්නේ නැතිව අපි සියලු දෙනාම එකට එකතු වෙලා ලැබෙන අවස්ථාවෙන්, ලැබෙන ප්‍රතිපාදනවලින් වඩාත් කාර්යක්ෂමතාවය ඇතිව මේ පළාත් සභාව ඉදිරියට ගෙනි යන්න වැඩ සටහන ක්‍රියාත්මක කරමු. තව කථා කරන්න බොහෝ දේවල් තිබුණත් විනාඩි 10 න් මට කථා කරන්න බැහැ. නමුත් ඔබතුමා ලබා දුන්නු කාලයට ස්තූති කරමින් මම නවතිනවා.

[අ.භා. 02.57]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් අපේ ගරු මහ ඇමැතිතුමාගේ වැය ශීර්ෂයට මට කථා කරන්න ලැබීම එක පැත්තකින් දෛවයේ සරදමක් විධියටයි මම දකින්නේ. පසුගිය වර්ෂයේ වැය ශීර්ෂය අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම විශාල මානසික පීඩනයක් ඇති කරනු ලැබුවා. ඒ වාගේම විශාල තෙරපුමක් ඇති කළා. විවිධ කොන්දේසි, බලපෑම් ඇති කළා. හැබැයි, මම ආධුනික මන්ත්‍රීවරයෙක් විධියට මේ සභාවට ඇවිල්ලා ඒ ඇමැති ධූරයේ කටයුතු කරගෙන යැමේදී මට සහයෝගය දීපු මන්ත්‍රීවරු හිටියා. අවවාද ලබා දීපු අය හිටියා. උපදෙස් ලබා දීපු අය හිටියා. ඒ වාගේම පිටුපසින් ඉඳගෙන පිහියෙන් ඇණපු අයත් හිටියා. ජුදාස්ලා. හැබැයි, මම හිතන්නේ ඒ අයට තිබුණු එකම ප්‍රශ්නය වුණේ දේශපාලනික වශයෙන් ගත්තොත් අපේ ස්ථාවරය, අපේ ප්‍රතිපත්තිය සහ අපේ මතවාදය ඒ අයට කිසියම් විධියකට ප්‍රශ්නයක් වෙන්න ඇති. ඒත් එක්කම මාත් සමඟ සහ අපේ පක්ෂයත් සමඟවෙර සහගත ආකල්පයකින් කටයුතු කරන්න ඇති. තවත් සමහරුන්ට තිබුණු ප්‍රශ්නයක් තමයි, ඔවුන් තුළ තිබුණු දේශපාලන කුහක කම. ඒ වාගේම දේශපාලන ඊර්ෂ්‍යාව. ඒක ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ඇතැම් මන්ත්‍රීවරුන්ට තිබුණා. කෙසේ නමුත් ඒ සියලු දෙනා පිළිබඳව මම උපේක්ෂාවෙන් බලන්නේ. නමුත් මම එකක් කියන්න ඕනෑ. තමන්ගේ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් ගරු මහ ඇමැතිතුමාට වගකීමක් තිබෙනවා. අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම කියන එකේදී ප්‍රධානම කාර්ය භාරය උසුලන්නේ මහ ඇමැතිතුමා. ඒ නිසා තමන්ගේ ඇමැතිවරුන්ගේ ඒ සාමූහික වගකීම ආරක්ෂා කිරීමේ වගකීමක් එතුමාට තිබෙනවා. බැඳීමක් තිබෙනවා. ඒ නිසා ගියවර වාගේ මම හිතනවා, සීනුව නාද කරන අවස්ථාවේදී අවාසියා කරණාබාධා කියන එක අපේ ගරු මහ ඇමතිතුමාට නොවැළඳේවා කියලා මම මේ වේලාවේ කියන්න කැමැතියි. ඒ මගේ කථාවේ පෙරවදන. කථාව දැනුයි පටන් ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපි මේ බස්නාහිර පළාත් සභාවේ අපේ මහ ඇමැතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳවයි කථා කරන්නේ. ඒ වාගේම අපි ජාතික මට්ටමෙන් මෙවර අයවැය විශාල විවාදයකට ලක් වුණා. සාකච්ඡාවකට ලක් වුණා. ගියවර ජාතික අයවැය පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරද්දී, ඒ අයවැය ඇත්ත වශයෙන්ම ගත්තාම සරදියල් පන්නයේ අයවැයක් වුණා. ඉවක් බවක් නැතිව අපි සහන ලබා දුන්නා. විශාල වශයෙන් සහන ලබා දුන්නා. වැටුප් වැඩි කළා. බඩු මිල අඩු කළා. ඒ වේලාවේදී මේ ගැන තක්සේරුවකින් තොරව අපි කරපු ඒ විශාල සහන අයවැය නිසා, අපට විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මෙවර ජාතික අයවැය අරගෙන බැලුවාම අපට පේනවා ඒ, අයවැය සකසුරුවම් අයවැයක් කියන එක. ඒ නිසා ඒ සකසුරුවම් අයවැය තුළ පළාත් සභාවලටත් අද කිසියම් ප්‍රමාණයකට වෙන් කරපු ප්‍රතිපාදන සීමා වෙලා තිබෙනවා. ජාතික මට්ටමින් ගත්තත් එහෙමයි. සියලු අමාත්‍යාංශවලට වෙන් කරපු ප්‍රතිපාදන සීමා කරලා තිබෙනවා. එහෙමනම් මේ අර්බුදය අද ජාතික මට්ටමින් තිබෙන ආර්ථික අර්බුදයක්. ඒ ආර්ථික අර්බුදය අපි තේරුම් ගත යුත්තේ රට ඇතුළේ විතරක් නොවෙයි.

අද ලෝකය පුරා මේ ආර්ථික අවපාතය, මේ ආර්ථික අර්බුදය ඇති වෙලා තිබෙනවා. අද ලෝකය පුරා හමාගෙන යන මේ නව ජාතික ආරක්ෂණ වාදය පිළිබඳව අපි තේරුම් ගන්න ඕනෑ. මහා බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වුණා. ඒ සඳහා ජනමත විචාරණයක් පැවැත් වුණා. ඩේවිඩ් කැමරන්ට ගෙදර යන්න සිදු වුණා. එහෙමනම් එදා ඒ යුරෝපා සංගමයෙන් ඉවත් වෙලා මහා බ්‍රිතාන්‍යය අද ජාතික ආරක්ෂණ වාදයට ගමන් කරමින් තිබෙනවා. ඒදේම තමයි පසුගිය දා ඇමරිකාවේ සිද්ධ වුණේ. එහෙමනම් අපි තේරුම් ගන්න ඕනෑ. හිලරි ක්ලින්ටන්ට ගෙදර යන්න සිද්ධ වුණේ ඇයි? ඒ වාගේම ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා වශයෙන් පත් වන්නේ කෙසේද? කියන එක. එහෙමනම් මුළු ලෝකයම අද ජාතික ආරක්ෂණ වාදයට ගමන් කරමින්

තිබෙනවා. ගෝලීය වාදය globalization කියන එක අද සියලු දෙනාම අතහරිමින් තමන්ගේ රටවල් ඇතුළත තමන්ගේ ආර්ථිකය ගෙන යමින් තිබෙනවා. ඒ නිසා තමයි ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කළේ, ඇමරිකාවේ ඉදිරි ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ තමන්ගේ රටට ආනයනය කරන සෑම භාණ්ඩයකටම 45% ක බද්දක් පනවන්න කියලා. එහෙමනම් අපේ ලංකාවේ ඇඟලුම්වලින් 60% ක් අපි අපනයනය කරන්නේ, ඇමරිකා එක්සත් ජනපදයට. 45% ක අපට බද්දක් වැටෙනවා කියන්නේ අපට ලැබෙන්න තිබෙන විදේශ විනිමය විශාල ප්‍රමාණයකින් අඩු වෙනවා කියන එකයි මේකෙන් පැහැදිලි වන්නේ. ඒ නිසා මේ තත්ත්වයන් අපි තේරුම් ගන්න ඕනෑ.

මුළු ලෝකය පුරාම විශාල ජාතිවාදී රැල්ලක් හමාගෙන යනවා. ඒක අද ප්‍රංශයේ තිබෙනවා. ඊළඟ ප්‍රංශ ජනාධිපතිවරණයේදීත් මේ ආකාරයේම ප්‍රතිඵලයක් තමයි එන්නේ. ජර්මනියේ ප්‍රතිඵලයත් එයයි. ඔස්ට්‍රියාවේ ප්‍රතිඵලයත් එයයි. ඉතාලියේ අගමැතිවරයාට ඊයේ පැවැත් වුණු ජනමත විචාරණය පරාජය වීමත් සමඟ ගෙදර යන්න සිද්ධ වුණා. ඒ නිසා ලංකාව ඇතුළේ ව්‍යවස්ථා සංශෝධන ගැන කථා කරන, නව ව්‍යවස්ථා සම්පාදනය කරන්න කථා කරන අය ගැනත් මේ ලෝක ප්‍රවනතාවය ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ නිසා මම කියන්න කැමැතියි. අද මේ ආර්ථිකය පිළිබඳ අර්බුදය අපි ජය ගත යුත්තේ කොහොමද? බස්නාහිර පළාත කියලාකියන්නේ අපේ ආර්ථිකයේ එන්ජිම. අපේ හිතවත් සුමිත් විජයමුණි සොයිසා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, දළ ජාතික නිෂ්පාදනයෙන්42%ක පංගුවක් හිමි වන්නේ බස්නාහිර පළාත් සභාවට කියලා. එහෙමනම් බස්නාහිර පළාත් සභාව රටේ ආර්ථිකයේ එන්ජිම නම් මේ එන්ජිමේ ධාරිතාව වැඩි කරන්න මේ පළාත් සභාව විධියට අපට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ගරු මහ ඇමැතිතුමාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? එතුමාගේ අමාත්‍යාංශ අරගෙන බැලුවාම, පළාත් පාලනය ගැන අපි කථා කළා. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. දැන් මුළු රටේම අවධානය යොමු වෙලා තිබෙනවා, මේ පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ කොහොමද කියන එක ගැන. අපි සියලුම දෙනාම ඉල්ලා සිටිනවා. මේ අශෝභන, අවලස්සන, අශීලාචාර මේ රටේ දේශපාලන සංස්කෘතිය ඉතාම ජරා ජීර්ණ තත්ත්වයට පත් කරපු මේ සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. මේ දෙකේ සම්මිශ්‍රණයක් සහිත අලුත් ඡන්ද ක්‍රමයක් යටතේ පළාත් පාලන මැතිවරණය පවත්වලා, ඒ මගින් මේ රටට අලුත් ජනතා නියෝජිතයින් තේරී පත්වන අලුත් මැතිවරණ ක්‍රමයක් අපට අවශ්‍යයි. කොට්ඨාශයට වග කියන ජනතා නියෝජිතයින් පත් කරන්න ඕනෑ. ඒ නිසා ගරු මහ ඇමැතිතුමාගෙන් අපි ඉල්ලා සිටින්න කැමැතියි. මේ සම්බන්ධයෙන් ස්ථාවර ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනෑ. ආපසු පරණ ක්‍රමයට යන්න කියලා ඇතැම් දුෂ්ට විෂකුරු බලවේග මේ වේලාවේ උත්සාහ කරමින් තිබෙනවා. ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ඊළඟට ආර්ථික ප්‍රවර්ධනය ගැන මම කියන්න කැමැතියි. ආර්ථික ප්‍රවර්ධනය පිළිබඳව අද අපි සාකච්ඡා කරනවා, මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න ඕනෑය කියලා. මේ රට පොහොසත් රටක් බවට පත් කිරීම සඳහා අපට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? දැන් මේ රට මැදි ආදායම් ලබන රටක්. මේ මැදි ආදායම් ලබන රට, අපි බලාපොරොත්තු වන ආකාරයට ඒකපුද්ගල ආදායම ඩොලර් 8000 දක්වා ගෙනි යන්න නම්, ඒ සඳහා අපට තිබෙන ඉලක්කය මොකක්ද? ඒ සඳහා අපි වසර 2050 දක්වා ඉලක්කයක් ගත්තත්,10% ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගන්න ඕනෑ. 10% ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගන්න නම් බස්නාහිර පළාත තුළ අපේ යටිතල පහසුකම් විතරක් නොවෙයි. මේ පළාත් සභාව හරහා තිබෙන ඒ අමාත්‍යාංශවල තිබෙන කාර්යසාධනය පිළිබඳව, ඒවායේ ප්‍රගති සමාලෝචනය කෙසේද කියලා අනිවාර්යයෙන්ම සොයා බලන්න ඕනෑ. අපට ඒ ගැන සෑහීමකට පත් වෙන්න බැහැ. මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කරනවා. භෞතික ප්‍රගතිය ඉදිරිපත්කරනවා. හැබැයි, මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ප්‍රගතියක් ඉදිරිපත් කරන්නේ නැහැ. අපි කොපමණ මුදල් වක් කළත් වැඩක් නැහැ. ඒවායෙන් අපේ මානව සම්පත කොතෙක් දුරට සංවර්ධනය වෙලා තිබෙනවාද කියන එක පිළිබඳව විශ්ලේෂණයක් කරන්නේ නැහැ. ඇගයීමක් කරන්නේ නැහැ. ඒ ගැන වාර්තාවක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කරන්න ඕනෑය කියලා කියන්න කැමැතියි. ඒ වාගේම මේ රටේ මහා පරිමාණ ප්‍රතිපත්තිමය වෙනසක් අවශ්‍යයි. අද අපි ඇත්ත වශයෙන්ම මේ සභාව ඇතුළේ වෙලාවකට දුකක් හිතෙනවා. අපි ඔක්කොම නිකන් ජෝකර්ලා වෙලා තිබෙන්නේ. Tea Makers වෙලා තිබෙන්නේ. ප්‍රතිපත්ති සම්පාදකයින්

නැහැ. ඒ කියන්නේ Policy Makers ලා නැහැ. Law Makers ලා නැහැ. ඒ නිසා අපි මේක එකම කෝළම් මඩුවක්, විකාර මඩුවක් කරගෙන තිබෙන්නේ. ඒ නිසා කියන්න කැමැතියි. කරුණාකරලා අපි මේ රට පිළිබඳව වගකීමකින් කටයුතු කරමු.

ඊළඟට ආර්ථික ප්‍රවර්ධනය ගැන කථා කරනවා. අපනයනය සඳහා අපි මොනවද? බස්නාහිර පළාත ඇතුළේ, අලුතෙන් අපනයන ප්‍රවර්ධනය කරන්න යෝජනා කරලා තිබෙන්නේ. මොනවද? අපට තිබෙන අලුත් වෙළඳපොළවල්. මේවා පිළිබඳව මේ වාර්තාවල කිසි දෙයක් සඳහන් කරලා නැහැ. අපි මොනවද? ලෝකයට අලුතින් ගෙනි යන්නේ. අපේ මොනවද අලුත් දේවල්තිබෙන්නේ. ඒ නිසා මම අහන්න කැමැතියි. කරුණාකරලා ඉදිරියේදී දැන් අපට ආර්ථික ගොඩනැගීම සම්බන්ධයෙන් සැලැස්මක් අවශ්‍යයි.

ඒ වාගේම තමයි විදුලිබලය හා බලශක්තිය ගැන කිසිඳු අදහසක් නැහැ. අද ලෝකයේ විශාල බලශක්ති අර්බුදයක් තිබෙනවා. අපේ රට ඇතුළෙත් විශාල බලශක්ති අර්බුදයක් තිබෙනවා. අපි සූර්ය සංග්‍රාමය ක්‍රියාත්මක කරන්නඅද යෝජනා කරලා තිබෙනවා. හැම ගෙදරකටම සූර්ය පැනල් එකක් ලබා දෙන්න. හැබැයි, අපේ පාරේ තිබෙන මේ විදුලි පහන් කණු වලට ඒක කොහොමද අපි සම්බන්ධ කරන්නේ කියන එක පිළිබඳව වැඩ පිළිවෙළක් අපි යෝජනා කරන්න ඕනෑ. ඒ ගැන කිසි අදහසක් අපට ඉදිරිපත් කරලා නැහැ. ඒ වාගේම සුළං බල ශක්තිය පිළිබඳව, අනිකුත් පුනර්ජනනීය බල ශක්තීන් පිළිබඳව අවධානයක් යොමු කරලා නැහැ. පරිසරය ගැන අද අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. විශාල පාරිසරික දූෂණයක් මේ රටේ සිදු වෙනවා. බස්නාහිර තමයි වැඩිම කාර්මීකරණයක් වෙලා තිබෙන්නේ. ජනාකීර්ණ ප්‍රදේශයක්. ජලය දූෂණය වෙලා, වාතය දූෂණය වෙලා, කැළි කසළ ටික ඉවත් කරගන්න විධිමත් ක්‍රමවේදයක් නැහැ. ඒ වාගේම අපේ ජලමූලාශ්‍ර සියල්ල අද දූෂණය වෙලා, විනාශ වෙලා තිබෙන්නේ. ඒ නිසා අනාගත දැක්මක් ඇතිවමේ සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන්ම මේ සංචාරක කර්මාන්තය. මම හිතන්නේ අපේ ප්‍රධානම ආදායම් මාර්ගය බවට පත් වෙන්න නියමිතව තිබෙන්නේ, සංචාරක කර්මාන්තය. හැබැයි, ඒ සංචාරක කර්මාන්තය පිළිබඳව අදහසක් තිබෙන, වැඩ පිළිවෙළක් තිබෙන, ඒ පිළිබඳව දැක්මක් තිබෙන මිනිස්සුයි මේ ආයතනවල ප්‍රධානීන් බවට පත් කරන්න ඕනෑ. එහෙම නැතිව වාලම්පුරි විකුණන අය ගෙනැල්ලා, වෙළෙන්දෝ දාලා, මේ මිත්‍යාව වපුරන අය දාලා සංචාරක කර්මාන්තය ගොඩනඟන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලාගේ ලාංඡනය.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අපේ ලාංඡනය වාලම්පුරිය නොවෙයි. හක්ගෙඩිය. ඒ නිසා පැහැදිලිව කියන්න ඕනෑ. සංචාරක කර්මාන්තය පිළිබඳව අපි විසි ලක්ෂයක් ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා නම් ඒකට ගැලපෙන විධියට කොහොමද? බස්නාහිර පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය කරන්නේ? හෝටල් කාමර සූදානම් කරන්නේ කොහොමද? ඒවායේ මිල අඩු කරන්නේ කොහොමද? ඒ වාගේම සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සංස්කෘතික සංචාරක කර්මාන්තය, පාරිසරික සංචාරක කර්මාන්තය පිළිබඳව තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා කියන්න ඕනෑ. වාලම්පුරි විකුණන එක නොවෙයි, සංචාරක කර්මාන්තයේ ප්‍රධාන වැඩ පිළිවෙළ. ඒක නිසා අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. මේ අපේ ගරු මහ ඇමැතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව ඉදිරිපත් කරලා තිබෙන මේ වාර්තාවත් එක්ක ඉදිරියේදී මේ තුළ පැහැදිලි දැක්මක්, වැඩ පිළිවෙළක් ඉදිරිපත් වෙලා නැහැ. අපි එදිනෙදා මෙය පවත්වාගෙන යාම සඳහා ඉදිරිපත් කරලා තිබෙන වැඩ පිළිවෙළක් සහ වාර්තාවක් පමණයි මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මීට වඩා දිගු කාලීන, කෙටි කාලීන, මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් ඔස්සේ මේ රට ඉදිරියට මෙහෙය වන්න ඔබ සියලු දෙනාගේම දායකත්වය, කැපවීම අවශ්‍යයි කියන එක ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.10]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ මේ වන කොට පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂ වූ අදහස් සැහෙන ප්‍රමාණයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මතක් කරනවා. ඔබතුමා යටතේ ක්‍රියාත්මක වන දෙවැනි අයවැය තුළ දී අපි ඉල්ලා සිටින්නේ, මෙන්න මේ කැළි කසළ ප්‍රශ්නය, මුළු ලංකාව පුරාම පැතිරෙන මේ කැළි කසළ ප්‍රශ්නය නිසා මම හිතන්නේ අද පළාත් පාලන ආයතන තුළින් ජනතාව මහත් අසීරුතාවයට පත් වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත් මෙතැන ඉන්න වැඩි හරියක් පළාත් පාලන ආයතන ප්‍රධානීන් හැටියට ඉන්න කාල වකවානු තුළදී නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දීලා, මහත් පීඩනවලට පත් වෙලා ඒවා විසඳන්න, මම හිතන්නේ අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න සැහෙන ප්‍රමාණයෙන් කටයුතු කළා. අද ඔබතුමාගෙන් අපි ඉල්ලන්නේ, ඔබතුමා විදේශ රටකට ගිහිල්ලා මෙවන් වූ කටයුත්තක් නිර්මාණය කරන්න කටයුතු කරනකොට පිටිපස්සෙන් ගිහිල්ලා මුදල් ඉල්ලන කට්ටිය ඕනෑ තරම් ඉන්නවා. හැබැයි, ඒ කාලයේත් මේ දේවල් සිදු වුණා. මම කියන්නේ, මුදල් වලට නොවෙයි. මම හිතන්නේ මේ කටයුත්ත ඔබතුමාගේ කාලවකවානුව තුළ ලබන අවුරුද්ද අවසාන වෙන්න ඉස්සෙල්ලා, ඊළඟ අයවැය ක්‍රියාත්මක වෙන්න ඉස්සෙල්ලා මම හිතන්නේ, මෙය අවසන් කරලා මේ රටේ ප්‍රශ්නයෙන් කොටසක් හෝ ඉවර කරන්න ඔබතුමාගේ නායකත්වය යටතේ කටයුතු කරන්නය කියලා මම ඉල්ලනවා.

අපට මතකයි, අපි පළාත් පාලන ආයතනවල ඉන්න කොට ඒ ආයතන තුළ අපි බලෙන් තමයි කොම්පොස්ට් අංගන ඉදි කළේ. මෙතැන සන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ නිලධාරීන් ඉන්නවා. ඒ කාලයේ අධිකාරියෙන් අපට මුදල් ලබා දීලා අපි ඒවා මහා පරිමාණයෙන් ක්‍රියාත්මක කළත් අද ඒවා මේ වන කොට කඩා වැටිලා තිබෙනවා කියලා අපි තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. හේතුව මොකක්ද? අද වර්තමානයේ මේ පළාත් පාලන මැතිවරණය තියන්නේ නැති නිසා,අද එයට දේශපාලන නායකත්වය නැති නිසා සමහර නිලධාරීන්ට මෙය ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිලධාරීන් සමහර අවස්ථාවලදී ඒ කොම්පෝස්ට් අංගනය තුළ නොයෙකුත් ආකාරයේ දූෂණ ක්‍රියාවල් සිදු කරනවා. අපි ඒවා ගිහිල්ලා අල්ලලා දුන්නත් සමහර විට ඒවා විමර්ෂණය කළ නිලධාරීන් මේවා වෙනත් මාර්ගවලට හරවනවා. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, මෙන්න මේවා පිළිබඳව විධිමත් තීරණ අරගෙන කටයුතු කරන්නය කියලා.

ඒ වාගේම සංචාරක ව්‍යාපාරය ගැන මම ඔබතුමාට මතක් කරනවා. පයාගල ගල් කණුව ළඟ සිට බෙන්තර දක්වාම තිබෙන්නේ, සංචාරක කලාපයක්. ලංකාවේ මෙය නම් කරලා තිබෙන්නේ, රත්තරං සැතපුම කියලා. ඒ නිසා මේ වන කොට සංචාරක ව්‍යාපාරය අපේ ප්‍රදේශය තුළ කඩාගෙන වැටිලා තිබෙනවා. ඒවාට අලුතින් වැඩ නිර්මාණය කරන්න, අර කිච්චා වාගේ අලුතින් ඉදි වෙන හෝටල් වල අවශ්‍ය කරන ශක්තිය, රැකියා අවස්ථා, සංචාරකයින්ට අවශ්‍ය කරන නොයෙකුත් මඟ පෙන්වීම් යටතේ ක්‍රියාත්මක කරන වැඩ සටහන් ඔබතුමාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. අප ප්‍රදේශය තුළ නොයෙකුත් ආකාරයෙන්, බෙන්තර ගඟ ඉතාමත් ලස්සන ගං තීරය. මම හිතන්නේ, මේ වන කොට පරිසර දූෂණය තුළින් නොයෙකුත් ආයතන ඒ ගඟට නොයෙකුත් ආකාරයේ අපද්‍රව්‍ය පිට කිරීම නිසා මහා පරිමාණයෙන් ඒ ගං ඉවුර විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම මුහුදු වෙරළට හෝටල්වලින් දාන මළපහ නිසා එතැන දූෂණය වෙලා තියෙනවා. ඒ වෙනුවෙන් මම හිතන්නේ, පරිසර අධිකාරිය හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. හේතුව මොකක්ද? පරිසර අධිකාරියේ ඉන්න ඉහළ නිලධාරීන් කිසිම රැස්වීමකට එන්නේ නැහැ. සාමාන්‍ය නිලධාරියෙක් ඇවිල්ලා තමයි මේවාට උත්තර දෙන්නේ. ඇහුවාම, ඔහුට කථා කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පළාත් පාලන ආයතන තුළ ඉන්න කොට අපි දැක්කා.අර සංචාරක හෝටල්වල මළපහ කරන සියලු දේවල් ටැංකිවලට රැස් කරලා රාත්‍රී කාලයේදී වරුසාවත් එක්ක මම හිතන්නේ මුහුදට අරින කොට අපි ඒවා ගිහින් අල්ලලා ඔවුන්ව නීතියේ රැහැනට අසු කරන ශක්තිය අපි එදා නිර්මාණය කළා.

අපි ඔබතුමාට මතක් කරනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ අපේ හිටපු ගරු ඇමැතිතුමා මතක් කළා. එතුමාගේ අමාත්‍යාංශයට පසුගිය අයවැය තුළ දී සිදු වුණු දේ ගැන.

[ගරු ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ]

මම මතක් කරන්න හේතුව මොකක්ද? සුහදත්වය සහ වර්ධනය හරියාකාරව ක්‍රියාත්මක වුණා නම්, මම හිතන්නේ මහජන නියෝජිතයන්ගේ දේවල්වලට ඇහුම්කන් දුන්නා නම්, ගරු මන්ත්‍රීතුමනි එදා ඔබතුමාට මේ දේ සිදු වන්නේ නැහැ. නීතිය හා සාමය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය තුළ තිබෙනවා. එදා මට මතකයි. බේරුවල ආසනය තුළ සිංහල - මුස්ලිම් කෝළාහලය ඇති කරන්න තමුන්නාන්සේලා අලුත්ගම නගරයට ඇවිල්ලා, ඒ නගරය තුළ ක්‍රියාත්මක කරපු වැඩ සටහන් අපට මතකයි. ඒකේ සීඩී තැටි ගෙනැල්ලා මේ මන්ත්‍රීවරුන්ට බෙදලා, ගමට බෙදලා ඇති කරපු විත්නැහියෙන් තමයි මම හිතන්නේ, මේ රට මහා පරිමාණයෙන් විනාශයට පත් වුණේ. අද මම හිතන්නේ සාමය ගැන කථා කරනවා. ආණ්ඩුව ශක්තිමත් කරන්න කථා කරනවා. තමුන්නාන්සේලාට මතක ඇති. තමුන්ගේ හදවතට තට්ටු කරලා බලන්න. එදා අමාත්‍යාංශය තුළින් මොනවද කළේ කියලා. තමුන්නාන්සේට කෙටි කාලයක් තුළ ඇමැතිකම නැති වුණේ ඒ නිසා තමයි. ඒ නිසා තමයි මම හිතන්නේ, අපේ ප්‍රදේශයේ ඉන්න, අපේ ආසනයේ ඉන්න මන්ත්‍රීවරයෙකුට ඒ ඇමැතිකම ලැබුණේ. හැබැයි, එදා ඇති වුණු ඒ ප්‍රශ්නය නිර්මාණය කරන්න, හරියාකාරව කරන්න මේ ඉන්න ඇමැතිවරයාට පුළුවන්කම ලැබුණා. එදා ඔබතුමාට බැරි වුණා.

එහෙමනම් මම කියන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ අමාත්‍යාංශය භාර අරගෙන වැඩි කාලයක් නොවෙයි. මේ ප්‍රධාන අමාත්‍යාංශය මෙහෙයවන කොට නොයෙකුත් ආකාරයේ බාධක තාඩන පීඩන එල්ල වෙන්න පුළුවන්. ඒ වාගේම තමයි, අනිකුත් අමාත්‍යාංශ. අපි සන්තෝෂ වෙනවා. ඔබතුමාගේ නායකත්වය යටතේ ඉන්න අනිකුත් ඇමැතිතුමන්ලා ඉතාමත් පිළිවෙළකට වැඩ කරගෙන යන්න උත්සාහයක් දරන කොට මේ ඉන්න මන්ත්‍රීවරුන්ම තමයි කුකුළෙන් අදින්නේ. ප්‍රයෝජන ගන්නෙත් මේ ගොල්ලෝ. මෙතැන ඇවිල්ලා විවේචන කරන්නෙත් මෙතුමන්ලා තමයි. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ. මේ අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන්වලට දෙන්න පුළුවන් උපරිම ශක්තිය අපි තමුන්නාන්සේට ලබා දෙනවා. කවුරු අපට මොන දේ කිව්වත්, මොනවා කිව්වත් අපි අහගෙන හිටියත්, මේ ගොල්ලෝ හිතාගෙන ඇති, එහා පැත්තේ කට්ටියත් හිතාගෙන ඇති අපි මේ අයවැය පරද්දයි.නැත්නම් අපි වෙනත් පැත්තකට ගිහිල්ලා ඡන්දය දෙයි කියලා. මතක තියාගන්න. කරන හරි දේට හරියි කියනවා. වැරැදි දේට වැරැදියි කියලා ඕනෑම තැනක කථා කරන්න පුළුවන් කෙළින් ශක්තියක් තියාගෙන තමයි අපි කථා කරන්නේ. ඒ වාගේ නිවැරැදි දෙයක් කරන කටයුත්තකට අපි හැම දෙනාටම සහයෝගය දෙනවා. ඒක පක්ෂ විපක්ෂ කිසි භේදයක් නැහැ. ඒ නිසා ගරු මහ ඇමැතිතුමනි, ඔබතුමාගේ වැය ශීර්ෂය යටතේ අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න කටයුතු කරමු. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉහළ නිලධාරිතුමා ප්‍රධාන පහළ නිලධාරීන් සියලු දෙනාටමත්, ඒ සේවකයන් සියලු දෙනාටමත්, ඒ වාගේම සභා ලේකම්තුමා ප්‍රධාන අනිකුත් සියලු දෙනාටමත් අපේ අවංක ආදර ස්තුතිය පිරිනමනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතකොට අනුලා?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

අනුලා ගැන අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා දන්නවා. ඒ පළාත් පාලන ආයතනය ක්‍රියාත්මක වන ආකාරය ගැන දන්නවා. මෙතැන ඉන්න කොමසාරිස්තුමිය දන්නවා. මම හිතන්නේ දැනුම් දීලා තිබෙන්නේ. ඒවා හෙට අනිද්දා වෙන කොට ක්‍රියාත්මක වෙයි. ඒ ගැන මම වැඩිය කියන්න යන්නේ නැහැ. වැඩිය කිව්වාම අගයක් නැහැ. ඔබතුමාට දීර්ඝායුෂ ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ නම සඳහන් කරමින් මේ බේරුවල සිද්ධිය සම්බන්ධයෙන් කථා කළා. පැහැදිලිව කියන්න ඕනෑ. බේරුවල ඇති වුණු ඒ අවාසනාවන්ත සිද්ධියට ජාතික හෙළ උරුමය විධියට අපේ කිසිදු සම්බන්ධයක් නැහැ. ඊළඟට මම අපේ මන්ත්‍රීවරුන් සියලු දෙනාටම වාගේ සීඩී පටයක් යැව්වා. ඒ CD පටයෙන් පෙන්වා දුන්නේ, මේ සිදුවීමෙන් පස්සේ ඒ ප්‍රදේශයේ සිංහල ජනතාවට සිදු වුණු අලාභහානි සහ ගෙවල් ගිණි තැබීම්. ඒ පිළිබඳ වාර්තාවක් තමයි මා ලබා දුන්නේ. එහෙම නැතිව ගිහිල්ලා කොතැනකවත් කිසිම තැනක ජාතික හෙළ උරුමයේ සම්බන්ධයක් නැහැ.

ඒක ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. ඒක නිසා ඒ ප්‍රකාශය කරුණාකරලා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියලා මම කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 09 ක කාලයක් තිබෙනවා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මූලාසනයට පැමිණෙන ලෙස ආරාධනා කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රකාශය මම ඉල්ලා අස් කර ගන්නෙත් නැහැ. මොකද හේතුව, මට කියන්න පුළුවන් හින්දා තමයි මම ප්‍රසිද්ධියේ කිව්වේ. මේ ඉන්න මන්ත්‍රීවරු ටික ඒකට වග කියයි. බේරුවල ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරයා මෙතැන ඉන්නවා. ඕනෑ නම් කථා කරන්න පුළුවන්.

***අනතුරුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Later, Hon. Presiding Member [Mr. Sirikamal Filician de Silva M.P.C] left the Chair and Hon. Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 09 ක කාලයක් ලබා දෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ මන්ත්‍රීතුමා දිගින් දිගටම මගේ නම සඳහන් කරමින් ප්‍රකාශ කරනවා, බේරුවල සිදු වුණු ජාතිවාදී කෝළාහලයට මගේ සම්බන්ධයක් තිබෙන බවට. එය පැහැදිලිව තහවුරු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව තිබෙන සාක්ෂි පුළුවන් නම් ඉදිරිපත් කරන්නය කියලා ඉල්ලනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

CDගෙනැල්ලා ඔක්කොටම බෙදුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බැහැ. බැහැ. තමුන්නාන්සේ පස්සේ ඉදිරිපත් කරන්න.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

තමුන්නාන්සේට බැහැ මේක සිංහල ජනතාවට වුණු එකක් විදියට දෙන්න. එහෙමනම් දෙමළ, මුස්ලිම් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා පස්සේ ඉදිරිපත් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

නැහැ, නැහැ. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා හෙළ උරුමය සම්බන්ධයි.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

අනික් එක ඔබතුමා හක්ගෙඩි කියලා කියනවා. හක් ගෙඩි කියන්නේ එතුමාගේ රැකියාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

බෞද්ධ ජනතාව ගැන කථා කරන්න මට අයිතියක් තිබෙනවා.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ඔබතුමා කොහොමද හක්ගෙඩි ව්‍යාපාරය කියලා කියන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමා කියන විධියට මම කථා කරන්න ඕනෑද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

මම කියන විධියට තමයි ඉන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අවස්ථාව.

[සභාවේ ඝෝෂා]

මේ සභාව මෙහෙම ගෙනි යන්න බැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඔබතුමාට අලාභය පෙන්වන්න තිබුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

[අ.භා. 03.19]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ වැය ශීර්ෂය යටතේ මම කථා කරන්න ඉස්සෙල්ලා කල්පනා කළේ, ඒ අමාත්‍යාංශය ගැන කොහොමද කථා කරන්නේ කියලා. අද ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යවරයා බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධුරයට අමතරව තවත් ආයතන 48 ක නායකත්වය දරනවා. ඒ තමයි නගර සභා, ප්‍රාදේශීය සභා, මේ හැම සියල්ලගේම වක්‍රව හෝ ඍජුව සභාපති ධුරය හෝ නගරාධිපති ධුරය දරනවා. මේක තමයි සත්‍යතාවය. එහෙත් පසුගිය කාලයේ මම කල්පනා කළේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැය ශීර්ෂයට එක් වෙනවාද කියලා. ගොඩක් වෙලා කල්පනා කර කර ඉඳලා තමයි ආවේ. මේ පළාත් සභාවේ වුණු අක්‍රමිකතාවයක් පිළිබඳව මම ගිය අයවැයේදී බොහොම පැහැදිලිව කිව්වා. මුද්දර ගාස්තු සම්බන්ධයෙන් කිසියම් වූ වංචා, මේ රටේ ඉඩම් කට්ටි කැබලි කර විකිණීමේ සමාගමක් බස්නාහිර පළාත් සභාවට කරපු වංචා. අවසන් කැමැත්ත ලියලා, රෙජිස්ටර් කරලා, බොරැල්ලේ බිල්ඩින්වල ගාස්තු ගෙවන්නේ නැතිව, ඔප්පු ගාස්තු ගෙවන්නේ නැතිව බස්නාහිර පළාත් සභාවට කරපු අලාභය. අදත් ඒක යට ගහලා තිබෙනවා. ඒ ගාස්තු අය කිරීම් පිළිබඳව අදත් ගැටලුවක් තිබෙනවා.

ඒ වාගේම නගරාධිපතිවරු ගැන කථා කළා. ඒ නගරාධිපතිවරු කරදියානේ කුණු ගොඩෙන් හම්බ කරපුවා.වාහන දාපුවා.තමන්ගේ නගර සභාවෙන් පිට නගර සභාවල කුණු ගෙනැල්ලා, පාලම්වලින් මෙහාට ගෙනැල්ලා, තමන්ගේ නගරාධිපතිවරුන්ට ට්‍රක් අරගෙන ඒවායෙන් කුණු දාලා සල්ලි කෝටි ගණන් හම්බ කරපුවා. ඊට අමතරව නගර සභාවලින් වෙනම බිල් දාලා තමන්ගේ ගාස්තු ඉල්ලපු යුගයක් පිළිබඳව ගිය සභාවේදී මම කථා කළා. ඒ එකකටවත් අද වනතුරු අපට පිළිතුරු හම්බ වුණේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට කිව්වා, ඒ පිළිබඳව පරීක්ෂණයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරනවා කියලා. පුරා වසරක් ගියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ මම පළාත් පාලන විෂය පිළිබඳව කථා කරන්නටප්‍රථමයෙන් මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ඔබතුමා යටතේ තිබෙනබස්නාහිර පළාත් සභාව විදුලිබල ශක්තිය පිළිබඳව කවදත් අඩුවෙන් කථා කරන්නේ. සූර්ය කෝෂවලින් විදුලිය ලබා ගැනීමේ ව්‍යාපෘතියක් මධ්‍යම ආණ්ඩුව ආරම්භ කරලා තිබෙනවා. ලංකාවේ ඒ අලුත් ව්‍යාපෘතියට පෞද්ගලික බැංකු ණය දෙනවා. ඒ සඳහා බස්නාහිර පළාත් සභාව මේ බල ප්‍රදේශයේ ජනතාව දිරිමත් කරලා, මොකද ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා. අනාගතයේ තමන්ගේ ගෙදර

නිෂ්පාදනය කරන විදුලි බල නිෂ්පාදයෙන් වැඩි කොටස රජයෙන් මිලදී ගන්න තීන්දු කරනවා. ඒක මේ රටේ දැවෙන ප්‍රශ්නයට පිළිතුරක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා මම ගරු ප්‍රධාන අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිනවා. ඍජු මැදිහත්වීමක් මේ ව්‍යාපෘතියට ලබා දීලා ලබන වසර ඇතුළේ බස්නාහිර පළාතේ නිවාස ලක්ෂයක් අරමුණු කරගෙන, මෙම ක්‍රියාදාමයට බස්නාහිර පළාතට දායක වෙන්න ලැබුණොත් මම හිතනවා, එය විශාල කාර්ය භාරයක් කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නගර සභාවල කුණු ඇදීම කඩා වැටෙන්න ප්‍රධාන හේතුවක් තමයි ගිය වකවානුවේ නගරාධිපතිවරු විසින් බඳවාගත් සේවකයන්. කුණු ටැක්ටරයට ගත්තේ A/L පාස් වුණු කෙනා. ඔහු කුණු අදින්න ගියේ නැහැ. ඔහු හොඳ ඇඳුමක් ඇදගෙන නගර සභාව ඇතුළට වෙලා ෆේස් බුක් බලනවා. කුණු ටැක්ටරයට සේවකයන් නැහැ. හැබැයි, කුණු ට්‍රැක්ටරයට ගත්ත කෙනා ෆේස් බුක් බලනවා. ඔහුට උසස් පෙළ තිබෙනවා. ඔහුව ගන්නේ සභාපතිවරු. නගරාධිපතිවරු. මම බලාගන්නම්. ඔහේ පොඩ්ඩක් ඔය පුටුවේ ටික කාලයක් ඉන්නවා. ඊට පස්සේ මම අලුතින් වෙන තැනක් හදලා ඇතුළේ clarical රස්සාව ආපුවාම දෙන්නම් කියලා. නමුත් අද කුණු ට්‍රැක්ටරයට සේවකයන් නැහැ. දැන් පිළියන්දල ලේකම්තුමියගෙන් ඇහුවාම, ටැක්ටර්වලට සේවකයන් නැති නිසා ගන්න පුළුවන්ද කියලා. ගන්න විධියක් නැහැ. කාඩර් එක පුරවලා. නමුත් පුරෝප්පු අය ඉන්නේ කොහේද? ඒ ළමයින් හොඳට බෙල්ට් දාලා, තුන්දාහේ සපත්තු කුට්ටම දාලා ඇවිල්ලා නගර සභාව ඇතුළේ ඉන්නවා. කොහොමද කුණු අදින්නේ?කුණු අදින්න විධියක් නැහැ.

ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. මෙතෙක් කල් ගොඩනැගිලි සැලසුම් අනුමැතිය හැම නගර සභාවකම, ප්‍රාදේශීය සභාවකම සිද්ධ වුණා. ඉදිරියේදී මෙම පනතේ බලතල ප්‍රමාණයක් නාගරික සංවර්ධන අධිකාරිය ලබා ගන්නවා. ඒ අනුව දැනට පර්චස් 100 ට වැඩි ඉඩම් අනුමත කිරීම UD එක භාර අරගෙන තිබෙනවා. ඒ එක්කම මම අභියෝගයට ලක් කරනවා. කැස්බෑව ආසනයේ නාගරික සංවර්ධන අධිකාරියත් ඒ වාගේම නගර සභාවත් එකතු වෙලා Business එකක් කරලා, එක නිවාස සංකීර්ණයක් මැද්දෙන් ඔවුන්ගේ ප්‍රවේශ අයිතියට අභියෝග කරමින් තවත් නිවාස සංකීර්ණයකට අනුමැතිය දුන්නා. මේ සභාවේ අපි කථා කළා. අදත් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිට කැස්බෑව සංවර්ධන කමිටුව හරහා ඒ අනුමැතිය දීලා එවපු ක්‍රමවේදය මම අහලා එවනවා. තවම පිළිතුරු නැහැ. පළාත් සභාවෙන් ඇහුවා, අනුමැතිය දුන්නේ කොහොමද කියලා. තවම පිළිතුරු නැහැ. ඒ නිසා මේ රටේ නීති දවසින් දවස ඒ ඒ පුටුවලට ඕනෑ විධියට හදා ගන්නවා. නමුත් ගරු නියෝජ්‍යසභාපතිතුමනි, මේ ක්‍රමය වැරැදියි. මෙහෙම කරන්න බැහැ. ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා. දැන් කරදියාන කුණු ගොඩ සම්බන්ධයෙන් අවුරුදු ගණනක් මේකේ මන්ත්‍රීවරු විධියට අපි කථා කළා. හැබැයි, දැන් එය මධ්‍යම රජය භාර අරගෙන තිබෙනවා. එහෙමනම් ඒ ව්‍යාපෘතිය හැකිතාක් ඉක්මණින් ආරම්භ කරන්න.

ඒ එක්කම අපි ඉල්ලා සිටිනවා. ගියවර මගේ උපමාන ප්‍රතිපාදනවලින් මම කැළි කසළ බඳුන් දුන්නා. නමුත් අපේ මුදල් කොමිසමෙන් ඒක ප්‍රතික්ෂේප කළා. ලක්ෂ 07 ක් මම වෙන් කරලා තිබුණා. මට අවසානයේදී එව්වා, බඳුන් ලබා දීමට දෙන්න විධියක් නැහැයි කියලා. බස්නාහිර පළාත් සභාවට කැළි කසළ පිළිබඳ ඍජු වගකීමක් තිබෙන ආයතනයක්. නමුත් අපට බඳුනක් බෙදලා දෙන්න විධියක් නැහැ. මුදල් කොමිසම ඒකටත් හරස් වෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ, බස්නාහිර පළාත තුළ මේ කාර්යයන් කරන්න. මම නැවත නැවතත් කියනවා. සමහර මන්ත්‍රීවරුන්ට දැන් හොඳ දේ කරන්න කිසි ප්‍රශ්නයක් නැහැ. මොකක් හරි ප්‍රශ්නයක් ආපුවාම යහපාලනය. මම ආයිත් මතක් කරනවා. යහපාලනයේ නායකයා, ඔබේ නායකයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ගරු නියෝජ්‍යසභාපතිතුමනි,හැබැයි ඉසුර දේවප්‍රිය මැතිතුමා ඉතා දක්ෂයි. නියරේ තනි කකුළෙන් බයිසිකල් පදින්නේ. තනි කකුළෙන් නියරේ බයිසිකල් පදින්න හරි දක්ෂයි. ඒ නිසා එතුමාට පුළුවන්කම තිබෙනවා, නියරේ තනි කකුළෙන් පැදගෙන යන්න. හැබැයි, එකක් තිබෙනවා. මතක තියා ගන්න. බුදු රජාණන් වහන්සේට ගල් පෙරළුවේ, ජේසුස් වහන්සේට ඇණ ගැහුවෙත් ළඟ හිටිය කට්ටිය. ඒ නිසා මම ඔබතුමාට මතක් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජේසුස් වහන්සේට ඇණ ගැහුවේ ජුදාස්.

[සභාවේ සෝෂා]

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ඔන්න ඇණ ගහන කට්ටියගේ සද්දේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉතින් කොහොමද කරන්නේ? මේ කථා කරන්න දෙන්නේ නැහැ නේ? අවසාන අවශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි කියන්නේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගල් පෙරළුවාට බුදු වුණා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 120 මාර්ගය පළල් කළා. ගරු ප්‍රධාන අමාත්‍යවරයාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙම පාරේ විදුලි බල්බ හයි කරගෙන හයි කරගෙන ගියා. දැන් කැස්බෑව නගර බල ප්‍රදේශයට කියනවා, මාසයට ලක්ෂ 08 යි. බොරලැස්ගමුව නගර සභාවට කියනවා, ලක්ෂ 12 යි. කොහෙන් ගෙවන්නද? මේ නගර සභා දෙකෙන්ම ලක්ෂ 20 ක් මහ පාර මැද්දේ තිබෙන ලයිට් බිල ගෙවන්න තිබෙනවා. එවකට හිටපු දේශපාලන අධිකාරිය බලහත්කාරයෙන් නගර සභාවේ සභාපති දාලා සභා අනුමැතියකින් තොරව මේවා අනුමත කරලා දාලා තිබෙනවා. දැන් ලයිට් බිල් දෙක ගෙවන්න විධියක් නැහැ. දැන් පාරේ ලයිට් හයි කරලා තිබෙනවා. බිල ගෙවන්න ආයතනයක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන් වෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා අපි එදත් මෙහිදී ඉල්ලුවා. අවසානයේදී මේ ප්‍රශ්නය විදුලිබල මණ්ඩලයට ගියා. පිළිතුරක් නැහැ. අපි අවසානයේදී දිසාපති කාර්යාලයේ තිබුණු කොළඹ දිස්ත්‍රික් රැස්වීමට ගියා. ඒකේදීත් පිළිතුරක් නැහැ. ඒ නිසා නගර සභා දෙකටලක්ෂ 20 ක් ගෙවන්න බැහැ. නගර සභා දෙකේ එහෙම ආදායමක් නැහැ. එම නිසා අක්‍රමික වැඩ පිළිවෙළවල් ගිය ඒවා විධිමත් කරන්න,බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විධියට ඔබතුමාගේ මැදිහත් වීම අපේක්ෂා කරනවා. ඒ වාගේම නැවත වාරයක් කියනවා. ඔබතුමාට පිහි පාර අනින එක අනිනවා. පොඩ්ඩක් පරිස්සමින් ඉන්න. බොහොම ස්තුතියි.

[අ.භා. 03.28]

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයට වචන කිහිපයක් හරි කථා කරන්න ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. මම හිතන්නේ එතුමා තමයි මේ ලංකාවේ පළාත් සභා සියල්ලගෙන්ම මහ ඇමැතිතුමා වශයෙන් විශේෂ වරප්‍රසාදයක් ලබපු මහ ඇමැතිවරයා. ඒකට හේතුව තමයි, මම බලාගෙන සිටියා අපේ සහෝදර මන්ත්‍රීවරු මේ වන කොට සෑහෙන පිරිසක් එතුමා ගැන අදහස් ප්‍රකාශ කළා. මම හිතන්නේ, එතුමාට මේකේ විවාදයක් නැහැ. මම මීට පෙර කිව්වා, පැය දෙකකින් තුනකින් මේ අයවැය ඉවර කරමු. ඒකට හේතුව තමයි දෙපැත්තම එතුමාට කැමැතියි. එහෙමනම් ඇයි අපි මෙතැන එක එක්කෙනාට වචන හුවමාරු කර ගන්නේ. අපට අවශ්‍ය ප්‍රතිපාදන ටික සම්මත කරන්න අත උස්සලා මේක ඉවර කරලා දාමු. මම හිතන්නේ, එතුමා (බාධා කිරීම්) ලංකාවේම ජනප්‍රිය පළාත් සභාව බස්නාහිර පළාත් සභාව. ඒකේ ගරු ප්‍රධාන ඇමැතිවරයාට මෙහි මන්ත්‍රීවරු ටික ඒකරාශී කරගන්න පුළුවන් වෙලා තියෙනවා. මම හිතන්නේ මේ සංහිඳියාව,සුසන්යෝගයඇති කරගන්න පුළුවන් වුණු එකම මහ ඇමැතිතුමා තමයි ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමැතිතුමා. ඇත්තටම, එතුමා යටතේ අපට මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න ලැබීම ගැන අපි සතුටට පත් වෙනවා. ඇත්තටම මම සතුටින් කථා කරන්නේ. මගේ සහෝදර මන්ත්‍රීවරයෙක් කිව්වා, මෙතුමා අපේ පන්තියේ

මහ ඇමැතිවරයෙක් කියලා. මම අහගෙන හිටියා, මේ මෑත කාලයේ අපේ ජනාධිපතිවරයා කියනවා, අපේ රජේ නායකයෙක් කියලා. එහෙමනම් මෙතුමා අපේ රජේ නායකයෙක්. මෙතුමා ආවේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය දරලා. මහරගම ප්‍රාදේශීය සභාවේ ජනප්‍රියම ප්‍රාදේශීය සභාපතිවරයා වශයෙන් පත් වෙලා මෙතුමා සිතුවේ නැති විධියට එතුමාගේ වාසනාවට අපේ හිටපු ජනාධිපතිතුමා පරාජයට පත් වුණේ මම හිතන්නේ මෙතුමාගේ ග්‍රහඵල හොඳ නිසා වෙන්න ඇතියි කියලා තමයි මගේ පෞද්ගලික මතය වන්නේ. ඒ නිසා මම හිතන්නේ, මේ මහ ඇමැතිකම ලැබෙන්න ද දන්නේ නැහැ, අපේ ජනාධිපතිවරයා පැරදුණේ කියලා මම මගේ පෞද්ගලික මතය වශයෙන් දක්වනවා.

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඇත්තටම අපි ඔබතුමාගේ යටතේ අවුරුද්දක කාලයක් සේවය කළා. මම හිතන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැඩිය වැඩ කොටසක් අපට ආසනය තුළ, අපේ ගම්වල කරන්න ඔබතුමා අපට ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. මම හිතන්නේ, එක්සත් ජාතික පක්ෂයත්, ජේවීපීයත් තමයි අපට විරුද්ධව ඉන්නේ. මේකේ දේශපාලනයෙන් තොරව සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ලබා දීපු මහ ඇමැතිවරයෙක්. එහෙමනම් මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු මහ ඇමැතිතුමනි, 2017 අවුරුද්දට අපට මුදල් මහ ආණ්ඩුවෙන් වෙන් නොවුණත්, ඔබතුමා අපි වෙනුවෙන් ඒ මුදල් ලබා ගන්න සටන් කරපු එක ගැන, මගේ හදවතින් ස්තුතිය මේ වේලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මුදල් ලබා ගන්න එතුමා උනන්දු වන්නේ, එතුමාට නොවෙයි. මම හිතන්නේ අපේ ගරු මන්ත්‍රීවරුන්ට තමයි ඒ ප්‍රතිපාදන ලබා දෙන්න සටන් කරන්නේ. එහෙමනම් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම කියනවා. ගරු මහ ඇමැතිතුමනි, ඔබේ වැය ශීර්ෂය තුළ පළාත් පාලන ආයතන තුළ මේ තිබෙන ගැටලුව ඔබතුමා මැදිහත් වෙලා ඉක්මණින් විසඳා දෙන්න ඕනෑ ප්‍රශ්නයක්. මම හිතන්නේ කොළඹ නගර සභාව තුළ මේ වන කොට හිටපු ආරක්ෂක ලේකම් අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලයේ මේ කොළඹ පරිසරය මම හිතන්නේ, නගර සභාවට පිරිසිදු කරන්න ඉඩ තිබ්බේ නැහැ. එතුමා වෙනම කණ්ඩායම් දාලා, ඒ ශුද්ධ පවිත්‍ර කරලා ආයෝජකයින්ට, අපේ ශ්‍රීලාංකිකයන්ට බලන්න පුළුවන් නගරයක් වශයෙන් අපේ ප්‍රධාන නගරය වන කොළඹ නගරය අලංකාර කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා ගරු මහ ඇමැතිතුමාට කියන්න ඕනෑ. මේ වන කොට කොළඹ නගරයට ඇතුල් වන කොට නහයට ලේන්සුවක් තබාගෙන තමයි ඇතුල් වෙන්න වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍යසභාපතිතුමා හරහා මම ගරු ඔබතුමාට කියනවා. මේ ගැන අවධානය යොමු කරන්න. අපේ ප්‍රධාන නගරය. ප්‍රාදේශීය සභා, නගර සභා මැතිවරණය නොතිබුණොත් මම හිතන්නේ, පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් අපටත් ගම් තුළට යාමට අපහසුතාවයක් ඇති වේගෙන එන්නේ. මේ වන කොට තැන් තැන්වල කුණු කසළ බැහැර කරලා, එක තැනක එකතු කරගන්න බැරිවන තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. මේකේ ප්‍රධානීන්ට අපි දුරකථනයෙන් කථා කළාම එතුමන්ලා කියන්නේ, එක්කෝ වාහන කැඩිලා. නැත්නම් සේවකයන් මදී. මේ වාගේ දේවල් තමයි අපට ප්‍රකාශ කරන්නේ. ගරු මහ ඇමැතිතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි ඉක්මණට මේ ඡන්දය තියලා මන්ත්‍රීවරු පත් නොකළොත්, අපේ කරන සේවයත් මේ පළාත් සභා තුළින් වන සේවයත් ජනතාවට අගය නැති වෙලා යනවා. ඊළඟ මැතිවරණයේදී අපවත් කුණු කූඩයට පත් වන තත්ත්වයක් අද උදා වෙලා තිබෙන්නේ.

ඇත්තටම මම ඉන්නේ ගල්කිස්ස, දෙහිවල, රත්මලාන ආසනවල. වැඩිම විදේශිකයන් පැමිණෙන්නේ ගල්කිස්ස ප්‍රදේශයට. ඒ නිසා ඔබතුමාගේ වැඩි අවධානයක් ඒ ප්‍රදේශ සම්බන්ධයෙන් යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මේ මෑත කාලයේදී මම හිතන්නේ, සංචාරක කටයුතු සභාපතිතුමා සමඟ අපි සංචාරයක් කළා. ගල්කිස්ස පුරය කියන්නේ, සංචාරකයින් පැමිණෙන පැරණිම ස්ථානයක්. ගල්කිස්ස මුහුදු වෙරළ තීරයට ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරනවා. මම හිතන්නේ,මම නියෝජනය කරන ආසනයේ තිබෙන දෙහිවල - ගල්කිස්ස නගර සභාව, මේ වන කොට ලංකාවේ දෙවැනිම නගර සභාව. මෙය ක්‍රියාත්මක නැහැ. මම හිතන්නේ මෙයට තරම් ප්‍රතිපාදන ලැබෙන නගර සභාව වන්නේ කොළඹයි. කොළඹ නගර සභාව හැරුණාම දෙහිවල - ගල්කිස්ස නගර සභාව ධනවත්ම නගර සභාවයි. මේකේ කිසිම ක්‍රියාශීලීකමක් නැහැ.මම හිතන්නේ, කොමසාරිස්වරයා සතියකට දවස් දෙකක් තමයි සේවයට පැමිණෙන්නේ. ඉතිරි දවස් කිහිපය මෙතුමා එනවාද නැද්ද

[ ගරු අමල් සිල්වා ]

කියලා නැහැ. නිලධාරීන් නිලධාරීන්ගේ ක්‍රියාවන්වල. සේවකයන් සේවකයන්ගේ දිහාවල්වල. මම හිතන්නේ, ඉතාම මලානික තත්ත්වයකට දෙහිවල - ගල්කිස්ස නගර සභාව පත් වෙලා තිබෙනවා. මම මේ මෑත කාලයකදී එන කොට දැක්කා, එක නිවසක් ඉදිරියේ බෙර නාද සද්ද කරනවා. පස්සේ මම වාහනය නවත්තලා බැලුවාම මේ ගෙදර වරිපනම් ගෙවීම අඩුපාඩුකමක් ඇති වෙලා තිබෙනවා. මම බලනකොට බෙර ගහලා ඒ ගෙදර බඩු මුට්ටු ටික වෙන්දේසි කරන්න දෙහිවල - ගල්කිස්ස නගර සභාවේ නිලධාරීන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ ගෙවන්න තිබෙන්නේ රුපියල් තිස් දහස් ගණනයි. ඊට පස්සේ මම සොයලා බලන කොට ලක්ෂ 50, 60 ගෙවන්න තිබෙන ආයතනවල කිසිම බෙර සද්දයක් නැහැ. අහිංසකයින් ජීවත් වන ගෙවල්වල කුළියට ඉන්න මිනිස්සුන්ගෙන් තමයි මේ බඩු මුට්ටු එළියට දාන්න, එදිනෙදා කුළී කරලා ජීවත්වන මිනිස්සුන්ගේ බඩු තමයි වෙන්දේසි කරන්න තීරණය කරලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියනවා. දෙහිවල - ගල්කිස්ස කියන්නේ අපේ ජාතික සම්පතක්. එය රැකගන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියමින් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා, දෙහිවල - ගල්කිස්ස වාගේ සියලුම නගර සභාවල සේවකයන්ව ගන්නේ, කම්කරු පත්වීම් දීලා කියලා. මම හිතන්නේ, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ. සියලුම නගර සභාවල මේ පාලක පක්ෂය කියලා නොවෙයි. සියලුම දෙනා ගන්නේ, කම්කරු පත්වීම් තිබෙනවා නම් කම්කරු පත්වීම්වලට තමයි. කුණු අදින කෙනාට උස කොට බලන්නේ නැහැ. එතුමා කිව්වා, A/L කරපු කෙනා කුණු අදින්න ට්‍රැක්ටරයට යන්නේ නැහැයි කියලා. එහෙම සිදු වීමක් වෙලා නැහැ. මම හිතන්නේ එතුමා වැරදියි. කුණු අදින්න කම්කරුවන් ගන්නේ අට පාස් අයව. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගැන ඇත්තටම සතුටු වෙනවා. පළාත් සභා මන්ත්‍රීවරුන් වශයෙන් අපට ගම තුළ, පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක්ට වැඩිය වැඩක් කරන්න ශක්තිය ලබා දුන්නේ ඉසුරු දේවප්‍රිය ගරු මහ ඇමැතිතුමා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 03.36]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍යසභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ඉසුරු දේවප්‍රිය මැතිතුමාගේ වැය ශීර්ෂය වන පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවාහන, සංචාරක අමාත්‍යාංශය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳවඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා.. ඇත්තෙන්ම මම හිතන්නේ බස්නාහිර පළාත් සභාව මේ රටේ සියයට 42% ක ආර්ථිකය මෙහෙයවන ආර්ථික හබ් එක කියලා අපි හැමදාම කථා කරනවා. අද පළාත් සභාව බලයට පත් වෙලා අවුරුදු 26 ක් සම්පූර්ණ වන කාලයේත්, එදා සුදු අධිරාජ්‍යවාදීන් කොළඹට ජල අපවිත්‍ර පරිහරණ පද්ධතිය ලබා දුන්නාට පස්සේ, ඊට අමතරව මේ රටේ කිසිම ආයතනයකට බස්නාහිර පළාත් සභාව ඇතුළු තවත් ආයතන කිහිපයකටවත් එවන් පවිත්‍රතා පද්ධතියක් ලබා ගැනීමට අපහසුවීම පිළිබඳව මගේ කනගාටුව මුලින්ම ගෞරවනීය සභාවට මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඇත්තෙන්ම කථා කරන්න ගියාම කනගාටුදායක සිද්ධියක් වන්නේ, අපි Budget එක හදලා තිබෙන්නේ අර ඉතිහාසය අරන් ආපු ගමන, ඉදිරි වසරටත් ඒ විධියටම කොහොමද ගෙවලා දාන්නේ කියන අයවැයක් හැටියට තමයි මම නම් මේ අයවැය දකින්නේ. තිබෙන වැඩ පිළිවෙළට වැඩ පිළිවෙළක් එකතු කරනවා. තිබෙන අගයට වැඩි මුදලක් වියදම් කරන්න තව අගයක් එකතු කරනවා මිසක යෝජනාවක් ඉදිරිපත් වන්නේ නැති, යෝජනාවක් ඉදිරිපත් නොකරපු අයවැයක් හැටියටයි මම දකින්නේ. ඒකට එක හේතුවක්, උදාහරණයක් වශයෙන් මම ගන්නම්. අපේ සභාවේ සීමාව වන්නේ එක පැත්තකින් බෙන්තර ගඟ. අනික් පැත්තෙන් මහ ඔය. මේ ගංගා දෙක අතරේ කැලණි ගඟ, කළු ගඟ, කුඩා ගඟ, දඩුගං ඔය වැනි මහ විශාල ගංගා මුහුදට ගලා බසිනවා. පානීය ජල පහසුකම් ලබා ගන්න පුළුවන් ආකාරයේ ජලය මුහුදට නිකන් ගලා බසින කොට, මේවාට නාගරික ප්‍රදේශවල අපවිත්‍ර ජලය එකතු කරන ක්‍රමවේදයක් අද ලැබිලා තිබෙනවා. කැලණි ගඟ ගැන කථා කළා. බෙන්තර ගඟ ගැන ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කථා කළා. මේ සියලු ගංගා අපේ ප්‍රදේශයේ දූෂණයට පත් වෙමින් තිබෙන මොහොතක තමයි අපි මේ අයවැය

විවාදයේදීත් කථා කරන්නේ. හැබැයි, මේ දූෂණය පිළිබඳව මෙහෙම කථා කළාට, මේවා රකින්න ඕනෑ කියලා කිසිම වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කරලා නැහැ. ඒ නිසා මේ සභාවේදී යෝජනා කළ යුතු වෙනවා. මේ ප්‍රධාන ගංගා රකින්නට ඕනෑ. පානීය ජලය ලබා ගන්න පුළුවන් ගංගා ටික සුරකින්න ඕනෑ. මම හිතන්නේ අපේ ගරු මහ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ජලපවාහන සහ ජල මණ්ඩලය පවතින නිසයි මම මේ කථා කරන්නේ. මේවාට නීති සකස් කරලා, මේවා මේ රටේ අනාගත දරුවන් වෙනුවෙන් රැක ගන්නට වගබලාගත යුතුයි කියන එක මම ප්‍රකාශ කරනවා. එය මේ ගෞරවණීය සභාවේ වගකීමක් වන්නට ඕනෑ.

ඊට අමතරව අපවිත්‍ර වැසිකිළි ජලය කොළඹට පමණයි සීමා වෙලා තිබෙන්නේ. 2015 වසරේ ලෝක බැංකු ආධාර යටතේ, කොළඹට අමතරව මේ වැසිකිළි පද්ධතියක් මුහුදට ගලා බසින්නට කෝටි 10 ක මුදලක් වෙන් කරලා තිබුණා. බස්නාහිර පළාත් සභාව නොවෙයි. ලංකාවේ අනිකුත් පළාත් සභා නවයත් ඒවාට කථා කළේ නැහැ. මැදිහත් වුණේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. හැබැයි, මම හිතන්නේ රවුෆ් හකීම් ගරු ඇමැතිතුමා හරි මැදිහත් වෙලා නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක පුත්තලම නගර සභාවට ඒ අපජල පද්ධතිය ලබා දීලා අද කෝටි 06 ක් වියදම් කරලා, එක වසරක් තුළ ලක්ෂ 300 ක්, කෝටි 03 ක ආදායමක් ලබා ගන්නට වයඹ පළාත් සභාවට ප්‍රමාද වෙලා හරි හැකියාව ලැබුණා. හැබැයි, කියන්න කණගාටුයි. මේ රටේ 42% ක ආර්ථිකය සපුරන මේ පළාත් සභාව තුළ මේ කොළඹට අල්ලපු දෙහිවල - ගල්කිස්ස නගර සභාවේවත් ඒ අපද්‍රව්‍ය ජනන පද්ධතියක් අපට සකස් කරගන්න බැරි වීම අපේ අපොහොසත්වීමක් කියලා මම මේ සභාවේදී මතක් කළ යුතුයි. ඒ නිසා මෙය අනාගතයේදී බොහොම ප්‍රශ්නවලට තුඩු දෙන කාරණා වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ලෝකයේ වටිනාම සම්පත පානීය ජල සම්පත. මේවා රැක ගත යුතුයි. එය අපේ මේ සභාවේ වගකීමක් වෙනවා. කථා කළාම කියයි, මේවා මධ්‍යම රජයෙන් බලාගන්නට ඕනෑ. මේකට මධ්‍යම රජය තුළ අමාත්‍යාංශ තිබෙනවා කියලා. තවත් දෙයක් කිව්වාම කියන්නේ, චක්‍රලේඛ රෙගුලාසිවලට අපි යටත් වෙලා කියලා. මම අපේ ගෞරවණීය සභාවේ ගරු අමාත්‍යවරුන්ට මතක් කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අමාත්‍යවරයෙක් මහජන නියෝජිතවරයෙක් හැටියට පත් කරපු - අමාත්‍යවරයෙක්ව පත් කරන්න මේ රටේ නීති රෙගුලාසිවලට ඔබ්බෙන් ගිහිල්ලා -

**ගරු උපාලි කොඩිකාර**
**Hon. Upali Kodikara**

අගමැතිතුමාගේ සාකච්ඡාවේදී ඕක කිව්වාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
**Mr. Deputy Chairman**

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
**Hon. Ifthikar Jemil Marikkar**

මේ රටේ අමාත්‍යවරු පත් කරන්නේ, මහජන නියෝජිතයන් තුළින්. ලේකම් කෙනෙක්, එහෙමනම් නිලධාරියෙක් පත් කරලා ඒ චක්‍රලේඛවලට රෙගුලාසිවලට යටත්ව වැඩ කරන්න තිබුණා. අමාත්‍යවරයෙක්ව පත් කරන්නේ රෙගුලාසිවලට,චක්‍රලේඛවලට ඔබ්බෙන් ගිහිල්ලා මහජනතාවගේ පැත්තෙන් මහජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්නට. මේ ගෞරවණීය සභාවේ මේ අමාත්‍යවරු කරනවා ඇති. සමහරු මේ රෙගුලාසි චක්‍රලේඛවලින් ඔබ්බට ගිහිල්ලා මහජනයා පැත්තෙන් සාධාරණයක් ඉෂ්ට විය යුතුයි කියන එක මේ අයවැය ශීර්ෂයේදී මම මතක් කළ යුතු වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මම හිතන්නේ බොහොම සාරවත් කථාවක් ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ගරු මහ ඇමැතිතුමා මම හිතන්නේ සභාවේ නොසිටියත් මම යෝජනා කරනවා. අඩුම තරමේ එක සභාවකට, ප්‍රාදේශීය සභාවක් වෙන්න පුළුවන්. නගර සභාවක්, මහ නගර සභාවක් වෙන්න පුළුවන්. අඩුම තරමේ කාපට් පාරවල් දෙකක්, තුනක් හෝ ලබා දිය යුතුයි කියලා. අද සංවර්ධනය ගැන කථා කරනවා. සහයෝගය දෙන අයට කාපට් පාරවල් දෙන කොට අනික් මන්ත්‍රීවරුන්ට කොන්ක්‍රීට් පාරවල් ලබා දෙන සංස්කෘතියක් සභාව තුළ ඇති වෙලා තිබෙනවා. කථා කරද්දී අපට ප්‍රශ්න ගණනාවක් තිබුණත් අනිකුත් අමාත්‍යාංශ වැය ශීර්ෂ අරගෙන බැලුවත් ඒ හා සමානවම අපට ප්‍රශ්න ගොඩකට ගොනු වුණු, මම හිතන්නේ පළාත් සභා මන්ත්‍රීවරයාට ගමට යන්න බැරි තරමට ප්‍රශ්න මතු වෙලා තිබෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමන්ලා යූ.ඇන්.පී. නේ?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මම යූ.ඇන්.පී වෙන්න පුළුවන්. ඔබතුමා පොහොට්ටුවේ වෙන්න පුළුවන්. අනික් අය ශ්‍රී ලංකා වෙන්න පුළුවන්.

**ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Gunasiri Jayanath- Chief Government Whip

ඔබතුමා පළාත් සභාවේ ආණ්ඩුවේද? විපක්ෂයේද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මම ඇත්ත කථා කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 2 ½ ක් ගිහිල්ලා හරි ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට චෝදනා කරනවා නම්, වැරැද්දක් සිද්ධ වුණා කියලා. අද මේ සභාවේදී මම සතුටු වෙනවා. එදා කළ දේ වැරැදියි කියන එක අවුරුදු 2 ½ කට පස්සේ හරි පිළිගැනීම පිළිබඳව ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා වෙන්න පුළුවන්. පුද්ගලිකව මම වෙන්න පුළුවන්. ගෝඨාභය රාජපක්ෂ එදා ආරක්ෂක ලේකම්තුමා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඥානසාර හාමුදුරුවන් වෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැරැද්දක් සිද්ධ වුණා කියලා පසුව හෝ එය පිළිගැනීම පිළිබඳව සතුටට කරුණක්. ෆායිස් ගරු මන්ත්‍රීතුමා කියනවා, බේරුවල මන්ත්‍රීතුමා එකඟයි කියලා. මම ෆායිස් ගරු මන්ත්‍රීතුමාටත් කියන්නට ඕනෑ. ඒ සිද්ධියත් එක්ක අපි ඉලක්කයකට ගැහුවා. ඒ ඉලක්කය වැට්ටුවා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මේ රටේ පරිවර්තනයක් ඇති කළා. මේ රටේ රට රකින ආර්ථිකයක් අද පත්වෙමින් පවතිනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෞරවණීය සභාවේ අමාත්‍යවරුන්ගෙන් ඉල්ලීමක් කරන්නේ, ඉදිරි කාලය තුළ මේ සභාවේ ඉලක්කයට යන කොට, අලුත් ව්‍යාපෘති ඇතුළත් කරලා, සංවර්ධන යෝජනා ඉදිරිපත් කරලා ඒ සංවර්ධන යෝජනාවලට ආර්ථික සංවර්ධන බැංකුව වෙන්න පුළුවන්. ආසියානු සංවර්ධන බැංකුව වෙන්න පුළුවන්. ලෝක බැංකුව වෙන්න පුළුවන්. අපට ආධාර ලබා ගන්න හැකියාවක් තිබුණත් මම දන්න තරමින් බස්නාහිර පළාත් සභා ඉතිහාසයේ කිසිම වතාවක ඍජුවම ගිහිල්ලා මහ ඇමැතිවරයෙක් ආණ්ඩුවට කොහෙන් හරි ගෙනත් දුන්නාම, බස්නාහිරට බස්සනවා වෙන්න පුළුවන්. හැබැයි, මහ ඇමැතිතුමා හැටියට ඍජුවම ගිහිල්ලා කථා කරලා ආධාර ගෙනෙන්න හැකියාව තිබුණත් මම දන්න ඉතිහාසයේ එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ගේන්න පුළුවන්. උතුරට ගේන්න පුළුවන් නම්, නැගෙනහිරට ගේන්න පුළුවන් නම් වයඹට ගේන්න පුළුවන් නම් ඇයි අපටත් හොරෙන් ගේන්න බැරි. නොහැකියාව කියලා තමයි මම නම් කියන්නේ. ඒ නිසා ඉදිරි අයවැය ශීර්ෂවලදී අපි අනිකුත් අමාත්‍යාංශවලට කථා කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාට මූලාසනයට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 03.49]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහ ඇමැතිතුමාගේ වැය ශීර්ෂයේදී මටත් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඉස්සෙල්ලාම අපේ අර ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමාට ඔබතුමා හරහා උත්තරයක් දෙන්න ඕනෑ. එතුමා කිව්වා, හොඳ සාර්ථක ආර්ථිකයක් තිබෙනවා කියලා. මහින්ද මහත්මයාගේ කාලයේ සීනි කිලෝ එකේ ගණනට මේ ආණ්ඩුවේ ලූණු කිලෝ එකේ මිල ගිහිල්ලා.

ලුණු 120 යි. මම අද උදේ ගෙනාවා. සීනි කිලෝ එකක් ගණනට ලුණු කිලෝ එකත් ගිහිල්ලා. ඒක තමයි ඇත්ත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මහ ඇමැතිතුමාට විෂයයන් කිහිපයක් භාර වෙනවා. මම හිතන්නේ මේ පළාත් සභාව තුළ අපි පැමිණි දා සිට අයවැය තුළ කථා කරනවා. නමුත් අර ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා කිච්චාවාගේ ගිය අවුරුද්දේ අයවැයට තව ගණන් හිලව් ටිකක් එකතු කරලා, ඒ කරගෙන ගිය වැඩ පිළිවෙළේ තව මොනවා හරි ටිකක් එහා මෙහා කරනවා මිසක්, මම නම් දැක්කේ නැහැ, මේ බස්නාහිර පළාත් සභාව තුළ කවදාවත් නිර්මාණශීලී වැඩ පිළිවෙළක් ඉදිරිපත් වෙනවා. අර පරණ රෝල ගහගෙන, සල්ලි එහා මෙහා කරලා අඩු වැඩි කරලා තමයි තිබෙන්නේ. නිර්මාණශීලී අයවැයක් ඉදිරිපත් වෙලා. වැඩ සටහනක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මහ ඇමැතිතුමාට තමයි පළාත් පාලන විෂයය තිබෙන්නේ. මේ වන විට ප්‍රාදේශීය සභාවල,නගර සභාවල මන්ත්‍රීවරු නැහැ. සභාපතිවරු නැහැ. එතකොට අපේ ගරු මහ ඇමැතිතුමා තමයි නිල නොලත් ලෙස ඒ ලේකම්වරු පාලනය කරන්නේ. එතකොට පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල පාරවල් ගත්තාම අඩු වැඩි වශයෙන් 75% ක්, 80% ක් හැදිලා ඉවරයි. සෑම ආසනයකම අඩුවැඩි වශයෙන්. එතකොට අපි හැමදාම අලුත් පාරවල් හදන්න උත්සාහ කරනවා. සමහරවිට සභාවලට කොන්ත්‍රාත්කාරයාගෙන් කොමිස් එකක් හම්බ වෙන නිසා වෙන්න ඇති. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හදපු පාරවල් තිබෙනවා. ඒ පාර දැන් යාන්තම් කැඩීගෙන යනවා. ඒ පාරේ තැන තැන ගැලවිලා, කාපට් පළුදු වෙලා 1 ½ ක් තාර කෝඩ් එකක් දාලා. ඉතින් මේ පාරට අලුතෙන් තාර කෝඩ් එකක් දාන්න පුළුවන් නම් පුංචි වියදමයි යන්නේ. අලුතෙන් පාරක් හැදුවා හා සමානයි. ඒ භාගෙට කැඩී ගෙන එන පාරට වසර තුනකට සැරයක් වත් තාර කෝඩ් එකක් දමන්න. මම කටාන ප්‍රාදේශීය සභාවේ ඉන්න කාලයේ යෝජනා කළා. ඒ සභාපතිතුමා ක්‍රියාත්මක කළේ නැහැ. මොකද හේතුව. එහෙම දැම්මාම කොන්ත්‍රාත්කාරයාගෙන් කොමිස් හම්බ වෙන්නේ නැහැ නේ?ඒක නිසා වෙන්න ඇති. මම කියන්නේ මේක ගරු මහ ඇමැතිතුමාට. දැන් එතුමා යටතේ පළාත් පාලන තිබෙන නිසා ඒ හදලා ඉවර වුණු පාරවල් පොඩ්ඩ පොඩ්ඩ කැඩීගෙන එන පාරවල් විශාල ලෙස කැඩෙන්න ඉස්සෙල්ලා second Cord එකක් ගහලා පාරවල් ටික ආරක්ෂා කරගන්න. ඒ අනුව ඒ පළාත් පාලන ආයතනයේ කැඩී ගෙන එන පාරවල්වලින් 50% ක් හදලා නිම කරන්න පුළුවන්.

ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනා කරනවා. මේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු තමයි මේ රටේ වැඩිම විනාශය කරලා තිබෙන්නේ. මෙතැනත් හිටපු සභාපතිවරු ඉන්නවා. මොකද හේතුව, සුද්දා නීතිය හදලා තිබෙනවා. පළාත් පාලන පාරක පාරේ මැද්දේ සිට අඩි 10 ක් එහායින් තමයි තාවකාලික ඉදි කිරීමක් ඉදි කරන්න පුළුවන්. ඒ කියන්නේ පාර අඩි 10 නම් පාර මැද්දේ ඉඳන් 10 ක් තිබ්බාම 10 යි, 10 යි, 20 ක් වෙනවා. තාප්ප ගැහුවත් පාරට අඩි 20 ක් ඉතිරිවෙනවා. අද කෙලින්ම වැටෙන්ම තාප්පේ ගහනවා. තප්පෙ අයිනේ පස් කඳු ගහනවා. තාප්පේ පෙරළෙයි කියලා මලුත් හිටෝනවා. අන්තිමට අඩි 10, 12 පාරේ යන්න විධියක් නැහැ. ඉස්සර අපි පුංචි කාලයේ ගියේ, ෆුට් සයිකලයෙන්. අද මේ යහපාලන ආණ්ඩුව ඇවිල්ලා හැමෝටම කාර් තිබෙනවා නේ?එතකොට පාර දෙපැත්තට කාර් දෙකක් යන කොට අඩි 10 පාරේ කොහොමද වාහනයක් අයින් කරන්නේ?අනාගතයේදී මහ පාරේ මිනිස්සු ගහ ගන්නවා. පාර අඩි 10 යි. දෙපැත්තෙන් තාප්ප ගහලා. පළල් කරන්න බැහැ. වාහනයේ පළල අඩි 13 යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරහා මම ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මීන් මත්තටවත් මේ පළාත් පාලන ආයතනවල පාරවල්වල ඒ නීතිය ක්‍රියාත්මක කරන්න. නැත්නම් තාප්පය පාරේ ගහනවා. ගැහුවාට පස්සේ ආයේ කවදාවත් කඩන්නේ නැහැ. වතුර ලයින් එකක් යන්න බැහැ. බට ලයින් එකක් යන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

තිබෙන වාහනයත් විකුණන්න ලැහැස්ති කරලා තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

යහපාලනය නිසා තිබෙන එකත් විකුණන්න ලැහැස්ති කරලා තිබෙන්නේ. බොහොම ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාළාත් පාලන ආයතන ගරු මහ ඇමැතිතුමාට තිබෙන නිසා - අද එතුමා නැහැ. චන්ද්‍රානි මිස් ඉන්නවා. එතුමිය අහ ගනියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ලොකු

[ ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ]

ප්‍රශ්නයක්. ගෙදරකට මොනවාද ගේන්නේ කියලා බලන්න. ගෙදරට ගේන්නේ, මෙන්න මේ ෂොපින් බෑග් දෙකක රුපියල් 2000/- ක බඩු. යහපාලන ආණ්ඩුව නිසා ෂොපින් බෑග් දෙකකට රු.2000/- කයි ගෙන්න පුළුවන්. ඕකට අපද්‍රව්‍ය මොනවද දාන්න පුළුවන්. ලීස් කැලි ටික. ගෝවා කොළ ටික. පොල් කුඩු ටික. පොල් කට්ට විසි කරන්නේ නැහැ. ලිපට දානවා. කිරි හට්ටිය. යෝගට් කෝප්පය. මේවා තමයි අපද්‍රව්‍ය කියලා විසි කරන්නේ. ගේන ඔක්කෝම විසි කරන්නේ නැහැ නේ, අසූචි විසි කරන්නේ නැහැ නේ, එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩුම ගණනේ කොම්පොස්ට් භාජනයක් නිකන් දෙන්න බැරි නම් - අවුරුදු පහකට ගෙවීමේ ක්‍රමයට රුපියල් 2000/- යි. රුපියල් 3000/- යි. ගෙදරකට දෙන්න කියන්න. ශත පනහ පනහ එකතු කරන්න කියන්න. ප්‍රේමදාස මහත්මයා රුපියල් 100/- ට ගෙවල් දුන්නා. අද ගෙවලා ඉවරයි. Housing Scheme එකේ මාසයකට රුපියල් 100/- යි. අන්න මිනිස්සු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ සෑම ගෙදරකටම කොම්පොස්ට් භාජනයක් දෙන්න ඕනෑ.

ඊළඟට අපේ මිනිස්සු කෙහෙල් පැලේ හිටුවනවා. වතුර දානවා. වත්තේ පර්චස් 10 යි තිබෙන්නේ. කෙහෙල් පැලේ හිටුවනවා. වතුර දානවා. කැන එනවා. මාස 06 ක් බලාගෙන ඉන්නවා. කැන කනවා. විකුණ ගන්නවා. කෙහෙල් ගහ දෙකට කපනවා. පාරට දානවා. කෙලින්ම පාරට දානවා. කෙහෙල් ගහ අවුරුදු ගණනක් වත්තේ තියන්න පුළුවන්. කැන කන්න පුළුවන්. මාස 06 ක් ඕක දිහා බලාගෙන ඉන්න පුළුවන්. ගහ කපලා වළක් කපලා වළලන්න බැරි මේක මිනිස්සුන්ගේ ඕනෑ නැතිකමට පරිසරය අපවිත්‍ර කරන්න දෙන්න නරකයි. අන්න ඒවාටයි 25,000/- දඩය ගේන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් හැටියට කියන්නම්. ගෙදරකට කොම්පොස්ට් භාජනයකුයි, අඩියක් උසට අඩි තුනේ උර කැටයකුයි මම ගෙවල් කීපයකට දුන්නා. දැන් මම දීගෙන දීගෙන යනවා. ඒ අය දිරන ඒවා කොම්පොස්ට් භාජනයට දානවා. අර කොළ රොඩු ටික අර උර කැටයට දාලා ගිනි තියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ පාරට කිසිම දෙයක් විසි කරන්න ඕනෑ වෙන්නේ නැහැ. විසි කරන්න ඕනෑ නම් ගෑණියි මිනිහයි විසි කරන්න තියෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෆ්ලැට්වල ඒක කරන්න බැහැ. නිවාස යෝජනාක්‍රමවල ඒක කරන්න බැහැ. අපේ ගම්වල ට්‍රැක්ටරය එනවා. මොකටද? පර්චස් 20 යි, 30 යි, 50 යි අක්කරය. ඌත් කුණු දාන්නේ පාරට. එහෙම වෙන්න ඕනෑ නැහැ. ගම්වල මිනිස්සු. ඒවායේ එන්න ඕනෑ නැහැ. ඒ මිනිස්සුන්ට කුණු කළමනාකරණය කරන්න ක්‍රමයක් හදලා දෙන්න ඕනෑ.

ඒ වාගේම අපේ ගරු මහ ඇමැතිතුමාට සංචාරක අමාත්‍යාංශය තිබෙනවා. අපේ නිලධාරීන් සල්ලි වෙන් කරනවා. සල්ලි වෙන් කළාට පස්සේ නිලධාරීන් ගංගා වටේ දුවනවා. මොනවද හිටවන්නේ කියලා. ඇත්ත නේ ඉතින්. කුඹුක්ද? උණද? කජුද? අඩු ගණනේ අවුරුද්දකින් දෙකකින් හදන්න බැහැ. අවුරුදු දෙකක, තුනක, පහක ව්‍යාපෘතියක් හදලා මේ පළාත් සභාව තිබෙන කාලය තුළ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න පුළුවන්. මම අහගෙන අගලවත්ත පැත්තේ දිය ඇළි තිබෙනවා කියනවා. සංචාරකයින් එනවා කියනවා. නමුත් නිර්මාණශීලීව නිර්මාණය කරලා නැහැ. ආයෝජනය කරලා නැහැ. පළාත් පාලනය කියලා පාරවල් හදලා හරි යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනා කරනවා. දැන් බලන්න. කැළෑවට තිබුණු, වගුරු තිබුණු ඔය දියත උයන පැත්ත, පාර්ලිමේන්තුව පිටිපස්ස ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නාගරික සංවර්ධනය හරහා හදලා ලස්සන කරලා තිබෙනවා. ඒ වාගේ අපේ පුරන් වෙල් තිබෙනවා. රජයට පවරා ගන්න පුළුවන්. ඒවායේ අක්කර 10, 15 ජලාශ හදලා ඒ කපන පස් පැත්තෙන් ගොඩ කරලා ඒවායේ මිනිස්සුන්ට විනෝද වෙන්න.කන්න. බොන්න. ඒවා මිනිස්සු කරනවා. ඒවා පිටරටවල තියෙනවා. ඒවා ඉදි කරන්න ඕනෑ. එහෙම නැතිව මිලියන 10 ක්, 15 ක් වෙන් වුණාම මේ මිලියන 10, 15 ට කරන්නේ මොනවද කියලා අමාත්‍යාංශයේ කල්පනා කරලා, වටේ දුවලා හරි යන්නේ නැහැ. නිර්මාණශීලී අදහස් තිබෙන්න ඕනෑ. ඒවා නිර්මාණය කරන්න ඉන් මේ අවුරුද්දේ කොටසක් කරලා ලබන අවුරුද්දේ ඉතිරි කොටස කරන්න ඕනෑ. ඒ ආකාරයෙන් කරලා නිම කරන්න ඕනෑ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීගමු පුරවරයේ ඇති මීගමු Beach එකේ වෙරළ උද්‍යානය ගාව හැමදාම අවුරුද්දට පහක්, හයක්, දහයක් දිය වැලට

ගහගෙන යනවා. දහස් ගණන් මිනිස්සු නානවා. ඒත් නාන්න එපැයි ඉතින්. දිය වැලට ගහගෙන ගියත්. විනෝද වෙනවා නේ?එතකොට මම ගිය පාරත් යෝජනා කළා. මුහුද දිගේම ගල් වැටි දාන්න පුළුවන් නම් - මේ මුහුදු වෙරළේ සිට මීටර් 100 ක් එහාට, මම ඔය මුහුදේ හොඳට බැහැලා නාලා තිබෙනවා. මීටර් 100 ක් එහාට, අඩි 20 යි, 25 යි ගැඹුර තිබෙන්නේ. මීටර් 100 ක් ඔබ්බෙන් මීටර් හාර පන්සියයක් දිගට ගල් වැටියක් දැම්මා නම් රළ කඩලා එන්න, මුහුද උඩින් නොවෙයි. මුහුදට වඩා අඩියක් යටින් රළ කැඩිලා එන්න දැම්මා නම් දිය වැල නැහැ. එතකොට ටැංකිය වාගේ තිබෙනවා. පුළුවන්තරම් නාන්න පුළුවන්. අපේ අය නාන්න ගියාම වැලි නාන්නේ. චුට්ටක් එහාට ගියාම යන්න එපා කියනවා, දිය වැල එනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවයි, මධ්‍යම රජයයි කරලා දෙන්න ඕනෑ ඒ වාගේ දේවල්.

නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා මීගමුවේ ජීවත් වෙන මනුස්සයා. එතුමා ඉන්න කාලයේත් මම යෝජනාව කළා. ඒත් ක්‍රියාත්මක වුණේ නැහැ. එතුමාත් ඔය සංචාරක අමාත්‍යාංශයේම හිටියා. හැබැයි, මොනවා වුණත් මේ සංචාරක අමාත්‍යාංශයේ මුදල් නාස්ති කරන්නේ නැහැ. මම දැක්කා ඉස්සර නම් සංචාරක අමාත්‍යාංශයේ පොතක් ගහනවා. ඒකේ බස්නාහිර පළාතේ නැරඹුම් ස්ථාන තිබෙනවා. මේ තිබෙන්නේ, එහෙම ලස්සනට ගහපු පොත්. මේ සංචාරක අමාත්‍යාංශයේ නම් එහෙම නාස්ති කළේ නැහැ. ඒ ගැන මම අපේ ගරු මහ ඇමැතිතුමාට සහ එතුමාගේ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පළාත් පාලන අමාත්‍යාංශය මෙතුමාට තිබෙන්නේ. පළාත් සභා තිබෙනවා. අපි මේ හැමදේම කරන්නේ පවුල කියන ආයතනය ශක්තිමත් කරලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

විනාඩි දෙකක් දෙන්න. පවුල කියන ආයතනය ශක්තිමත් කරලා බොහොම ලස්සනට ජීවත් කරවන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් පාලන ආයතනවලට පුළුවන්. කොට්ඨාශයෙන් කොට්ඨාශයට ඒ ගෙවල්වල ඉන්න කාන්තාවන්ව දැනුවත් කරලා ගෙවතු වගාවල් හදලා යම් ආදායම් තත්ත්වය වැඩි කරන්න. එහෙම දෙයක් කෙරෙන්නේ නැහැ. ඊළඟට අපට තමයි පළාත් පාලන අමාත්‍යාංශයේ යටතේ ප්‍රජා ශාලා තිබෙන්නේ. ඒ ප්‍රජාශාලා ගැන බලන්න. තිබෙන තරමක් තිබෙන්නේ බෝ නොවන රෝග. අපි මළ ගෙවල් 10 කට ගියොත් එහෙම 05 කම තිබෙන්නේ, ප්‍රෙෂර් හැදිලා මැරිලා ගිහිල්ලා. නැත්නම් තව මොකක් හරි. මේ ආකාරයෙන් ඒවාත් වැඩි දියුණු කරලා ඒ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇවිදින මංතීරු හදන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇවිදින මංතීරු කෙසේ වෙතත් ඒ ආයතනවල - අර දැන් තිබෙන්නේ මොන ඩාන්සින්ද කියලා. ඒ වාගේ දේවල් කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් වශයෙන් ඉල්ලනවා. ජාත්‍යන්තර ගුවන් තොටුපල. මේ යහපාලන ආණ්ඩුවෙන් ලොකුවට කියනවා, වැඩ කරනවා කියලා. ගුවන් තොටුපලේ එනකොට තිබෙන, අර රවුන්ඩ්ද බවුඩ් එක කියලා එකක් තිබෙන්නේ. ඒක තුන්බවුඩ් තිබෙන්නේ. තුන් මුලස් තිබෙන්නේ. ඒකේ තිබුණු මල් ටික මැරිලා ගිහිල්ලා, වතුර ටිකක් දාගන්න විධියක් නැහැ. අඩුම ගණනේ සීදුව - කටුනායක නගර සභාවෙන්වත් ඒක හදන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී විශේෂ නිවේදනයක් කරන්න තිබෙනවා. අද උදේ රියැදුරන්ගේ ආහාර පිළිබඳ ඇති වුණු තත්ත්වය තුළ යම්කිසි තත්ත්වයක් පැන නැඟිලා තිබිලා ගරු සභාපති සුනිල් විජේරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හදිසියේ සභා කටයුතු රැස්වීම රැස් වුණා. ඒකට සියලුම සාමාජිකයන් සහභාගි වුණා. එතැනදී තීන්දුවක් ගත්තා, ගරු මන්ත්‍රීතුමන්ලාගේ රියැදුරන් සඳහා ආහාරපාන සැපයීම සම්බන්ධයෙන් පැන නැඟී තිබූ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අද දින සභා

[ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ]

කටයුතු කාරක සභාවේ විශේෂ රැස්වීමක් පවත්වන ලදී. 2016.12.08 වන දින පටන්, එනම් හෙට පටන් තම රියැදුරන් හට ආහාරපාන සපයා ගැනීම සඳහා රුපියල් 500/- ක දීමනාවක් බැගින් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දීමට එම සභා කටයුතු කාරක සභා රැස්වීමේදී තීරණය කරන ලද බව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දැනුම් දෙමි. ඒ දැනුම් දෙන්නේ ගරු සභාපතිතුමාගේ නියමය පරිදි. ඒක වඩාත් පැහැදිලි කරනවා නම්, එම කාරක සභාවේ හිටපු කෙනෙක් හැටියට මම කියන්නේ, තමුන්නාන්සේලාගේ රියැදුරන්ට දෛනිකව රුපියල් 500/- ක දීමනාවක් ආහාරපාන සඳහා ලබා දෙනවා. ඒ කියන්නේ මෙහෙන් ආහාර සපයන්නේ නැහැයි කියන කාරණයයි. ඉන් කියැවෙන්නේ, මම හිතන්නේ අහාරපාන සම්බන්ධයෙන් පෙරවරුවේ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා සභා කටයුතු කාරක සභා රැස්වීම ඒකමතිකව තීන්දු කළා. ඒක ඔබතුමන්ලාගේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කළේ.

මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා සභාව අමතනවා. ඔබතුමාට කාලය විනාඩි 10 යි.

[අ.භා. 04.02]

**ගරු රසික මංජුලබුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, හය වැනි පළාත් සභාවේ තුන් වැනි අයවැයට අද දින ගරු මහාමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලපවාහන හා සංචාරක අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට මා හට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා විශේෂයෙන් පළාත් පාලන විෂයය පිළිබඳව කථා කරද්දී මම හිතන්නේ වැඩිපුරම අත්දැකීමක් තිබෙන හිටපු අමාත්‍යවරයෙක් වශයෙනුත්, හිටපු සභාපතිවරයෙක් වශයෙනුත් ඔබතුමාට මේ පළාත් පාලන විෂයය පිළිබඳව පුළුල් අත්දැකීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කඩුවෙල ආසනය - මම හිතන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඇරුණාම වැඩි ජනගහනයක්, වැඩි ජනතාවක් වෙසෙන ප්‍රදේශයක් වශයෙන් කඩුවෙල ආසනය - මහරගම, හෝමගම මේ ප්‍රදේශ අපේ ආසනය වටේ තිබෙන අනිකුත් ආසනවල අතරින් මම හිතන්නේ, ඉතාම විශාල ජන සංඛ්‍යාවක් වෙසෙන ප්‍රදේශයක් තමයි කඩුවෙල ආසනය.

ඒ වාගේම තමයි පසුගිය රජය ගත්තත්, වර්තමාන රජය ගත්තත් මේ ආසනය කේන්ද්‍ර කර ගනිමින් ඉතාමත් වේගයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන වැඩ පිළිවෙළවල් කිහිපයක් පසුගිය දශකය පුරාමත්, මේ එළැඹෙන අවුරුදු දෙක තුන පුරාමත් ඉලක්ක ගත කරලා තිබෙනවා. මම හිතන්නේ, ඒ බස්නාහිර පළාතේ සංවර්ධනයට අවශ්‍ය කාරණා කටයුතු ඉෂ්ට සිද්ධ කර ගැනීමට. උදාහරණයක් වශයෙන් ගත්තාම පසුගිය ආණ්ඩුවෙන් යුධ හමුදා මූලස්ථානය පැලවත්තේ ඉදි කිරීමට පටන් අරගෙන මම හිතන්නේ පසුගිය අවුරුද්දේ මේ ආණ්ඩු හුවමාරුවත් සමඟ තාවකාලිකව අතරමග නතර වුණත්, නැවතත් මේ කාරණය සිදු වී ගෙන යනවා. මට මතකයි, පසුගිය අවුරුදු පහ පුරා ඔබතුමාත් වෙසෙන ප්‍රදේශයේ ඉතාම යෝධ සංවර්ධනයකට ලක් වුණා. මේ සංවර්ධනය තුළින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා කඩුවෙල ආසනය ඉතාමත් වේගයෙන් සංවර්ධනය කරා පියනගමින් යන අතරතුරේ මේ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා තිබුණු ඒ ඉඩ පහසුකම්වල මදි පාඩුකමක් ඇති වුණා. විශේෂයෙන් කිව්වොත් මහා මාර්ගවලට අවශ්‍ය ඒ යටිතල පහසුකම්, එතකොට විදුලිය, ජල සැපයුම, දුරකථන මේ වාගේ දේවල් සංවර්ධනය කළා. ඊට අමතරව කඩුවෙල මහ නගර සභාව විසින් සපයන්න පුළුවන් ඒ ජනතාවට අවශ්‍ය සැපයීම් පිළිබඳ අඩුපාඩු සැහෙන ප්‍රමාණයක් ඇති වුණා. අපි ඒක ගැන ගරු මහ ඇමැතිතුමා කථා කරලා ඒවාට අවශ්‍ය කරන තාවකාලික පැලැස්තර දැමීම තුළින් මේවා ක්‍රියාත්මක කරගෙන ගියත් මම හිතන්නේ, පසුගිය අවුරුද්දේ මැද භාගයේදී මේ පළාත් පාලන ආයතනය, සභා එක්කම ඒ කාලය ඉකුත් වී ඒවායේ ක්‍රියාකාරීත්වය නැති වෙලා ගියාට පස්සේ, මේ වන කොට වර්තමාන තත්ත්වය මේවායේ පරිපාලනය ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ඒ කණ්ඩායම් අතින් ගිලිහුණාට පස්සේ නගරයට විශාල අඩුපාඩුවක් මේ වන විට දැනෙමින් පවතිනවා. මම ඒ ගැන වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ. මොකද, ඒ පළාත්

පාලන විෂයය පිළිබඳව මම දැක්කා, විටින් විට ෆයිසර් මුස්තාපා ගරු ඇමැතිතුමා සීමා නිර්ණය පිළිබඳ ප්‍රශ්නය යොමු කරමින් ඒ සඳහා අවශ්‍ය සුදුසු කාලයේදී මේ මැතිවරණය පැවැත්වීම සඳහා ඒ වට පිටාව සැකසීමට කටයුතු කරන බව සඳහන් කරන අයුරු.

නමුත් අද මේ පළාත් පාලන විෂයය සම්බන්ධයෙන් අයවැයේදී මම මතු කරන්න කැමැතියි, මේ විෂයය ගැන වැඩිදුරටත් අවධානය යොමු කරලා, මේවාට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා අවශ්‍ය පාරවල්, මංමාවත්, ඒ විදුලිය, ජලය ඒ වාගේම දූරකථන පහසුකම්, ඒ සියල්ල සංවර්ධනය කිරීමේ උවමනාව පළාත් සභාවේ අවධානය යොමු කරලා මේවාට තව තවත් කරන්න පුළුවන් ආයෝජන වශයෙන් කරන්න පුළුවන් සියලු දේ කරලා සංවර්ධනය කළ යුතුව පවතිනවා.ඇත්තටම කඩුවෙල ආසනය විතරක් නොවෙයි. පසුගිය දවස්වල මම දැක්කා, කොළඹ සංවර්ධනය පිළිබඳව ගරු අමාත්‍යාතුමාගේ කථාවත් එක්ක බත්තරමුල්ල ආසනයේ ප්‍රවාහන කේන්ද්‍රය, රජයේ සියලු ආයතන බත්තරමුල්ලට ගේන කොට මේ මංමාවත්වල තිබෙන මාර්ග තදබදය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් අත්දැකීම් ලබනවා ඇති. රාජගිරිය හරියෙන් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඉතින් මේ වාගේ කාරණා කටයුතු ඉදිරියේදී ඉෂ්ට සිද්ධ කරන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වගකීම තමයි මේවා පෙන්නලා දීලා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු වශයෙන් ඒ යෝජනා ක්‍රියාත්මක වන කොට අපේ දැනුවත්වීම සඳහා සහ අපේ අදහස්, ඒ කාරණා ලබා ගැනීමේ ක්‍රියාවලියක් ගරු මහ ඇමැතිතුමාගේ නියෝජනයෙන් අපට ලබා දෙන්න පුළුවන් නම් මම හිතන්නේ එය මීට වඩා බෙහෙවින්ම ප්‍රයෝජනවත් වෙනවා. අපට ඒ සඳහා වඩාත් හොඳ යෝජනා ගෙනැල්ලා, මේ සඳහා හොඳ ස්ථිර විසඳුමක් ඉදිරියට ගෙන යන්න පුළුවන්. මොකද, මේ සමහර ගන්න තීන්දු, තීරණ සමහරවිට අපි නැතිව ගන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කියන්නේ මෙගා පොලිස් වාගේ -

**ගරු රසික මංජුලබුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ඔව්. මම නම කියන්නේ නැතිව කථා කළේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පළාත් සභාවේ මහජන නියෝජිතයින්ගෙන් අදහස් ගන්න කියන කාරණාව. ඒක වැදගත්.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ඔබතුමා නියෝජනය කරන, මම දන්නවා, මේ පළාත් සභාව ගරු මන්ත්‍රීවරු හතර පස් දෙනෙක් කඩුවෙල ආසනය නියෝජනය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනා කරන්නේ, ඉදිරියේදී මෙගා පොලිස් ව්‍යාපෘතිය බත්තරමුල්ල ප්‍රදේශයට ගෙනැල්ලා, මම හිතන්නේ, ඒක තමයි Hub එක. Transporgt Hub එක බත්තරමුල්ල ප්‍රදේශයට එන කොට ඒ සඳහා අපගේ යෝජනා ලබාගෙන ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අපව දායක කර ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි මම කියන්න කැමැතියි. මම දැක්කා, විපක්ෂයේ අපේ හිතවත් සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කිරීමක් කළා, මේ පළාත් පාලන ආයතන ගැන. මේ පාරවල් සෑදීමේදී අවුරුදු 20 කට වැඩි අත්දැකීමක් මුසු කරලා තමයි ඒක කිව්වේ. මට කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා. එතුමා ඒක ප්‍රකාශයට පත් කළේ, මේ ටෙන්ඩර් ක්‍රියාදාමය සහ පාරවල් හැදීම පිළිබඳවයි. එතුමා කිව්වා, උදාහරණයක් වශයෙන් ගත්තාම මේ පාරක් හදන්න රුපියල් ලක්ෂයක් වියදම් කරන කොට පාරකට වියදම් කරන්නේ රුපියල් 55,000/- ක්, 60,000/- ක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒක විශේෂයෙන්ම ඉල්ලා අස් කරගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අද මම දන්නවා. මේ තිබෙන ඒවාට අවශ්‍ය ගල්, වැලි, තාර මේ සියලු දේ ගත්තාම අද ඒ පිරිවැය වැඩි වෙලා තිබෙනවා. නමුත් මේවායේ තවමත් මේ මැනුම් කටයුතු කරන්නේ, මුදල් වෙන් කරන්නේ ඉතාමත් පැරැණි ක්‍රමයකට. නමුත් මම හිතන්නේ නැහැ, මේ කියන තරම් පළාත් සභාවේ - ගරු මහ ඇමැතිතුමාත්, එහෙම අකටයුතු සිදු වෙනවා නම් ඒ ගැන සොයා බලා මහජන බදු මුදල් නිරපරාදේ අත යට හොරකම්වලට සිදු වන්න දෙන්නේ නැතිව ඒ සංවර්ධන මුදල්, මහජනතාවගේ බදු මුදල් සංවර්ධනයට යොමු කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 04.10]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම මා කැමැතියි, අද පෙරවරුවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා - එතුමා මේ වෙලාවේ නැති වුණත් මට මේ කාරණය කියන්න සිද්ධ වෙනවා. ඇත්ත වශයෙන්ම අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා, අගමැතිතුමා කිව්වා කියලා ගරු ප්‍රධාන ඇමැතිතුමාට සහාය දෙන්නය කියලා. ඒක හොඳයි. යහපාලන ආණ්ඩුව හැටියට ගරු ප්‍රධාන ඇමැතිතුමාට සහාය දෙන්න ඕනෑ. එහෙම අදහසක් අගමැතිතුමාගේ තිබුණා. කෙලින්ම වචනයෙන් නොකිව්වත්. හැබැයි, ගරු මහ ඇමැතිතුමා එළියේ ගිහිල්ලා කියන්නේ මොකක්ද? එළියේ ගිහිල්ලා කියනවා, එක්සත් ජාතික පක්ෂයයි, අගමැතිතුමායි මගේ කකුළෙන් අදිනවා. වැඩ කරන්න දෙන්නේ නැහැයි කියලා. මට තේරෙන්නේ නැහැ, මේක මොකක්ද කියලා.

කෙසේ වෙතත් ඒක මතක් කරන ගමන්, එතුමා අද උදේ මාධ්‍යයට දැඩි ප්‍රහාරයක් එල්ල කළා. මොකක්ද? මම කරපු ප්‍රකාශයක් පුවත්පතක තිබුණා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කරපු ප්‍රකාශ ආපසු ඇද ගන්නේ නැහැ. මම වගකීමෙන් ඒ ප්‍රකාශ කරන්නේ. එතුමා එක අවස්ථාවකදී කිව්වා, ලක්ෂ 24 යි දෙන්නේ කියලා. ඔව්. ලක්ෂ 24 යි. එක මන්ත්‍රීවරයෙකුට ලැබෙන්නේ. ගිය අවුරුද්දේ මන්ත්‍රී ප්‍රතිපාදන මිලියන 460 ක් ලැබුණා. මේ අවුරුද්දේ මිලියන 254 යි. ඉතින් ඔය ගණන බෙදා ගන්න එක හරි සරළයි. ලක්ෂ 24 යි එක මන්ත්‍රීවරයෙකුට ලැබෙන්නේ. ඊට පස්සේ වෙන ප්‍රතිපාදන දෙන කථා අපි දන්නේ නැහැ. උපමාන පාදක ලක්ෂ 24 යි එක මන්ත්‍රීවරයෙකුට ලැබෙන්නේ. ඒක මම වගකීමෙන් කියනවා. ඉතින් ඒක වාර්තා කිරීම වැරැදිද කියන ප්‍රශ්නය කියන්න කෝ? ඒක වාර්තා කිරීම වැරැදිද කියන්න කෝ? ඒක වාර්තා කිරීම වැරැදි නැහැ. මොකද, වාර්තාකරුවාට වාර්තා කරන්න තිබෙන අයිතිය අනුල්ලංඝනීය එකක්. ඒක ඔහුගේ වරප්‍රසාදයයි. හැබැයි, මේ පළාත් සභාවේ වැරැදි දෙයක් කියැවුණොත්, ඒ වැරැදි දේ ඉවත් කිරීම අපේ වගකීමක්. ඒ වැරැදි දේ හැන්සාඩ් එකට යන එක වළක්වන එක අපේ වගකීමක්. හැන්සාඩ් එකට යන්න එපාය කියලා නියෝගයක් දුන්නාට පස්සේ අන්න ඒක පුවත්පත්වල පළ කළා නම්, අන්න එතැන ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නැතිව අපි වැරැදියිකියලා නොකියපු කාරණයක් පුවත්පතක වාර්තා කළාට පස්සේ, අපට ඒක ප්‍රශ්න කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.එහෙමනම් හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න ඕනෑ. ඒක නිසා මේ එතුමාගේ අවශ්‍යතාවය. තමන්ට ඕනෑ දේ නොකියැවුණා කියලා මෙතැන කථා කරනවා. ඊළඟට එතුමා කිව්වා, එතුමාගේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය ගැන කිව්වා. මේ එතුමාගේ වාර්තාව. එතුමාගේ නිලධාරීන් දෙන එක. 45% යි. අපට ඕනෑ එකක් කිව්වේ නැහැ. ඒ නිසා ඒක මා නිවැරැදි කරන්න ඕනෑ. සමහරවිට එතුමා කියන්න උත්සාහ කළේ, මම කියලා පත්තරේ දා ගත්තාය කියලා. එතුමා කියන කොට තමයි අද ඒක පත්තරේ දාලා කියලා මම දන්නේ. ඊළඟට එතුමා මේ වාළම්පුරි ගැන කිව්වා. වාළම්පුරි ගැන මම විතරක් නොවෙයි. සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා බරපතළ කාරණයක් විස්තර කළා. මොකක්ද? නමෝ නාරායන. මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමේදී මේ සියලු නීති රෙගුලාසි කඩලා තිබෙනවා. මේක බරපතළ කාරණයක්. එහෙම පුද්ගලයෙක් තමයි සංචාරක මණ්ඩලයේ සභාපති වෙලා ඉන්නේ. ඒ නිසා -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ඊයේත් මේ වාගේ ප්‍රකාශයක් කළා. කාගේ හරි පුද්ගලික ව්‍යාපාර අපට අදාළ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ මගේ කාලය. ඔබතුමාගේ වෙලාවේදී ඔබතුමා උත්තර දෙන්න. ඔබතුමා කියපු කාරණය ගැන මම කිව්වේ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔබතුමා අයවැය ගැන කථා කරන්න කෝ. කොයිතරම් විෂයයන් තිබෙනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට තිබෙන විෂයයන් ගැන කථා කරන්නේ. ඒක වාර්තා කිරීම වැරැදි නම් ඔබතුමාට කියන්න තිබුණේ, ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මොනතරම් විෂයයන් තිබෙනවාද? ඒවා කථා කරන්න කෝ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේකේ කථා කරලා හැන්සාඩ් ගත වුණාට පස්සේ වාර්තා කරන්න පුළුවන් කියන එකයි මම කිව්වේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා,

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පොදු සාකච්ඡාවේදී තමුන්නාන්සේලා ඒ සම්බන්ධයෙන් පුළුල්ව කථා කරලා තිබෙනවා. දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයය පථයට අදාළව කථා කරනවා නම් තමයි මේ සභාවට හොඳ පණිවුඩයක් යන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ නිසා පොදු සාකච්ඡාවේදී කියැවුණු කාරණා යළි යළිත් පුන පුනා කීම අවශ්‍යයි කියලා මූලාසනය හැටියට මම විශ්වාස කරන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශයේ තිබෙන ප්‍රශ්න ටික කැටි කරලා දක්වනවා නම්, මේ කසළ අර්බුදය, ඒ වාගේ ඉඩම් කට්ටි කිරීම. ඉඩම් ගොඩ කිරීම. නීති විරෝධී ලෙස වැලි සේදීම. ප්‍රාදේශීය සභා එහෙම නැත්නම් පළාත් පාලන ආයතන දේශපාලනීකරණය වීම. දැන් බලන්න. සමහර පළාත් පාලන ආයතනවල සභාපතිවරු නැහැ. විසුරුවා හැරලා. හැබැයි, සේවකයන් දේශපාලන කටයුතුවලට යොදා ගන්නවා. මේ ළඟදී අපේ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රැස්වීමක් තිබුණා. ඔක්කොම කොඩි දැම්මේ, සියලු වැඩ කළේ ප්‍රාදේශීය සභාවේ සේවකයන්. ඇහුවාම කියනවා, සභාපතිතුමාගේ වැඩක් කියලා. මෙතුමා මට කොටිකාවත්ත කුණු කසළ අංගනය නවීකරණය කරන්න ලක්ෂ 50 ක් දුන්නා. ඒක ඉතාම මන්දගාමී විධියට යන්නේ. ඒකේ ඉන්න නිලධාරීන්ගෙන් ඇහුවාම මොකක්ද කියන්නේ? නිලධාරීන්ගෙන් ඇහුවාම කියනවා, පල්ලෙහා සේවකයන් වැඩ කරන්නේ නැහැයි කියලා. එතකොට සේවකයන්ගෙන් ඇහුවාම කියන්නේ මොකක්ද? මේ අපට කරගන්න විධියක් නැහැ. අපි මේ සභාපතිතුමාගේ පෝස්ටර් ගහනවා. හැබැයි, සභාපතිතුමා බලයේ නැහැ.

මම කියන්නේ, මේ දේශපාලනීකරණයට යටත්වීම ගරු ප්‍රධාන ඇමැතිතුමනි, වළක්වන්න ඕනෑ. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබතුමාට ආයතන 48 ක් තිබෙනවා. ඒ නිසා මේවා තවදුරටත් දේශපාලනය මත ක්‍රියාත්මක කිරීම වළක්වන්න ඕනෑ. නැත්නම් මේ විසුරුවා හැර තිබෙන වේලාවේදී තවත් මේවා අරාජික වෙනවා. මේ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්ට වැඩ කරගෙන යන්න බැහැ. ඇයි? එළියේ ඉන්න දේශපාලන බලවේගය විසින් මේ අයව මෙහෙය වන්නේ. මෙතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා මීට වඩා වැඩි කාලයක් මේ ගැන අවධානය යොමු කරලා කටයුතු කරන්න ඕනෑය කියලා මා විශ්වාස කරනවා.

ඊළඟට දැන් ප්‍රාදේශීය සභා හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති. මෙතුමා දැන් මුදල් දුන්නා. ලක්ෂ 15 බැගින් දුන්නා. බොහොම හොඳයි. මටත් ඒ ලක්ෂ 15 ලැබුණා. මෙතුමා දන්නවා. ලක්ෂ 7 ½ බැගින් පාරවල් කොටස් දෙකක් ගල් අතුරන්න කියලා ඒ කොන්ත්‍රාත් එක එව්වේ කොහෙටද? ප්‍රාදේශීය සභාව හරහා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කාරයෝ දෙන්නෙකුට. පාර හැදුවාට පස්සේ මට මිනිස්සු දුරකථන ඇමැතුම් දීලා කිව්වා, මන්ත්‍රීතුමා මේකේ ප්‍රමිතිය නැහැයි කියලා. එතකොට මම බලන්න ගියා. ගිහිල්ලා ඉවර වෙලා මම අපේ මහ මාර්ග ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. එතුමා දන්නවා.

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ගරු ඇමැතිතුමා, මේ පාරවල් දෙකේ ප්‍රශ්නයක් තිබෙනවා. ඉංජිනේරුවන් යොදවා මට පරීක්ෂා කර දෙන්න කියලා. ඊට පසුව ඉංජිනේරුවන් පරීක්ෂා කරලා කිව්වා, මේ පාරවල් දෙකම ප්‍රමිතියට නැහැයි කියලා. ඊට පස්සේ මම එතුමාට කිව්වාම එතුමා කිව්වා. නැහැ මේක කියන්න ඕනෑ ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියලා. ගරු ප්‍රධාන ඇමැතිතුමාට මම දුරකථනයෙන් කිව්වා. මම හිතන්නේ එතුමා ඒකට පියවර අරගෙන තිබෙනවා. නමුත් මම කියන්න හදන්නේ මොකක්ද දන්නවද? පළාත් පාලන ආයතනය හරහා මේ කොන්ත්‍රාත් එක භාර ගන්නේ, මේ කොන්ත්‍රාත් එක තවමත් භාර දෙන්නේ හිටපු සභාපති.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලක්ෂ 15 ක් අපට දුන්නේ නැහැ නේ ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපට දුන්නේ ලියුමක් එවලා - ඇයි මේ හැම මන්ත්‍රීවරයෙකුටම ලියුමක් එවලා දුන්නේ. මම දන්නේ නැහැ. හැමෝටම දීලා තිබෙනවා. මම දන්නේ නැහැ. අපේ ගරු මහ ඇමැතිතුමා කියන්න කෝ. ඔබතුමා මට විතරක්ද දුන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔක්කොටම දුන්නා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔක්කොටම දුන්නා. ඒක නිසා මේක බරපතළ තත්ත්වයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. මීට පස්සේ ප්‍රාදේශීය සභාවට කොන්ත්‍රාත් දෙන කොට මේ ගැන සැලකිලිමත් වෙන්න. මම ඉල්ලීමක් කළා, මේ කොන්ත්‍රාත්කාරයෝ දෙන්නා අසාදු ලේඛන ගත කරන්න කියලා. ඒ විතරක් නොවෙයි. මීට පස්සේ එහෙම පළාත් පාලන ආයතනවලට දෙනවා නම් නිසි අධීක්ෂණය යටතේ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. අපි දන්නවා, පළාත් පාලන කොමසාරිස්තුමියට මේක තනියෙන් කරන්න බැහැ. එතුමියත් අසරණයි. එතුමියට සමහර දේවල් කිව්වාම එතුමිය කියනවා, මම නිලධාරියාට කිව්වා. නමුත් ඒක කෙරෙන්නේ නැහැ. වෙලා තිබෙන්නේ මොකක්ද? මේකට දේශපාලන මැදිහත්වීම තවම තිබෙනවා. ඒ නිසා මේක වැළැක්කුවේ නැත්නම් මේ කාරණය ඉස්සරහාට යන්නේ නැහැයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ.

ඊළඟට මේ කසළ කළමනාකරණය ගැන කථා කළා. දැන් කොළොන්නාවේ කසළ කළමනාකරණය ප්‍රශ්නය තවම තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කඩුවෙල කොන්ත්‍රාත් දෙන්නෙත් එහෙමයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කඩුවෙල එහෙමද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හිටපු අය මගේ ව්‍යාපෘති දුන්නේ යාළුවෙකුට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

යාළුවෙකුට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමාවෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කසළ කළමනාකරණය ගැන කථා කළා. කොළොන්නාවේ ප්‍රශ්නය එහෙමම තිබෙනවා. මාසයකින් කොළොන්නාවේ ප්‍රශ්නය විසඳනවා කියලා අගමැතිතුමා පොරොන්දුවක් දුන්නා. අපි කිව්වා, නැහැ මාස තුනක් දෙන්නම් කියලා. ඊළඟටදැන් කොළොන්නාවේ ප්‍රශ්නයට තව විරෝධයක් ඇවිල්ලා තිබෙනවා. දැන් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එංගලන්තයේ ඉඳලා කෙනෙක් ගෙනැල්ලා ගිවිසුමක්

අත්සන් කළා කිව්වා. එතුමා ලියුමක් දුන්නා. ඒක අපි ටෙලිවිෂන් එකෙන් දැක්කා. එතුමා ඒ පිළිබඳව ඊට කලිනුත් කථා කළා. හැබැයි, අපි නිලධාරීන්ගෙන් ඇහුවා. සභාපතිතුමියගෙන් ඇහුවා. කසළ කළමනාකරණය- හැබැයි, ඒ ගොල්ලෝ කිව්වා, අපි දන්නේ නැහැ එහෙම ලියුමක් ගැන කියලා. හරි. එතකොට ඒ ලියුම (බාධා කිරීමක්) ඔබතුමා, දීපු ලියුම ගැනයි මම කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

දැන් බොරුවට ලියුමක් ගැන කථා කරන්න ඕනෑ නැහැ නේ මන්ත්‍රීතුමා. ඕන කෙනෙක් දන්නවා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ඒක අරන් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා කිව්වා නේ ලියුමක් දුන්නාය කියලා. ඔබතුමා එස්.කේ.පී. කියන සමාගම ගේන්න සභාවෙන් අවසර ගත්තා නේ? ඔබතුමාට මේ සභාවට ගෙනැල්ලා මට අවසර දෙන්න කියලා කිව්වාද? නැද්ද?ඇයි ඔපමණ කේන්ති යන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔබතුමා කරපු වැඩ අපි දන්නේ නැද්ද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා, ප්‍රධාන අමාත්‍යතුමා - මේ සභාවේ සම්ප්‍රදායක් තිබෙනවා. ප්‍රධාන ඇමතිවරයා යම්කිසි දෙයක් කියනවා නම් ඒකට ඇහුම්කන් දෙන්න ඕනෑ. මම අවස්ථාවක් දෙන්නම්.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මෙතුමා කොරියාවේ ගිහිල්ලා කරපු වැඩේ අපි දන්නවානේ? මෙතුමා මොනවා කරලාද මේ සභාවේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාගේ වෙලාවේදී ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, සාවද්‍යානව පැහැදිලි කිරීමක් කරන්න, ප්‍රධාන ඇමතිතුමාට අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීතොටමුල්ලේ කුණු කන්ද අපට අයිති නැහැ. ඒක මෙතුමා දන්නවා. මෙතුමා බබාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම්, ඔබතුමා මොකටද මීතොටමුල්ලේ ගිහිල්ලා ලියුමක් දුන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

අපි ඒ වෙලාවේ ඒ ලියුම දුන්නේ - නමුත් ආර්ථික කටයුතු අමාත්‍යාංශය දැන් ඒක භාර අරගෙන තිබෙනවා. මේ සභාවේ මේ විවාදයට මොන තරම් දේවල් කියන්න පුළුවන්ද? මෙතුමා මොනවාද මේ කියන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා හැම තැනම ගිහින් කියනවා නේ? කුණු කන්ද ඕනෑය කියලා. ඔබතුමා ඒකට අයිතිය කියනවා නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරුමන්ත්‍රීතුමා, දැන් එතුමාගේ කරුණු පැහැදිලි කිරීම කළා. දැන් ඔබතුමාගේ කථාව කර ගෙන යන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ කුණු කන්ද ප්‍රශ්නය එහෙම්මම තිබෙනවා. මේ මන්ත්‍රීවරු සියලු දෙනාම කථා කළා මේ කුණු ප්‍රශ්නය ගැන. අපි කියන්නේ, මේකට විසඳුමක් ඕනෑ. ඒ නිසා මේ විසඳුම සොයන්න ඉස්සරහාට යන්න ඕනෑ.

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරිත භූමි වැඩි කිරීමේ ව්‍යාපෘතියත් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, හරිත භූමි වැඩි කරනවාය කියලා මොකක්ද කරන්නේ? ඉඩම් කට්ටි කරනවා. දැන් මම හොඳ උදාහරණයක් කියන්නම්. මොකක්ද උදාහරණය? බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අක්කර 25 ක ඉඩමක් තිබුණා. මේක අයිති වුණේ, දූම්කොල සමාගමට. මේ ඉඩම රක්ෂිතයක් වාගේ තිබුණේ. කැලේ වාගේ තිබුණු ඉඩමක්. මේක කැඩුවා පර්චස් 8.5 ගණනේ කොටස් 265 කට. හැබැයි, මේක කඩන්න ඕනෑ, 12.5 ට. මොකද වෙන්නේ? ඉඩම් කට්ටි 265 කට කැඩුවාම ළිං 265 ක් කපනවා. මේවා පාරම්පරික ප්‍රදේශ. මේකෙන් පාරම්පරික සියලු ජල උල්පත් සිඳී යනවා. අක්කර 25 ක මේ ඉඩමේ ස්වභාවික වැව් දෙකක් තිබුණා. හැබැයි, මේ ඉඩම කඩන්න අවසර දුන්නා. කොහොමද අවසර දුන්නේ? සල්ලි අරගෙන. ඒ නිසා ප්‍රධාන ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ ගැන සොයලා බලලා පරීක්ෂණයක් කරන්න. නැත්නම් මේකේ සියලු තොරතුරු හෙළි කරනවා. මේකට සල්ලි අරගෙන කවුද මේ අවසරය දුන්නේ? කොහෙන්ද මේ අවසරය ගත්තේ? දැන් සමහර පළාත්වල කියනවා, ගම්පහ දිස්ත්‍රික්කයේ එහෙම මේ ඉඩම් කට්ටි කඩනවා නම් ගිහිල්ලා ලොක්කෙක් හමු වෙන්න ඕනෑලු. ඒ නිලධාරීන් කියනවාලු මේ ඉඩම් කට්ටිය කැඩීම ගැන අපට තීරණයක් ගන්න බැහැ. පළාත් සභාවේ එක්කෙනෙක් ඉන්නවා. එයාගෙන් ගිහිල්ලා අවසර අරන් එන්න ඕනෑ කියලා. එතකොට අපට ආරංචි විදියට කෙනෙක් මේ බිලූ මවුන්ටන් කියන සමාගමෙන් රුපියල් ලක්ෂ 60 ක් අරගෙන තිබෙනවා, මේ ඉඩම් කට්ටි කඩන්න අවසර දෙන්න. නීතියට පිටින් මේක කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුද මේක කළේ? ඒක තමයි අපිත් අහන්නේ? ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නම කියන්න නොවෙයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ ගැන සොයලා බලන්න. මේකේ නීතිය කඩ වෙලාද නැද්ද කියලා. වෙලාවට නම හෙළි කරන්නම්. එතකොට ඔබතුමා පරීක්ෂණයක් කරන්න කෝ?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

පළාත් පාලන ආයතනය මොකක්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක තිබෙන්නේ යක්කල වීරඟුල. අත්තනගල්ලට අයිතියි. PTC සමාගමට අයිති ඉඩම.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඉඩම පිළිබඳව අපට වාර්තා වෙලා, අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා යෝජනාව ගෙනැල්ලා, පර්චස් දොළහ මාරට කඩන්න තමයි අපි තීරණය කරලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ කියන්නේ පර්චස් දොළහ මාරට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි. බොහොම හොඳයි. ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සමහර ඉඩම්වල බදු ගන්නේ නැහැ. පළාත් පාලන ආයතන බොහොමයක තිබෙන ප්‍රශ්නය තමයි ඉඩම් බදු ගන්නේ නැති එක. ගිණුම් කාරක සභාවේ අපේ සභාපතිතුමා ඉන්නවා. සමහර ඉඩම්වල බදු ගන්නේ නැහැ. බලාගෙන යන කොට පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය සභා මේ ඉඩම් ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. බදු අරගෙනත් නැහැ. ඒ නිසා මේවා ගැන මීට වඩා පරික්ෂා කරන්න. මීට වඩා අවධානයෙන් ඉන්න. බදු අය කර ගන්න කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.24]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ විශේෂයෙන්ම පළාත් පාලනය, ආර්ථික ප්‍රවර්ධනය, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන, ජලාපවාහන හා සංචාරක අමාත්‍යාංශය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ හැමෝම මන්ත්‍රීවරු කිව්වා වාගේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා බොහොම දක්ෂ, කාර්යක්ෂම ප්‍රධාන ඇමතිවරයෙක්. මම හිතන්නේ, ප්‍රධාන ඇමතිතුමාට මේ විෂයයන් ටික මදි වාගේ. ප්‍රධාන ඇමතිතුමාට මීට වඩා විෂයයන් දෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. මොකද, එතුමා වැඩ කරන්න පුළුවන් කෙනෙක්. ඒ නිසා මීට වඩා විෂයයන් දුන්නොත් තව ගොඩක් වැඩ කරයි කියලා විශ්වාස කරනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ. මේ අමාත්‍යාංශය යටතේ අද ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පැවරිලා තිබෙන - (බාධා කිරීම්) අධ්‍යාපන අමාත්‍යාංශය පවරලා දුන්නාට කමක් නැහැ. වැඩ කරන්න පුළුවන්. (බාධා කිරීම්) නැහැ. ඒක එළියෙත් කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රධාන ඇමතිතුමාගේ විෂයයන් යටතේ තිබෙන ප්‍රධානම විෂය තමයි පළාත් පාලන විෂය. මේ පළාත් පාලන විෂය සම්බන්ධව කථා කරද්දී අද තිබෙන ප්‍රධාන ගැටළුව පිළිබඳව කථා නොකර මේ විෂය ගැන කථා කරන්න පුළුවන්කමක් නැහැ. පළාත් පාලන ආයතන විසුරුවලා හැරලා ලබන අවුරුද්දේ මාර්තු මාසේ 19 වැනිදාට හරියටම අවුරුදු දෙකයි. අවුරුදු දෙකක් වෙනවා පළාත් පාලන ආයතන විසුරුවලා. මම හිතන්නේ, ඉතිහාසයේ කවදාවත් මැතිවරණයක් නොතියා, පළාත් පාලන ආයතන විසුරුවලා, මේ තරම් කාලයක් පළාත් පාලන ආයතනවලට මහජන නියෝජිතයෝ පත් කරලා නොතිබුණු කාලයක් තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලනය 100% ක් Devolved subject එකක්. මේක 100% ක් බෙදුනු බලයක්. මේ බලය එහෙම්පිටින් තිබෙන්නේ, පළාත් සභාවලට. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පළාත් සභා ලැයිස්තුව ඇතුළේ තමයි පළාත් පාලන ආයතන තියලා තිබෙන්නේ. මේක සමගාමී ලැයිස්තුවේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම තිබෙන්නේ, පළාත් සභාවට. ඒ නිසා පළාත් සභාව ඇතුළේ ඉන්න පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට බරපතළ වගකීමක් පැවරිලා තිබෙනවා. මේ මැතිවරණ පැවැත්වීමේ කටයුත්තේදී තමන්ගේ නායකත්වය, දායකත්වය දෙන්න. අද පළාත් පාලන විෂයයට මධ්‍යම ආණ්ඩුවේ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයෙක් ඉන්නවා. ඒ අමාත්‍යවරයා විවිධ සාකච්ඡා තියනවා. මාධ්‍ය සාකච්ඡා තියනවා. හමු තියනවා. පුවත්පත්වලට ප්‍රකාශයන් කරනවා. මේ සියල්ල කරන්නේ, ශ්‍රී ලංකාවේ මූලික ව්‍යවස්ථාවට විරුද්ධව. ඒ නිසා අපේ පළාත් සභාවේ ඇමතිතුමා මැදිහත් වෙලා මේ කටයුත්තට දායකත්වය දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවල මැතිවරණ තියන්න මැතිවරණ ක්‍රමය සමානුපාතික නියෝජනය නොවෙයි. කේවල කොට්ඨාශ මැතිවරණ ක්‍රමය කියන එක පාර්ලිමේන්තුවේ සම්මත වෙලා ඉවරයි. ඒ සඳහා දැන් සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කරලා, සීමා නිර්ණය කිරීම හමාර කරන්න තිබෙද්දී, ඒක හිතා මතා ප්‍රමාද කරමින් ඉන්නවා. ඒ ප්‍රමාද කරමින් සිටිද්දී අපි කනගාටු වෙනවා. මේ සමානුපාතික මැතිවරණ ක්‍රමය දූෂිත එකක් කියලා මේ රටේ ජනතාව තමන්ගේ ප්‍රැක්ටිස් එකෙන් දන්නවා. තමන් අත්දැකලා දන්නවා. හැබැයි, එහෙම තියෙද්දී මම දැක්කා ඊයේ පෙරෙයිදා දවසක පිදෙල් කැස්ත්‍රෝ සමරන්න සමරු උත්සවයක් විහාර මහා දේවී උද්‍යානයේ තියන වෙලාවේ, ජනතා විමුක්ති පෙරමුණේ නායකයා -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

මේ රටට අවශ්‍ය කරන පරමාදර්ශී දේශපාලඥයා හදන්න අපි කටයුතු කරනවා කියලා එක්සත් ජාතික පක්ෂයේ ලණුව ගිලලා තිබුණා. එතුමා පාර්ලිමේන්තුවේ කිව්වා, නැහැ. නැවත වතාවක් සමානුපාතික නියෝජන ක්‍රමයට මේ මැතිවරණය තියන්න ඕනෑය කියලා. නැවත වතාවක් -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂයේ නායකතුමාගේ නම කියලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පක්ෂ නායකතුමාගේ නම කිව්වා කියලා ඔබතුමාට අයිතියක් නැහැ, ඒ ගැන කථාකරන්න. කරුණාකර වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සංවිධායක. මේ මැතිවරණය අපි දූෂිත කර ගෙන නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නම -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නිසා විවේචන ස්වරූපයෙන් එතුමාගේ නම සඳහන් නොකර කථා කරන්න. (බාධා කිරීම්)

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නම හැන්සාඩ් එකේ කීම උචිත නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බාධා කරන කාලය මට ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රතු අලි පැටියා කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ නම අයින් කර ගන්නවා. මම කියනවා, රතු අලි පැටියා කියලා. රතු අලි පැටියා එහෙම කිව්වා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

රතු අලි පැටියා කියන්නේ කවුද? අපි ඒක අර්ථ නිරූපනය කර ගන්න ඕනෑ. කවුද? සතෙක්ද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමා එහෙම කිව්වා. ඒ නිසා අද නැවත වතාවක් මේ කේවල ඡන්ද කොට්ඨාශ ක්‍රමය - මේ රටේ ඡන්ද දායකයාට පහසුවක් වන, මේ රටේ තිබෙන දූෂණය නැති වන මැතිවරණ ක්‍රමයකට යන්න කරපු උත්සාහය, නැවත වතාවක් ආපස්සට හරවන්න එක්සත් ජාතික පක්ෂයේ උවමනාව වෙනුවෙන් පෙනී සිට තිබෙනවා. ඒක තමයි ඒ අයගේ තිබෙන පරමාදර්ශී දේශපාලනය කියලා අපි විශ්වාස කරනවා. කොහොම වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන විෂය ගැන කථා කරද්දී කියන්නට ඕනෑ. පළාත් පාලන ආයතන පිළිබඳ සොයා බැලීම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලට සහ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලවලට තිබෙන වගකීම බරපතළ එකක්. නමුත් ඒක නිසියාකාරව ඉෂ්ට වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඔබතුමා දන්නවා. අවුරුදු තුනක්, තුනහාමාරක් තිස්සේ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට පළාත් පාලන ආයතන ගෙන්වන්න පුළුවන්කම තිබුණේ නැහැ. අවුරුදු හතක් විතර දැන් ගෙන්වන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතන අධීක්ෂණය වීමේ ක්‍රියාවලිය අද සිද්ධ වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාවටත් පළාත් පාලන ආයතන කැඳවන්නේ ඉතාම කලාතුරකින්. තෝරා ගත් එකක් දෙකක්. අපට ගිණුම් කාරක සභාවේ පුළුවන් වුණා, අවුරුදු හතකට පස්සේ කැස්බෑව මහ නගර සභාව

ගෙන්වන්න. මීට මාසයකට කලින් ගිණුම් කාරක සභාවට ගෙන්වපු වෙලාවේ අපි දැක්කා, බරපතළ දූෂණ, වංචා රාශියක් සිද්ධ වෙමින් තිබෙනවා. ඒවා පිළිබඳව අධීක්ෂණ ක්‍රියාවලිය සිද්ධ වෙලා නැහැ. මේ අධීක්ෂණ ක්‍රියාවලිය නොවන නිසා තමයි මේ දූෂණ වංචා බරපතළ විධියට සිද්ධ වෙන්නේ. පළාත් පාලන ආයතන වියදම් කරන මුදල්, පළාත් පාලන ආයතන මහජනතාවත් එක්ක සම්බන්ධ වෙලා කරන සමහර කටයුතු සියල්ලම නිසි අධීක්ෂණයක් නැතිව වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන මහජනතාවට ඉතාම සමීපතම ආයතනය. 1991 හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා පළාත් පාලන ඇමතිවරයා විධියට හදපු මේ පනත ලංකාවේ පුංචි ආණ්ඩු කරවන්න තිබෙන හොඳම පනත විධියට තමයි අපි පිළිගන්නේ. මේක ඉතාම ශක්තිමත් පනතක්. ග්‍රාමීය රාජ්‍යයන් ඉතාම සක්‍රීයව ක්‍රියාත්මක වන පනතක්. හැබැයි, ඒක නිසියාකාරව ක්‍රියාත්මක වීම අධීක්ෂණය වෙන්නේ නැහැ. අද පළාත් පාලන ආයතනයකට මහජනතාව කවුරුන් හෝ ගියොත් ඔහු පළාත් පාලන ආයතනයෙන් එළියට එන්නේ, ඉතාම කලකිරීමකින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල වැඩ කරන තාක්ෂණික නිලධාරීන් ඉතාම දූෂිත විධියට තමයි ඒ අයගේ රාජකාරී ඉෂ්ට කරන්නේ. මේවා අධීක්ෂණය වෙන්නේ නැහැ. මහජනතාව බරපතළ විධියට පීඩාවට ලක් කරනවා. අද ඉඩම් සැලසුමක් සම්මත කර ගන්න ගියොත්, ඒ අයට ඉඩම් සැලසුම සම්මත කර ගන්න ලැබෙන්නේ නැහැ. තමන් හිතන නිසි කාලවකවානුවේ ඒක කර ගන්න ලැබෙන්නේ නැහැ. බොහෝ වෙලාවට මේ අනුමත කිරීම් සඳහා යම් මූල්‍යමය සහනයන් මේ නිලධාරීන් බලාපොරොත්තු වෙනවා. ඒ නොදෙන හැම වෙලාවේම ඔවුන්ව රස්තියාදු කරලා, ප්‍රමාද කරලා, ඔවුන්ව අධෛර්යමත් කරලා මේ ව්‍යාපෘති අනුමත කරලා දෙන එක දවසින් දවස ප්‍රමාද කරනවා. මේ ප්‍රමාද කිරීම් සිද්ධ කරන්නේ, නිසි අධීක්ෂණය නැති නිසයි.

අපි පළාත් පාලන ආයතනය ගෙන්වපු වෙලාවේ දැක්කා, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව නගර සභාවේ කෙරිලා තිබුණු බොහෝ කටයුතු ගැන දැනගෙන හිටියේ නැහැ. මීට අවුරුදු තුනහමාරකට විතර කලින් කෝටි දෙකහමාරකට වැඩියෙන් වියදම් කරලා තිබුණු හොඳම තානායම කඩලා දාලා, කැස්බෑව නගර සභාව තානායමක් හදන්න මූලික කටයුතු කරලා තිබෙනවා. ඒ මුදල එතැනින් ඉස්සරහාට ගිහිල්ලා නැහැ. අර වියදම් කරපු මුදල අපතේ ගිහිල්ලා. ව්‍යාපෘතිය නතර වෙලා. ඒක සොයා බලන්නේ නැතිව ඒක එහෙම්ම නතර වෙලා තිබෙනවා. එහෙම ව්‍යාපෘති තවත් පළාත් පාලන ආයතන ඇතුළෙත් තිබෙන්න පුළුවන්. ඒ නිසා පළාත් පාලන ආයතන අධීක්ෂණ ක්‍රියාවලිය මීට වඩා ශක්තිමත්ව සිද්ධ වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් වෙන්නේ, ඒකේ දැවැන්ත මහජන පීඩාව ජනතාව විසින් භුක්ති විඳිනවා. මැතිවරණ නොතියා තිබීමෙනුත් මේ අපරාධය ජනතාවට සිද්ධ වෙනවා.

අද පළාත් පාලන ආයතනවල පාරවල් හැදෙන්නේ නැහැ. පළාත් පාලන ආයතන ඇතුළේ වීදි ලාම්පු නඩත්තුව සිද්ධ කරන්නේ නැහැ. පළාත් පාලන ආයතන ඇතුළේ සුසාන භූමි නඩත්තුව සිද්ධ කරන්නේ නැහැ. මේ කිසිම මහජන ක්‍රියාවලියක් පළාත් පාලන ආයතන ඇතුළේ නිසියාකාරව සිද්ධ වෙන්නේ නැහැ. පසුගිය සතියට එහා සතියේ අපේ පළාත් සභා න්‍යාය පත්‍රයේ ප්‍රශ්න ගණනාවක් තිබුණේ, පළාත් පාලන ආයතනවල නිලධාරීන්ට විරුද්ධව දාපු ප්‍රශ්න. ඒ අය කරපු අකටයුතුකම් පිළිබඳ ප්‍රශ්න. මේ සියල්ල මතු වෙන්නේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා. ඒ නිසා පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරවන්න මේ රජයට බල කරන්න, පළාත් සභාවේ ඇමතිවරයා විධියට අපේ ප්‍රධාන අමාත්‍යතුමාට පළාත් සභාවල පළාත් පාලන විෂය භාරව ඉන්න අනික් සියලුම ඇමතිවරුත් එක්ක ලොකු සටනක් කරන්න වෙනවා. එහෙම නැත්නම් ඒකේ පීඩාව ජනතාව දිගින් දිගටම භුක්ති විඳිනවා. පළාත් පාලන විෂය ගැන කථා කරද්දී ඒ කාරණය මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට සංචාරක කර්මාන්තය පිළිබඳ කාරණා යම් ප්‍රමාණයක් අපි මතක් කරන්න ඕනෑ. ඒ මම මේ පළාත් සභාවේ හිටපු සංචාරක ඇමතිවරයෙක් නිසා. මට මතකයි. එදා අපි උත්සාහ කළා සංචාරක කර්මාන්තය වෙනුවෙන් සංචාරක කර්මාන්තය පුහුණු කරන පාසලක් ආරම්භ කරන්න. මට මතකයි, මූලාසනයේ සිටින ඔබතුමා ඒ වැඩ පිළිවෙළ ඉස්සරහාට

ගෙන යන්න උත්සාහ කළා. සංචාරක පුහුණු පාසල. අද වන කොට ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා ගරු මහ ඇමතිතුමාට අපි කියනවා, සංචාරක පුහුණු පාසල ස්ථාපිත කරන්න කටයුතු කරන්නය කියලා. බස්නාහිර පළාත විශේෂයෙන් සංචාරක ආකර්ෂණීය ප්‍රදේශයක් විධියට තිබෙන නිසා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ දකුණු වෙරළ තීරය. කළුතර සිට උඩහට යන වෙරළ තීරය. ඒ වාගේම මීගමුව වෙරළ තීරය. මේ සියල්ල සංචාරක කර්මාන්තය විශාල විධියට සිද්ධ වන ස්ථාන. ඒ ස්ථානවල සේවය කරන, සංචාරක කර්මාන්තයේ ඉන්න ශ්‍රමිකයෝ පුහුණු කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. බොහෝ වෙලාවට මේ සංචාරක කර්මාන්තයේ නියැළිලා ඉන්න සමහර අය නිසා සංචාරක ව්‍යාපාරයට සහනයක් නොවෙයි වෙන්නේ. සංචාරක ව්‍යාපාරයට හිරිහැරයක්, කරදරයක් වෙන්නේ. ඒ නිසා සංචාරක ව්‍යාපාරය අධෛර්යමත් වන තැනකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ සංචාරක කර්මාන්තය වෙනුවෙන්,බස්නාහිර පළාතේ සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන්. රුපියල් මිලියන 48 ක් වෙන් කරලා තිබෙනවා. මේ රුපියල් මිලියන 48 න් කරපු ව්‍යාපෘති ගණන සතුටු වෙන්න පුළුවන් ව්‍යාපෘති ප්‍රමාණයක් නොවෙයි. විශේෂයෙන් ඇමේසින් ශ්‍රී ලංකා කියලා මැගසින් එකක්. සංචාරක ව්‍යාපාරය පිළිබඳ පළ කරපු පොත. ඒ පොත කොයි තරම් ප්‍රමාණයක් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් බලපාන පොතක්ද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. ඒක කොයි තරම් ප්‍රමාණයක් සංචාරක ව්‍යාපාරයේ නිරත වෙලා ඉන්න, සංචාරක කර්මාන්තය වෙනුවෙන් වැඩ කරන ආයතනවලට දුන්නාද කියන ප්‍රශ්නය තිබෙනවා. බස්නාහිර පළාතේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කරන්න මේ පොතෙන් ගත් ප්‍රයෝජනය කොයි තරම් ප්‍රමාණයක්ද කියලා අපට දැනෙනවා. විශේෂයෙන් සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබඳව බස්නාහිර පළාතේ තිබෙන ඒවාට වැඩිය රට පුරා තිබෙන සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබඳව මේ පොතේ කථා කරලා තිබුණා. මම හිතන්නේ, ඊට වඩා වැදගත් වෙන්නේ, බස්නාහිර පළාතේ සංචාරක කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් තිබෙන ආකර්ෂණීය ස්ථාන පිළිබඳව හඳුන්වාදීම කරන්න. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සංචාරක කාර්යංශය විධියට බස්නාහිර පළාතේ - සංචාරක කර්මාන්තය වෙනුවෙන් කටයුතු කරද්දී මහා පරිමාණ සංචාරක ව්‍යාපාරය කෙරෙන තැන්වලට වැඩිය බස්නාහිර පළාතේ අභ්‍යන්තරයේ තිබෙන සංචාරකයින් ගමන් කරන ස්ථාන සංවර්ධනය කරන්න ගත යුතු ක්‍රියාමාර්ග තමයි වැඩි වශයෙන් බස්නාහිර පළාත කරන්නට ඕනෑ. ඒකේදී ප්‍රශ්නය මතු වෙන්නේ, බස්නාහිර පළාතේ සංචාරක කාර්යාංශය කොයි තරම් දුරට ඒ ස්ථාන සංවර්ධනය කරන්න මැදිහත් වුණාද කියලා. විශේෂයෙන්ම අපි දන්නවා. අපි ජීවත් වන අවිස්සාවේල්ල ආසනයේ ඉතාම සංචාරක ආකර්ෂණීය දිය ඇලි, ගංගා රාශියක් තිබෙනවා. මේ ස්ථානවලට විශාල වශයෙන් සංචාරකයෝ එනවා. මේ එන හැම කෙනාම පරිසරයටත්, ඒ වාගේම ස්වභාවික සෞන්දර්යයටත් විශාල හානියක් කරන පිළිවෙළට තමයි හැසිරෙන්නේ. ඒක නතර කරන්න පුළුවන්කම ලැබෙන්නේ, යම් ප්‍රමාණයකට අපේ සංචාරක කාර්යාංශය මැදිහත් වෙලා, ඒවා නතර කරන්න පුළුවන් ක්‍රියාමාර්ග ගැනීමෙන් විතරයි. එවැනි ක්‍රියාමාර්ග ගැනීමට සංචාරක කාර්යාංශය කොයි තරම් දුරට කටයුතු කරලා තිබෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. විශේෂයෙන් කැළි කසළ බැහැර කරන්න ස්ථානයක්, එහෙම නැත්නම් වැසිකිළි පහසුකම් එවැනි දේවල්. එහෙම නැත්නම් මේ ස්ථානවලට ළඟා වෙන්න පහසුකම් සලසන පුවරු ටිකක් මේ බස්නාහිර පළාතේ සංචාරක කාර්යාංශය ඉදි කරලා දෙනවා නම් ඒක විශාලවශයෙන් දේශීය සංචාරකයන්ට සංචාරය කිරීම සඳහාත්, සංචාරක ආකර්ෂණීය ස්ථානත් එක්ක යම් ප්‍රමාණයක් ජීවිතයට යම් වින්දනයක් ගන්න අවස්ථාවක් ලබා දෙන්නත් සහනයක් වෙනවා. එවැනි තැන්වලට සංචාරක දෙපාර්තමේන්තුව එළඹිය යුතුයි කියන කාරණය මතක් කරනවා. කාලය අවසන් නිසා කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, සංචාරක ව්‍යාපාරය පිළිබඳ කථා කරපු නිසා මට මූලාසනයේ ඉන්න අවස්ථාවේදී පොඩි අවස්ථාවක් ගන්න බලාපොරොත්තු වෙනවා. මම සංචාරක අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ අපේ බත්තරමුල්ල ප්‍රදේශයේ තිබෙන ඉතාමත් ආකර්ෂණීය වැව තමයි දකුණු තලංගම වැව. ඒක අපි ඉතාමත් මැනවින් සංචාරක පුරවරයක් හැටියට සංවර්ධනය කළා. නමුත් පසුගිය කාලයේ මීට අවුරුදු පහකට හයකට පෙර කාලයේ සිටම ඒක සම්පූර්ණයෙන්ම අත හැරලා දාලා තිබුණා.

ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවට ඒක අනුබද්ධ කරමින් ඔබතුමා ලබන වර්ෂයේදී ඒකට විශේෂ වැඩ පිළිවෙළක් යොදන්නය කියලා මම මූලාසනයේ සිටින වෙලාවේ ඉල්ලා සිටිනවා. මීළඟට අශෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමට විනාඩි 08 ක් තිබෙනවා.

[අ.භා. 04.38]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් දක්වන කොට පරිසර විෂය සම්බන්ධව තමයි මම වඩාත්ම අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ. මේ පරිසර විෂය සම්බන්ධව අපි කථා කරද්දී මධ්‍යම රජයට, එහෙම නැත්නම් පළාත් සභාවට, ප්‍රාදේශීය සභාවට කියලා මේ පරිසර විෂය වෙන් කරන්න බැහැ. අනික් බොහෝ විෂයයන් අපට අධ්‍යයනයේ පහසුව සඳහා හෝ ක්‍රියාත්මක වීමේ පහසුව සඳහා වෙන් කරන්න පුළුවන්. මේ වන කොට ගෝලීය වශයෙනුත් දැන් මේ කාරණය සලකනවා. පරිසර විෂය රටක් විධියටවත්, එහෙම නැත්නම් ප්‍රාදේශීය මට්ටමටවත් කථා කරන්නේ නැතිව, ගෝලීය වශයෙන් කථා කළ යුතුයි කියලා. තිරසාර සංවර්ධන ඉලක්කවලදී මේ සම්බන්ධව දීර්ඝ ලෙස කථා කරලා තිබෙනවා. ඒ සම්බන්ධව අපේ රජයත් 2016 නොවැම්බර් මාසේ 16 වැනිදා අත්සන් කරලා තිබෙනවා. මේ සම්බන්ධව කොහොමද කටයුතු කරන්නේ කියලා පොදු විෂයයක් විධියට සලකා ගෙන තමයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා අයවැය කථාවේදී ඉතාම වැදගත්කාරණයක් ඉතාමත් කෙටියෙන් කිව්වා. ඩෙංගු මර්දනයේදී ධූම කරනය සම්බන්ධව ප්‍රධාන අමාත්‍යතුමා සහ අමාත්‍යාංශය දරන මතය. දුමකරණය කරන්නේ නැහැ. ඒකට හේතුව, විශාල ජීවීන් ප්‍රමාණයක් අපේ රටේ අහිමි වෙනවා. ඒ නිසා ඩෙංගු මර්දනයේදී ජෛව විවිධත්වය අපි ප්‍රයෝජනයට ගන්න ඕනෑ. Biodivacity ජෛව විවිධත්වය එක ප්‍රයෝජනයට ගන්න ඕනෑය කියන කාරණය සඳහන් කළා. ඒ කාරණය මම වඩාත් ඉහළින් තවත් පැහැදිලි කිරීමක් විධියට, ඔබතුමන්ලා දන්නවා ඇති. ශ්‍රී ලංකාව තුළ සපුෂ්පික ශාක, මල් පිපෙන ශාක තිබෙනවා, 3154 ක්. මේ 3154 න් 894 ක් ම ලංකාවට ආවේණික ශාක. ඒ වාගේම කකුළු වර්ග. ගොඩ බිම සහ මුහුදේ ඉන්න කකුළුවන් වර්ග 51 ක් තිබෙනවා. මේ 51 න් 50 ක්ම ලංකාවට ආවේණික කකුළුවන් වර්ග. ඒ වාගේම ලංකාවේ මකුළු විශේෂ. 501 ක් තිබෙනවා. ඒ 501 න් 256 ක්ම ලංකාවට ආවේණික මකුළු විශේෂ. ඒ වාගේම ගොඩබිම ගොළුබෙල්ලන් විශේෂ වූ 253 න් 205 ක් ම ලංකාවට ආවේණිකයි. ඒ වාගේම මත්ස්‍ය විශේෂ 91 න් 50 ක් ම ලංකාවට ආවේණිකයි. ඒ වාගේම ගෝනුසු විශේෂවලින් 18 න් 14 ක් ම ලංකාවට ආවේණිකයි. එහෙම නම් ඉතාමත්ම හොඳින් පැහැදිලියි. ලංකාව ජෛව විවිධත්වයෙන් ඉතාම අනගි දිවයිනක්. ඒ නිසා වෙන රටක ගහක් කපනවාට වඩා, වෙන රටක අඩි 10 ක 15 ක වළක් කපනවාට වඩා ලංකාව බරපතළ පරිසර හානියක් කර ගන්නේ හිතුමතයේ ගොඩ කිරීම හෝ ඒ සම්බන්ධව මැදිහත් වීමෙන්. ඒ නිසා ශ්‍රී ලංකාව තුළ යම් ස්ථානයක් කැණීම් කරනවා නම්, යම් ස්ථානයක් ගොඩ කරනවා නම්, යම් ස්ථානයක කැළයක් සුද්ද කරනවා නම්, මහා රුක්ෂ ගහක් කපනවා නම්, ඒ සම්බන්ධව අපට වඩ වඩාත් හිතන්න බල කරලා තිබෙනවා. 2016 තිරසාර සංවර්ධන ඉලක්ක SDG එනම්, Sustainable Development Goal වලදී මේ සම්බන්ධව ඉතාමත්ම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ලංකාව ලෝකය විධියට ගත්තොත් එහෙම පරිසර විනාශයට දායක වෙලා තිබෙන්නේ ප්‍රමාණය අල්පයක්. හැබැයි, අප විසින් කරන පුංචි පරිසර විනාශයක් කියන්නේ, ඒක ලෝක පරිමාණයෙන් ගෝලීය උෂ්ණත්වයට කරන බරපතළ බලපෑමක්. ඒ නිසා මේ ජෛව විවිධයත්වය නිසා ශ්‍රී ලංකාවට විශේෂ ලකුණු ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා.

ඒ නිසා මෙන්න මේ ආශ්‍රයෙන් මීගමුව ප්‍රදේශයට ගියාට පස්සේ ඉතාමත් කනගාටුදායක සිද්ධියක් දකින්න පුළුවන්. ගැඹුරු මුහුදේ ඈසට පෙනෙන දුරින් පැය භාගයකට විතර සැරයක් නැවක් එනවා. මේ නැව මුහුදෙන් පා වෙලා තමයි ඒකේ උඩට විශාල ප්‍රමාණයක් ජේන්නේ. ග්‍රිනිච් රේඛාවෙන් උඩින් ජේන්නේ. හැබැයි, විනාඩි 20 ක් යන කොට මේ නැව වැලිවලින් පිරිලා මුහුදු මට්ටමටම එනවා. ඊට පස්සේ ඒ නැව එතැනින් පිටත් වෙනවා. නැවත නැවක් එනවා. මේ වැලි පොම්ප කරලා මේ නැව්වලට ගොඩ ගහලා, අර පෝට් සිටි එක ගොඩ කරන්න මෙතැනින් අරගෙන යනවා. විනාඩි 20 කට සැරයක් නැව පිරෙනවා. අපි කිමිදුම් කණ්ඩායමක් එක්ක ගිහිල්ලා

කිමිදිලා ඒ ස්ථානය පරික්ෂා කළා. විද්‍යාඥ කණ්ඩායමක් එකක්. අලියෙකුගේ හොඬක් වාගේ හෝස් ගණනාවක් එකට වැඩ කරලා තමයි මේ නැවට පොම්ප කරන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

නැව කාගේද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

නැව අයිතිකාරයා නම් මම දන්නේ නැහැ. මේ නැව වැඩ කරන්නේ චීන සමාගමක් විසින්. පෝර්ට් සිටි එක ගොඩ කිරීමේ ක්‍රියාවලිය තමයි සිද්ධ කරන්නේ. නැව කාගේද කියලා අපි දන්නේ නැහැ. එතකොට මේ ක්‍රියාවලිය සිද්ධ කරද්දී මුහුදේ ඉන්න පුංචි ජීවීන් කෝටි ගණනක් විනාශ වෙනවා. මේ විධියට වැලි ගන්න කියලා තිබෙන්නේ මුහුදේ සිට කිලෝ මීටර් 10 කට වඩා ඈතින්. හැබැයි, අපේ ඇසට පෙනෙන දුරින් තමයි - ඇසට පේන්නේ කිලෝ මීටර් හතරක් විතර. ඇහැට පේන දුරින්, ඉතාම පැහැදිලිව, නැවේ පාට පවා පෙනෙන දුරින් තමයි මේ වැඩේ ඉතා දැවැන්ත දෙයක් ලෙසට කරන්නේ. මේ විධියට වැලිවලින් ගොඩ කරලා පෝර්ට් සිටි එකේ ඉලක්ක සහගතව තිබෙන, ETI එකේ තිබෙන වාර්තාව අනුව ඒගොල්ලෝ කියුබ් මිලියන 60 කට වැඩි ප්‍රමාණයක් වැලිවලින් ගොඩ කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඊට අමතරව මෙගා පොලිස් යටතේ ගල්කිස්ස ප්‍රදේශය ගොඩ කිරීම සඳහා තවත් මිලියන 20 ක් වෙන් කරලා තිබෙනවා. අපරාදේ යන වැලි ප්‍රමාණය තිබෙනවා, වෙනම මිලියන 03 ක්. මේ ඔක්කොම එකතු කළාට පස්සේ කියුබ් මිලියන 90 කට වැඩි ප්‍රමාණයක් මේ විධියට මුහුදෙන් හාරලා ගොඩ කිරීම් කටයුතු කරනවා. මේ ගොඩ කිරීම තුළ සංඛ්‍යාලේඛනවලින් ගත්තාට පස්සේ අපට දකින්න ලැබෙනවා, මේ මිලියන ගණන ගොඩ කිරීමේදී මිලියන 65 ක් - වැලි කියුබ් එකක සාමාන්‍ය මිල රුපියල් 12,000 යි. අපි රු. 8,000 ක් කියලා හිතුවොත් ප්‍රවාහන වියදම් පැත්තකට දාලා වැලිවල මිල විතරක් ඩොලර් බිලියන 3.5 ක් වෙනවා. කළුගල් මේ විධියටම එතැනට ගොඩ කරනවා. කළුගල් කියුබ් එකක මිල රුපියල් හාරදාහක් ගත්තොත් එහෙම කළුගල් කියුබ් මිලියන 1.5 කින් ගොඩ කිරීම සිද්ධ කරනවා. එතැන මිල තවත් බිලියන 1.5 ක්. සම්පූර්ණ චීනයට අපේ රටේ ජනතාවගේ සම්පත් විධියට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය බිලියන 4.5 කට වැඩියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ සාරවත් කථාවක්. මම අගය කරනවා. හැබැයි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ. ඒ නිසා කාලය කළමනාකරණය කර ගන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ප්‍රධාන වටිනා සම්පත් ප්‍රමාණයක් මේ විධියට වැලි විධියට, කළු ගල් විධියට අපේ රටෙන් අහිමි වෙනවා. ජනතාවට ඒ චීන ව්‍යාපෘතිය යටතේ පෝර්ට් සිටි එකෙන් ලබා දෙන ප්‍රතිලාභය 1/3 කට ලඝු කරලා තිබෙනවා. හැබැයි, චීනය දාලා තිබෙන්නේ බිලියන 1.5 ක්. ලංකාවේ ජනතාවගේ සම්පත් වියදම් කරලා තිබෙනවා, බිලියන 4.5 ක්. බීච් සිටි එක ගත්තත් ලංකාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන්න ඕනෑ. පරිසර විනාශයේ දැවැන්ත හානියක් කරමින් මීගමුව ප්‍රදේශයේ සුරතල් මසුන් විධියට නොවෙයි. විසිතුරු මසුන් විධියට Ornamental Fish විධියට - සතුන් ඇල්ලීම ඒ කියන්නේ දිය ගැරඬියන්, සර්පයින් මුහුදෙන් එකතු කරලා, ඒගොල්ලෝ පිටරට යවනවා මල් විධියට වාස්වලට දාලා. ඒ හෝටල්වල ප්‍රදර්ශනය කරන්න. දවසයි ඒ සත්තු ඉන්නේ. මැරෙනවා. මේක අපරාධයක් විධියට සලකලා මේක තහනම් කරලා තිබෙනවා. හැබැයි, මේ ප්‍රමාණය වාගේ දහස් ගුණයක් මේ වැලි පොම්ප කිරීම නිසා අපේ මාතෘ භූමියෙන් අහිමි වෙනවා. විශාල කුඩා ජීවීන් කෝටි ගණනක්. ඒ වාගේම මේ පරිසර විනාශය තිරසාර සංවර්ධන වැඩ සටහන යටතේ ඉතාමත් පැහැදිලිව කියලා තිබෙනවා, ශ්‍රී ලංකාවට ඒ අදාළ ලකුණු ප්‍රමාණය අහිමි වන ක්‍රියාවලියක් විධියට.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

එතුමාට තව කාලය දෙන්න හැකියාවක් නැද්ද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මහ ඇමතිතුමා කාලය පිළිබඳ ගැටළුවක් තිබෙනවා. කාලය නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පාලින්ද නුවර ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ, බදුරලිය ප්‍රදේශයේ තිබෙනවා, අත්වැල්තොට කියලා ලස්සන දිය ඇල්ලක්. මේ දිය ඇල්ල කුඩා විදුලිබලාගාරයක් ලෙස නිර්මාණය කිරීම නිසා අද වන කොට මේක ඉතාමත් බරපතළ දැවැන්ත අවධානමකට පත් වෙලා තිබෙනවා. මේ ප්‍රදේශයේ මේ දිය ඇල්ල ගමන් කරලා අවසානයේදී එකතු වෙන්නේ පාලින්ද ගඟට. එහෙම නැත්නම් පැළෑඳ ගඟට එකතු වෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තවත් විනාඩි හතරක් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ බැගෑපත් ඉල්ලීම මත, ගරු මහ ඇමතිතුමාගෙන් දුන්නා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ දිය ඇල්ල තුළ ඉන්නවා ඉතාමත් වටිනා ජීවීන් 150 කට වැඩි මත්ස්‍ය වර්ග ප්‍රමාණයක්. මේ මත්ස්‍ය වර්ග ප්‍රමාණයෙන් රෙඩ් පොට්, ඒ කියන්නේ රතු දත්තයා.ලෝකයේම ඒ ස්ථානයේ පමණයි ඒ මාළුවා ඉන්නේ. වෙන ස්ථානයක ඒ මාළුවා හදන්න බැහැ. ඒ ස්ථානයේ මාලුවා නැති වුණොත් මුළු ලෝකයෙන්ම ඒ ජීවියා අතුරුදහන් වෙනවා. ඒ නිසා මිලියන 8.4 කට අයත් මේ මහා පෘථුවිය තුළ වාසය කරන ජීවීන්ගෙන් එක ජීවියෙක් අපි සදහටම අහෝසි කර ගන්නවා. ඒ මාළුවාගේ නම තමයි මාටින්ස්ටයින්ගොබේකියන මාළු විශේෂය. ඒ මාළුවා පාලින්ද නුවර තිබෙන ඒ දිය ඇල්ලේ පමණයි වාසය කරන්නේ. ඒ නිසා පරිසර සංවිධානත්, විශේෂයෙන්ම අපිත් එකතු වෙලා ගරු ජනාධිපතිතුමාට දැනුම් දුන්නා, මේ දිය ඇල්ල තුළ හදන්න එපාය කියලා. හැබැයි, ඒක ඉතාමත් අවාසනාවන්ත කාරණය තමයි නැවත සැරයක් ඒ දිය ඇල්ල හදන්න මුල් කර ගත් පුද්ගලයින්ටම තමයි නැවත මේ සම්බන්ධව පරීක්ෂණ කරන්න පවරලා තිබෙන්නේ. කැලණිය විශ්ව විද්‍යාලයට නොවෙයි. කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකුට පවරලා තිබෙනවා මේ සම්බන්ධව පරීක්ෂණ කරන්න. ඒ නිසා නැවත උත්තරය ලැබෙන්නේම කොන්දේසි සහිතව ඒ දිය ඇල්ල ආශ්‍රිතව විදුලි බලාගාරය නිර්මාණය කරන්නයි. බරපතළ හානියක්. ඒ ගොඩේ කොන්දේසි යටතේ දාලා තිබෙනවා, ඒ මත්ස්‍ය වර්ගය වෙන තැනක වගා කරන්න කියලා. හැබැයි, අපි දන්නවා රෙඩ් පොට් මත්ස්‍ය වර්ගයක් නැවත කොහේවත් වගා කරන්න බැහැ. දැන් අවුරුදු පහක් තිස්සේ පරීක්ෂණ කරනවා. බලංගොඩ පැත්තේ කුඹුරකින් හමු වුණු බන්දුල පෙතියා වෙන තැනක හදන්නේ කොහොමද කියලා. නමුත් ඒ ඔක්කොම පරීක්ෂණ අද වන කොට අසාර්ථක වෙලා තිබෙනවා. ඒ නිසා මේ රෙඩ් පොට් යටතේ තිබෙන මාටින්ස්ටයින් ගොබේ කියන මත්ස්‍ය වර්ගය, ඒ වාගේම රාස්බොරොඩීන් නිගොමර්ගිනේටස් කියන මත්ස්‍ය වර්ගය. ශ්‍රී ලංකාවේ කියන්නේ, කළු වරල් හල්මල් දණ්ඩියා කියලා. මේ දණ්ඩි විශේෂයත්, මේ මාළු වර්ගයත් ලෝකයේම ඉන්නේ මේ දිය ඇල්ල ආසන්නයේ පමණයි. ඒ නිසා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා, බස්නාහිර පළාත ගෝලීය වශයෙන් සලකන, ශ්‍රී ලංකාව විධියට සලකා ගෙන මෙවැනි ආයතනවලට, ජනතාව තනිව කරන සටන්වලට, පරිසරවේදීන් තනිව කරන සටන්වලට සභාවක් විධියට මැදිහත් වෙන්නේ කොහොමද කියලා සභාවක් විධියට වැඩ පිළිවෙළක් හදා ගන්නය කියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, පරිසර විෂය සම්බන්ධව.

ඒ වාගේම කටුනායක දක්වා යන අධිවේගී මාර්ගය හදද්දීම ඒ feasibility report එක හදපු ජපන් විශේෂඥවරු ලංකාවට ඇවිල්ලා, ජපන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයොත් එක්ක එකතු වෙලා එක එක පැලෙන් පැලේ හඳුනා ගන්නවා. පිටු හත්සිය ගණනක වාර්තාවක්. පිටු හැට ගණනක සටහන් වෙලා තිබෙන්නේ, මේ පැල වර්ග මොනවාද කියලා. එතැනදී පරිවර්තන කාර්යයේ මමත් යෙදුණා. ඒ ජපන් පැලැටි කොහොමද හඳුනා ගන්නේ කියලා. එතැනදී බෝවිටියා පැලේ ඉඳන්, එහෙම නැත්නම් වෙනත් පුංචි සතුන්ගේ සිට සියලු දෙනාම වාර්තා කරලා තිබෙනවා. මේ අධිවේගී මාර්ගය සෑදීම නිසා මේ ප්‍රදේශය ඉතාමත් මහඟු බිමක්. ඒක ඒගොල්ලෝ සඳහන් කරන්නේ මීගමුව ප්‍රදේශයේ ඒ මහා ජල කඳ, ඒ මහා සයුර, ඊළඟට අරාබි මුහුද, ඊට පස්ස අත්ලාන්තික් සාගරය, පැසිපික් සාගරය මේ ඔක්කෝටම තිබෙන එකම වගුරු බිම බවට පත් වෙලා තිබෙන්නේ, ඒ කඩොලාන ශාඛ බවට පත් වෙලා තිබෙන්නේ මුතුරාජවෙල. මුතුරාජවෙල තිබෙන වටිනාකම සලකා ගෙන තමයි ඒ විධියට එකින් එක ශාකය හඳුනා ගන්නේ. එකින් එක ජීවී ප්‍රජාව හඳුනාගන්නේ. හේතුව,

[ගරු අසෝක සපුමල් රන්වල ]

මේ ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ තිබෙන වතුර ප්‍රමාණය ක්‍රමානුකූලව මුහුදට බැහැලා යන්න තිබෙන්නේ මේ වගුරු බිම හරහා. මේ වගුරු බිම සංරක්ෂණය කර ගත යුතුයි. ඒ නිසා තමයි හයිවේ එක උඩින් ගියේ. හැබැයි, අද වන කොට මේ වගුරු බිම තුළ මහා පරිමාණ කර්මාන්ත ශාලා, මහා පරිමාණ ගබඩා සංකීර්ණ එකින් එක ගොඩ කරන්න පටන් අරගෙන. ඔබතුමන්ලා අධිවේගී මාර්ගයෙන් යද්දී පොඩ්ඩක් බලන්න. මන්ත්‍රීවරුන් විධියට දකින්න පුළුවන්. දෙපැත්තේ කහ පාටට පස්වලින් ගොඩ කරලා අද ගොඩනැගිලි හදනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඉතාම සාරවත් කථාවක්. කනගාටුවෙන් වුණත් මට ඉල්ලීමක් කරන්න වෙනවා, කථාව නවත්වන්නය කියලා. හැබැයි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මෙතුමා අපේ විද්වත් මන්ත්‍රීවරයකු විධියට අපි එතුමාට වෙනත් වෙලාවක සුවිශේෂී අවස්ථාවක් දිය යුතුයි කියලා මම අදහස් කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ වාගේම ඉෆ්තිකාර්ගරු මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව සඳහන් කළා කැලණි ගඟ සම්බන්ධව. ඒ වාගේම බොල්ගොඩ සම්බන්ධව. ඒ වාගේම අනෙකුත් ගංගා සම්බන්ධව ඉතාමත් බරපතළ අනතුරකට පත් වෙලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වෙනත් විෂයයක් පිළිබඳ විවාදයේදී ඔබතුමා මේ ගැන ඉතිරි ටික කථා කරන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

තව එක විනාඩියක් දෙන්න. ලෝකයේ බොහෝ රටවල දැන් අපද්‍රව්‍ය පොළොවට දාන්නේ නැහැ. හැබැයි, අපජලය පවාහන පද්ධතියක් අපේ රට තුළ ක්‍රියාත්මක කරන්න නීතියෙන් බාධා කරලා තිබෙනවා. කොළඹ නගරයේ විතරක් සුද්දෝ හදපු අපජල පවාහන පද්ධතිය තිබෙනවා. වෙන කොහේවත් අපජල පවාහන පද්ධතියක් නැහැ. හැබැයි, ලෝකයේ වතුර ටික හොඳට ගන්නවා. අපජලය සහ වෙනත් ප්‍රයෝජන ගන්නේ නැති ජලය නල පද්ධතියෙන් ගිහිල්ලා ඒක පිරිසිඳු කරලා පරිසරයට මුදා හරිනවා. හැබැයි, අපේ රට අසමත් වෙලා තිබෙනවා. අප ජලය ජනතාවට දෙනවා තනි තනිව කළමනාකරණය කර ගන්න කියලා. ඒ අපජලය දැම්ම නිසා පරිසරයට වන හානිය තක්සේරු කරන්නේ නැහැ. මෙතුමා ප්‍රකාශ කළෙත්, ඒ වාගේම අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේත් කැලණි ගඟ මේ වන කොට ඉතාමත් බරපතළ අවධානමකට පත් වෙලා තිබෙනවා. බීමට ගන්නා ජලය පෝෂණය කරන්නේ ලංකාවේ කැලණි ගඟෙන් කොළඹ නගරය ආශ්‍රිතව. ඒ නිසා මේ අනතුරින් මුදවා ගැනීමට මේ වන කොටත් අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඒ සම්බන්ධව පළාත් සභාව තුළ යම් කටයුතු ප්‍රමාණයක් කරලා තිබෙනවා. ඒ වාගේම සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා ගං දැලේජීවත් වන මන්ත්‍රීවරයෙක් විධියට, ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ කැලණි ගඟේ වටිනාකම ඕනෑවටත් වඩා දන්නා හඳුනන මිනිස්සු විධියට අපි මේක සංරක්ෂණය කර ගෙන, තේම්ස් නදිය බවට - තේම්ස් නදිය මීට වඩා විශාල හානියක් සිද්ධ වෙලා තිබුණු ගඟක්. හැබැයි, ලන්ඩන් නගරය අලංකාරවත් කරන තේම්ස් නදිය බවට අපේ කැලණි ගඟ පත් කර ගන්න අපි සියලු දෙනාම මැදිහත් වීමක් කළ යුතුයි. බොහොම ස්තූතියි.

[අ.භා. 04.52]

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂය පථයට අදාළ වැය ශීර්ෂයට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව මුලින්ම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මෙතැන ගරු මහ ඇමතිතුමාගේ විෂය පථය පිළිබඳව වැඩියෙන්ම කථා කළේ පළාත් පාලන විෂය සම්බන්ධව කියන එක මම සිහිපත් කරනවා. මොකද, අද ලංකාවේම පළාත් පාලන ආයතන විසුරුවලා. ඒ වාගේම බස්නාහිර පළාත විශේෂයෙන්ම ගම්පහ, කළුතර, ඒ වාගේම කොළඹ ප්‍රධාන කොට ගෙන පළාත් පාලන ආයතන ගණනාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තමයි මම නියෝජනය කරන්නේ. ගම්පහ දිස්ත්‍රික්කය ගත්තාම මහ නගර සභා දෙකක් තිබෙනවා. එයින් ප්‍රධාන මහ නගර සභාවක් විධියට තමයි මීගමුව මට තමුන්නාන්සේට, මේ සභාවට මතක් කරන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් අපි පළාත් පාලන ආයතනයෙන් පළාත් සභාවට ආපු මන්ත්‍රීවරයෙක් හැටියට අපි විශේෂයෙන්ම කනගාටු වෙනවා, අපි නියෝජනය කරන ප්‍රදේශයේ අද වර්තමාන කොමසාරිස්වරයා යටතේ පාලනය වන ආකාරය සම්බන්ධව විශේෂයෙන්ම කනගාටු වෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි කොමසාරිස්වරයෙක් නැත්නම් ලේකම්වරයෙකු යටතේ පළාත් පාලන ආයතන හසුරුවන කොට මහජන අදහස්, ඒ වාගේම පළාත් සභා මන්ත්‍රීවරු, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසන්නේ නැතිව අත්තනෝමතිකව තමයි කටයුතු සියල්ල සිද්ධ වෙන්නේ. විශේෂයෙන් ගොඩක් වෙලාවට බහුතරයක් පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙන්නේ ඒ විධියට කියන එක මම මේ සභාවට මතක් කරලා දෙනවා. ඒ නිසා මම හිතනවා. පසුගිය දවස්වල ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ පළාත් පාලන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් බස්නාහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතන කැඳවලා, ඒ ප්‍රධානීන්ට 2017 වර්ෂයේ අයවැය සම්බන්ධව යම්කිසි ප්‍රගති සමාලෝචනයක්, අඩුපාඩු සාකච්ඡාවට භාජනය කරලා, ඒ වාගේම 2017 වසරේ අයවැය සම්බන්ධව යම් යම් අඩුපාඩු නිවැරදි කරන්න අවශ්‍ය උපදෙස් ලබා දුන්නා. ඒ ගැන මම විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ විෂය භාරව කටයුතු කරන ලේකම්තුමියටත් මගේ ස්තූතිය පුද කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මම නියෝජනය කරන මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ අපි මිනිස්සුත් එක්ක ජීවත් වෙන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සු ඇවිල්ලා කියනවා, වීදි ලාම්පුවක් දා ගන්න බැහැ. එහෙම නැත්නම් කාණුවක් සුද්ධ කර ගන්න බැහැ. එහෙම නැත්නම් මිනිස්සුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගන්න පළාත් පාලන ආයතනයට ගියාම, ඒ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් කටයුතු කරන ආකාරය ඉතාමත්ම කනගාටුදායකයි. මොකද, අපි මිනිස්සුත් එක්ක උරෙන් උර ගැටිලා, මිනිස්සු එක්ක ඉතා සහයෝගයෙන් ජීවත් වුණු පරිසරයක් තුළ තමයි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයයි තිබෙන්නේ. ඒ නිසා කාලය කළමනාකරණය කර ගන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ඒ නිසා මම විශේෂයෙන් මතක් කරනවා. පසුගිය දවසක මීගමුව මහ නගර සභාවේ සැලසුම් කමිටුව අඟහරුවාදා දවසේ තිබෙන්නේ. අඟහරුවාදා දවසට ගියාම, සැලසුම් කමිටුවේ සියලු අනුමැතිය ලබලා සතියක් බලාගෙන ඉන්න ඕනෑ, කොමසාරිස්තුමා අත්සන් කරන කල්. අපට කනගාටුයි. මේ රටේ නිදහස් අධ්‍යාපනය ලබලා, මේ රටේ බදු ගෙවන ජනතාවගේ මුදල්වලින් වැටුප් ලබලා, මේ රටේ ජනතාවට සේවය කරනවා වෙනුවට ඒ අය තමුන්ගේ බල පුළුවන්කාරකම් මේ අවස්ථාවේදී පෙන්වීම සම්බන්ධව අපි කනගාටු වෙනවා. මම වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ. මට තව කාලය ලබා දෙනවා නම් වඩාත් හොඳයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩි පහයි තිබෙන්නේ. සභාව ප.ව. 5.00 ට අවසන් කරන්න ඕනෑ.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ඒ නිසා මම අදහස් කර ගෙන ආපු කරුණු ටික කියන්න බැහැ. ඒ නිසා එක පැත්තකින් මීගමුව ධීවර කර්මාන්තය වාගේම මම විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ගැනත් කථා කරනවා. මොකද, පසුගිය දවස්වල මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට අයත් සංචාරක මණ්ඩලයට ගියා. නමුත් සංචාරක අමාත්‍යාංශයේ සභාපතිවරයා එම ස්ථානයේ නැහැ. සභාපතිතුමාව අදත් බැලුවා. මම දැකලත් නැහැ. කළු ද සුදු ද දන්නෙත් නැහැ. අද මෙතැනත් නැහැ. මීගමුවේ තිබෙනවා, විශාල පිහිනුම් තටාකයක් හදලා. මේ පිහිනුම් තටාකය මුහුදු සීමාවේ ඉඳලා මීටර් 25 යි 50 යි අතර සීමාවේ තමයි තිබෙන්නේ. ඒක කෝටි ගණනක් වියදම් කරලා හදලා තිබෙනවා. අදටත් ඒක කිසිම ටෙන්ඩර දීලා හදලත් නැහැ. කිසිම කෙනෙක් ඒකට සම්බන්ධ වෙලා,ඒ තුළින් ආදායම් උපදවන ක්‍රියාමාර්ගයක් අද වන තුරු කටයුතු

[ ගරු එස්.එම්. සකාවුල්ලා ]

කරලා නැහැ. ඒ නිසා මම ඒ සම්බන්ධව තොරතුරු ලබා ගන්න මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ තිබෙන සංචාරක අමාත්‍යාංශයට යන. එතැනදී කිසිම තොරතුරක් ලබා නොදීම සම්බන්ධව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම වැඩිදුර කථා කරන්න බැහැ. ඒ නිසා නැවත වාරයක් ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේ පළාත් පාලන ආයතන සම්බන්ධව ඒ වාගේම සංචාරක අමාත්‍යාංශය සම්බන්ධවත් මීගමුවේ මම ජීවත් වන පරිසරයේ මම නියෝජනය කරන ප්‍රදේශය ගැනත් වැඩි අවධානයක් යොමු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 04.56]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ දීර්ඝ කථාවක් කරන්න මේ අවස්ථාවේදී වෙලාව නැහැ. ඒ වුණත් කෙටි අදහස් කිහිපයක් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. මම මුලින්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ 2017 අයවැයට සුභ ප්‍රාර්ථනා කරනවා. විපක්ෂයක් වශයෙන් අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ප්‍රධාන අමාත්‍යතුමාට ලබා දෙනවාය කියලා අපේ කණ්ඩායම තීරණය කරලා තිබෙනවා. මම විශේෂයෙන්ම කථා කරන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධාන විෂය වන පළාත් පාලන විෂය ගැනයි. මේ පළාත් පාලන විෂය පිළිබඳව කථා කරන කොට මට අදාළව පවතින කරන ප්‍රාදේශීය සභාව තමයි බියගම ප්‍රාදේශීය සභාව. මේ බියගම ප්‍රාදේශීය සභාවේ පරිපාලනය මෙහෙයවන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, පසුගිය කාල සීමාවේදී මහජන නියෝජිතයින් නොමැති වුවත් බියගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන නිලධාරීන් විසින් මේ ප්‍රාදේශීය සභාව හසුරුවන්නේ, හිටපු සභාපතිවරයාට අවශ්‍ය කරන විධියට. පසුගිය කාල සීමාව තුළදී අපි දැක්කා, බියගම ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලබා දීමේදී, මෙම ව්‍යාපෘති සියල්ලම ලබා දෙන්නේ ටෙන්ඩර් පටිපාටියකින් තොරව හිටපු සභාපතිවරයාගේ කණ්ඩායමට.

ඒ වාගේම අපි පසුගිය කාල සීමාව තුළදී, ඔබතුමාගේත් අවධානය යොමු කළා. බියගම ප්‍රාදේශීය සභාවේ කුණු කසළ ඉවත් කිරීම පිළිබඳ ගැටළුව පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපේ උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා, දොම්පේ කුණු ටික දොම්පේට දාන්න කියලා. අපි ඔබතුමාහරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බියගම තිබෙන කුණු බියගමට විතරක් නොවෙයි. ලංකාවේ තිබෙන සියලුම කුණුවලට, බස්නාහිර පළාතේ තිබෙන කුණුවලට ඔබතුමා ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. අපි පසුගිය කාල සීමාව තුළ දැක්කා දොම්පේ, මාලිගාවත්තේ - මම හිතන්නේ දොම්පේ, බියගම සහ අත්තනගල්ල තිබෙන කුණු ටික දොම්පේ, මාලිගාවත්තේ තිබෙන පිටියට දාන්න ඕනෑ කියලා තීන්දුවක් ගත්තා. නමුත් මෙතැනදී ප්‍රශ්නයක් මතු වුණා. බියගම කුණු, මහර කුණු, කැලණිය කුණු, කොළඹ කුණු කියලා නැහැ. ඒ නිසා අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. බියගම ආසනයේ සමස්ත ජනතාව ඉන්නවා. ලක්ෂ දෙකක් විතර. ඒ එක්කම බියගම නිදහස් වෙළඳ කලාපයේ ඉන්නවා 40,000 ක පමණ නේවාසික සේවකයින්. විශාල වශයෙන් කුණු ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා, බියගම ආසනයේ කුණු නොමැති නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා අඩුම ගණනේ මේ අසන තුන හතරට කුණු දාන්න ස්ථානයක් අපට සකස් කරලා දෙන්නය කියලා.

ඒ එක්කම විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කැලණි ගඟ. අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් ලක්ෂ 10 කට ජලය ලබා දෙන්නේ කැලණි ගඟෙන්. ඒ කැලණි ගඟේ පට්ටිවෙල තිබෙන ජල පොම්පාගාරයෙන් තමයි වතුර ලබා දෙන්නේ. පසුගිය කාල සීමාව තුළදීත් අපි දැක්කා, එහා පැත්තේ හංවැල්ලේ ඉඳලා පැලියගොඩ දක්වාම තිබෙන කර්මාන්ත ශාලාවලින් ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, සියලුම දේවල් ගඟට බහින්නේ. කොකා කෝලා කොම්පැනිය, බියර් කොම්පැනිය හැම ව්‍යාපාරික ස්ථානයකම තිබෙන දහජරාව ඔක්කොම කැලණි ගඟට දාන්නේ. එතැනින් පට්ටිවෙලින් අපි වතුර අරගෙන ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් ලක්ෂ 10 කට අපි වතුර ලබා දෙනවා. මේක මහජනතාවට විශාල ප්‍රශ්නයක්. අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මෙය තනිවම ඔබතුමාට විතරක් කරන්න බැහැ. නමුත් ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ඡා කරලා, කැලණි ගඟ පිරිසිඳු කිරීමේ ව්‍යාපෘතියක් ඔබතුමා ඉතාමත්ම ඉක්මණට ආරම්භ කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒත් එක්කම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් තවත් විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. බියගම ප්‍රාදේශීය සභාවේ කුණු කසල ප්‍රශ්නය, බිම් කට්ටි

අනුමත කිරීමේ ප්‍රශ්නය, වීදි ලාම්පු සවි කිරීමේ ප්‍රශ්නය පිළිබඳව අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ඒ එක්කම ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, විශේෂයෙන්ම පසුගිය 28 වැනිදා විශාල ප්‍රශ්නයක් වුණා. මම හිතන්නේ, ඔබතුමාගේ මැදිහත් වීමෙන්, අපේ ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ මැදිහත් වීමෙන් මටත් ඒකට ආරාධනා කරලා තිබුණා. අපි පළාත් පාලන අමාත්‍යාංශය හරහා රුපියල් ලක්ෂ 500 ක වියදමින් ගොඩනැගිල්ලක් ආරම්භ කළා. මේ ගොඩනැගිල්ල පසුගිය ආණ්ඩුවෙන් ලබා දුන්නාට, මේ ආණ්ඩුවෙන් විවෘත කිරීමට අවශ්‍ය කරන කටයුතු සම්පාදනය කරලා තිබුණා. ඒ අවස්ථාවේදී බියගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා එතුමාගේ හිතවත් පිරිසක් සමඟ ඇවිල්ලා ෆයිසර් මුස්තාපා ගරු අමාත්‍යතුමා එන්න කලින් මේ ගොඩනැගිල්ල බලහත්කාරයෙන් විවෘත කළා. ඒ විවෘත කරන කොට රුපියල් ලක්ෂයක් පමණ වන වියදමකින් බියගම ප්‍රාදේශීය සභාවෙන් විශාල වශයෙන් ආහාර සංග්‍රහයක් ලැහැස්ති කරලා තිබුණා. මේ ආහාර ඔක්කොම භුක්ති විඳලා මේ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්. බොහොම ස්තුතියි.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියගේ අවධානය යොමු කරලා, මේ කටයුත්තට වහාම නීතිමය කටයුතු තදින් ක්‍රියාත්මක කරන්නය කියලා ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපි ස්තුති කරනවා. මට විනාඩි 09 ක් තිබුණා. නමුත් අපි විනාඩි 04 කට කථාව සීමා කළා. කාලය ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 04.59 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 04.59 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අද දින උදෑසන ආණ්ඩුකාරවරයා, පළාත් සභාව හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ සාකච්ඡාව ආරම්භ වූ අතර එකී විවාදය පූ.භා. 11.59 ට අවසන් විය. සම්ප්‍රදායානුකූලව ඒ පිළිබඳව බෙදීමක් නොඉල්ලූ නමුදු එකී වැය ශීර්ෂයන් සභාවේ සම්මත වූ වැය ශීර්ෂයන් ලෙස සැලකූ බවත්, ඉන් අනතුරුව ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ වැය ශීර්ෂයන් අ.භා. 12.07 ට ආරම්භ වූ අතර අද දින එම විවාදය අවසන් නොවූයෙන් හෙට දිනට නැවත එම වැය ශීර්ෂයන් විවාදයට ගන්නා බව අද දින ප්‍රගතිය වශයෙන් ප්‍රකාශ කරනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.01 ට, 2016 දෙසැම්බර් මස 08 වන දින පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 05.01 p.m till 9.00 a.m. on 08.12.2016*